©

මෙම කෘතිය කතුවරයාගේ පූර්ණ අනුමැති සහිතව
sinhalaebooks.com වෙබ් අඩවිය විසින්
පාඨකයන්ගේ කියවීම උදෙසා නොමිලේ බෙදාහරින ලද කෘතියකි.

Published with Author Consent.

*.... 01*

“දැන් ඕවා ගැන හිතලා වැඩක් නෑ කෙල්ලේ“

“ජීවිතේ ඔහොම තමා. හැමදාම රැවටෙන්නේ අපි“

“මොන දේ වුණත් ඉවසපන්. පොඩි කාලේ ඉඳන් දුක් විඳපු උඹට මේ හැමදේම දරාගන්න පුළුවන් කියලා මං දන්නවා අනූ“

“මාත් හිතනවා මලින්දි මට දරාගන්න පුළුවන් වෙයි කියලා“

කුස්සිය පැත්තේ බිම ඉඳගෙන අනූ ඔහේ නිල් අහස දිහා බලාගෙන හිටියා.

මලින්දි, අනුලි විජේසිංහගේ පාසල් මිතුරිය. අනුලිට හැමෝම ආදරේට කතා කළේ අනූ කියලා.

මලින්දි පුළුවන් වෙලාවට අනූව බලලා යන්න එයාගේ ගෙදරට එන්නේ මිතුරුකම නිසා.

එහෙම ආපු වෙලාවේ තමා අනූ එයාට වෙලා තියෙන හැමදේම කිව්වේ.

“උඹට වරදින්නේ නෑ කෙල්ලේ“

“හැමදේම ලැබෙන්නේ ඒකට ලැබෙන්න ඕනම වෙලාවට. ඒ හින්ද ඉවසන්නම වෙනවා අමාරුවෙන් වුණත්. ඔයාට දෙයක් නොලැබුනේ ඊට වඩා හොඳ දෙයක් ඔයාට ලැබෙන්න තියෙන නිසා වෙන්න පුළුවන්නේ අනූ“

“එහෙම හිතලා හිත හදාගනින්“

“එහෙම නොවෙන්නත් පුළුවන්නේ මලී“

“උබට නරකක් වෙන්නේ නෑ බං“

“අනේ මන්ද“

“මාත් යනවා බං නංගිව ක්ලාස් එකට දන්න ඕනේ. ආයේ එන්නම්කෝ“

“හ්ම්ම්ම් පරිස්සමෙන් පලයන්“

මලින්දි ගියාට පස්සෙත් අනූ එතනම ඉඳගෙන අහස දිහා බලාගෙන හිටියා.

අනූටත් තිබුණා ලස්සන ආදර කතාවක්. ඒත් නොහිතපු විදියට ඒ කෙනා වෙනස් වෙද්දි, ලැබෙන ඉරණමකට මූණ දෙන්න අනූ හිත හදාගත්තා.

අනුලිගේ පියා මෙලොව හැර ගියේ එයා කුඩා කාලේදීමයි. එයාගේ අම්මා මේ නිසාම අළුත් විවාහයක් කරගත්තා.

ඒත් ඒ බාප්පා අනූට ආදරෙන් සැලකුවේ එයාගේ මල්ලි ඉපදෙනකම් විතරයි. අම්මාත් දැන් අනූට වෙනස්කම් කරනවා.

තාත්තාගේ ආදරේ කොහොම වුණත් අම්මෙකුගේ ආදරය නැතුව දරුවෙක් හරි අසරණයි. අනූත් එහෙමයි. අම්මා බාප්පගේ පැත්ත ගනිද්දි අනූ අසරණ වුණු අවස්ථාවල් එමටයි.

බාප්පගේ රැවුම්, ගෙරවුම්, ආඩපාලි මැද්දේ අනූ කොහොම හරි තමන්ගේ අධ්‍යාපනය සම්පූර්ණ කර ගත්තා.

“දැන් රස්සාවක් හොයාගත්තොත් නරකද උඹ. මං මල්ලි ගැනත් බලන්න ඕනේනේ“

“උඹ ගැන විතරක් හිතලා බෑනේ. මිනිහෙක් එක්ක යනකම් සල්ලි හොයපං“

“මං රස්සාවක් හොයාගන්නම් බාප්පේ“

අනූගේ බාප්පා රස්සාවක් හොයාගන්න බල කරපු නිසාම අනූ ගොඩක් උනන්දුවෙන් පුළුවන් හැමතැනකම රස්සාවල් හෙව්වා.

කම්පැනි ගාණේ ගිහින් අයදුම්පත් දැම්මා. ගණන් කරන්න බැරි තරම් අයදුම්පත් ප්‍රමාණයක් අනූ දන්න ඇති.

අනූගේ උත්සාහය නිසාම ඉක්මණින්ම පෞද්ගලික ආයතනයකට සම්බන්ධ වෙන්න එයාට පුළුවන් වුණා.

ඒ රස්සාවෙන් ලැබෙන පඩියෙනුත් වැඩි කොටසක් බාප්පා ඉල්ලා ගත්තේ අම්මාත් දැනුවත්ව. ඒත් අනූ නම් කිසිම දෙයක් කිව්වේ නෑ. හැමදේම ඉවසගෙන හිටියා.

රැකියාවට ගිහින් නොබෝ දිනකින් අනූගේ ජීවිතේට ආදරේ එන්නේ බලාපොරොත්තු ගොන්නකුත් එක්ක.

අනූ රැකියාව කල ආයතනයේම වසර 2ක් පමණ වැඩිමල් ලිපිකරුවෙක් වන දමිත් එක්ක ඇය ආදර සම්බන්ධයක් ඇති කර ගත්තා.

හොඳම යාළුවෝ වෙලා හිටපු මේ දෙන්නා ආදරවන්තයෝ වුණේ නොදැනීමයි.

වසර තුනක පමණ කාලයක් දෙන්නා ආදරේ කළේ අවුරුදු 23 වෙනකොට විවාහ වෙන බලාපොරොත්තුවෙන්.

'ඒත් බලාපොරොත්තු මිනිස්සුන්ව ජීවත් කරවනවා කියන්නේ බොරුවක්. බලාපොරොත්තු නිසා මැරි මැරි ජීවත්වෙන්නයි මිනිස්සුන්ට වෙලා තියෙන්නේ'

'ඔයා මට මෙහෙම නොකළා නම් අද මාත් සතුටින් දමිත්'

තාමත් අහස දිහා බලාගෙන හූල්ලන අනූ හිතුවේ අතීතෙට යන ගමන්.

ආදරේ කියන තැනදී අනූ කොහොමත් අසරණයි. තමන්ගේ තාත්තගේ ආදරේ වැඩි කාලයක් විඳින්න අනූට බැරි වුණා.

අම්මා තමන් ළඟ ඉඳලත් තමන්ට ආදරේ කරන්නේ නෑ.

දමිත්ට මුළු ලෝකෙටම තරම් ආදරේ කලත් එයාට ඒකේ කිසිම අගයක් නෑ.

"දමිත් අපි තවත් මේ දේවල් කල් දාන්න ඕනේ නෑනේ. අපේ අම්මාත් කිව්වා ඔයාට එන්න කියන්න කියලා"

අනූගේ අම්මාට, බාප්පාට ඕනේ වුණේ එයාව ඉක්මණට කසාද බන්දලා දීලා පවුලෙන් අයින් කරලා දාන්න. මොකද ඒක බාප්පාගේ ඕනකම. අනූගේ අම්මාත් බාප්පාට බයයි.

අනූගේ අහිංසකකමින් හැමෝම ප්‍රයෝජන ගත්තා.

“ඔයා කිව්වාට බෑ අනූ මට බඳින්න සල්ලි නෑ. මං ගස් වලින් කඩනවා කියලා හිතුවාද“

“ඉතිං අනේ සල්ලි තියෙන මිනිස්සු විතරද බඳින්නේ“

“ඒ අනිත් අයනේ. මේ මම. මම කරන්නේ මට ඕන විදියට“

“ඔයාට මොකද්ද මේ වෙලා තියෙන්නේ දමිත්. ඇයි ඔහොම කතා කරන්නේ. ඔයා මට ප්‍රොමිස් වුණානේ“

“හැම කෙනාම පොරොන්දු වුණු පළියට එව්වා රකිනවාද. නෑනේ“

“මේ අහන්න අනූ. මට පුළුවන් කාලෙට තමා මම බඳින්නේ. ඔයාට හදිස්සි නම් ඔයාට කැමති කෙනෙක් එක්ක යන්න පුළුවන්“

“මට මෙදුට බඳින්න පුළුවන් කියලා දවසක් මට කියන්න බෑ. මට පුළුවන් දවසක බඳින්නම්. එච්චරයි කතාව. ආයේ ඒ ගැන කතා කරන්න එපා“

“ඔයා කියන විදියට තව අවුරුදු 20කින් 30 කින් වුණත් වෙන්න පුළුවන්නේ“

“ඔව් පුළුවන්. නොවෙන්නත් පුළුවන්“

“දමිත්...“

අනූ සද්දෙට කතා කළේ දමිත් මේ කියපු දේවල් විශ්වාස කරගන්න බැරුව.

එක බත් එක බෙදාගෙන කාලා, අහස් මාළිගා හදපු දමිත් මෙහෙම කතා කරද්දි අනූට පුදුම කලකිරීමක් දැනුනා.

“ඇයි අනේ ඔයා ඔහොම කියන්නේ. ඔයා මට ආදරේ නැද්ද දමිත්“

ඇස්වල කඳුළු පුරවගෙන අනූ දමිත්ගෙන් ඇහුවා.

“ආදරෙයි කියලා මට මැරෙන්නද කියන්නේ. මට දැන්ම බඳින්න බෑ. ඔයාගේ ගෙදර අයටත් ඒක කියන්න“

අනූගේ අහස උසට තිබුණු බලාපොරොත්තු හැමදේම කඩාගෙන වැටෙන්න වැඩි දවසක් ගියේ නෑ.

එයාගේ දෙමව්පියන්ට දමිත් කියපු දේවල් කිව්වාම එයාලා කිව්වෙම දමිත් ගැන බලාගෙන ඉන්නේ නැතුව එයාලා කතා කරන දේකට කැමති වෙන්න කියලා.

මොකද බාප්පාගේ ඕනකම ඉෂ්ට කරන්න අම්මාටත් ඕන වුණ නිසා. අනූ දන්නවා කසාදෙකින් පස්සේ කවදාවත් ආයෙත් මේ පවුල එක්ක සම්බන්ධයක් එයාට තියාගන්න වෙන්නේ නෑ කියලා. මොකද ඒ තරමටම තමන්ගේ අයගෙන් වෙනස්කම් සිද්ධ වෙනවා.

අනූ නම් අම්මලා කතා කරන කසාදයක් කරගන්න පොඩ්ඩක්වත් කැමති වුණේ නෑ.

“උඹට ඕනේ මගේ මිනිය රේල් පාරේ දකින්නද ආ කියපිය“

“දුක් විඳලා උඹව හැදුවේ උඹට ඕන ඕන දේවල් කරන්නද“

sinhalaebooks.com

“කතා කරපන් ඉතිං අනූ“

“අම්මා මොනවද මේ කියන්නේ“

“ඔය මිනිහාව අමතක කරපන්. ඕකා කසාදේ කරන්නේ නෑ. ඒක ඉර හඳ වගේ විශ්වාසයි“

“මෙච්චරටම කියලත් කරන්නේ නෑ කියන්නේ ඒක කරන්නෙම නෑ. උඹලට ඕවා තේරෙන්න උඹ මෝරලා මදි තාම“

“අනික උඹව තවත් කල් ගෙදර තියාගෙන ඉන්න බෑ. අර මිනිහා මාව කන්න හදනවා“

“අම්මා මං ඔයාගේ දරුවෙක් නෙමෙයිද. ඇයි මට මෙහෙම කරන්නේ ඔයාලා“

අනූ නම් හොඳටම අඩනවා. දවස් ගාණක් දමිත්ගෙන් උත්තරයක් ගන්න ඇහුවත් එදා කියපු දේම තමා එයා කිව්වේ. කාගෙවත් පිහිටක් අනූට තිබුණේ නෑ.

“මට කන්න බොන්න දෙන්නේ අර මිනිහා. එයාට විරුද්ධ වෙන්න මට බෑ“

“ඒ හින්දු අපි කරලා දෙන දේකට කැමති වෙයන් ආයේ මට කියන්න බෑ“

“මට මගේ තාත්තාවත් හිටියා නම්“

“මැරිච්ච මිනිහෙක් ගැන කිව්වාට ආයේ එනවාද ඒකා. නිකං හිටහන්“

අනූ ඉකි ගගහා එදා ඇඩුවා එයාට මතකයි.

“මොන දේටත් වඩා මට වටින්නේ ඔයාලව අම්මේ“

“ඔයාලා කෙනෙක් හොයන්න මං කැමති වෙන්නම්“

හැමදේම හොඳට හිතලා අනු අන්තිමට ගත්ත තීරණේ ඒක.

‘මං නැතත් ඔයාලා හරි සතුටින් ඉදිනේ‘ අනුට ඒක අම්මාට කියාගන්න තරම් ශක්තියක් නැති වුණා.

ඇස් වලින් ගලාගෙන ගියපු කඳුළු පිහදලා අනු හොඳ හුස්මක් ගත්තා.

‘මේ ලෝකේවත් ස්ථිර නැති එකේ ආදරේ විතරක් ස්ථිර වෙයිද‘ අනු හිතුවේ එහෙම.

*.... 02*

සති ගණන් ගතවෙලා කපුවෙකුගේ මාර්ගයෙන් අනුට මංගල යෝජනාවක් ආවේ හේමන්ත සපරමාදුගේ ගෙදරින්.

පෞද්ගලික ආයතනයක රැකියාව කරන හේමන්ත අවුරුදු 28ක තරුණයෙක්. හේමන්ත ඉක්මන් කේන්තිකාරයෙක්. ජීවිතේ තමන් ආදරේ කරපු කෙනාට එයාගේ දෙමව්පියෝ අකමැති වුණේ ඒ කෙල්ල සංකර එකියක් වුණ නිසා.

හේමන්ත දැන් පැටලිලා ඉන්න අවුලෙන් බේරගන්න එයාගේ දෙමව්පියෝ වෙන ඕනම කෙල්ලෙකුට කැමති වෙන තත්වයේ තමයි හිටියේ.

අනූගේ ඡායාරූපයක් දැක්කාම ඒ අහිංසකකමටම හේමන්තගේ දෙමව්පියෝ කැමති වුණා.

“සීදේවි කෙල්ල පුතා. මේ බලන්නකෝ හරි ලස්සනයි“

“ලස්සන තියාගෙන කන එකයි ඇත්තේ“

හේමන්ත කේන්තියෙන් කියලා දැම්මා.

“උඹට ඉතිං මේ ලෝකේ ඉන්න එකම ගෑණි අර උඩැක්කියනේ“

“එකක් මතක තියාගනින් පුතේ. ඒ ගෑණිව උඹ ගෙනාවොත් මේ ගෙදරින් එළියට බහින්න වෙන්නේ හිස් අතින් තේරුණාද“

“මගේ දේපල හැමදේම මං අනාථ නිවාසෙකට දෙනවා මිසක් උඹට නම් තඹ සතේක දෙයක් මගෙන් නම් නෑ පුතෝ“

හේමන්තට ඕනෙත් දේපල ටික ලියවගන්න තමා. මේ නිසාම දෙමව්පියන්ගේ බල කිරීමට හේමන්ත කෙල්ලව බලන්න යන්න කැමති වුණා.

හේමන්තට සහෝදරයෙක් වගේ ඉන්න එයාගේ අතීතේ වර්තමානේ හැමදෙයක්ම දන්න එයාගේ යාළුවා නිශිත් වික්‍රමසිංහත් මේ ගමනට එක් වුණේ හේමන්තගේ බල කිරීමට.

“අනේ එන්න එන්න සපරමාදු මහත්තයෝ“

අනූගේ අම්මා හේමන්තලාව පිළිගත්තේ පුදුම සතුටකින්.

“ගේ හොයාගන්න අමාරු වුණාද මන්ද“

“අනේ නෑ නංගියේ. අපේ කපු මහත්තයා අපට පාර හරියටම කිව්වා“

“මේ දරුවෝ දෙන්නාගෙන්......“

“මේ හේමන්ත මගේ පුතා. මේ එයාගේ හොඳම යාළුවා. තනියම යන්න බෑම කිව්වා නංගියේ. පුතා හෙන ලැජ්ජාකාරයා“

‘අනේ මූගේ ලැජ්ජාව. මොකට කියනවාද ඒක‘ එහෙම හිතුවේ නිශිත්.

“එහෙනම් තේ ටිකක් බීලා ඉමු“

“ඊට කලින් අපේ ලේලිව බලලා ඉමු නේද“

“එහෙනම් මං එක්කගෙන එන්නම්කෝ අක්කේ“

අද දවසට අනූ ලෑස්ති වුණේ කරන්න දෙයක් නැතිකමට. එයාගේ අසරණකමට. දෙමව්පියන්ට තවත් බරක් වෙන්න බැරිකමට මිසක් ජීවිතේ ආසාවකට නෙමෙයි.

කණ්ණාඩියෙන් පේන තමන්ගේ මූණ දිහා අනූ ඔහේ බලාගෙන හිටියා.

තමන්ගේ ජීවිතේ මේ වගේ සැරසිලා දමිත් ඉස්සරහාට යන්න හීන දැකපු අනූට ජීවිතේටවත් දැකලා නැති අඳුරන්නේ නැති කෙනෙක් ඉස්සරහට අද යන්න වෙලා.

දමිත් මූණගැහිලා මේ දේවල් කිව්වාත් එයා ඒවා කණකටවත් ගත්තේ නෑ නේද කියලා අනූට මතක් වුණා.

"දමිත් අපේ අම්මලා මට මනමාලයෙක් බලලා"

"ඉතිං හොඳයිනේ. කොච්චර දෙයක්ද"

"දමිත්....."

"ඔයා මට ආදරේ කළේ බොරුවටද. ඔයාගේ පාළුව මකාගන්නද මාව තියාගෙන හිටියේ"

"ඔයාට පිස්සුද අනූ. මට ඔයාව බඳින්න බැරි නම් ඔයා කාව හරි බඳින්න ඕනනේ ළමයෝ"

"යන්න දමිත් ඔයා බොරු කළා. මගේ හීන එක්ක සෙල්ලම් කළා. ඔයාට ඕනේ වුණේ මම වෙන කාත් එක්ක හරි යන එකනේ"

"ඔයාගේ බලාපොරොත්තුව එහෙනම් ඉෂ්ට වුණා දමිත්"

එහෙම කියලා අනූ දමිත්ව දාලා ආපු හැටි අනූට මතක් වුණා.

අනූ එයාගේ කඳුළු වලට ඔහේ ගලාගෙන යන්න දුන්නා.

"මේ හොටු පෙරන එක නවත්තලා එනවා යන්න ඉස්සරහාට"

"අම්මා... මං මේක කරන්නම ඕනේද"

‘‘ඒ මිනිහා ආවේ මාව දීග ගෙනියන්න නෙමෙයිනේ‘‘

‘‘එනවා යන්න මෙන්න මෙහේ‘‘

අනූ කඳුළු පිහදාගෙන ජීවිතේට මූණ දෙන්න ශක්තිය දෙවියන්ගෙන් ඉල්ලුවා.

දොර රෙද්ද මෑත් කරලා  බුලත් හෙප්පුවත් අරගෙන කහ පාට ඔසරියකින් සැරසිලා බෙල්ලට කොණ්ඩයක් බැඳලා හිමින් ගමනින් එන මේ ලස්සන අහිංසක කෙල්ල දිහා හේමන්ත ඇරෙන්න අනිත් හැමෝම බලාගෙන හිටියා.

හේමන්ත වගේම නිශිත් එතන හිටපු නිසා අනූව එයාගේ අම්මා හේමන්ත ළඟටම එක්කගෙන ගියා.

අනූ බුලත් හෙප්පුවත් අල්ලගෙන හේමන්ත දිහා බැලුවත් එයාගේ නපුරු ඇස් දැකපු කෙල්ල හොඳටම බය වුණා.

ඒ වෙද්දිත් තරහෙන් පුපුර පුපුර හිටපු හේමන්තට කෙල්ල කොච්චර ලස්සන වුණත් පොඩ්ඩක්වත් අනුකම්පාවක් හිතුනේ නෑ.

නිශිත්ට නම් කෙල්ලව දැකපු වෙලාවේ ඉඳන්ම අමුතු හැඟීමක් හදවතට දැණුනා.

ඒ වගේම නිශිත් හරිම අනුකම්පාවෙන් කෙල්ල දිහා බැලුවේ හේමන්ත ගැන හොඳින්ම දන්න නිසා.

ඒත් ඉතිං එයා කියලා මොනවා කරන්නද.

‘පව්‘ නිශිත්ට හිතුනා.

තාමත් අනූ බුලත් හෙප්පුව අල්ලගෙන ඉන්නවා.

“පුතා ඔය හෙප්පුව වහලා තියෙන රෙද්ද අයින් කරන්න“

“දැන් හැදෙන ළමයි පරණ සිරිත් විරිත් දන්න එකක්යෑ නේද නංගියේ“

හේමන්ත තරහෙන්ම ඒක අයින් කළා.

“අපි මේ දරුවාට කැමතියි“

“ඒ හින්දු කල් නොදූ මේ කසාදේ ඉක්මණින්ම කරමු නේද නංගියේ“

“අපිම නැකැත් හදන වැඩ ටික කරලා දිනයක් දගෙන කියන්නම්“

“ලොකුවට ගන්න ඕනේ නෑ. පොඩියට කරලා දමු“

හේමන්තගේ අම්මාට නම් මේ කසාදේ කරන්න පුදුම හදිස්සියි.

“අපිට දෑවැදි එපා. ඒ හින්දු ඒ ගැන කරදර වෙන්න ඕනේ නෑ“

අනූගේ අම්මාට ඒක ඇහුවාම ඉගේ මලක් පිපුණා වගේ වුණා.

“අක්කලා කැමති විදියට මේ දේවල් කරමු අපි“

“එහෙනම් ඉතිං දැන් ඔන්න අපි නෑදෑයෝ“

“මේ දෙන්නාත් ටිකක් අඳුරගන්න ඕනනේ නේද. අපි මේ දෙන්නට ටිකක් කතා කරගන්න දීලා යමු නේද නංගියේ“

හේමන්තගේ අම්මාගේ යෝජනාව පිළිඅරගෙන හැමෝම එතනින් ඉවත්වුණේ මේ දෙන්නාට තනිවෙන්න දීලා.

වැඩි වෙලාවක් ගියේ නෑ හේමන්තත් එළියට ආවා.

“මෙච්චර ඉක්මණට කතා කරලා ඉවරද පුතා“

“බැන්දුම කතා කරන්න ඉතුරු කරගත්තාද දන්නේ නෑනේ නංගියේ“

පුතාගේ හැටි දන්න නිසාම ඉතිං හේමන්තගේ අම්මා එහෙම කියලා දැම්මා.

හැමෝම ඇතුලට එද්දි අනුගේ ඇස්වල කඳුළු පිරිලා තියෙනවා දැක්කේ නිශිත් විතරයි.

‘මූ බැන්නාද දන්නෙත් නෑ‘ නිශිත්ට හිතුණේ එහෙම.

කතාබහ හැමදෙයක්ම ඉවරකරගෙන විවාහය සිදුකරන බවටත් තීන්දු කරගෙන හේමන්තගේ දෙමව්පියෝ ඒ ගෙදරින් පිටත් වුණා.

*********************************************
*******

“අයියේ…“

“ම්ම්ම්ම්“

“මොකෝ බං මේ හේමන්ත අයියා එක්ක ගිහින් ආවා විතරයි බලාගත්තු අත බලාගෙන“

නිශිත් වික්‍රමසිංහගේ එකම මල්ලි මලිත්. හේමන්තගේ ගෙදර ගිහින් ආව වෙලාවේ ඉඳන් එයාගේ අයියාගේ වෙනසක් පෙණුනු නිසාම මලිත් නිශිත් එක්ක කතා කළා.

“පිස්සු“

“කාටද මටද“

“නැතුව මටද“

“මේ හලෝ මට නම් පිස්සු නෑ. මට නම් පේන්නේ මොකක් හරි මගුලක් වෙලා වගේ“

“මොකෝ බලන්න ගිය කෙල්ල තමුසේ ටැකල් කරපු එකක්වත්ද“

“විකාරද බං. මොන මගුලක් කියනවාද මන්ද“

“උඹටත් දැන් මනමාලියෝ බලන්න කාලේ හරි“

“අනේ මේ මගෙන් මුකුත් අහගන්නේ නැතුව ඉන්නවා“

“යකෝ උඹ බඳිනකම් මට බඳින්න විදියකුත් නෑ රෙද්ද“

“මේ මගේ මගුල මං බලාගන්නම්. උඹට තදියම නම් බැඳගනින්“

“හරි හරි මේ. ඒක නෙමෙයි අයියේ කෙල්ල ලස්සනයිද“

“ලස්සනයි.... හරි අහිංසකයි මල්ලි. පව් කියලා හිතෙනවා“

නිශිත් ඒක කියපු විදියට මල්ලි ඇස් දෙකත් ලොකු කරන් එයා දිහා බලන් හිටියා.

“ඒ... මේ... ඒකිව බැලුවේ උඹටද අරූටද“

“මට බලන්න ගියේ නෑනේ බොල“

“ඒ වුණාට කතා කරන්නේ හරියට උඹට බලපු කෙල්ල වගේනේ. හරිම හැඟීම්බරයි. ආ...දරණීයයි“

“උඹට ඔක්කොම විහිළු“

“අරූ මහා වසවර්තියා. අතික ඌ තිසුනිව නම් අත ඇරලා දයි කියලා හිතන්න බෑ“

“බලෙන් වගේ තමා කරන්න හදන්නේ“

“කව්ද දන්නේ ඉතිං මේ කෙල්ලව දැක්කාම අරකට වඩා මේක හොඳයි කියලා හේමන්ත අයියාට හිතුණද කියලා“

“හ්ම්ම්ම්ම්“

අයියාගේ මූණේ තියෙන සීරියස් පෙනුම දැක්කාම මලිත්ට හිතුණේ අයියාගේ හිතේ මොකක්ම හරි තියෙනවා කියලා.

“මේ ඒක නෙමෙයි අයියේ තමුසෙගේ හිත එහෙම ඒ කෙල්ලට ගියේ නෑනේ නේද“

මලිත් නිශිත්ගේ හිත කියෙව්වා වගේ කිව්වාම නිශිත්ට ලාවට හිනාවකුත් ගියා.

“ආව්... ආව්.... හේමන්තගේ මනමාලි මෙන්න අයියාගේ හිත අරගෙනෝ....“

“බූරුවෝ කෑ නොගහා ඉඳින්. අම්මාට ඇහෙයි“

“ඒ කියන්නේ කතාව ඇත්තනේ“

නිශිත් සද්දයක් නෑ.

“කියනවකෝ“

“ඔව් බං ඔව්. ඇත්තටම ඔව්. ජීවිතේ කවදාවත් දැණුනේ නැති විදියේ ෆීලින් එකක් මට දැනෙනවා“

“මටත් ආදරේ කරන්න ඕනේ කියලා හිතෙනවා“

“හේමන්තගෙන් ඒ කෙල්ලව ඉල්ලගන්න හිතෙනවා“

නිශිත් කියාගෙන කියාගෙන ගිය විදියට මලිත් පුදුම වෙලා.

“ඒ අයියේ මේ උඹමද. හොඳ සිහියෙන් නේද“

මලිත් නිශිත්ගේ ඔළුව අතගානවා. කොණ්ඩේ අදිනවා.

“ඒ කෙල්ලට හේමන්ත ආදරේ කරයිද කියලා මට සැකයි මල්ලි“

“අනික තිෂුගේ සම්බන්දේ ඌ නවත්තයි කියලා මට හිතන්නත් අමාරුයි. මොකද ඒක ගොඩක් දුර ගිය සම්බන්ධයක්“

“අපි මොකද්ද මේකට කරන්නේ. උන්ගේ අම්මලා හැමදේම කරන්න පටන් අරන් ඉවරනේ අයියේ“

“හැබැයි ඉතිං උඹට ෆුල් සපෝර්ට් එක මේ මල්ලිගෙන්. කෙල්ලව උස්සමුද“

“උඹට ඕනේ නම් මං කොහොමහරි කරලා දෙන්නම්“

මලිත් නම් අයියාට උදව් කරන්න පුදුම උනන්දුයි.

“දැන් පරක්කු වැඩියි මල්ලි“

“හේමන්ත ඒ කෙල්ල ගැන හිතනවාද කව්ද දන්නේ. මොකද මාත් එක්ක ඒ ගැන කිසිම දෙයක් කතා කලේ නෑ ඒ ගමන යන්න එන්න කිව්වා ඇරෙන්න“

“ඌ තිෂුව අමතක කරලා කෙල්ලට ආදරේ කරයි සමහරවිට“

“එහෙම වෙනවා නම් හොඳයි“

“නැත්තම් ඒ කෙල්ල දුක් විඳියි“

“හේමන්තගේ තරහක් නැත්තම් මං කැමති කෙල්ල ගැන හේමන්තගෙන් අහන්න මල්ලි“

“ඒත් අනූ මට කැමති වෙයිද කව්ද දන්නේ“

“අනූ.......?“

මෙච්චර වෙලා නිශිත් කියපු දේවල් අහගෙන හිටිය මලිත්ට තිබුණු ප්‍රශ්නේ ඒක.

“හම්ම්ම්. ඒ කෙල්ලගේ නම අනුලි. අනූ කියලා තමා කතා කරන්නේ“

“හෝ හෝ.....“

“මට ඒ කෙල්ලට හිතෙන් ආදරේ කරන්න පුළුවන් මලිත්. ඒකට තහනමක් නෑනේ “

“මොකක්? අම්මෝ උඹ තමා දවසකටවත් මිනිහා. මහ වනචරයෙක්“

“ඇයි දැන් මොකද්ද වැරැද්ද?“

“වැරැද්ද? වැරැද්දද? හිතෙන් ලව් කරද්දි ඉතිං උඹට ඕන ඕන දේවල් කරගන්න පුළුවන්නේ නේද?. කාට පේනවා දැනෙනවා කියලද?“

එහෙම කියලා ඇහැකුත් ගහලා මලිත් නිශිත්ගේ කාමරෙන් එළියට දිව්වේ ගුටි කන්න වෙන බව දන්න නිසා.

*.... 03*

කාලය වේගෙන් ගතවෙලා හේමන්තගෙත් අනුගෙත් විවාහය ඉතාම චාම් විදියට සිද්ධ වුණා.

හේමන්තගේ දෙමව්පියෝ එයා වෙනුවෙන් ඉදි කරලා තිබුණු දෙමහල් නිවසට ඒ දෙන්නව පිටත් කළේ නිදහස් ජීවිතයක් ගත කරන්න ඕන නිසා.

ඉතිං අනූත් හේමන්තත් මේ ගෙදරට ඇවිත් තාමත් ගෙවුණේ සතියකටත් අඩු කාලයක්.

ඒ කැදැල්ල මේ වෙනකොටත් ප්‍රශ්න වලින් පිරුණ තැනක් වෙලා ඉවරයි.

‘‘මට තමුසෙව දකිනකොට පුදුම කේන්තියක් එනවා ඕයි‘‘

‘‘ඒ හින්ද ඕනම දේකට ඇරෙන්න ඔය මූණ මට පෙන්නන්න එපා‘‘

‘‘තමුසේ ඒක හොඳට මතක තියාගන්නවා. ආයේ ආයේ මට කියන්න ඉඩ තියන්න එපා‘‘

අත දික් කර කර කෑගැහුවේ හේමන්ත.

‘‘හ්ම්ම්ම්ම්ම්ම්‘‘

අනූ මහා බර සුසුමක් හෙළුවේ හේමන්තගේ කතාවට. උදේම තමන්ගේ හස්බන්ඩ් ඒ වගේ කතාවක් කියද්දි දැනෙන දේ අමුතුවෙන් කියන්න ඕනේ නෑනේ.

අනූ එහෙම්මම ඇවිත් ඉඳගත්තේ කුස්සිය පැත්තේ තියෙන පොඩි පඩිපේළියේ. ගෙදර ඉන්න කාලෙත් එයාගේ පුරුද්ද ඒකනේ.

අනූට කෑගහපු හේමන්ත වාහනෙත් අරන් වේගෙන් ආවේ හිතේ පැසවන කේන්තියට. තමන්ගේ අරමුණ ඉෂ්ට නොවුනු නිසා වගේම මේ කසාදේ වුණ දවසේ ඉඳන්මත් හේමන්ත ඉන්නේ කේන්තියෙන්.

ටික දුරක් ඇවිත් වාහනේ අයිනක නතර කරගෙන සුක්කානම උඩින් ඔළුව තියාගත්තේ ඉවසන්න බැරි පීඩනයක් ඔළුවේ තියෙද්දි.

දුරින් නෑදෑ කෙනෙකු වන තිෂුනි එක්ක හේමන්ත සම්බන්ධයක් පටන් ගත්තේ මීට අවුරුදු 4කට විතර කලින්. හේමන්තගේ දෙමව්පියන් සිරිත් විරිත් හැසිරීම් වලට ගරු කරපු මිනිස්සු. මේ සම්බන්ධකම දැනගත්තු දවසේ ඉඳලම මේකට විරුද්ධ වුණේ එයාලා හොයන කිසිම ගතිගුණයක් තිෂුනිට නොතිබුණු නිසා.

තිෂුනි මේ සම්බන්ධකම පටන් අරන් කෙටි කාලෙකින්ම ගොඩක් දුර ගියෙත් ඒ තිබුණු හැදියාව නිසාම වෙන්න ඇති. මේ දේවල් නිතර නිතර වෙද්දි හේමන්තට තිෂුනිව අතඅරින්න බැරි තරම් ආදරේ කරන්න ගත්තා.

ඒ ආදර බැඳිම විවාහයක් කර ගන්න හේමන්ත එයාගේ දෙමව්පියෝ එක්ක කතා කළත් ඒකෙන් කිසිම පලක් වුණේ නැති නිසා තමා අනූව විවාහ කරගන්න වුණේ.

“උඹ මතක තියාගනින් පුතේ මේ අම්මා තාත්තා ඉන්නකං උඹට ඕන දේවල් කරන්න බෑ“

“හිතාගෙන ඉන්නේ ඒ වගේ එකියක් අපේ ලේලි කරගයි කියලා නම් එව්වා හදේ තමා“

“මට ඒ කෙල්ලව අතඅරින්න බෑ තාත්තා. ඇයි මගේ කැමැත්ත ගැන හිතන්නේ නැත්තේ ඔයාලා“

“ඔයාලට ඕන හැමදේම මං මේ වෙනකම් කළා. මේ දේවත් මට ඕන දේ කරන්න දෙන්න තාත්තා“

“උඹව හැදුවේ අපි. උඹ කරන්න ඕන අපිට ඕන දේ විතරයි“

“ලෑස්ති වෙනවා අර කෙල්ල බලන්න යන්න“

අකමැත්තෙන් වුණත් අන්තිමට එයා මේ දේට කැමති වුණේ හේමන්ත එයාගේ අම්මා තාත්තා ගැන හිතපු නිසා.

“මට සමාවෙන්න තිෂු. මට වෙන කරන්න දෙයක් නෑ“

ගෙදර ගත්තු මේ තීරණේ අමාරුවෙන් වුණත් හේමන්ත තිෂුට කිව්වා.

“ඔයා මෙච්චර දුරක් ඇවිත්ද මට මෙහෙම කියන්නේ හේමන්ත. නියමයිනේ“

“මේ අහන්න කෙල්ලේ. මං ඒ කෙල්ලව මැරි කළා කියලා ඔයාව අතඅරින්නේ නෑ. මට මේ ප්‍රශ්නේ විසඳගන්න ටික කාලයක් දෙන්න ප්ලීස්“

“මං පුළුවන් ඉක්මණට මේ කෙල්ලව අයින් කරලා ඔයාව මගේ ළඟට ගන්නවා“

“මං මේ කසාදේ නොකලොත් මට ලැබෙන්න තියෙන කිසිම දෙයක් ලැබෙන්නේ නෑ තිෂු“

“මේ මගුල කරලා ඒ ටික ලියවගෙන අරකිව මං එලවලා දනවා“

“ආ… එතකොට මං ඔයාගේ හොර ගෑණි වෙලා ඉන්න ඕනද එතකම්. ඒකද කියන්නේ“

“ඔයාට විකාරද තිෂු. මොනවාද මේ කියන්නේ. වෙනදා වගේම අපි හම්බෙනවා කතා කරනවා. ඔයා මගේ ගෙදර ඉන්නේ නැති එක විතරයි වෙන්නේ“

“අනේ මේ…“

“හා නේද තිෂු කියන්නකෝ“

“හරි හරි“

අකමැත්තෙන් වගේ තිෂු මේ දේට කැමති වුණා.

වාහනේට වෙලා හේමන්ත මේ දේවල් මතක් කලේ පුදුම දුකකින්.

**************************************************
********

ආදරේ ගැන අහස උසට බලාපොරොත්තු තියාගෙන ඉන්න ජීවිත නම් කොච්චරක්ද. ඒත් ඒ හැමෝටම තමන්ගේ ආදරේ තමන්ට ඕන විදියට හිමිවෙන්නේ නෑ.

කුස්සිය පැත්තේ තියෙන පොඩි පඩිපේළියේ ඉඳගත්ත අනූ ඔහේ නිල් අහස දිහා බලාගෙන හිටියා.

අනූ හේමන්තන්ට වඩා අවුරුදු පහකින් පමණ බාල තරුණියක්. ඇය දැන් රැකියාව නොකරන්නේ තමන්ගේ ස්වාමිපුරුෂයාට යුතුකම් ඉටුකරන්න රැකියාව බාධාවක් වෙයි කියලා හේමන්තගේ දෙමව්පියෝ කියපු නිසා.

ගලවපු ගලවපු තැන්වල ඇඳුම්, සපත්තු. කෑම කන පිඟානවත් හේමන්ත හෝදන්නේ නෑ.

එයාගේ අම්මා මේ දේවල් දන්න නිසා තමා අනූට ගෙදර නවතින්න කිව්වෙත්.

මේ ගෙදර වැඩ හැමදෙයක්ම කෙරෙන්නේ අනූගේ අතින්. මේ වෙනකම් හේමන්තගෙන් මේ කිසිම දේකට උදව්වක් නෑ. ඉස්සරහටත් ලැබෙයි කියලා අනූ හිතන්නෙත් නෑ.

හේමන්තගේ අම්මාට අනූ රැකියාවක් නොකරන්න ඕනේ වුණේ මේ වැඩ ටික පුතාගෙන් නිදහස් කරගන්න. හැමෝම තමන්ගේ අයගේ වාසිය ගැන විතරයි හිතන්නේ.

හිමින් හිමින් මුළු ගේම අතුගාලා, මිදුලත් අතුගාලා නාන කාමරයට ගියේ හේමන්තගේ හෝදන්න තියෙන රෙදි ටිකත් අරන්.

රෙදි ටික කනපිට හරවපු අනූ හේමන්තගේ කලිසම් සාක්කුවේ යමක් අතට දැණුනු නිසා නිකමට ඒක එළියට ගත්තේ.

අනූගේ මුළු සිරුරම වෙව්ලලා ගියේ දැකපු දේට.

ඊයේ දිනේ දපු බිලක්. හෝටලක කාමරයක් ගත්තු බිලක් එක්කම පිරිමි අය පාවිච්චි කරන දෙයක කවරයක්.

අනුගේ ඇස් වලට කඳුළු පිරුණේ නොදැනීමයි.

'ඒ කියන්නේ ඊයේ වැඩට ගිහින් නැද්ද'

මොන දේ මොන විදියට සිද්ධ වුණත් කසාදයක් කියන්නේ මග දලා යන්න බැරි දෙයක්.

'හ්ම්ම්ම්ම්ම්'

'හේමන්ත ඇයි ඒ කෙල්ලට ආදරෙයි නම් මාව බඳින්න කැමති වුනේ'

'මට වගේම ගෙදරින් බල කරන්න ඇති'

අනූගේ අම්මා, බාප්පා එයාව අතඇරලා දලා ඉවරයි. අනූ දැන් තනි වෙලා. තමන්ට කාත් කවුරුවත් නෑ නේද කියලා අනූ හිතුවේ ජීවිතේ ගැන කලකිරීමෙන්.

'මගේ ජීවිතේ මේක නම් මට ඒක පිළිගන්නම වෙනවනේ'

අනූ තනියම කල්පනා කළේ දුකින්.

අනූ ඉස්සර ඉඳලම පොත් කියවනවා. එකතු කරගත්ත පොත් සේරම එයා මෙහෙට එනකොටත් අරගෙන ආවේ ගෙදර නිකන් ඉන්න වෙලාවට කරන්න දෙයක් නැති නිසා.

ඒ පොත් මේ වෙනකොටත් දෙතුන් පාරක් කියවලා තිබුණත් වෙන කරන්න දේකුත් නැති නිසා පොතක් අතට ගත්තා.

ඒත් පොතක් කියවන්න තරම් හිතේ සැනසීමක් අනුට තිබුණේ නෑ. ඔහේ පොත දිහා බලාගෙන හිටියා.

හේමන්ත හවස 6 විතර වෙනකොට ගෙදර එන නිසාම එයාට තේ හදන්න රෑට උයන්න වගේ දේවල් අනුට කරන්න තියෙනවා.

ඒ හැමදේම සූදානම් කරලා අනූ ඉස්සරහා දොර උළුවස්සට හේත්තු වුණේ හේමන්ත එන පෙරමග බලන්න.

වාහනේ නවත්තපු ගමන් දුවගෙන ගිහින් හේමන්තගේ අතින් බෑග් එක අනූ ගත්තාම හේමන්ත අනූගේ කරවටේ අත දාගෙන කම්මුලට පොඩි හාදුවක් දුන්නේ හරිම ආදරෙන්. දෙන්නම හිනා වෙවී ගේ ඇතුලට ආවා.

ඒ හීනේ හරි ලස්සනට අනූගේ හිතේ මැවුණා. ඒත් ඒක හීනයක්ම විතරයි කියලා හිතෙද්දි පපුව පුරාම දැණුනු වේදනාව කකුල් දෙක දක්වාම යනවා එයාට තේරුණා.

හේමන්තගේ වාහනේ එනවා දකිද්දිම එයාගේ සිහියට ආවේ උදේ හේමන්ත කියපු දේ.

‘තමුසෙව මට දකිනකොට පුදුම කේන්තියක් එනවා ඕයි. ඒ හින්ද ඕනම දේකට ඇරෙන්න ඔය මූණ මට පෙන්නන්න එපා‘

අනූ අඩියට දෙකට මුළුතැන්ගේ පැත්තට ගියේ හේමන්තට නොපෙනෙන්න.

ඉක්මණින් තේ හදලා ගෙදර තිබුණු බිස්කට්, කේක් එක්කම මේසේට තිබ්බේ හේමන්ත මහන්සි වෙලා එන නිසා.

“අයියේ තේ බොන්න මෙතන තියලා තියෙනවා“

අනුට හේමන්ත ඉන්න වෙලාවට එයාගේ කාමරේටවත් යන්න විදියක් නෑ. ඉතිං කාමරේ ළඟට ගිහින් දොර රෙද්දෙන් මෙපිට ඉඳන්ම අනු කෑගහලා කිව්වා.

අනු, හේමන්ත එයාගේ ස්වාමිපුරුෂයා වුණත් නම කියලා කතා කරන්නේ නෑ. ඒ නිසා පුරුදු විදියටම අයියේ කියලා තමා කතා කරන්නේ.

හේමන්ත නම් වචනෙකින්වත් උත්තරයක් දෙන්නේ නෑ.

බැඳලා තාමත් සතියක්වත් නොවුණත් එයාට මීට වඩා දෙයක් හේමන්තගෙන් බලාපොරොත්තු වෙන්න බෑ කියලා දන්න නිසා අනු මේ දේවල් දරාගන්න පුරුදු වුණා.

හේමන්ත රෑ කෑම 7.30 විතර වෙනකොට ගන්නවා කියලා එයාගේ අම්මා කලින්ම කියලා තිබුණු නිසාම අනු ඒ පුරුදු වෙනස් කරන්න ගියේ නෑ.

ඉක්මණින් කෑම පිළියෙල කරලා ව්‍යංජන ටික පීරිසි වලට දලා ලස්සනට මේසේ හදන්නේ තමන්ගේ ස්වාමිපුරුෂයාට කවදා හරි මෙහෙම සලකනවා කියලා එයාගේ හිතේ තිබුණු නිසා.

දමිත් එක්ක ගොඩනගන්න හීන දැකපු ඒ ජීවිතේ හීනයක්ම වෙලා යද්දි ස්වාමි භක්තිය අඩු නොකර අනු හැමදේම

හේමන්ත වෙනුවෙන් කරන්න මුල් දවසේ ඉඳලාම තමන්ටම පොරොන්දු වුණා.

කායික බැඳීම් මානසික බැඳීම් මොන දේ කොහොම වුණත් හේමන්ත කියන්නේ අනුගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා. ඒ වෙනුවෙන් අනු හැමදේම ඉවසුවා.

“අයියේ කන්න එන්න“

එහෙම කියපු අනු එයාගේ සුපුරුදු තැන කුස්සිය කෙළවර තියෙන පොඩි පඩි පේලියේ ගිහින් ඉඳගත්තා.

පළවෙනි පාරට මේ ගෙදරට ඇවිත් ලස්සනට හදපු කෑම මේසේට හේමන්ත එක්කම අනු වාඩි වුණත් වුණු සිද්ධිය නිසා ආයෙත් එයා හේමන්ත එක්ක එකට වාඩි වුණේවත් නෑ.

අනු කෑම මේසෙන් වාඩි වුණත් එක්කම හේමන්ත පුටුවත් මහ සද්දෙන් එහාට කරලා එතනින් නැගිට්ටේ අනුගේ ඇස් වලට කඳුළු පිරෙද්දි.

“අයියා කන්න. මං යන්නම්. ප්ලීස් නොකා ඉන්න එපා“

එහෙම කියපු අනු කෑම නොකාම එතනින් නැගිටලා යන්න ගියා.

හේමන්ත නපුරු කෙනෙක් කියලා අනු දැනගත්තේ කසාදේ දවසෙමයි.

ඒත් කෑම මේසේදිත් මෙහෙම හැසිරෙයි කියලා එයාට හිතුණේ නෑ.

ඊයේ වුණු මේ සිද්ධිය ගැන හිත හිතම අනූ පඩි පේළියේ ඉඳගෙන උළුවස්සට ඔළුව හේත්තු කර ගත්තා.

අනූගේ කල්පනා ලෝකේ බිඳුණේ මුළුතැන්ගේ වතුර කරාමේ සද්දෙට. ඉක්මණින් කඳුළු පිහදාගෙන නැගිට්ටේ හේමන්ත කෑම අරගෙන ඉවරයි කියලා දැනගත්තු නිසා.

එයත් කෑම කාලා කෑම භාජන හැමදෙයක්ම හෝදලා පිරිසිදු කරලා ගේත් අතුගාලා හෙට දවසට උයන්න ඕන කරන ඒවත් සූදානම් කරලා ඇඟත් හෝදගෙන අනූ එනකොටත් හේමන්ත එයාගේ කාමරේට වෙලා ඇමතුමක.

“තිෂු“

“මං දන්නවා ඔයා මට ගොඩක් ආදරෙයි කියලා“

“මාත් ඔයාට ගොඩක් ආදරෙයි තිෂු“

හේමන්ත මොනම හේතුවක් නිසාවත් එයාගේ ආදරේ තිෂු අමතක කරන්න සූදානමක් නෑ. කෑම කාලා ඉවරවුණ ගමන්ම හේමන්ත ෆෝන් එක අතට ගන්නේ තිෂුට කතා කරන්න.

ඒ කතාව මහ රෑ වෙනකම් ඉවර වෙන්නේ නෑ.

ඒ ආදර කතා බහ ඇහෙද්දි අනූගේ ඇස් වලට කඳුළු එන්නේ ඉබේටමයි. ඒත් මොනවා කරන්නද.

හිමින් හිමින් අනූ එයාගේ කාමරේට ගිහින් දොර වහගත්තා.

විවාහයෙන් මාස ගාණක්ම ගත වුණේ කිසිම වෙනසක් නැතුව මේ විදියටමයි.

*.... 04*

“මචං හේමන්ත“

“ඉතිං කියපං කියපං“

“මං ඊළඟ සතියේ ඉඳන් උඹලාගේ ඔෆිස් එකේ“

“ආරංචි ආරංචි“

හේමන්ත නිශිත් දෙන්නාගේ යාළුකම පටන් ගත්තේ උසස් පෙළ පන්තියේදී. එකම පාසලට ගිය මේ දෙන්නාගේ යාළුකම සහෝදර බැඳීමකටත් එහා ගිය බැඳීමක් වෙන්න වැඩි කාලයක් ගියේ නෑ.

උසස් පෙළත් සාර්ථකව අවසන් කරලා දෙන්නම රජරට විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන උපාධියක් ලබා ගත්තෙත් එකටමයි. එකම රැකියා ස්ථානයේ දෙතැනක දෙන්නට වැඩ කරන්න වුණත් මේ යාළුකමට කිසිම හානියක් වුණේ නෑ.

ප්‍රධාන කාර්යාලයේ ඇතිවුණ පුරප්පාඩුවක් වෙනුවෙන් නිශිත් අනුයුක්ත කරන්න ආයතන ප්‍රධානීන් තීරණය කරලා තිබුණා. ඉතිං ඒ විදියට තමා හෙට නිශිත් හේමන්තගේ කාර්යාලයට එන්නේ.

“මචං මට ඉන්න තැනක් බලපංකෝ“

“ඉන්න තැනක්?“

“නැතුව ඉතිං මං ඔහේ ගෙවල් හදලා තියෙනවාද බූරුවෝ“

“ඇයි හරකෝ මගේ ගෙදර තියෙන්නේ“

“අපෝ බෑ“

“ඒ මොකද“

“මේ අළුත බැඳපු උන්ට උන්ගේ පාඩුවේ වැඩක් කරගන්න දෙන්න ඕනේ“

“අනේ මගුල තමා“

“මගුල හින්දු තමා කිව්වේ බං. රෑට රෑට ඇඳන්වල පොලු කැඩෙනකොට මට පිස්සු හැදෙයි“

“අනේ මේ තොට මං කිව්වා කියලා හිතාගනින්. පොලු කඩන්නේ නැතුව අපි කරගන්නම්. විකාර නොකර වරෙන්“

“අනේ බෑ බං“

“හරි උඹ එහෙමද එහෙනම් මේ යාළුකම ඕනත් නෑ“

sinhalaebooks.com

“මේ තොට තාම ඔය කේන්තිය නතර කරගන්න බැරි වුණාද. අර ගෑණි පව් බං. ඒකි අහිංසකයි“

“හිහ්හ්හ්... මට ඒවා වැඩක් නෑ. උඩ තට්ටුවම නිකං තියෙන්නේ. කොහොමත් කුලියට දෙන්න හිතාගෙන හිටියේ. ඒ හින්දු උඹ අපේ ගෙදර නවතින්න බලන් වරෙන්. එච්චරයි“

“හරි හරි උඹට ඉතිං සද්ද නැතුව කරගන්න පුළුවන් නම් මං එන්නම්“

“එහෙනම් හම්බෙමු නිශියා“

කොහොම හරි නිශිත් හේමන්තගේ ගෙදරම උඩ තට්ටුවේ නතර වෙන්න කැමති වුණේ හේමන්ත තරහා කරගන්න බැරි නිසා.

“ඊළඟ සතියේ ඉඳන් නිශිත් මෙහේ නතර වෙන්න එනවා. උඩ ටිකක් අස් කරලා තියනවා“

“මං අස් කරන්නම්“

හේමන්ත ගෙදර ඇවිත් අනූට කිව්වේ නිශිත් එන්න කලින් ඒවා පිළිවෙල කරන්න ඕන නිසා.

උදේම වැඩ ඉවර කරපු අනූ උඩ තට්ටුව අතුගාලා, අළුතින් බෙඩ් ශීට් දාලා හැමදෙයක්ම පිළිවෙලට තියලා තිබුණා.

අනූ ගෙදර ඉන්න කාලේ ඉඳලම ලස්සනට, පිළිවෙලට, පිරිසිදුවට වැඩ කරන්න පුරුදු වුණ කෙනෙක්. ඉතිං එයා ඒ වගේ දේවල් කරන්න හරිම උනන්දුයි.

හේමන්ත වැඩට ගියාට පස්සේ එයාගේ වැඩ ඉවර කරලා විශේෂ වැඩක් නැත්තම් කරන්නේ ගෙදර මිදුලේ මල් හදන එක.

මල් පැළ ගේන්න නම් සල්ලි අනූ ළඟ නෑ. ගෙදර වත්තේම එහෙ මෙහේ අපිළිවෙලට තිබුණු පැළ තැනින් තැන හදලා පුළුවන් උපරිමෙන් ලස්සන කළේ තමන්ගේ මහත්තයාගේ දේවල්නේ කියලා හිතලා.

ඒත් හේමන්ත නම් අනූ ගැන පොඩිම හැඟීමක්වත් නෑ.

අනූ නිශිත්ව අඳුරගත්තේ එයාව බලන්න හේමන්ත එක්ක ආපු දවසේ. ඊළඟ සතියේ ඉඳලා එයා මෙහෙට නවතින්න ආවාම මොන විදියට හැසිරෙන්නද කියලා අනූ හැමවෙලේම හිතුවා.

හේමන්ත අනූ එක්ක කතා කරන්නෙවත්, මූණ බලන්නේවත් අඩුම තරමේ එකට කෑම ගන්නේවත් නැති නිසා ඒ දේවල් නිශිත්ගෙන් හංඟන්නේ කොහොමද කියලා අනූ දහ අතේ කල්පනා කරනවා.

'පුළුවන් තරම් කාලයක් ඒ දේවල් මං හංඟගෙන ඉන්නම්' අනූ අන්තිමට හිතුවා.

එදා හවස හේමන්තත් එක්කම නිශිත් එයාලගේ ගෙදර නතර වෙන්න ආවා.

"උඹට උඩ තට්ටුවමම තියෙනවා. කැමති විදියකට ඉන්න පුළුවන් හරිද"

“මෙයා උයන නිසා කෑම ප්‍රශ්නයක් නෑ උඹටත් එක්ක උයයි“

“අනේ ඔයාලට කරදරයි මං හින්ද“

“අනේ නෑ අයියේ ඕක මොකද්ද කොහොමත් ඉතිං උයන එකනේ“

“නෑ ඉතිං මං කිව්වේ අනිත් දේවල් වලට“

අනූ නම් රතු වුණේ ලැජ්ජාවට.

“තෝ ආව වැඩේ කරගනින්කෝ විකාර කියවන්නේ නැතුව“

හේමන්තට නම් ඒවා කියද්දි කේන්තියි.

“මං තේ හදන්නම් අයියේ. ඔයාලා වොශ් දාගෙන එන්නකෝ“

වෙනදා විදියටම තේ මේසය හදලා හේමන්තටත් කියලා අනූ පුරුදු විදියටම මුළුතැන්ගේ පඩි පේළියට වෙලා ඉඳගත්තා.

“කෝ නංගී... තේ බොන්නේ නැද්ද“

“එයා තේ බොන්නේ නෑ. උඹ බීපන්“

නිශිත්ට අමුත්තක් දැණුනත් එයා ඒ ගැන වැඩිය හිතන්න ඉක්මණ් වුණේ නැත්තේ මේ ගෙදරට ඇවිත් තාමත් පැය ගාණක්වත් ගත වෙලා නැති නිසා.

හේමන්ත නම් එහෙම්ම තේ බීපු කෝප්පේ එතන තියලා කාමරේට ගියා.

ඒ ඉතිං හේමන්තගේ හැටි. කව්රු හිටියත් එයා එයාගේ පුරුදු වෙනස් කරන ජාතියේ කෙනෙක් නෙමෙයි.

ඒත් නිශිත් හරි නිවුණු චරිතයක්. එයා තේ බීපු කෝප්පෙත් අරගෙන මුළුතැන්ගේ හොයාගෙන ගියේ ඒවා හෝදලා තියන්න.

එතෙන්ට ඇතුල් වෙනකොටම පඩි පේළිය උඩ මිදුල පැත්තට හැරිලා වාඩි වෙලා තේ බොන අනුව දැක්කාම නිශිත්ට මතක් වුණේ හේමන්ත කලින් කියපු දේ.

“එයා තේ බොන්නේ නෑ. උඹ බීපන්කෝ“

‘දෙන්නගේ පොඩි රණ්ඩුවක් වෙන්න ඇති‘ එහෙම හිතපු නිශිත් එයා එතෙන්ට ආවා කියලා අඟවන්නේ නැතුව ආයෙත් යන්න හැරුණා.

“අයියේ. අනේ ඇයි මෙහෙට ආවේ. ඕක දෙන්න මං හෝදන්නම්“

අහම්බෙන් වගේ අනු දැක්කේ නිශිත් මුළුතැන්ගේ ඉන්නවා. ඉක්මණින් නැගිටලා ඇවිත් එයාගේ අතේ තිබුණු කෝප්පය ගත්තා.

“එහෙම හරි නෑනේ“

“අනේ ඕක මොකද්ද අයියේ. ඔයා යන්න. රෑට කෑම 7.30 විතර වෙද්දි දෙන්නම්. ඒ වෙලාවට එන්න. හේමන්ත අයියා ඒ වෙලාවට තමා කන්නේ“

“මාත් ඔයාට උදව් කරන්නද“

නිශිත්ට ඒක ඇහුනේ ඉබේටමයි.

අනූගේ පපුව හිරවුණේ නිශිත් ඒ අහපු දේට.

මේ වෙනකම් තමන්ගේ මහත්තයා වුණත් හේමන්තවත් එක දවසක්වත් බොරුවට හෝ එහෙම අහලා නැති නිසා එයාගේ හිතට ඒක ගොඩක් දැණුනා.

"අනේ එපා අයියේ. පින් එහෙම ඇහුවට"

නිශිත්ව පිටත් කරපු අනූ තේ මේසේ අස් කරලා වෙනද වගේම රෑ කෑම සකස් කරලා ඉක්මණින් මේසෙට යැව්වේ අද ඉඳන් අමුත්තෙකුත් ඉන්න නිසා.

"අයියේ කෑම ලෑස්තියි"

වෙනදට වඩා හඩින් අනූ කිව්වේ නිශිත්ටත් ඇහෙන්නමයි.

හේමන්ත නිශිත් දෙන්නම ඇවිත් මේසෙන් ඉඳගත්තට පස්සෙයි අනූට මතක් වුණේ වතුර තිබ්බේ නෑ නේද කියලා.

වතුර දෙකත් අනූ කෑම මේසේට තියලා යන්න හැරුණේ වෙනද පුරුද්දට.

"නංගි කමු අපිත් එක්කම"

"එයා කන්නේ රෑ වෙලා" හේමන්ත අනූ පිළිතුරක් දෙන්න කලින්ම නිශිත්ට කිව්වා.

අනූ අහිංසක විදියට හිනා වෙලා එතනින් ආවේ එයාගේ සුපුරුදු තැනට. ඒ තැනට එයා දැන් ඇබ්බැහි වෙලා. ගෙදර මොන තැනටත් වඩා ඒ තැන එයාට හිතට සහනයක් ගෙනත් දෙනවා.

'නිශිත් අයියා ආවා කියලාවත් හේමන්ත අයියා නම් වෙනස් වෙන්නේ නෑ. ඒ විදියම තමා'

'වැඩි කාලයක් නොගිහින් නිශිත් අයියාත් මේ ප්‍රශ්න දැනගනීද මන්ද'

'අනේ එහෙම නම් වෙන්න එපා දෙයියනේ'

දෙන්නාම කෑම කාලා ඉවර වුණාට පස්සේ අනූ ඉක්මණින් ආයෙත් වතුර වීදුරු දෙකක් පුරවගෙන ගිහින් එකක් හේමන්තගේ කාමරෙන් තිබ්බා.

අනූ එයාගෙන් වෙන්න ඕන හැම යුතුකමක්ම කිසිම චෝදනාවක් නොකර කිසිම දෙයක් බලාපොරොත්තු වෙන්නෙත් නැතුව ඉටු කරනවා.

"නිශිත් අයියේ..."

අනිත් වීදුරුවත් අරගෙන උඩ තට්ටුවේ පඩි පෙළ ළඟට ගිහින් නිශිත්ට කතා කළේ කාමරේ ළඟට යන එක වැරැද්දක් කියලා හිතුණු නිසා.

"ඇයි නංගී.."

"මේ වතුර එක අරන් යන්න රෑට ඕනේ වෙයි"

"ඔයාට කරදරයි මං නිසා"

"අනේ එහෙම නෑ අයියේ"

"අයියා යන්නෙත් හේමන්ත අයියා යන වෙලාවටමයි නේද"

"ඔව් ඒ වෙලාවටම තමා"

"ගුඩ් නයිට් නිදාගන්න එහෙනම්"

"ගුඩ් නයිට් නංගී"

'කෙල්ල පව්. මහන්සි වෙනවා'

නිශිත් ආපු වෙලාවේ ඉඳන්ම දැකපු ටිකට එයා එහෙම හිතුවා.

නිශිත්ට ඇත්තටම එයා ගැන පව් හිතුණා.

නිශිත් කොහොමත් ටිකක් රෑ වෙලා නිදාගන්න කෙනෙක්. හේමන්ත ඉක්මණටම කාමරේට ගිය නිසා නිශිත් උඩට ඇවිත් නිදහස් කෑල්ලේ ඉඳගෙන හිටියේ ෆෝන් එකත් අතට ගන්න ගමන්.

නිශිත් හිටියත් හේමන්ත එයාගේ පුරුදු වෙනස් කරන්නේ නෑ. වෙනස් කරන්න ඕනකමකුත් නෑ.

පුරුදු විදියටම අනූ කෑම මේසේ අස් කරලා අතුගාලා මුළුතැන්ගෙට ගියේ කෑම කන්න.

කෑම එකත් බෙදාගෙන පුරුදු තැනම බිම ඉඳගෙන කෑම කන්න ගත්තේ තමන් ගැනම කල්පනා කර කර.

ගෙදර ආපු වෙලාවෙම නිශිත්ට දැණුනු සැකේට එයා ටිකක් ඒ ගැන සැලකිල්ලෙන් ඉන්න පටන් ගත්තා. මේ හින්දම උඩ හිටියාත් පහළ ගැන ටිකක් අවධානෙන් හිටියේ.

'හේමන්ත කෑම කාපු ගමන් කාමරේට ගියා. කෙල්ල තනියම වැඩ. මූ නම් මොකෙද්ද මන්දා අප්පා'

අනූ කෑම මේසේ අස්කරලා ගේ අතුගාලා මුළුතැන්ගේ පැත්තට යනවා නිශිත් හොරෙන් බලාගෙන හිටියා.

නිශිත්ට අනූ දීපු වතුර එකත් බීලා ඉවර වුණු නිසාම එයා පහළට ආවේ වතුර එකක් ගන්නත් හිතාගෙන.

හේමන්තගේ කාමරේ ඇතුලෙන් හිමින් කතා කරන හඬක් නිශිත්ට ඇහුණත් තාමත් පහළ එකම ලයිට් එකක්වත් නිවලා නැති නිසා සැකේට වගේ ඔළුව දැම්මේ මුළුතැන්ගේ පැත්තට.

කලින් වගේම බිම ඉඳගෙන පිඟාන අතේ තියාගෙන අනූ කනවා දැක්කාම නිශිත්ගේ පපුව නම් හෝස් ගාලා ගියා.

'මෙච්චර ලොකු ගෙදරක ඇයි මෙතනම මේ කෙල්ල ඉන්නේ'

'අරූ කාත් එක්කද ඔච්චර හිමින් කතා කරන්නේ. ඇයි මේ කෙල්ලට පොඩ්ඩක්වත් උදව් කරන්නේ නැත්තේ'

නිශිත්ට හිතුනේ මේවා තමා.

''නංගි ඇයි මේ බිම ඉඳගෙන''

අනූ කල්පනාවෙන් හිටියේ නැති නිසා ඒ හඬට ගැස්සුණා.

''අ... යි...යේ.. මේ... මෙතන ඉතිං සනීපයිනේ.. ඒකයි''

''අයියා ඇයි මෙතන''

''වතුර එකක් ගන්න''

''කෝ දෙන්න මං පුරවලා දෙන්නම්''

අනූ කෑම එකත් බිමින් තියලා නැගිට්ටන්න හැදුවේ.

sinhalaebooks.com

“ඔයා කන්න මං වතුර ගන්නම්“

“මං හෙට ලොකු බෝතලේකට දලා දෙන්නම් අයියේ“

“ඇයි මෙච්චර රෑ වෙනකම් ඉන්නේ කන්න“

“වැඩ ඉවර කරලා තමා කන්නේ අයියේ“

“හේමන්ත නිදිද“

“එයා කලින්ම නිදාගන්නවා“ විනාසයි. හිතපු අනූ ඉක්මණින් කතාව වෙනස් කළා.

“නෑ මං කිව්වේ  එයා කලින් කාමරේට යනවා. නිදි නෑ“

“හ්ම්ම්ම්ම්“

නිශිත්ට ආයෙත් කලින් දැණුනු සැකේම දැණුනා.

‘මුන් දෙන්නා අතරේ මොකක් හරිම තියෙනවා‘ හොඳයි මං හොයාගන්නම්කෝ‘

එහෙම හිත හිතම නිශිත් එයාගේ කාමරේට ආවා.

*.... 05*

පුරුදු විදියටම දින ගණන් සති ගණන් ගෙවිලා ගියේ කාගේවත්ම ජීවිත වල කිසිම වෙනසක් නොවී.

හැමදම උදේම අනූ පුරුදු විදියටම පාන්දර නැගිටලා උයලා කෑම පාර්සල් බැඳලා වෙන වෙනම තියනවා.

හේමන්ත යනකොටවත් එනකොටවත් අනූ පෙරමගට එන්නේ නැත්තේ ඇයිද කියලා නිශිත්ට තාමවත් හිතාගන්න බෑ.

දෙන්නා අතර කතා බහක් නොවෙනම තරම් නේද කියලා නිශිත් හිතුවේ දුකෙන්.

'අළුත බැඳපු එවුන් මෙහෙමද අනේ ඉන්නේ. මොකද්ද මුන් දෙන්නට වෙලා තියෙන්නේ'

'අරූ හැමදම කෝල් එකේමයි'

'ඒ කියන්නේ මූ තිෂූ එක්ක සම්බන්ධේ නවත්තලා නැද්ද'

'මේ දේවල් අනූ දන්නේ නැද්ද නැත්තම් දැනගෙන මෙහෙම ඉන්නවාද'

'මුන් දෙන්නා පවුල් කනවාද කියලාත් මට නම් සැකයි දැන්'

'පවුල් ප්‍රශ්න වලට අත දන්නත් බෑ. ඒත් අනූ වෙනුවෙන්වත් හේමන්ත එක්ක කතා කරන්න ඕනේ' නිශිත් හිතුවා.

''මට උඹෙන් දෙයක් අහන්න තියෙනවා මචං''

හේමන්ත එක්කම වාහනේ යන ගමන් නිශිත් කතාව පටන් ගත්තා.

''මොකද්ද''

''තිෂූගේ සම්බන්ධේ තාම තියෙනවාද''

''ඇයි අහන්නේ''

''නිකන් ඇහුවේ''

“කතා බහ කරනවා ඉතිං“

“ඇයි බං තවත් කතා කරන්නේ. අර කෙල්ල ඕවා දන්නවාද“

“දැනගත්තත් නැතත් මට වැඩක් නෑ. උඹ දන්නවනේ මං කරන්නේ මට ඕන දේ කියලා“

“ඒත්...“

“නිශිත් ප්ලීස් ඇති මචං“

“මගේ ජීවිතේට ඇඟිලි ගහන්න එපා. මං කැමති නෑ. උඹ ඒක දන්නවනේ“

එතනින් කතාව ඉවර කරන්න වුණේ හේමන්තගේ කේන්තිය පිරුණු කටහඬ නිසා.

අනු හේමන්ත අතර ප්‍රශ්න තියෙනවා කියලා නිශිත් දැනගත්තත් එදයින් පස්සේ ආයෙත් නිශිත් කිසි දෙයක් අහන්න ගියේ නෑ.

මේ අතරේ අනුට අළුත් යාළුවෙක් හම්බවෙලා. හරිම ලස්සන දුඹුරු පාට බලු පැටියෙක්. ගෙදර අයිනේ පාරේ දාලා ගිහින් ඉද්දි දැකලා තමා මූව අරගෙන ආවේ.

හේමන්තගෙන් ඇහුවාම ඌව ඇති කරන්නද කියලා හා කිව්වෙත් නෑ එපා කිව්වෙත් නැති නිසා අනු ඌව තියාගත්තා.

දැන් අනුටත් කතා කරන්න කෙනෙක් ඉන්නවා. මේ මාස ගාණ හරිම පාළුවෙන් හිටපු අනුට නම් ඒ්ට වඩා දෙයක්

නෑ. ඉක්මණින් ගෙදර වැඩ ඉවර කරලා මුළු දවසම ඌ ළඟට වෙලා ඉන්නවා.

“උඹවත් ඉන්න එක කොච්චර දෙයක්ද මට කතා කරන්න“

“මට වචනත් අමතක වෙලා යනවා තව ටික කාලයක් ගියා නම්“

අනූ බලූ පැටියත් එක්ක කතාව. හේමන්ත අනූ එක්ක වචනයක්වත් කතා කරන්නේ නැති තරම්. අනූ කියන දේකට හා හ්ම් වත් කියන්නේ නෑ. නොකියා බැරි දෙයක් තිබුණොත් විතරයි කටහඬවත් ඇහෙන්නේ.

“අයියේ“

රෑ නිශිත් උඩට යනකම් බලාගෙන ඉඳලා අනූ හේමන්තගේ කාමරේ ළඟට ගිහින් එයාගේ දෙරට තට්ටු කලා.

“හෙට එළවළු ගේන්න සල්ලි දෙන්න පුළුවන්ද“

හේමන්ත ඉන්න වෙලාවට අනූ එයාගේ කාමරේට යන්නේ නැති නිසා දෙරෙන් එළියේ ඉඳන්ම ඇහුවා.

ඒකටවත් උත්තරයක් අනූට ලැබෙන්නේ නෑ.

අනූ ජීවිතේ ගැන පුදුම කලකිරීමකින් දරාගෙන ඉන්නවා වෙන කරන්න දෙයක් නැතිකමට.

තමන්ගේම කෙනෙක් නැතුව අනූ හරියට අසරණ වෙලා. එයාගේ අම්මා එයාව නිකම්ම අතඇරලා දැම්මේ කිසිම දෙයක් නොදී.

අනූ ඉතුරු කර ගත්ත සල්ලි වලින් එයා හදාගෙන තිබුණු ලස්සන චේන්පට විතරයි එයා අරගෙන ආවේ.

විවාහය දවසේ රුපියල් දහදහක් අම්මා එයාගේ අතට දුන්නේ වියදමට තියාගන්න කියලා. එච්චරම තමා. අනූගේ ඉතුරුකරලා තිබුණු සල්ලි හැමදෙයක්ම එයාගේ බාප්පාගේ කීමට අම්මා ඉල්ල ගත්තා.

ඒ සල්ලියි, චේන්පටයි, දාගෙන ඉන්න කරාබු දෙකයි විතරයි අනූට කියලා තිබුණේ.

ඒ මුදලුත් මුලදි වියදම් වුණ නිසා අනූ ළඟ සල්ලි නෑ.

ඉතිං හැමදේටම මුදල් හේමන්තගෙන් ඉල්ලන්න වෙලා.

උදේ රු. 2000ක් මේසේ උඩින් හේමන්ත තිබ්බේම කේන්තියෙන්.

දැන් කොහොමත් හේමන්ත ඉස්සරටත් වඩා කේන්ති ගන්නවා. අනූ දන්නවා එහෙම වෙන්නේ එයා රෑට තිෂු එක්ක කතා කරන නිසා කියලා.

“දැන් මට බල්ලන්ටත් එක්ක හම්බ කරන්න වෙලානේ“

අනූ කිසිම දවසක බලූ පැටියාට කියලා වෙනම කෑම හැදුවේ නෑ. එයාලා කන දෙයක්ම තමා දෙන්නේ. ඒත් හේමන්ත මේ කියපු කතාවට අනූට ගොඩක් දුක හිතුණා.

නිශිත් ඉන්නවා තේදවත් නොබලා හේමන්ත කියලා දැම්මා.

මේ කතාව අහන් හිටපු නිශිත්ටත් දුක හිතුණා.

ඒටත් වඩා අනුගේ කඳුළු පිරුණු ඇස් දෙක දැකපු නිතිශ්ට ඒටත් වඩා දුක හිතුණා.

'බල්ලෙක් කිව්වාට ඌ බත් කටවල් දෙකක්වත් කන එකෙක්ද. මූ නම් කිසි මනුස්සකමක් නැති එකෙක් වෙලා' නිශිත් හිතුවා.

දෙන්නම පිටත් කළාට පස්සේ ගෙදර වැඩත් ඉවර කරලා අනූ ටවුන් එකට යන්න ලෑස්ති වුණා.

හේමන්ත දීපු සල්ලි දගන්න පර්ස් එක ඇරලා බලද්දි ඒකේ තිබුණේ රු. 100ක් විතරයි.

අනූ රැකියාවෙන් ඉවත් වුණාට පස්සේ එයාට ජීවත් වෙන්නවත් සල්ලි දෙන්න කෙනෙක් නෑ.

එයාගේ දෙමව්පියන්ගෙන් ඉල්ලන්න විදියක් නෑ. එයාලා හිටපු ගෙවලුත් අතඇරලා දලා කොහේද්‍ෙ යන්න ගිහින්.

ළඟ තිබුණු පොඩි ගාණත් ඉවර වෙලා.

හ්ම්ම්ම්ම්ම්..

මිනිස්සු මෙච්චරටම අසරණ වෙනවාද.

බර සුසුමක් හෙලපු අනූ බෑග් එකට කුඩේකුත් පුංචි වතුර බෝතලේකුත් දගෙන දෙරත් වහගෙන එළියට ආවේ ටවුමට පයින් යන්න හිතාගෙන.

'වෙන මොනවා කරන්නද. බස් එකේ යන්න සල්ලිත් මදිනේ'

ටවුන් එකට ගෙදර ඉඳන් කිලෝ මීටර් 4ක විතර දුරක් තියෙනවා. මේ අව්වේ ඒ වගේ දුරක් පයින් යනවා කියන්නේ අමාරු වැඩක්.

ඒත් ජීවිතේට මූණ දෙන්නම වෙනවා. ජීවිතේ මග දලා දුවන්නවත් ආයෙත් හැරෙන්නවත් එයාට පුළුවන්කමක් නෑ.

කොච්චර දුක් උහුලන්න වුණත් අනු හේමන්තට වචනෙකින්වත් හිතෙන්වත් බැන්නේ නෑ. එයා ගැන තරහක් හිතුවෙත් නෑ.

හිමින් හිමින් තැනින් තැන නැවතී නැවතී අනූ පයින්ම ටවුන් එකට ආවා.

“අනේ මේ නංගී ජම්බු ගෙඩිය වගේ රතු වෙලානේ“

“ඒකනේ බං මිරිකන්න හිතෙනවා“

පාරේ ඉන්න කොල්ලෝ එක එක දේවල් කියනවා අනූට ඇහෙනවා.

“මෙච්චර ලස්සන කෙල්ලෙක් මොකද මේ පයින්ම ආ“

කෙල්ල ඒ දේවල් ගණන් නොගෙන යන්න ගියා.

ටවුන් එකෙන් එළවළු ටිකත් අරගෙන බස් හෝල්ට් එකට ආවේ ටික දුරක් හරි බස් එකේ යන්නම් කියලා හිතලා.

එහෙම හිතපු අනූ බස් එකට රු. 20 ක් දීලා ඒකෙන් යන්න පුළුවන් දුර ගිහින් බස් එකෙන් බැහැගත්තා.

sinhalaebooks.com

අමාරුවෙන් බඩු ටිකත් උස්සගෙන ගේට්ටුවත් ඇරගෙන යද්දී ඉස්සරහට ආවේ එයාගේ පුංචි යාළුවා.

අනූගේ මහන්සිය කොහෙත් ගියාද නෑ. තමන් ගෙදරට එනකොට සතෙක් වුණත් තමන්ව පිළිගන්නවා නම් ඒ කෙනාට දැනෙන්නේ පුදුම සතුටක්නේ.

“පැටියෝ…. මං නැතුව පාළුවෙන්ද හිටියේ ආ“

බඩු මල්ල බිමින් තියපු අනූ එයාගේ හුරතලාව වඩා ගත්තා.

“අනේ ඉතිං.. ඔය මදිද මාව ලෙව කෑවා“

“යමු ගෙට… බඩගිනියිද මිමි“

හේමන්තට එළවළු ඉවරයි කියලා සල්ලි ඉල්ලන්න ගිය වෙලාවේ එයා කියපු කතාව අනූට තාමත් දෝංකාර දෙනවා.

“දැන් මට බල්ලන්ටත් එක්ක හම්බ කරන්න වෙලානේ“

“අද ඉඳන් උඹත් මගේ කෑම එකෙන්ම කාපන් පැටියෝ“

පුංචි බලුපැටියාගේ ඔළුවත් අතගාලා දෙන්නම ගෙට ගියේ පුරුදු විදියට වැඩ පටන් ගන්න.

*********************************************
*******

නිශිත්ට නම් අනූ ගැන ඇත්තටම දැනෙන්නේ අනුකම්පාවක්.

රැකියාවට ගියත් නිශිත්ට අනූ ගැන කල්පනා වෙනවා. දෙන්නා සතුටින් ඇති කියලා නිශිත්ට ඇතිවුණ සිතිවිල්ල වැරදි කියලා එයාට හිතුණේ මේ ගෙදරට ආව මුල් දවසෙමයි.

අනූ නිකන් ඉන්න වෙලාවක් දකින්නේ හරිම කලාතුරකින්. එහෙම වෙලත් හේමන්තගේ කටින් ආදරෙන් එක වචනයක්වත් මේ ආපු මාස ගාණටම ඇහුණේ නෑ නේද කියලා නිශිත් කල්පනා කළා.

පුරුදු විදියට හැමදම දෙන්නා ගෙදර එනකොටම තේ හදලා රෑට පුරුදු වෙලාවටම කන්න දීලා ගේ දොර අස්කරලා එයාගේ යුතුකම් ඉෂ්ට කරන අනූ ගැන නිශිත්ට පුදුම ආදරයක් දැණුනා.

තමන්ට මේ කෙල්ලව හිමි වුණා නම් තමන් තරම් වාසනාවන්තයෙක් නෑ නේද කියලා නිශිත් හිතුවේ දුකෙන්.

ගෙදර වැඩ ඉවර කරලා අනූ රෑ බත් එකත් බෙදාගෙන පුරුදු තැනට ඇවිත් ඉඳගත්තේ තමන්ගේ බලූ පැටියා සැමී එක්කමයි.

“ම්ම්ම්ම් අද උඹ කාපන් මේක. උඹේ බඩ පිරුණාම මම කන්නම් හොඳද“

අනූ එයාගේ පිඟානේ තිබුණු බත් ටික ටික අනලා සැමීගේ පිඟානට දැම්මා.

සැමීටත් ඉතිං ඒට වඩා දෙයක් නෑ. හොඳට කනවා.

“තව බඩගිනිද ආ. එහෙනම් ඔක්කොම කාපන්. මට බඩගිනිත් නෑ“

අනූ එයාගේ පිඟානේ තිබුනු බත් ඔක්කොම අනලා සැමීට දැම්මා.

මේ හැමදේම නිශිත් බලාගෙන හිටියේ හොරෙන්. දැකපු දේවල් නිශිත්ගේ පපුව වේදනාවට පත් කළා.

“බල්ලන්ටත් එක්ක හම්බකරන්න වෙලානේ“ කියලා හේමන්ත කිව්ව නිසා කෙල්ල එයාගේ බත් එක නොකා ඒකම සැමීට දුන්නානේ කියලා දකිද්දි හිතට පුදුම දුකක් දැණුනා.

‘මට ඔයාව බලාගන්න තිබුණා නම්‘ නිශිත් මහා බර සුසුමක් හෙළුවා.

‘අපි හැමෝටම අපිට ඕන දේවල් ලැබෙන්නේ නෑ‘

‘දෛවය කරන්නේ එයාට ඕන දේවල්‘

‘උඹලා දෙන්නා සතුටින්වත් ඉන්නවා නම් මට හිත හදාගෙන ඉන්න පුළුවන්‘

‘ඒකත් නෑ‘

‘මේ කෙල්ලට ගෙදර අයවත් නෑ. මිනිහාත් සලකන්නේ නෑ‘

‘කොච්චර දුක හිතෙනවා ඇද්ද‘

‘පව් දෙයියනේ‘

නිශිත් හිතුවේ අනූ දිහා බලාගෙනමයි

*.... 06*

එක දවසක හේමන්ත වැඩ ඇරිලා ගෙදර ආවේ ඔළුව උස්සගන්නවත් බැරි තරම් වේදනාවෙන්. ඒත් ඉතිං ඒ ගැන අනූ දැනගෙන හිටියේ නෑ.

හේමන්ත කාමරේට ගියා ගියාමයි තේ බොන්නවත් ආවේ නෑ එහෙම්මම ඇඳට වැටුණා.

"හේමන්ත අයියා තේ බොන්න ආවේ නැද්ද අයියේ"

වෙන කරන්න දෙයක් නැති නිසාම අනූ නිශිත්ගෙන් ඇහුවා. මොකද කාමරේටවත් ගිහින් බලන්න විදියක් නැති නිසා. අනික දැන් ගෙදර ප්‍රශ්න ටික ටික නිශිත් දන්නවා කියලා අනූ දන්නවා.

නිශිත් විතරක් තේ බීලා තියෙනවා දැක්කාම අනූ එයාගෙන් ඇහුවේ හේමන්තගේ කටහඬවත් මේ වෙනකම් ඇහුණේ නැති නිසා.

"උදේ ඉඳන් ඔළුව රිදෙනවා කිය කිය හිටියේ. දැන් වැඩියි වගේ. ඔයාට කිව්වේ නැද්ද"

'ඒක කියන්න මාත් එක්ක කතා කරන්න එපැයි'අනූ බිම බලාගෙන හිතුවේ කියන්න දෙයක් නැති නිසා.

"මං බලන්නම්"

එහෙම කියලා එතනින් ආවත් හේමන්තගේ කාමරේට යන්න තරම් ශක්තියක් අනූට නෑ. මොකද එයාව දැක්කොත් කෑගහන බව දන්නවා වගේම නිශිත් අයියාත් මේ හැමදේම දැනගනී කියලා අනූ බය වුණා.

ඒත් ඉතිං තමන්ගේ මහත්තයාට අසනීපයි කිව්වාම පැත්තකට වෙලා ඉන්න බෑනේ.

වෙන දෙයක් වෙන්න කියලා හිතලා අනූ හේමන්තගේ කාමරේට ගියා.

“අයියේ“

“මොකද තමුසේ මෙතෙන්ට ආවේ“

“අනේ සොරි ආවාට. ඔයාට ඔළුවේ කැක්කුමයි කියපු නිසා ආවේ“

“ඇයි තමුසේ ආවාම හොඳ වෙනවාද. පලයන් යන්න“

“අනේ කෑගහන්න එපා නිශිත් අයියාට ඇහෙයි“

“ඇහුණදෙන්. පලයන් ඉතිං එකපාරක් කිව්වාම ආයෙත් ආවොත් කකුල් දෙක කඩලා දානවා“

මහ හයියෙන් හේමන්ත කෑගැහුවා.

අනූ කාමරෙන් එළියට එද්දි නිශිත් එතන.

නිශිත් දිහා බලපු අනූ ලැජ්ජාවටම බිම බලාගත්තා.

“මොකද අරූ කෑගහන්නේ“

“එයාට අමාරුයි වගේ අයියේ“

“අමාරු හින්ද වෙන්න ඇති මැරෙන්න හදන්නේ ඌ“

අනූ ඉක්මණට ඇවිත් රෑට කෑම හදන අතරෙම සූප් එකකුත් හැදුවේ හේමන්ත කන්නේ නැති වෙයි කියලා හිතුණු නිසා.

නිශිත් කෑමට පහලට එනකම් හිටපු අනු එයා ළඟට ගියා.

"අයියේ..."

"ඇයි නංගී"

"ඔයාට කරදරයක් නැත්තම් මට උදව්වක් කරනවාද"

"මොකද්ද"

"මේ සුප් එකයි. පෙනඩෝල් 2යි හේමන්ත අයියාට දෙනවාද"

"මං දෙන්නම්. ඇයි ඔයා යන්නේ නැත්තේ"

"එයා ටිකක් කේන්තියෙන්නේ ඉන්නේ. මං ගියොත් අසනීපත් වැඩි වෙයි. ඒකයි"

"ඒකත් එහෙමද. හ්ම්ම්ම්ම් කෝ දෙන්න"

'ඔයාලා දෙන්නා ගොඩක් ඇතයි. මං දැනගනී කියලා ගොඩක් පරිස්සම් වෙනවා නේද' නිශිත් හිතුවා.

අනු සුප් එක, සර්වියට් එක, පෙනඩෝල් හැමදේම නිශිත් අතට දුන්නා.

"හේමන්ත"

"මේ සුප් එක බීලා ඉඳපන්. නොකා නොබී ඉද්දි අසනීප වැඩිවෙනවා බං"

"පෙන්ඩෝල් දෙකත් බීපන්. බෙහෙත් ගන්න ඕනේ නම් යමං"

"ඕනේ නෑ"

හේමන්ත තවත් වචනයක්වත් නොකියා සූප් එකත් බීලා, පෙනඩෝල් දෙකත් බිව්වා.

අනූ නම් නිදාගන්න කාමරේටවත් ගියේ නෑ. රෑට හදිසියක් වුණොත් කියලා හේමන්තගේ කාමරේ එළියෙන් බිම ඉඳගෙන හිටියා.

නිශිත් මේ දේවල් දැකලාත් නොදැක්කා වගේ හිටියේ පවුල් ප්‍රශ්න වලට අත දන්න ගිහින් අනූට ප්‍රශ්නයක් වෙයි කියලා හිතපු නිසා.

මහ රෑ ඇහුණු කෙඳිරියට අනූ හේමන්තගේ කාමරේට ගියේ මැරුවත් කමක් නෑ කියලා හිතලා.

'දෙයියනේ හොඳටම උණ'

අනූ ඉක්මණින් හේමන්තගේ නළලට ඕඩිකොලොන් දාපු රෙදි කෑල්ලක් කියලා ඔළුවටත් ටිකක් දලා හේමන්තට නින්ද යනකම්ම ඔළුව අතගෑවා.

උදේ වෙනකොට හේමන්තට හරි සිහියක්වත් නැති තරමට උණ හැදිලා. අනූ නම් ගොඩක් කලබල වුණා.

''හේමන්තට දැන් මොකද''

''අනේ අයියේ එයාට හොඳටම උණ''

''මෙහෙම කොහොමද බෙහෙත් ගන්නවත් එක්කගෙන යන්නේ. හන්දියේ ඩොක්ටර්ටවත් කතා කරලා බලමුද''

ඒ ඩොක්ටර් හේමන්තව ටිකක් අඳුරන කෙනෙක් නිසාම අනූ එයාට කතා කලා.

“මං එක්කගෙන එන්නම්“ නිශිත් ඉක්මණින් වාහනේ අරගෙන ගිහින් ඩොක්ටර්ව එක්කගෙන ආවා.

“මේ දවස් වල වෛරස් උණක් තියෙනවා. හැදුණම ටිකක් අමාරුයි තමා“

“මේ බෙහෙත් ටික දෙන්න. හෙට හවස් වෙද්දි අඩු වෙයි“

හේමන්තට නම් කිසිම දේක සිහියක් තිබුණේ නෑ.

අනූ එයා අතින්ම හේමන්තට පුළුවන් තරම් සැලකුවා. වෙලාවට බෙහෙත් ටික දුන්නා. සුප්, කැඳ වගේ දේවල් හදලා දුන්නා. ඒත් ඉතිං හේමන්තට නම් මේවා කොහොම වුණාද කියන්න දන්නෙත් නෑ.

දවස් තුනක් විතර යද්දි හේමන්තට හොඳටම සුව වුණේ ඇත්තටම අනූගේ කැපවීමෙන්. ඒත් ඉතිං ඒකට ස්තූතියක්වත් හේමන්තගෙන් නම් නෑ. අනූ ඒ දේවල් බලාපොරොත්තු වෙන්නෙත් නෑ. එයාගේ යුතුකමක් වගකීමක් කියලා හිතලා තමා හැමදේම කරන්නේ.

එපා කියද්දි අනූටත් බැනලා අද වැඩටත් ගියේ හිතුවක්කාරකමට.

“උඹ නම් හරි ලකී හේමන්තයා“

“ඒ මොකද“

“ඊයේ පෙරේද දවස් දෙකම අර කෙල්ල නිදි නෑ. උඹට සාත්තු කලා“

“උඹට නින්ද යනකම්ම ඔළුව අතගගා හිටියා“

“උඹව පිරිසිදුවට තියා ගන්න ඒකි පුදුම විදියට දැඟළුවා බං. දැන් කාලේ ගෑණු ඕවා කරන්නේ නෑ බං. පව්“

හේමන්තගේ කේන්තිය හිත ඇතුලේ පැසවන්න පටන් ගත්තේ නිශිත්ගේ කතාවට.

වාහනේ වේගේ වැඩි කරපු හේමන්ත කේන්තියෙන්ම ගෙට ආවේ නිශිත් පුදුම වෙලා බලාගෙන ඉද්දි.

‘මූට මොකද්ද වුණේ එකපාරම‘

නිශිත් එහෙම හිත හිතම එයාගේ කාමරේට ගියා.

හේමන්ත කේන්තියෙන්ම මුළුතැන්ගෙට ඇවිත් අනූගේ කොණ්ඩෙන් අල්ලගෙන කාමරේට ඇදගෙන ආවා.

“අයියේ අනේ...“

“ඇයි මේ....“

“අත අරින්නකෝ අනේ..... රිදෙනවා“

වුණේ මොකද්ද කියලා අනූට හිතාගන්න බැරි වෙද්දි එයාගේ කොණ්ඩේ හේමන්තගේ අතින් ගලවගන්න ගොඩක් උත්සහ කළා. ඒත් අනූ වගේ දෙගුණයක් විතර කෙනෙක් එක්ක කොහේ හැරෙන්නද?

“බැල්ලි.... මට අසනීප වුණාම ප්‍රයෝජන ගන්නවා නේද ඒකෙන්“

“තොට මං කියලා තියෙනවා මගේ කාමරේට එන්න එපා කියලා“

“මාව අල්ලන්න එපා කියලා“

“සිහියෙන් ඉද්දි කරගන්න බැරි ඒවා අසනීප වුණාම කරගන්න දගලනවාද ආ“

“හිටපන් මං උඹට. හොඳ වැඩක් කරනවා“

හේමන්ත ගලවලා ගත්තේ එයාගේ ඉනේ තිබුණු පටිය. අනූව බිමට තල්ලු කරපු හේමන්ත ඉණේ තිබුණු පටියෙන් හොඳටම ගැහුවා.

අනූට ඒ පහරවල් දරා ගන්න බැරි වුණත් එයා ඒවා ඉවසගත්තේ ගෙදර පිට කෙනෙක් ඉන්න නිසා.

“අනේ රිදෙනවා. අයියේ...“

දත්මිටි කාගෙන අනූ ඒ වේදනාව දරාගත්තා.

“මගේ ජීවිතේම විනාස කරලා දැන් මට සලකන්න එන්නේ අයිතිය ඉල්ල ගන්න වෙන්න ඇති උඹ නේද“

“අනේ කෑගහන්න එපා. නිශිත් අයියාට ඇහෙයි“

“ඇහුණදෙන්. මං කාටවත් බය නෑ යකෝ“

අනූ ගුටි කන අතරෙත් උත්සහා කරන්නේ ඒ දෙන්නගේ ප්‍රශ්න නිශිත් දැන ගන්න එක නවත්තන්න.

“අනේ.... රිදෙනවා.... අයියේ.....“

මේ අතරේ නිශිත්ට මහ සද්දෙන් ඇහුණු හේමන්තගේ කෑගැහිල්ලට අඩියට දෙකට පහළට ආවා.

“අනේ ගහන්න එපා අයියේ රිදෙනවා“

“අනේ රිදෙනවා. මං ආයේ එහෙම කරන්නේ නෑ“

ඒත් හේමන්තගේ කේන්තිය නම් අඩුවක් නෑ.

අනූ හොඳටම අඩනවා. අත් කකුල් හොඳටම රතුවෙලා. බෙල්ට් එකේ පාරවල් ඇඟ පුරාම.

“නවත්තපං යකෝ ඕක“

නිශිත්ට බලන් ඉන්න බැරි නිසාම හේමන්තගේ කාමරේට පැනලා හේමන්තව තල්ලු කරලා දැම්මා.

“තෝ පවුල් ප්‍රශ්නවලට අතනොදා හිටපන්“

“මං ගහන්නේ මගේ ගෑණිට. තොගේ ගෑණිට නෙමෙයිනේ“

හේමන්ත ඉණ පටියත් පැත්තකට විසි කරලා ඇඳෙන් ඉඳ ගත්තා.

“මොකාගේ ගෑණි උනත් ගෑණියෙක්නේ. උඹේ පාරවල් මුන්ට කන්න බෑ“

“තෝ නම් මහ සතෙක් වගේ හැසිරෙන්නේ. ඡිටි“

“නංගි යන්න ඔයා“

නිශිත් තරහෙන්ම අනූටත් කෑගැහුවා. ඒත් අනූට නැගිටගන්නවත් පණ නෑ.

අනූව අත්දෙකෙන් උස්සලා නැගිට්ටවපු නිශිත් එයාව එක්කගෙන ගිහින් පුටුවකින් ඉන්දෙව්වා.

අනූගේ ඇස් වලින් කඳුළු හෝ ගාලා ගලන්න ගත්තේ හිතේ ගතේ දෙකේම වේදනාවට.

අම්මා තාත්තාගෙන්වත් මෙහෙම ගුටි කාලා නෑ එයා. මෙච්චර නපුරු කෙනෙක් එයාගේ ජීවිතේට එයාට හම්බවෙලත් නෑ.

'අර කෙල්ල මෙච්චර මූට දේවල් කරනවා. මූ සලකන්නේ වැඩකාරියෙක්ට වගේනේ'

'මේ වගේ සතෙක්ට මේ අහිංසක කෙල්ලම හම්බුණ එකනේ කරුමේ කියන්නේ'

අනූට වතුර එකක් දෙන ගමන් නිශිත් හිතුවා.

''අයියා යන්න දැන්. මං හොඳින්''

මෙහෙම අනූට සලකනවා කියලා හේමන්ත දැනගත්තොත් මේ කෙල්ලටමයි ප්‍රශ්නයක් වෙන්නේ කියලා හිතපු නිශිත් අනූගේ ඔළුවත් අතගාලා යන්න ගියේ පුදුම දුකකින්.

අනූට මෙහෙම දෙයක් කරලාත් එයා හේමන්ත එක්ක කේන්තියෙන් හිටියේ නෑ. ඉක්මණට උයන්න පටන් ගත්තේ රෑ කෑම පරක්කු වුණොත් තවත් තරහා යයි කියලා හිතලා.

කෑම ටිකත් මේසෙට යවලා බෙහෙත් ටිකත් පීරිසියකට දාලා හේමන්තගේ තැන ළඟින් තිබ්බේ බොන්න අමතක වෙයි කියලා.

නිශිත් නම් ජීවිතේ ගැන පුදුම වේදනාවකින් මේ දේවල් දිහා බැලුවා. වෙන කෙනෙකුට එහෙම මෙහෙම ගැහුවා නම් මෙතන වෙන විනාසේ හිතාගන්න බැරුව යනවා.

කෙල්ලගේ අත්වල කකුල් වල රතු පාට පාරවල් හැමතැනම. ඉදිමිලා. ඇවිදින්නෙත් අමාරුවෙන්.

නිශිත්ට පුදුම විදියේ දුකක් දැණුනා. දුවගෙන ගිහින් තුරුල් කර ගන්න හිතුණා. ඒත් ඒවා හීන විතරයි.

'ඒත් අනූ බෙහෙත් ටික පවා ළඟින්ම තියලා'

'ඒ කෙල්ල කරුමයක් ගෙවන්න මූ එක්ක ඇවිත් තියෙන්නේ'

අනේ අයියේ ගහන්න එපා රිදෙනවා කිය කිය බිම වැටිලා අනූ වැඳගෙන හිටපු හැටි නිශිත්ගේ පපුව පුරාම ලොකු වේදනාවක් ඇති කළා.

'මං කියලා මොනවා කරන්නද අනූ'

'මූට උපදෙසක් දෙන්න පුළුවන් එකෙක් නෙමෙයිනේ'

නිශිත්ට මේ ගෙදරින් යන්න හිතුනු වාර අනන්තයි. ඒත් එහෙම වුණොත් මේ කෙල්ලව මෙහෙමවත් බේරගන්න කෙනෙක් නැති වෙනවා නේද කියලා හිතලා ඒ අදහස අතඇරගත්තා.

****************************************************
********

දැන් දවස් දෙකක විතර ඉඳලාම අනුගේ ඇඟට හරි නෑ. හරියට තින්දක්වත් නෑ. අදත් නැගිටලා පුළුවන් විදියට උයලා කෑම බැඳලා ඒ දේවල් කළා.

ඒත් අද එයාගේ ඇඟටම පණ නැති ගතියක් දැණුනා. අනූ ඔළුව අල්ලගත්තේ එයාට කැරකිල්ලක් වගේ ආපු නිසා.

හිතන්නවත් වෙලාවක් නැතුව මුළුතැන්ගේ තිබුණ පුටුවකුත් පෙරළගෙනම අනූ බිම වැටුණේ එයාගේ පුංචි බලුපැටියත් කලබල වෙලා කෑගහද්දි.

“හේමන්ත මොකද්ද සද්දේ“

නිශිත් හේමන්ත දෙන්නම යන්න ලෑස්ති වෙලා එළියට යන්න ආවා විතරයි.

“මොකක් හරි වැටෙන්න ඇති. අපි යමු“

“පොඩ්ඩක් බලපන් නංගිවත්ද දන්නේ නෑ“

“අනේ මේ උඹට ඕනේ නම් බලපං“

‘තොදකින් මූ වගේ එකෙක්‘

නිශිත් තවත් හිතන්නේ නැතුව මුළුතැන්ගේ පැත්තට ආවා.

“දෙයියනේ නංගි“

“නංගී නැගිටින්න“

අනු කෙඳිරිගානවා.

අනුව පරිස්සමෙන් බිත්තියට හේත්තු කරපු නිශිත් ඉක්මණට ගියේ හේමන්තට කතා කරන්න.

“හේමන්ත මෙහේ වරෙන්. නංගි වැටිලා තියෙන්නේ“

“ඉතිං දැන් මට මොකද්ද කරන්න කියන්නේ“

“යකෝ ඒ තොගේ ගෑණි නේද. දරුවෙක්වත් හම්බෙන්නද දන්නේ නෑ බං. ටිකක් බලපං“

“තොට ඔල්මාදේ හැදිලාද. මට පරක්කු වෙනවා. මං යනවා“

හේමන්ත ගාණක්වත් නැතුව වාහනෙත් අරන් යන්න ගියේ නිශිත්ව පුදුම කරලා.

ආයෙත් නිශිත් ඉක්මණින් ගියේ අනූ ළඟට.

වතුර එකක් අරගෙන නිශිත් අනුව එයාගේ ඔඩොක්කුවට බර කරගත්තේ අනුකම්පාව උපරිම වෙද්දි.

‘ඇඟත් හොඳටම රස්නෙයි. අරුගෙන් උණවත් බෝ වුණාද දන්නේ නෑ‘

“නංගී.... නංගී... අනූ කතා කරන්නකෝ“

අනූගේ මූණට වතුර ටිකක් ඉස්සාම එයා හිමින් හිමින් ඇස් ඇරියා.

“ඔයාට මොකද වුණේ“

“අයියේ කෝ හේමන්ත අයියා. ඔයාලා ගියේ නැද්ද තාම“

“හේමන්තට ඔෆිස් එකෙන් ඉක්මණට එන්න කියලා කෝල් එකක් ආව නිසා ඌ ගියා“

නිශිත් බොරුවක් කිව්වේ අනූගේ හිත රිදෙයි කියලා. ඒත් අනූ දන්නවා ඇත්ත මොකද්ද කියලා.

“ඔයාව රස්නෙයි හොඳටම. බෙහෙත් ටිකක් ගමු. නැත්තම් වැඩි වෙයි“

“මං ගන්නම්. ඔයා යන්න අයියේ පරක්කු වෙනවානේ“

“ඔයාට තනියම යන්න බෑ. ලෑස්ති වෙලා එන්න මං අරන් දීලාම යන්නම්“

“අනේ එපා අයියේ මට පුළුවන්“

“පණ්ඩිත නොවී එන්න අනේ“

අනූ තවත් කියලා වැඩක් නැති නිසා අමාරුවෙන් ඇඳුමක් මාරු කරගෙන ආවා.

නිශිත්ම වාහනේ දෙරත් ඇරලා දීලා අනූව පරිස්සමෙන් ඉන්දවලා ඩිස්පෙන්සරියට එක්ක ගියා.

“ඇයි උණ බව දැනගෙනත් ඔයා බෙහෙත් ගත්තේ නැත්තේ“

“බලන්න ඩොක්ටර්ත් බැන්නනේ“

“ඔයත් අරූ වගේම මහා හිතුවක්කාරයි නේද“

“ඊයේ ගුටි කෑවාම වැඩි වෙන්න ඇති“

“ඇයි ඔයා ගැන හිතන්නේ නැත්තේ“

නිශිත් කියවනවා.

“මගේ ළඟ සල්ලි තිබුණේ නෑ බෙහෙත් ගන්න“

අනූ බිම බලාගෙනම කියලා දැම්මා.

නිශිත් ඇස් ලොකු කරගෙන අනූ දිහා බලාගෙන හිටියා.

අනූට දවස් ගාණක්ම ඇගේ අමාරුව තිබුණා. ඒත් එයා ඒක ගණන් ගත්තේ නෑ සල්ලි නැති නිසා.

“මට බෙහෙත් අරන් දුන්නට ඔයාට ගොඩක් පිං අයියේ“

අනූ අත්දෙකත් එකතු කරලා එහෙම කියද්දි නිශිත්ට හේමන්ත ගැන පුදුම කේන්තියක් ආවා.

“ඇයි ඔයා හේමන්තගෙන් සල්ලි ඉල්ල ගන්නේ නැත්තේ. එයා දෙන්නේ නැද්ද“

“හැමදේටම ඉල්ලන්න බෑනේ අයියේ“

“එහෙම කියලා බෑනේ. ඔයා ජොබ් එකට යන්නේ නැත්තේ එයා නිසානේ“

“මගේ ලැබීම මේක වෙන්න ඇති අයියේ...“

“ඔයාලා දෙන්නා අතර රණ්ඩු නේද“

“එයා වසයි“

‘මං දන්නවා ඔයාලා අතරේ ප්‍රශ්න ගොඩයි. ඒත් ඔයා ඒ දේවල් කියන්නේ නෑ‘ නිශිත් හිතුවා.

“එයා ඉස්සරත් එහෙම තමා. ඉක්මණට දරුවෙක් හදාගන්න බලන්න. හැමදේම විසඳෙයි“

අනූට නම් ඒ කතාවට හිනාවක් ගියා.

“ඇයි හිනාවෙන්නේ?“

“අනේ නෑ අයියේ නිකන් හිනා ගියේ“

‘දරුවෙක්... ඒක මගේ ජීවිතේ හීනයක් විතරයි අනිත් ඒවා වගේම‘ අනූ ඒක කිව්වේ නෑ.

*.... 07*

කිසිම අරමුණක් නැතුව, අළුත් බලාපොරොත්තු නැතුව කාලය ඔහේ සති ගණන් ගෙවිලා යනවා.

ආදරේ ගැන මිනිස්සු මොන සුරංගනා කතා කිව්වාත් ඒක විඳින කෙනා විතරයි දන්නේ ඒකේ ඇත්ත තත්වේ ගැන.

sinhalaebooks.com

ජීවිතේ දුක කියන්නේ මරණය නෙමෙයි. ජීවත් වෙලා ඉද්දිම අපි ඇතුලේ තියෙන දේවල් වලට මැරෙන්න ඉඩ දීලා ඉන්න එක.

අනූට වෙලා තියෙන්නෙත් ඒකම තමා.

ජීවිතේ ගැන අහස උසට තිබුණු බලාපොරොත්තු එකින් එක අත්අරින්න වෙනකොට ඒක නිකම්ම නිකම් හිස් ජීවිතයක් විතරයි.

තමන් එක්ක එක බත් එක බෙදාගෙන කාපු දමිත් අනූගේ ජීවිතේ ඔහේ අතඇරලා දලා යන්න ඇත්තෙත් තමන්ගේ තිබුණු පවකට වෙන්න ඇති කියලා අනූ හිතුවා.

දමිත් එක්ක හිටපු කාලේ වුණත් කිසිම දවසක කසාදයක් ගැන කතා කරන්නවත් දමිත් අකමැති වුණ හැටි අනූට මතක් වුණා.

"ඔයාට ඕනේ පැය 24ම කසාදේ ගැන කියව කියව ඉන්න එකෙද්ද අනූ"

"එහෙනම් මාව හරියන්නේ නෑ. මොකද මට කසාදෙට වඩා වැඩ තියෙනවා කරන්න"

"ඔයාට මාත් එක්ක ඉන්න බැරිනම් කසාදේ ගැනම කියවන එකෙක් හොයා ගන්න"

"ඇයි දමිත් මේ පොඩි දේටත් ඔහොම කේන්ති ගන්නේ"

"මාව කේන්ති කරන්න එපා අනූ හැමවෙලේම කසාදයක් ගැන කියලා"

“හරි හරි ආයේ කතා කරන්නේ නෑ“

හ්ම්ම්ම්ම්ම්.

බර සුසුමක් හෙලලා ළය සැහැල්ලු කරගත්ත අනු පුරුදු විදියටම දවස පටන් ගත්තා.

හෙට දවසේ එයාගේ බලාපොරොත්තුව ඉෂ්ට කරගන්නේ කොහොමද කියලා අනු කල්පනා කළේ හිතේ ලොකු බරකින්.

************************************************************

අනු විවාහ වෙලා හිටියත් එයාගේ පරණ යාළුවෝ එක්ක යාළුකම් වැඩියේ පැවැත්වුයේ නැති වුණත් අද උදේ ඉඳලම එයාට දුරකතන ඇමතුම් එනවා.

“හැපි බර්ත්ඩේ අනු“

“තැන්ක්ස් උමාලි. උඹට මතක තිබුණා නේද“

“නැතුව නැතුව ඉතිං“

“ඉතිං උඹට කොහොමද උමාලියෝ“

“මං ලබන මාසේ මැරි කරනවා අනු“

“අනේ වාසනාවන්. අර අහිංසකයා පව් හැබැයි“

“අනේ මේ පලයන් යන්න“

“නෑ බං සිතුම් අයියා හරි හොඳයි. උඹව ආදරෙන් බලාගනී“

‘මට වගේ නෙමෙයි උඹ වාසනාවන්තයි‘ අනු හිතුවා.

sinhalaebooks.com

“උඹට කොහොමද දැන් බබෙක් එහෙම“

“හිහ්හ්හ්“

“තාම බැඳලා මාස කීයද බං. ළමයි ගැන හිතනවාට වඩා වැඩ තියෙනවා“

අනු දුකින් උනත් එහෙම කියලා දැම්මා.

“ඒකත් ඇත්තනේ නේද“

“හාකෝ හාකෝ....“

වෙනදට වඩා ටිකක් කලින් නිශිත්ට ඇහැරුණ නිසා එයා පහළට ආවේ වතුර බොන්න.

එනකොට අනු කතා කරනවා ඇහුණු නිසා එතෙන්ට යන්නේ නැතුව හිටියා.

“හරි එහෙනම් මං තිබ්බා“

“තැන්ක්ස් උමාලි මාව මතක් වුණාට“

ඒ ඇමතුම ඉවර වුණා විතරයි ආයෙමත් කෝල් එනවා.

ඒ ආව හැම එකටම අනු තැන්ක්ස් කරනවා නිශිත් අහගෙන හිටියා.

‘අද කෙල්ලගේ බර්ත්ඩේ එකවත්ද. නැත්තම් එන කෝල් වලට තැන්ක්ස් කියන්නේ මොකටද නේද‘

‘හොයා ගන්නේවත් කොහොමද. අරුගෙන් අහන්නත් බෑනේ‘

“අනේ තැන්ක්ස් මචෝ“

“ඔව් ඔව් උමාලිත් උදේම විශ් කළා“

අනූ කියනවා ඇහුණු නිසාම නිශිත් තහවුරු කරගත්තා අද එයාගේ බර්ත්ඩේ එක කියලා.

‘හේමන්ත විශ් කරද්දිම විශ් කරනවා. නැත්තම් හරි නෑනේ‘

එහෙම හිතපු නිශිත් ආයෙමත් කාමරේට ගියේ තමන් එතන හිටපු බව අනූට අඟවන්න ඕනේ නැති නිසා.

හේමන්ත විශ් කරනවා තියා කෙල්ලගේ මූණවත් බැලුවේ නෑනේ කියලා නිශිත් හිත හිත හිටියා.

‘මූ දන්නේ නැද්ද දන්නේ නෑ. ඒත් ඒක වෙන්න බෑනේ‘

කොහොම කොහොම හරි වෙනදා වගේම හේමන්ත නිශිත් එක්කම එළියට බැහැලා ආවා. නිශිත් නම් විශ් කරන්න බැරි වුණ නිසා ඉන්නේ දුකෙන්.

“අපේ උන්ගේ බර්ත්ඩේ වත් දැන් මතක නෑ බං“

නිශිත් වාහනේ යන ගමන් කතාවක් පටන් ගත්තේ එහෙමවත් හේමන්ත ඒ ගැන දන්නවාද බලන්න.

“එකපාර මොකද බර්ත්ඩේ මතක් වෙලා“

“අදක හෙටක කාගේ හරි එකක් තියෙනවා මතකයක් තියෙනවා. හරියටම කාගේද කියලා මතක නෑ“

ටික වෙලාවක් කල්පනා කර කර හිටපු හේමන්තට මතක් වුණේ බර්ත්ඩේ එක.

“උඹ වෙලාවට බං මතක් කළේ“

sinhalaebooks.com

‘‘ඇයි නංගිගේ බර්ත්ඩේ එකද‘‘

‘‘සයිකෝද මං දන්න බර්ත්ඩේ එකක් නෑ. ලබන සතියේ තිෂුගේ බර්ත්ඩේ එක‘‘

‘ගෑණිගේ බර්ත්ඩේ එක දන්නේ නෑ. කොහේවත් ඉන්න උන්ගේ ඒවා මතකයි‘

නිශිත් කේන්තිය පිට නොකර එතනින්ම කතාව නතර කරලා දැම්මේ අනු ගැන දුක හිතෙද්දි.

මේ අතරේ අනු ගෙදර වැඩ ඉවර කරලා අද දවසේ එයා කරන්න ඕන දේ ගැන කල්පනා කළා. ඒත් කෝ සල්ලි.

ටිකක් වෙලා කල්පනා කරපු අනුට දෙයක් මතක් වෙලා එයා ගියේ කණ්නාඩිය ළඟට. කණ්නාඩියෙන් පේන තමන්ගේම මූණ දිහා ටිකක් බලාගෙන හිටියා.

‘කමක් නෑ. මං කරන්නේ ඊට වඩා පිනක්නේ. මේක නැති වුණාට කමක් නෑ‘

එහෙම හිතපු අනු ලෑස්තිවෙලා එළියට ආවේ පුංචි බලුපැටියාවත් හුරතල් කරලා.

‘‘මං ගිහින් ඉක්මණට එනකම් දඟ නොකර ඉන්න පැටියෝ හොඳද‘‘

අනු පයින්ම ටවුන් එකට ආවේ බඩු ටිකක් ගන්න. පයින්ම ඇවිත් එයාට නම් හොඳටම මහන්සියි. ඒ මහන්සියටම ගිහින් බස් හෝල්ට් එකට වෙලා ටිකක් ඉඳගත්තා.

අද නිශිත්ට ෆීල්ඩ් යන්න වෙලා. ඉතිං එයා වාහනෙත් අරගෙන කාර්යාලයෙන් එළියට ආවා. හේමන්තලා ඉන්න ටවුන් එක පහු කරගෙන තමා අදුල තැනට යන්න ඕනේ.

හුරුපුරුදු රුවක් බස් හෝල්ට් එකේ ඉන්නවා දැකපු නිසා එයා වාහනේ අයිනක් බලලා නතර කර ගත්තා.

'අනූ ඇයි ටවුන් එකේ මේ වෙලාවේ'

අනූ ටිකක් මහන්සි නිවාගෙන එහෙම්මම ගියේ ටවුන් එකේ තියෙන ලොකුම උකස්බඩු ගන්න තැනකට.

'මෙයා ඇයි මෙතෙන්ට ගියේ'

හරිම සතුටින් සල්ලි ටිකත් අරගෙන අනූ එළියට ආවේ අද එයාගේ බලාපොරොත්තුව ඉෂ්ට කරගන්න පුළුවන් වෙන නිසා.

ළඟම තිබුණු කඩේකින් එළවළු, තව ගෙදරකට ඕන කරන කුළු බඩු කීපයක් දාපු බෑග් දෙකක් අරගෙන අනූ එළියට ආවා.

ආයෙත් පොඩි දෙයක් මතක් වෙලා අනූ බැලුවේ පර්ස් එක දිහා. පර්ස් එකටම තිබුණේ රුපියල් 200 යි.

'කමක් නෑ'

ඉක්මණට ආයෙත් කඩේ ඇතුලට ගිහින් චොක්ලට් දෙකකුත් ගත්තා.

මේ හැමදේම නිශිත් බලාගෙන.

sinhalaebooks.com

අනූ පයින්ම අර ලොකු බෑග් දෙකත් උස්සගෙන යනවා දැකපු නිශිත් පුදුම වෙලා බලාගෙන හිටියා.

නිශිත් ඉක්මණට ගියේ උකස් බඩු කඩේට.

“මිස් දැන් අනුලි කියලා කෙනෙක් ආවා නේද“

“අනුලි.... විනාඩියක් ඉන්න බලන්න සර්“

“ආ ඔව්. එයා කරාබු දෙකක් උකස් කළා“

“මොකක්?“

නිශිත් පුදුම වුණා.

“ඔව් සර්.. ඇයි?“

“නෑ නෑ මුකුත් නෑ. මං ඒ දෙක බේරගන්නවා“

“දැන්ම?“

“ඔව් ඇයි?“

“නෑ සර් මේ....“

“මේ ඔයාට වෙන දේවල් වැඩක් නෑනේ. මං සල්ලි දෙනවානේ. ඔයා ඒක දෙන්න මිස්“

“ගාණ කීයද“

“තුන්දහයි“

නිශිත් කොහොම හරි ඒ කරාබු දෙක බේරගෙන ආයෙත් වාහනේට ආවේ අනූව හොයන්න.

'වාහනේ එයා ළඟට ගියොත් එයාට දුක හිතෙයි. ඒ හින්ද මොකද කරන්නේ කියලා බලමු'

එහෙම හිතපු නිශිත් අනූගේ පස්සෙන් දුර තියාගෙනම වාහනේ ආවා.

බඩු බෑග් දෙකත් අරගෙන අමාරුවෙන් පයින් යනවා දැක්කත් කරන්න දෙයක් නැති නිසා නිශිත් ඉවසීමෙන් හිටියා.

අනූ මහන්සියට බස් හෝල්ට් වල නතර වෙවී ආවේ මහ දවල් අව්වේ එක දිගට එන්න බැරි නිසා.

'කෙල්ල පව් දුක් විඳිනවා හේමන්ත එක්ක ඇවිත්'

'මට ඔයාව මගේවත් කරගන්න තිබුණා නම්'

නිශිත් හිතුවා.

අනූ ගියේ එන පාරේම එකම ඉඩමේ හදලා තියෙන දුප්පත් මැටි ගෙවල් දෙකකට. ගෙවල් දෙකටම මේ බඩු බෑග් දෙක දුන්නා.

"ඔයාට ගොඩක් පින් නෝනේ"

අනූ ඒ ගෙදර හිටපු අම්මාට වැන්දේ තමන්ගේ හැඟීමට.

"කෝ බබාලා අද නැද්ද"

"ඉන්නවා ඉන්නවා. පුතා..."

දරුවෝ දෙන්නම එළියට දුවගෙන ආවා.

sinhalaebooks.com

ඉඳගෙන හිටපු අනුගේ ඔඩොක්කුවේ ඇවිත් පොඩි ළමයා නම් වාඩි වුණේ පුරුදු කාරයෙක් වගේ.

"ආ... මේක ගන්න"

අනු ගත්ත චොක්ලට් දෙක ඒ ළමයි දෙන්නට දුන්නා.

ළමයින්ගේ සතුටෙන් පිරුණු මූණ දකිද්දි අනුටත් සතුටුයි.

ටිකක් වෙලා කතා කර කර හිටපු අනු ඒ ගෙදරින් තේ එහෙමත් බීලායි එළියට බැස්සේ.

මේ හැමදේම නිශිත් බලාගෙන ඉන්නේ හරිම ආදරෙන්.

ඒ ගෙවල් ඉස්සරහම තියෙන බස් හෝල්ට් එකට ඇවිත් අනු ඉඳගත්තේ අව්ව ටිකක් අඩු වෙනකම්.

ඒත් එක්කම අර ගෙදර හිටපු ලොකු පිරිමි ළමයා බයිසිකලේ ආවේ අනුව ගිහින් දන්න.

අනු නම් ඒ ළමයාට පින් දීලා බයිසිකලේට නැග්ගේ බස් එකේ යන්නවත් සල්ලි තිබුණේ නැති වෙලාවක ඒ කරපු උදව්වට.

"පරිස්සමෙන් යන්න පුතා"

"හරි නැන්දේ මං යනෝ"

ගේ ඇතුලට ආව අනුට ඇහුණේ කව්රුහරි බෙල් කරන සද්දේ.

"මේ වෙලාවේ කව්ද"

එහෙම කියලා දොර අරිද්දි එතන හිටියේ නිශිත්.

“අයියේ....“

“මං ෆයිල් එකක් දාලා ගිහින්. ඒක් ගන්න ආවා“

“එහෙනම් අරන් එන්න. මං තේ හදන්නද“

“එපා නංගි දැන් බොන්න බෑ.

ඒ උනාට අනූ ඉක්මණට තේ හදන්න ලෑස්ති වුණා.

“නංගී...“

තමන්ගේ පිටිපස්සෙන්ම වගේ ඇහුණු කටහඬට අනූ නම් ගැස්සුණා.

“අයියේ...“

“මාව විශ්වාසයිද“

“අනේ ඇයි එහෙම අහන්නේ. විශ්වාසයි“

“එහෙනම් ටිකකට ඇස් පියාගෙන මාත් එක්ක එනවාද“

අනූගේ ඇස් ලොකු වෙන්න වැඩි වෙලා ගියේ නෑ.

“ඇ... යි....“

“එන්නකෝ ඉතිං“

අනූ ඇස් වහගත්තාම එයාව පරිස්සමෙන් කෑම මේසේ ළඟට නිශිත් එක්කගෙන ආවා.

“ඇස් අරින්න“

අනූ ඇස් ඇරියා.

“අනේ අයියේ.....“

අනූගේ මූණ පුදුමෙන් පිරිලා.

ලස්සනම ලස්සන පුංචි කේක් එකක් මැද ඉටිපන්දමක් පත්තු කරලා. හරිම ලස්සනයි.

අනූ කවදවත් බලාපොරොත්තු වුණේ නැති දෙයක් නිසාම ඇස් වලට කඳුළු පිරුණේ බලාගෙන ඉද්දි.

ඒ මූණේ ඇඳුණු අහිංසක හිනාව නම් නිශිත්ට කවදවත් අමතක කරන්න බැරිවෙයි.

“ඔයා කොහොමද දන්නේ අද මගේ බර්ත්ඩේ එක කියලා“

“මං කොහොම හරි දන්නවනේ“

“දැන් කේක් එක කපන්න“

“අනේ ඒත්... ඇයි.. මේ... දේවල්“

“කපන්නකෝ ඉතිං“

අනූ කේක් එක කපලා නිශිත්ටත් කෑල්ලක් කැව්වේ සහෝදරකමට.

“හැපි බර්ත්ඩේ නංගී“

නිශිත් ඔළුවත් අතගාලා අනූට විශ් කළා.

“ම්.. මේක ගන්න මගෙන් පුංචි තෑග්ගක්...“

“තෑග්ගක්... මට..“

“තෑග්ගක් කිව්වාට ඒක ඔයාට අයිති දෙයක්. හැබැයි තෑග්ග බැලුවට පස්සේ මගෙන් බැණුම් අහන්න වෙනවා ඔයාට“

“අනේ මොකද්ද.. ඇයි බැනුම් අහන්නේ“

“ඉස්සෙල්ලා මේක බලලා ඉන්න“

අනූ හිමින් හිමින් ඒ පුංචි පෙට්ටිය ඇරලා බැලුවා.

හරිම අහිංසක විදියට නිශිත් දිහා බැලුවේ නිශිත් ඉණටත් අත් දෙක තියාගෙන අනූ දිහා බලාගෙන ඉද්දි.

“අයියේ.. මේ.. මේක....“

“ඔව් මේක තමා. ඇයි එහෙම කළේ අනූ. ඔයාට අයියා කෙනෙක් වගේ ඉන්න මගෙන් හරි සල්ලි ඉල්ලන්න තිබුණා“

“බඩු ටිකත් උස්සගෙන පයින්ම ඒ ගෙවල් වලට ගියා. ඔයාට මහන්සි නැද්ද. ඇයි මෙහෙම දුක් විඳින්නේ“

“අද කළේ ගොඩක් හොඳ වැඩක් තමා. ඒත්...“

“ඔයා මාව දැක්කාද“

“ඔව් දැක්ක නිසානේ කිව්වේ“

“මගේ අම්මා මාව පවුලෙන් අයින් කරලා. ඉතිං මට අත මාරුවක්වත් ඉල්ලගන්න කෙනෙක් නෑ“

“හේමන්ත අයියාගෙන් ඉල්ලන්න බෑ“

“මට එයා කන්න බොන්නවත් දෙන එකම ඇතිනේ“

“කීයක්වත් ළඟ තිබුණේ නෑ. පේන මානෙක තිබුණේ මේ කරාබු දෙක විතරයි“

“අනික මේ දෙක නැතිවුණා කියලා මං දිහා කව්රු බලන්නද අයියේ“

“හේමන්ත ඔයාට වියදමට සල්ලි දෙන්නේ නැද්ද නංගී“

“ගෙදරට බඩු ගේන්න දෙන සල්ලි වල ඉතුරු මං තිබ්බාම කාසි ටික මට තියලා එයා කොළ ටික ගන්නවා“

“මට සල්ලි ඉල්ලලා එයාට කරදර කරන්න බෑනේ අයියේ“

නිශිත් එයාගේ පර්ස් එක අරගෙන රු. 5000 නෝට්ටුවක් අරන් අනූගේ අතේ තිබ්බා.

“අනේ අයියේ එපා. මේක නම් කරන්න එපා.. මට මේක ගන්න බෑ“

“මේ අහන්න. ඕක දුන්නේ ණයට කියලා හිතන්න. තියෙන වෙලාවක මට දෙන්න“

“බඩු උස්සගෙන පයින් එච්චර දුරක් යන්න එන්න එපා නංගී. ඔයා පව්“

“කරදර අපි හැමෝටම එන අනිවාර්ය දෙයක්. ඒත් ඒක විඳිනවාද විඳවනවාද කියලා තීරණය කරන්න ඕනේ අපිමයි“

“ඔයා මගේම නංගි කෙනෙක් වගේ. මොනම හරි ප්‍රශ්නයක් තියෙනවා නම් මාත් එක්ක කතා කරන්න“

“මං දන්නවා ඔයා හේමන්තට විරුද්ධව කිසි දෙයක් කියන්නේ නෑ කියලා“

“ඒත් මොනවා හරි ඕනේ නම් මට කියන්න. තේරුණාද“

“මං යන්න ඕනේ. කේක් එක තියන්න එපා හේමන්ත දැක්කොත් ඔයාට ප්‍රශ්නයක් වෙයි. ඒකයි මං පුංචි එකක් ගෙනාවේ“

“ඒක පුංචි වුණාට මට ගොඩාක් වටිනවා අයියේ. පරිස්සමෙන් ගිහින් එන්න“

අනූ දණ ගහලා නිශිත්ට වැන්දේ නිශිත් පුදුම වෙද්දි.

“ඔයාට වරදින්නේ නෑ නංගි. හැමදෙයක්ම හරියයි. ඉවසීමෙන් ඉන්න ටික කාලයක්“

හ්ම්ම්ම්ම්ම්...

‘හේමන්ත අයියාවත් මගේ බර්ත්ඩේ එක දන්නේ නෑ. දැනගත්තත් මෙහෙම දෙයක් කරන්නේත් නෑ‘

‘නිශිත් අයියා කොහොමද දැනගත්තේ‘

‘පව්‘ අනූ එහෙම හිත හිතම මූළුතැන්ගේ පැත්තට ගියා.

“මගේ සැමී පැටියෝ මෙන්න ඔයාට කේක් තියෙනවා“

බලූ පැටියාට ඉතිං කෑම කිව්වොත් ඊට වඩා දෙයක් නෑනේ.

**.... 08**

ජීවිතේ කියන්නේ අපේ දෛවය ලියලා තියෙන පොතක් වගේ. ඒක අපි අමුතුවෙන් කියවන්න ඕනේ නෑ. දෛවයම අපට ඒ පාඩම් ටික ටික කියා දෙනවා.

දෙමව්පියන්ගේ සැනසීම වෙනුවෙන් තමන්ගේ ජීවිතේ බිලිදෙනකොට එයාලා ඒ ගැන වගේ වගක් නැතුව ඉන්නකොට තමන්ගේ මහත්තයා තමන්ව ප්‍රතික්ශේප කරනකොට මේ විශාල ගේ ඇතුලට වෙලා පැය ගණන් දවස් ගණන් ගෙවනකොට ජීවිතේ කියන්නේ මොකද්ද කියලා තේරෙනවා.

පුරුදු විදියටම දවස් ගෙවෙද්දි අනුගේ නම් සහනය වුණේ සැමී පූංචි බලූ පැටියා.

“උඹවත් මගේ ළඟට ආව එක කොච්චර දෙයක්ද. නැත්තම් මට කතා කරන්නවත් කෙනෙක් නෑනේ“

“මාව දලා යන්න එපා සැමී. හැමදාම මාත් එක්කම ඉන්න හොඳද“

sinhalaebooks.com

අනූ රෑ වැඩ ඉවර කරලා නිදගන්න යන්න කලින් හැමදාම කරන්නේ සැමීව හුරතල් කරන එක.

පුරුදු නැතම ඉඳගෙන දණිස් දෙක උඩ ඔළුවත් තියාගෙන අනූ පහළ පඩියට වෙලා දිග ඇරිලා ඉන්න සැමීව අතගාන ගමන් එයත් එක්ක කතාව.

හේමන්ත කාලා කාමරේට ගියාට පස්සේ කවදාවත් එළියට එන්නේ නෑ උදේ වෙනකම්.

නිශිත් හේමන්ත ඉන්න වෙලාවට වැඩි කතාවක් නැත්තේ අනූට ප්‍රශ්නයක් වෙයි කියලා හිතන නිසා. ඒත් ඉතිං අනූ සැමී එක්ක කතා කරන ඒවා නම් ගොඩක් වෙලාවට එයා අහගෙන ඉන්නවා.

“උඹයි මමයි දෙන්නම එක වගේ නේද. අපි දෙන්නම තනි වෙලා“

“උඹට කතා කරන්නවත් පුළුවන් වුණා නම් අපිට ගොඩක් දේවල් කතා කරන්න තිබුණා සැමී“

“අපි දෙන්නා මේ හැමදේම දාලා යමුද කොහේ හරි“

නිශිත් මේවා අහගෙන ඉන්නේ අනූ ළඟට ගිහින් එයාව වැළඳ ගන්න බැරිකමට.

“එහෙම යන්නත් බෑනේ ඉතිං. අපි ලෝකෙට පේන්න හරි මෙහෙම ඉන්න ඕනේනේ නේද“

“උඹට නිදිමතයි නේද“

“නිදා ගන්න එහෙනම්. මාත් නිදාගන්න යනවා“

මෙහෙම ඇහුණු ගමන් නිශිත් ඉක්මණට එතනින් ඉවත් වුණේ අනූ එයාව දකී කියලා.

‘හේමන්තව වෙනස් කරන්න බැරිවෙයිද මට. බැණුම් අහන්න හරි කතා කරලා බලනවා‘ නිශිත් හිතුවා.

********************************************
********

“මොකද කියන්නේ අපි කොහේ හරි ට්‍රිප් එකක් යමුද හේමන්ත“

“යමු යමු ගොඩක් කාලෙකින් ගියෙත් නැනේ“

උදේ කෑම මේසේදි නිශිත් කිව්වේ හේමන්තට.

“නංගිත් ඉතිං හැමදාම ගෙදරනේ. ඒ හින්දා වෙනසකටත් එක්ක යමු“

අනූ එනවා දැකපු නිශිත් එයාට ඇහෙන්න එහෙම කිව්වා.

“එයා ට්‍රිප් යන්න කැමති නෑ. යනවා නම් අපි දෙන්නා යමු“

පපුවට පිහියෙන් අනිනවා වගේ හේමන්ත ඒ කියපු කතාවට අනූට ගොඩක් දුක හිතුණා.

“අනේ ඔව් අයියේ මං ඇවිදින්න වැඩිය කැමති නෑ“

එහෙම කියලා අනූ ඉක්මණින් ආයෙත් මුළුතැන්ගේ පැත්තට ගියේ පුදුම කලකිරීමකින්.

මේ අතරේ නිශිත් හේමන්ත පිටත් වුණේ වැඩට යන්න.

“ඇයි බං උඹ අර කෙල්ලට ඔහොම කරන්නේ“

“දැන් මං මොකද්ද කළේ කියපංකෝ“

“උඹ ඒකිට සලකන්නේ හතුරෙකුට වගේනේ බං. ඒකී උඹේ ගෑණී“

“දැන් මට නැති අමාරුවක් උඹට ආවේ කොහොමද කියපංකෝ මගේ ගෑණි ගැන“

“උඹත් එක්ක කතා කරන්න බෑනේ බං පුදුම තදවිල්ලක්නේ“

“එහෙනම් කතා නොකර හිටපන්“

වාහනේ දෙන්නා වැඩට යනගමන් නිශිත් මේ දේවල් කතා කළේ වෙන වෙලාවක් හම්බෙන්නේ නැති නිසා.

“උඹට ඉස්සර මෙච්චරටම තද වුණේ නෑ බං. දැන් නිකං යකෙක් වැහිලා වගේනේ“

“ඔව් වැහිලා තමා ඉන්නේ. ඌ හරියට එළියට ආව දවසට මගේ අතින් එකෙක් මැරුම්කයි“

“හේමන්ත..“

නිශිත් කෑගැහුවේ අනූ ගැන බයක් දැණුන නිසා.

“උඹ මේ කසාදෙට අකමැති නම් ඇයි ඒක කළේ“

“කළේ නෑ. බලෙන් කෙරෙව්වා. මගේ ජීවිතේ විනාස කළා. උඹ දැන් මුකුත් දන්නේ නෑ වගේ කතා කරනවා“

sinhalaebooks.com

“එහෙම කියන්න එපා බං අනු නංගි උඹට වැරැද්දක් කරන්නේ නෑනේ“

“රෙද්ද තමා“

“දැන්වත් දරුවෙක් ගැන හිතපං හේමන්ත. තවත් ඇයි කල් දාන්නේ“

නිශිත් අනුට ආදරේ කළත් දෙන්නාව දෙපැත්තට කරලා අනුව ලබා ගන්න තරම් නිශිත් පහත් නෑ. එයාට ඕනේ වුණේම හේමන්තටවත් අනුවත් ආදරෙන් ළං කරන්න.

හේමන්ත කට පැත්තට කරලා නෝන්ඩි හිනාවක් දැම්මේ නිශිත්ට.

“කට වහගෙන යමන් බං. උදේම මගේ කේන්ති අවුස්සන්නේ නැතුව“

නිශිත් තවත් මුකුත් කතා කළේ නෑ.

*.... 09*

“හැමවෙලේම සල්ලි සල්ලි සල්ලි. මොන මගුලක්ද ඕයි මේ“

“තමුසේ සල්ලි වලින් මොනවාද කරන්නේ. දවල් තිස්සේ කොහේ යනවාද කව්ද දන්නේ ඉතිං නේද“

අනුට නම් තමන් ගැනම පුදුම දුකක් දැණුනා.

“හේමන්ත අයි....“

“කට වහගන්නවා කියවන්නේ නැතුව“

“මගෙන්ම කන්න බලන් ඉන්නේ නැතුව රස්සාවක් හොයාගන්නවකෝ මගුල“

හේමන්ත එයාගේ කාමරේ ඉඳලාම මහ සද්දෙන් කෑගැහුවේ ගෙදර තව කෙනෙක් ඉන්නවා නේද තමන්ගේ ගෑණිටමයි නේද ලැජ්ජා කියලාවත් හිතන්නේ නැතුව.

නිශිත් දැන් මේ ගෙදර ප්‍රශ්න ගොඩක් ඒවා දන්නවා. ඒ නිසා ඉතිං මේ රණ්ඩු එයාටත් අමුත්තක් නෑ. ඒත් අනූ ගැන පුදුම දුකකින් නිශිත් ඉන්නේ.

මොනවා කරන්නද කියන්නද කියලා හිතාගන්න බැරුව.

‘මූ මං ඉද්දිත් මෙහෙම නම් නැති කාලේ කොහොමද කියලා හිතාගන්නවත් බෑ‘

හැම සතියේම ගෙදරට ඕන කරන බඩු ගේන්න යන්නේ අනූ. එයා ජොබ් එකක් නොකරන නිසා සල්ලි ඉතිං හේමන්තගෙන් ඉල්ලන්නේ නැතුව වෙන කාගෙන් ඉල්ලන්නද?

‘ජීවිතේ මාව මෙච්චරටම පරීක්ෂා කරනවාද දෙයියනේ‘

‘එයාගේ අම්මාට ඕන නිසානේ මං ජොබ් එකෙන් අයින් වුණේ‘

‘මං දවල් තිස්සේ කොහේවත් යන්නේ නෑ අනේ‘

‘ඇයි මට මෙහෙම චෝදනා කරන්නේ‘

'බස් එකේ යන්නවත් සල්ලි නැති මං කොහොමද රවුම් ගහන්නේ'

අනූ එයාගේ පුරුදු තැනට ගිහින් ඉඳගත්තේ ජීවිතේ සැනසීම තියෙන එකම තැන ඒක හින්ද.

මේ අතරේ හේමන්තගේ උස් හඬ ඇහුණු නිශිත් පහළට ආවේ ඇයිද බලන්න.

හේමන්ත කියපු දේවල් ඇහුණු නිශිත්ට නම් කේන්තියක් ආවාත් කරන්න දෙයක් නැතිකමට ඉවසගෙන හිටියා.

බර සුසුම් හෙළ හෙළ පඩියට වෙලා ඉඳගෙන ඉන්න අනූව දැක්කාම නිශිත්ගේ පපුවට දැණුන ඒ හැඟීම එයාටවත් තේරුම් ගන්න බැරි වුණා.

'ටිකක් ඉවසලා ඉන්න නංගී. හැමදේම හරියයි දවසක' නිශිත් හිතුවා.

'රස්සාවක් හොයා ගන්න කියලා හේමන්තම කියනවා නම් මට කන්න දෙන එකත් එයාට ප්‍රශ්නයක් නම් මං කොහොම හරි රස්සාවක් හොයා ගන්නම ඕනේ'

අනූට මතක් වුණේ එයාගේ බාප්පා කියපු දේ.

"දැන් රස්සාවක් හොයාගත්තොත් නරකද උඹ. මං මල්ලි ගැනත් බලන්න ඕනේනේ"

"උඹ ගැන විතරක් හිතලා බෑනේ. මිනිහෙක් එක්ක යනකම් සල්ලි හොයපං"

“මං රස්සාවක් හොයාගන්නම් බාප්පේ“

“මාව හැමෝටම බරක් වෙලා සැමී“

“මං මහා පව්කාරියක්“

මෙහෙම හිතපු අනූ හේමන්ත නිශිත් දෙන්නාම වැඩට යනකම් ඉඳලා ටවුන් එක පැත්තට ගියේ අද දවසම ඇවිදලා හරි රස්සාවක් හොයා ගන්නවා කියලා හිතාගෙන.

පයින් ඇවිදලා ඇවිදලා මහන්සියටම අනූට නම් කලන්තේ වගේ.

‘කී තැනකට ගියාද. එකක්වත් හරිගියේ නෑනේ‘

‘අනේ දෙයියනේ පිං සිද්ධවෙයි මට මාර්ගයක් පෙන්නලා දෙන්නකෝ‘

අනූ හිතින් හඬා වැටුණා.

වටපිට බලපු අනූ දැක්කේ පාර එහා පැත්තේ මේ මුළු පළාතටම පිහිටලා තියෙන ලොකුම හෝටලය. රන්මල් හෝටලය.

කොණ්ඩෙත් අත් දෙකෙන්ම හදාගෙන ඉක්මණට ලේන්සුව අරගෙන මූණත් පිහදාගෙන එයා හෝටලය ඇතුලට ගියා.

එතන හිටපු කළමණාකාරවරයා හමු වුණු අනූ නම් එළියට ආවේ සතුටින්.

අනූට එන්න යන්න පුළුවන් වෙලාවල්වලට මෙයාලා කැමති වුණ නිසා අනූට නම් ඊට වඩා දෙයක් නෑ.

මොන දෙයක් වුණත් ගෙදර වැඩ අතපසු කරන්න අනූ කැමති නෑ. මේ නිසාමයි උදේ නවයේ ඉඳන් දවල් 4 වෙනකම් වැඩ කරන්න කතා කරගත්තේ.

උදේ ගෙදර වැඩ ඉවර කරලා හෝටලේ වැඩ කරලා ආයෙත් හවස වැඩ පටන් ගන්න වෙලාව තියලා ගෙදර යන නිසා ඒ වැඩවලටත් බාධාවක් නෑ.

‘‘හේමන්ත අයියේ...‘‘

‘‘මොකද‘‘

‘‘මං ජොබ් එකක් හොයාගත්තා‘‘

‘‘ඉතිං‘‘

‘‘නෑ මං හෙට ඉඳන් යනවා කියන්න ඕනේ වුණේ‘‘

‘‘ඕන මගුලක යනවා මට මොකද ඉතිං‘‘

හ්ම්ම්ම්ම්ම්....

හේමන්ත ගෙදර එනකල් බලාගෙන හිටපු අනූ ඒ ආරංචිය හේමන්තට කිව්වේ රස්සාව මොකක් වුණත් මොන තරාතිරමේ වුණත් අඩුම තරමේ වචනෙකින් හරි සුභ පතයි කියලා හිතලා.

මේක ඇහුණු නිශිත් තමා එයාගෙන් විස්තර ඇහුවේ.

‘‘කොහේද හම්බුණේ නංගී‘‘

‘‘අයියේ අර ටවුන් එකේ රන්මල් හෝටෙල් එකේ‘‘

sinhalaebooks.com

"හොටෙල් එකේ?"

"ඔව් මේ.... මේ... එකවුන්ට්ස් හදන්න එන්න කිව්වා"

"ආ ඉතිං හොඳයිනේ එහෙනම්"

මේක ඇහුණු හේමන්තට නම් තරහයි.

"ගෙදර වැඩ කරන්න තව ගෑණියෙක් ගන්න වෙයිද දන්නේ නෑ"

කාමරේ ඉඳන්ම හේමන්ත කෑගහද්දි නිශිත් ඒ පැත්තට හැරුණේ බනින්න කට හදාගෙන.

අනූ ඔළුව හොලවලා එපා කිව්වේ නැති ප්‍රශ්න ඇති කරගන්න අකමැති නිසා.

"මං වෙලාව හදාගත්තා උදේ 9 හවස 4. ඒ හින්දා ගෙදර වැඩ කරන්න පුළුවන්"

"යකෝ ඒක මරු තැනනේ. එකවුන්ට්ස් හදන්නමද දන්නේ නෑ.."

"හොටෙල් එකක්නේ.. එකවුන්ට්ස් එක්කම තව එකක් කරගන්න බැරියෑ"

හේමන්ත නෝන්ඩියට වගේ කිව්වා.

නිශිත් දිහාත් බලපු අනූ නම් මේවා අහන් ඉන්න බැරි නිසා දුවලා ගියේ එයාගේ පුරුදු තැනට.

"තෝ නම් මහ සතෙක් බං" නිශිත් කිව්වේ එච්චරයි.

'කවුරු මොන දේවල් කිව්වත් මං හිතා වෙලා ඉන්නවා. මට මොන දෙයක් කලත් මං ඒ දේවල් දරා ගන්නවා.  කොච්චර තනි වුණත් සතුටින් ඉන්න මට පුළුවන්'

මෙච්චර වෙලා අඩපු අනූ අන්තිමට හිතුවේ එහෙමයි.

*************************************************
*****

අනූ රැකියාවට ගිහින් දැන් සතියකටත් වැඩියි. ලොකු වැටුපක් නැති වුණත් සතිපතාම වැටුප් ගෙවන්න කැමති වුණ නිසා අනූට නම් ඒක ලොකු දෙයක්.

මේ රැකියාව නිසාම අනූට දැන් ගොඩක් මහන්සියි. ඒත් ගෑණියෙක් වුණාම හැමදේම දරාගෙන ඉන්න ඕනේනේ. ඉතිං කාටවත් වැරැද්දක් නොකියා එයා එයාගේ පාඩුවේ රස්සාවට ගියා.

"නංගි කෙට්ටු වෙලා. අතුත් සුදුමැලි වෙලා. මූකුත් අසනීපයක්වත්ද"

නිශිත් නම් පුළුවන් හැමවෙලාවකම කෙල්ලට ප්‍රශ්නයක් ඇති නොවෙන විදියට එයා ගැන හොයලා බැලුවා.

නිශිත්ගේ හිතේ ඇත්තටම අනූ ගැන ආදරයක් තියෙනවා.

'මට ඔයාට ආදරේ කරන්නවත් ඒක පෙන්නන්නවත් විදියක් නෑ අනූ..'

'ඔයාගේ හිතට ආදරේ කරන්න මට කිසිම තහනමක් නෑ...'

‘ඒ වගේම ඒක එයාට කියන්න ඕනේමත් නෑ...‘

‘සදහටම හිතෙන් ආදරේ කරන්න මට පුළුවන්... ‘

“ඉඳගෙනම ඉඳලා කෙට්ටු වෙලා අයියේ“

අනූ කියලා දැම්මා.

නිශිත්ට මතක් වුණේ අනූව බලන්න හේමන්ත එක්ක ගියපු දවසේ කෙල්ල ලස්සනට හිටපු හැටි. මනමාලි වෙලා ආපු දවසේ වගේ නෙමෙයි දැන් කෙල්ල හොඳටම කෙට්ටු වෙලා ඇදිලා ගිහිල්ලා.

‘ඔයාව මට හම්බුණා නම් මං ඔයාව ගොඩක් ආදරෙන් බලාගන්නවා කෙල්ලේ. ඒත් දැන් මොනවා කරන්නද‘

නිශිත් හිතුවේ දුකින්.

එදා පළවෙනි දවසේ නිශිත් අනූව දැක්කාම හදවතට දැණුනු ඒ ගැස්ම එයාට හොඳටම දැණුනා. ජීවිතේ පළවෙනි පාරට තමන්ගේ යාළුවා ගැන අහිතක් හිතුවා. ඒ අනූ නිසා.

අනූ වගේ අහිංසක ලස්සන කෙල්ලෙක් තමන්ගේ කර ගන්න මොන කොල්ලද අකමැති.

ඒත් දැන් ඒ හැමදේම අතීතයක් විතරයි.

“ඉඳගෙන ඉන්නකොට කෙට්ටු වෙනවා කියලා ඇහුවමයි“

අනූ හිනාවුණා.

ඒ හිනාව හරි ලස්සනයි.

sinhalaebooks.com

**.... 10**

"අවුරුදුත් එනවා සැමී"

"අපි අවුරුද්දට මොනවාද හදන්නේ......"

"ම්ම්ම්ම්ම් කැවුම්, කොකිස්, අළුවා, එතකොට තව..... ආ මට පුළුවන් අතිරස හදන්න"

"උඹටත් ඉතිං ඒවාම තමා කන්න වෙන්නේ හොඳද"

අවුරුදු කියන්නේ මිනිස්සු හිතේ තියෙන තරහා අමතක කරලා දන දවසක්.

"හේමන්ත අයියාත් මාත් එක්ක තියෙන තරහා අමතක කරලා දයි නේද සැමී"

අනූගේ ඉතිං යාළුවා සැමීනේ. එයාගෙන් උත්තර නැති වුණොට අනූ එයත් එක්ක කතාව.

“මං හෙට ගිහින් ඕන කරන බඩු අරගෙන එන්නම්. අපි දෙන්නා හදමුකෝ නේද“

අනූ රැකියාවට ගිහින් ටික කාලයක් වුණත් එයාට ලැබුණු වැටුප එයා එකතු කර ගත්ත නිසා අවුරුද්දට හේමන්තගෙන් ඉල්ලන්නේ නැතුව ඒක වියදම් කරන්න අනූ කල්පනා කළා.

ටවුන් එකට ගිහින් ඕන කරන බඩු හැමදේම අනූ අරගෙන ආවා. අනූ එයාට අළුත් ඇඳුමක්වත් ගත්තේ නෑ. මොකද මහා ලොකු සල්ලියක් එයා ළඟ නැති නිසා.

හේමන්තගෙන් පොඩි හරි උදව්වක් නැති නිසා අනූ එයාට පුළුවන් විදියට ගෙදර පිරිසිදු කරගන්න වැඩ හැමදෙයක්ම කරගත්තා දෙන්නා ගෙදර නැති වෙලාවට.

මොකද නිශිත් අයියා හිටියොත් උදව් කරන්න එනවා කියලා අනූ දන්නවා.

“ගෙදරම සුවඳයිනේ“

“මං කැවිලි ටිකක් හැඳුවා අයියේ“

“එහෙනම් මේපාර අපිට අවුරුදු සරුයි නේද හේමන්ත“

“හ්ම්ම්ම්“

හේමන්තගෙන් නම් වචනයක් ගන්නවා කියන්නේ ඉතිං ඉබ්බාගෙන් පිහාටු ගන්නවා වගේ කියලා අනූ නම් දන්නවා.

නිශිත් අවුරුද්දට ගෙදර යන්න හිතුවේ නැත්තේ අනූ හින්දමයි. ළඟදී ගෙදර ගිහින් ආව නිසාම එයා අවුරුද්දට ගෙදර එන්නේ නෑ කියලා එයාගේ අම්මාට කිව්වා.

නිශිත් ටවුන් එකට ගිහින් හේමන්තට වගේම අනූටත් ඇඳුම් තෝර ගත්තේ අනූට නම් ඇඳුමකට වත් වියදම් කරන්න තරම් සල්ලි නැති නිසා.

“හේමන්ත.... නංගී....... පොඩ්ඩක් මෙහෙට එනවාද“

හේමන්තයි අනූයි දෙන්නාම සාලෙට ආවේ නිශිත් කෑගහන්නේ මොකද බලන්න.

“මේක හේමන්තට මගෙන් පොඩි තෑග්ගක්“

“ඒ මට මොකටද බං තෑගි“

“හරි හරි ආයේ නෑ මේ පාර විතරයි“

“නංගී මේක ඔයාට“

“අනේ මට...... ගොඩක් පිං අයියේ“

“ලස්සනයි...“

අනූගේ ඇස් වල තිබුණු සතුට නිශිත්ගේ හදවතටම දැණුනා.

“දෙන්නාටම මදි නම් මාරු කරගන්න පුළුවන්. මගේ ළඟ බිල් තියෙනවා“

“උඹට පිස්සුනේ බොරුවට වියදම් කරනවා නිශිත්“

“බොරුවට කියන්නේ කොහොමද. උඹ ඉතිං මගේ සහෝදරයා වගේ තමා“

“මං කිව්වේ මෙයාට. මෙයාට මොකටද තෑගි ගත්තේ“

අනුට නිශිත් දිහා බැලුණෙත් අනූ නිශිත් දිහා බැලුවෙත් එකටමයි.

අනූ පුදුම තරම් අසරණ වුණා හේමන්තගේ කතාවෙන්.

“අනේ ඔව් අයියේ. මට මොකටද තෑගි ඉතිං“

“මට උඹලා දෙන්නාම එකයි“

එහෙම කියපු නිශිත් තරහෙන්ම එයාගේ කාමරේට ගියා.

‘මූ මෙච්චරටම නපුරු ඇයි දෙයියනේ. මේ කෙල්ලට මෙච්චරටම මූ වෛර කරනවා නම් මුන් දෙන්නා අතරේ......‘

‘මූ කෙල්ලගෙන් වැඩෙත් කරගෙන ඒකිට මෙහෙම සලකන්නේ ඇයි‘

‘මට තේරෙන්නේ නෑ‘

නිශිත් කල්පනා කළේ දෙන්නගේ බැඳීම ගැන.

“සැමී මේ දැක්කද මේක හරිම ලස්සනයි නේද“

අනූ නිශිත් ගෙනත් දීපු ගවුම ඇඟට තිය තිය කැරකි කැරකී සැමීට හැඩ පෙන්නනවා.

එයාගේ හැඩ වෙන කව්රු බලන්නද ඉතිං. තමන්ගේ මහත්තයාට බිරිඳව පෙන්නන්න බෑ. තවත් මොනවාද ඉතිං..

‘‘නිශිත් අයියා ගෙනත් දුන්නේ මේක‘‘

‘‘එයා හරි පව් සැමී. දවසක එයාව ලැබෙන කෙනා හරි වාසනාවන්තයි‘‘

නිශිත් මේ හැමදේම අහගෙන.

අනූ සැමී එක්ක කතා කරන බව දන්න නිසාම නිශිත් හරි ආසයි ඒ කතාබහට ඇහුම්කන් දෙන්න. නරක පුරුද්දක් තමා අනූන්ගේ දේවල් අහන් ඉන්න එක.

ඒත් නිශිත්ට අනූ එක්ක කතාබහ කරන්න බැරිකමට අනූගේ හිතේ තියෙන දේවල් දැනගන්න ඕනකමට එයා මේ කතා පුළුවන් වෙලාවට අහගෙන ඉන්නවා.

************************************************************

අවුරුදු දවසත් උදා වෙලා. අනූ උදේම නැගිටලා නිශිත් දීපු ඇඳුම ඇඳගත්තේ එයාට හිතෙන්ම පින් දීලා.

නැකැත් වෙලාවල් ටිකත් බලාගෙන අනූ ළඟ ළඟියේ ඒ දේවල් වලට සූදානම් වුණා.

අනූගෙත් හේමන්තගෙත් විවාහයෙන් පස්සේ එළඹෙන පළවෙනි අළුත් අවුරුද්ද.

අනූ පරණ හැමදේම අමතක කරලා අද දවස සතුටින් ගතකරන්න හිතාගත්තේ ජීවිතේ තියෙන ආසාවන් පොදි බැඳගෙන.

කලින්ම හොයාගෙන තිබුණු පොඩි ගඩොල් තුන තියලා ගේ මැද ලස්සනට ලිපක් හැදුවා. පුංචි කිරි මුට්ටියක් ලිපි ළඟින්ම තිබ්බේ හේමන්තට ලිප ගිනි මොලවන්න දෙන්න.

නිශිත් ලෑස්තිවෙලා ඉක්මණට පහළට ආවේ ගෙදරින් පිට සමරන පළවෙනි අවුරුද්ද නිසා.

ඒ වෙනකොටත් අනු හැමදේම ලෑස්ති කරලා කියලා නිශිත් දැක්කා.

'ලස්සනයි'

අනු නිශිත් දීපු ඇඳුමත් ඇඳගෙන එතනට එද්දි නිශිත්ට හිතුණා.

"කිරියෙන් පැණියෙන් ඉතිරෙන සුභම සුභ අළුත් අවුරුද්දක් අයියේ ඔයාලා දෙන්නාටම"

අත් දෙක එකතු කරලා අනු එහෙම සුබ පැතුවේ නිශිත්වත් හේමන්තවත් දැකපු නිසා.

"අපෝ උඹේ අවුරුද්දම ඉවරයි ඉතිං"

ගත් කටටම හේමන්ත එහෙම කිව්වාම අනුට දැණුනේ එයාට පිහියෙන් අනිනවා වගේ.

සුභම සුභ අළුත් අවුරුද්දක් මහත්තයෝ කියලා දවසක සුබ පතන්න අනුගේ හිතේ තිබුණු බලාපොරොත්තු හීනයක්ම විතරයි.

'මාත් එක්ක මෙච්චර වෛරයක් ඔයාගේ හිතේ තියෙනවාද හේමන්ත අයියේ' අනූ හිතුවේ දුකෙන්.

අනූ මහා බර සුසුමක් හෙලද්දි නිශිත්ට කර කියා ගන්න දෙයක් නැතුව ගියා.

"ඔයාටත් සුබම සුබ අළුත් අවුරුද්දක් නංගී"

"හේමන්ත අයියේ වෙලාව හරි. ලිපි පත්තු කරන්න"

"ජීවිතේම කාලා ලිපි පත්තු කරන්නළු"

ඇහෙන නෑහෙන ගාණට එහෙම කියපු හේමන්ත ලිප පත්තු කළා.

අනූ එතනින් නැගිටලා යන්න ගියේ අවුරුද්ද දවසේවත් හේමන්තගේ හිත කඩන්න ඕන නැති නිසා.

'මේ වගේ මිනිහෙක් ඇත්තමයි කණ පැලෙන්න ගහන්න හිතෙනවා'

'අර කෙල්ලට රිද්දන තරමක්'

නිශිත්ට මේ දේවල් ඇහෙද්දි කේන්ති ආවාත් එයා ඉවසුවේ අද සුබ දවසක් නිසා.

අනූ ඉක්මණින් කිරිබතක් එක්ක ලුනු මිරිසක් හදලා කැවිලි වර්ග එක්කම ලස්සනට කෑම මේසේ පිළියෙල කළේ ඊළඟ නැකැත් වෙලාවට.

අනූ වතුර කේතලෙත් ගහලා එතෙන්ට වෙලා බලාගෙන හිටියේ කට්ටියටම තේ හදන්න.

sinhalaebooks.com

'මගේ ජීවිතේ මෙච්චරටම මම පව් කරලාද දෙවියනේ'

'මගේ මහත්තයා ඇයි මට මෙහෙම සලකන්නේ'

'එයාගේ ආදරේ උදුරගත්තේ මම නෙමෙයිනේ'

අනූගේ කල්පනා ලෝකේ බිඳුනේ කේතලේ තලා සද්දෙට.

''නංගි ඉක්මණට එන්න තව විනාඩි පහයි තියෙන්නේ''

නැකැත් වෙලාව ළඟ නිසාම ඉක්මණින් තේ තුනකුත් හදාගෙන අනූ ගියේ කෑම මේසෙට.

''එයා නැකැත් කරන්නේ නෑ''

හේමන්ත එහෙම කිව්වේ අනූ එයාලත් එක්කම කෑම මේසේට ඉඳගයි කියලා හිතලා.

අනූට ඒක තේරුණා.

''අනේ ඔව් අයියේ. මං ගෙදර ඉද්දිත් නැකැත් කරන්නේ නෑ. ඔයාලා කන්නකෝ''

''ඕන දෙයක් තිබුනොත් කතා කරන්න''

අනූගේ පපුවේ වේදනාව පිටට පෙනෙයි කියලා හිතලා ඉක්මණින් එතනින් ආවා.

'මං හිතුවා අවුරුදු දවස නිසාවත් මට ආදරෙන් සලකයි කියලා'

'එහෙම නෑ නේද'

'මං මෙච්චරටම පව් කරලාද දෙයියනේ'

'මගෙයි වැරැද්ද මේ දේවල් බලාපොරොත්තු වුණ'

ලොකු හුස්මක් ගත්ත අනූ පිඟානකට කිරිබත් කෑලි 2ක් අනික් රසකැවිලිත් දාගෙන ගිහින් ඉඳගත්තේ එයාගේ සුපුරුදු තැන.

''ඔන්න සැමී ඔයයි මමයි අවුරුදු සමරන්නේ හොඳද''

''නැකැත් වෙලාව ආවම මං උඹට කවන්නම්. එතකල් චුට්ටක් ඉවසලා ඉන්න ඕනේ හොඳ කොල්ලා වගේ''

මේ අතරේ නිශිත් වතුර වීදුරුවක් අරගෙන එන්නම් කියලා කෑම මේසෙන් නැගිටලා ආවේ අනූ මොකද කරන්නේ බලන්න.

අනූ කියපු දේවල් ඇහුණු නිශිත්ට පුදුම දුකක් දැණුනා.

වට පිටාවේ රතිඤ්ඤා ගහන හඩින්ම නැකැත් උදා වෙලා කියලා තේරුම්ගත්තු නිශිත් අනූ හිතන්නත් කලින් එයාගේ පිඟානේ තිබුණු කිරිබත් කෑල්ලක් අරගෙන අනූට කැව්වා.

අනූට වුණේ මොකද්ද කියලා හිතාගන්න බැරුව ගියා.

අනූගේ ඔළුව අතගාපු නිශිත් ඉක්මණට කෑම මේසෙට ගියේ හේමන්ත එතන නිසා.

'නිශිත් අයියේ ඇයි මට මෙහෙම කරන්නේ ඔයා'

අනූට නිශිත් ගැන දැණුනේ පුදුම අනුකම්පාවක්. කසාද සහතිකේට හරි තමන්ගේ මහත්තයාවත් නොකරන දේවල් ඇයි එයා කරන්නේ...

තමන්ගේ මහත්තයාත් එක්ක කිරි උතුරවන්න, කෑම මේසේට වාඩි වෙලා දෙන්නාට දෙන්නා කෑම කවාගන්න, නෑගම් යන්න තිබුණු ආසාවත් හිතට විතරක් සීමා වෙලා.

*.... 11*

අවුරුද්දෙන් පස්සේ නිශිත්ට හදිසියේම ගෙදර යන්න වුණේ එයාගේ අම්මාට අසනීප වුණු නිසා. සතියක් විතරම වැඩට එන්නත් බැරි වුණා.

අම්මාට දැන් ටිකක් සුව නිසාම අද උදේම ගෙදරින් පිටත් වෙලා ආවේ හෙටවත් වැඩට යන්න සූදානම් වෙන්න.

හේමන්තගේ ගෙදරටම ගියාමයි මතක් වුණේ අනූත් දැන් වැඩට යන නිසා ගෙදර කව්රුත් නෑනේ කියලා.

'මොකද කරන්නේ. මගේ ළඟ ඉතිං යතුරක්වත් නෑනේ'

'අනූට කෝල් කළොත්...'

'නෑ... ඒක හරි නෑ. අනික එහෙම වුණොත් එයා ගෙදර දුවගෙන එයි'

'එතෙන්ට ගිහින් යතුර ඉල්ලගෙනම එනවා'

හේමන්තට නිශිත්ව එයාටත් වඩා විශ්වාසයි. නැත්නම් එයාව ඒ ගෙදර නවත්තගන්නේ නෑනේ තරුණ බිරිඳක් ඉද්දිත්.

නිශිත් ගියේ අනූ රැකියාව කරන රන්මල් හෝටෙල් එකට.

“එක්ස්කියුස්මී මිස්“

“යර්ස් සර්..“

“මට මිස් අනුලිව ටිකකට මීට් වෙන්න පුළුවන් වෙයිද“

“මිස් අනුලි? එහෙම කෙනෙක් මතක නෑනේ සර්“

“ඔව් අර එකවුන්ට්ස් වලට ගත්ත අළුත් කෙනා. අනුලි විජේසිංහ“

“එකවුන්ට්ස් වලට... හොඳටම ෂුවර්ද“

“ඔව්.. ඇයි එහෙම කෙනෙක් නැද්ද“

“නෑ සර් දැන් එකවුන්ට්ස් කරන කෙනා තමා මෙහේ ඉන්න සීනියර්ම කෙනා. එයා අළුත් කෙනෙක් නෙමෙයි“

“එහෙමද.. කව්රුත් අළුතෙන් ආවේ නැද්ද දැන් සති දෙකකට විතර කලින්“

“ආ කෙනෙක් නම් ආවා. එයාගේ නම නම් මතක නෑ. හැබැයි එයා ආවේ නම් කිචන් එකට“

“කිචන් එකට...?“

නිශිත් පුදුම වුණා.

“මං එතෙන්ට ගියාට කමක් නැද්ද මිස්...“

නිශිත් කොහොම හරි කියලා කියලා මැනේජර් එක්කම ගියේ කිචන් එක පැත්තට.

‘අනූ‘

නිශිත් තමන්ටම මුමුණ ගත්තේ දැකපු දර්ශනේට.

ඒප්‍රන් එකක් දාගෙන දඩිය බිංදු අතින් පිහ පිහ පිගන් හෝදනවා. වෙන කව්රුත් නෙමෙයි ඒ අනූමයි.

විනාඩි ගාණක්ම නිශිත් ඒ දිහා බලාගෙන හිටියේ උහුලගන්න බැරි වේදනාවකින්.

“මගෙන්ම කන්න බලන් ඉන්නේ නැතුව රස්සාවක් හොයාගන්නවකෝ මගුල“ එදා හේමන්ත කෙල්ලට කෑගැහුව හැටි...

“නංගි කෙට්ටු වෙලා. අතුත් සුදුමැලි වෙලා. මූකුත් අසනීපයක්වත්ද“ කිව්වාම

“ඉඳගෙනම ඉඳලා කෙට්ටු වෙලා අයියේ“ කියලා අනූ කියපු හැටි. මේ හැමදේම නිශිත්ට මතක් වුණා.

හේමන්තගේ බැණුම්, ගුටි මේ හැමදේටම මූණ දීලාත් තාමත් වෙනසක් නැතුව හේමන්තට එයාගේ යුතුකම් ඉෂ්ට කරන අනූ ගැන පුදුම දූකක් දැණුනා.

උදේ පාන්දර නැගිටලා උයලා ගෙදර වැඩ කරලා මෙහේ ඇවිත් මේ වැඩත් කරලා ආයේමත් ගෙදර ගිහින් ගෙදර වැඩත් කරලා රෑ 10ට විතර නින්දට යනකම් කෙල්ලට ඉඳගන්නවත් නෑ.

දවස් ගාණක්ම මුළුතැන්ගේ පඩිය උඩ ඉඳගෙන කකුල් අතගාගන්නවා නිශිත් දැක්කාත් ඒ ගැන වැඩිය හිතුවේ නැත්තේ මෙහෙම දෙයක් හීනෙකින්වත් හිතුවේ නැති නිසා.

sinhalaebooks.com

ඒත් දැන් ඒකට හේතුව එයා දන්නවා.

තමන් දිහා කව්රු හරි බලන් ඉන්නවා කියලා දැණුනු නිසාම අනූ හැරිලා බැලුවා.

දැකපු දෙයින් ඇස් උඩ යන්න වැඩි වෙලාවක් ගියේ නෑ. හෝද හෝද හිටපු පිඟාන අනූනවයෙන් බේරුණේ බිම නොවැටී.

අනූ ඉක්මණට දගෙන හිටපු ඒප්‍රන් එකෙන් අත් දෙකත් පිහදලා ඒක ගලවලා තියලා ආවේ නිශිත් ළඟට.

“අයි...යේ...“

කතා කරන්න එපා කියලා අතින් සන් කරපු නිශිත්ගේ නපුරු මූණ දැක්කාම අනූට දඩිය දැම්මා.

“වචනයක්වත් කතා කරන්න එපා එනවා ගෙදර යන්න“

“අනේ අයියේ මං කිය....“

“මට තරහා ගියොත් හේමන්ත වගේ නෙමෙයි තේරුණාද“

“කරුණාකරලා යනවා වාහනේට“

නිශිත්ට අනූ හිටපු හැටි දැකලා දැණුනු දුක කේන්තියක් වෙන්න විනාඩියක් ගියේ නෑ.

අනිත් අයට නොතේරෙන්න දත්මිටි කකා නිශිත් අනූට යන්න කිව්වේ වාහනේට.

අනූ ඉක්මණට එතන හිටපු මැනේජර්ට බොරුවක් කියලා නිශිත් එක්කම ගෙදර යන්න ආවා.

“අයියේ ටිකක් මං කියනදේ අහන්නකෝ“

නිශිත්ගේ හිතේ අනූ ගැන ආදරයක් තියෙන බව ඇත්ත. ඒත් නිශිත් කවදාවත් ඒක එයාට දැනෙන්න තිබ්බේ නෑ. තමන්ගේම සහෝදරියකට වගේ සැලකුවා.

ඒත් අද දැකපු දේ. දඩිය දාගෙන පිඟන් හෝදන හැටි දැක්කාම නිශිත්ගේ පපුව හෝස් ගාලා ගියා.

දුප්පත් කෙනෙක් නම් කමක් නෑ. ඒත් හේමන්ත කෝටිපතියෙක් නොවුණත් සල්ලි වලින් අඩුවක් එයාට තිබුණේ නෑ. එහෙම කෙනෙක්ගේ වයිෆ් මෙහෙම හෝටල් වල පිඟන් හෝදනවා කිව්වාම තවත් මොනවා හිතන්නද?

හේමන්ත අනූට මුදල් දෙන්නේ නැත්තේ එයත් එක්ක තියෙන තරහට මිසක් සල්ලි නැතිකමට නෙමෙයි.

“මං බොරු කිව්වා තමා. ඒත්...“

“අනූ ප්ලීස් ටිකක් කට වහගෙන ඉන්න“

වාහනේ එනකම්ම නිශිත් නම් එතනින් එහාට වචනයක්වත් කතා කළේ නෑ.

අනූ දන්නවා එයා එහෙම ඉන්නේ තමන් බොරුවක් කරපු නිසා කියලා.

ගෙදර ගිය ගමන්ම නිශිත් අනූගේ බාහුවෙන් අල්ලගත්තේ රිදෙන්නම.

“කියනවා ඇයි බොරු කිව්වේ“

“ඇයි ඔය වගේ දේකට කැමති වුණේ“

“තමුසේ හේමන්තගේ වයිෆ් මිසක් වැඩකාරියක් නෙමෙයි“

“බලනවා තමුන්ගේ අත්වල හැටි“

“ෂිට් මට තියෙන කේන්තියට තමුසේට දෙන්න හිතෙනවා කණ පැලෙන්න ඇත්තමයි“

“මං වෙන මොනවා කරන්නද අයියේ“

“හේමන්ත අයියා මට නිකං කන්න දෙන්නත් අකමැති නම් මං වෙන මොනවා කරන්නද“

“තමුසේට වෙන රස්සාවක් හොයාගන්න තිබුණේම නැද්ද“

“තමුසේගේ අම්මායි තාත්තයි දන්නවා නම් තමන්ගේ ළමයා පිඟන් හෝදන්න යනවා කියලා“

“එයාලා මොනවත් කියන එකක් නෑ. පවුලෙන් මාව අයින් කරලා තියෙන එකේ“

“මට වෙන මොකද්ද කරන්න කියන්නේ අයියේ ඔයා“

“ඔයා හිතාගෙන ඉන්නේ අපි රස්සාවල් ඉල්ලගෙන යනකොට දෙන්න බලාගෙන කට්ටිය ඉන්නවා කියලාද“

අනූත් මෙච්චර දවසක් ඉවසගෙන හිටියා හැමදේම. එයාගෙත් ඉවසීම ඉවරවෙලා.

“රස්සාවක් හොයා ගනින් කියනකොට ඒ ඉක්මණට රස්සා දෙන්න කට්ටිය නෑ“

“ලේසියෙන්ම කරන්න පුළුවන් රස්සාවක් තිබුණට මං කැමති නෑ ඒක කරලා ගෙදර එන්න“

චටාස්

නිශිත් අනුට හිතන්නවත් වෙලාවක් නොදී අත දිගඇරලා දුන්නේ කම්මුල් පාරක්.

කම්මුලත් අල්ලගෙනම අනූ නිශිත් දිහා බැලුවා.

“ගහන්න අයියේ. ඔයත් ගහන්න. මං ඉන්නේ ගුටි කන්නයි බැණුම් අහන්නයි තමා“

“විඳවලා විඳවලා හරි මහන්සියි දැන් මට. මැරිලාවත් යනවා නම් එකක්“

“මං මොන පවක් කරලාද මෙහෙම මට දඬුවම් දෙන්නේ“

“අතඅරින්න පුළුවන්කමක් තිබුණා නම් මේ හැමදේම මං අතඇරලා ගොඩක් කල්“

“ඔයාලාට හැමදේම කියන්න ලේසියි. ඒත් අපිට එහෙම කරන්න අමාරුයි අයියේ“

නිශිත් අනුව ළඟට ඇදලා අරගෙන තුරුල් කරගත්තේ එයාට අත උස්සපු දුකට.

අනූ නම් පුදුම වෙලා අත් දෙකත් පහළට දාගෙන ඉන්නවා.

“මට සමාවෙන්න නංගී. ඔයා එහෙම ඉන්නවා දැක්කාම මට පුදුම දුකක් දැණුනා“

“ඊටත් වඩා ඔයා එහෙම කියද්දී මට කේන්ති ආවා“

නිශිත් අනුව තුරුලෙන් අයින් කරලා එයාගේ මූණ දිහාම බලාගෙන හිටියා.

"මේ අහන්න මං දන්නවා ඔයා දුක් විඳිනවා කියලා. ඔයා ඔහොම ඉන්න ඕන කෙනෙකුත් නෙමෙයි කියලා"

"මං මේ ගෙදරට ඇවිත් ටික කාලයයි. ඒත් දැන් ඔයා ජීවත් වෙන විදියෙන් මට හිතාගන්න පුළුවන් ඔයා කලිනුත් එහෙම තමා කියලා"

"හේමන්ත ඔයාට සලකන්නේ නැතුව නෙමෙයි. එයාටත් ප්‍රශ්න තියෙනවා"

හේමන්ත අනූ තරහා කරවන්නවත් දෙන්නා දෙපැත්තට කරලා අනූව ලබා ගන්නවත් නිශිත්ට ඕනේ නෑ.

"තරහාට කෑගහනවා තමා. ඌ අපිටත් එහෙමයි"

"ටිකක් ඉවසන්න. ආයෙත් ඒ රස්සාවට යන්න එපා. මං හේමන්ත එක්ක හිමීට මේ ගැන කතා කරන්නම්. ඒ හින්ද ඉවසලා ඉන්න"

"ඒ අතරේ මං හොඳ තැනක් බලන්නම්. එතකල් ටිකක් අපි ඉවසමු.."

"දැන් බැඳලා අවුරුද්දකටත් කිට්ටුයිනේ. මුගේ නපුරු ගති හැමදේම මගඇරිලා යයි දරුවෙක් ආවොත්"

"ඒ නිසා ඒ ගැන ටිකක් හිතලා බලන්න"

“මං ගැන වැරදියට හිතන්න එපා. ඔයා මගේම නංගි කෙනෙක් වගේ නිසයි කියන්නේ... හොඳද?“

නිශිත් අනුගේ ඔළුවත් අතගෑවා.

හ්ම්ම්ම්ම්ම්

‘මාත් ආසයි අයියේ මගේ තනියට දරු පැටියෙක්වත් එනවාට. ඒත් ඒ දේට වාසනාවක් නෑ මට‘ අනු තනියම හිතුවා.

*.... 12*

‘අඩන්න බැරිකමට හිනාවෙන මට මං ගැනම දුක හිතුනත් හිනා වුණා. හේතුවක් නැතුව හිනා වුණා. කෑගහලා අඩන්න බැරිකමට හිනා වුණා‘

‘මාත් හරි ලෝභයි ආදරේට, හැමතිස්සේම ආදරේ විඳින්න ආසයි, ආදරණීය පිරිමියෙක්ගේ සෙනෙහස ලබන්න ආසයි මම, ඒත් මට නැත්තෙත් ඒකමයි‘

එදා වුණු ප්‍රශ්නේ නිසා ආයෙත් රස්සාවට යන්නත් බැරුව අනු නම් හිතේ පීඩනේකින් හිටියේ.

‘හේමන්ත අයියා දැනගත්තොත් ලොකු ප්‍රශ්නයක් වෙයි‘

‘ඒත් මං මොකද්ද කරන්නේ‘

‘බැඳලා අවුරුද්දකටත් කිට්ටුයි. ඒත් හේමන්ත අයියා ඒ විදියමයි‘

‘මාව පෙන්නන්න බෑ තරහා යනවා‘

'මොකද්ද මං කරන්න මේකට'

'මං මොකද්ද කරන්නේ සැම්'

බලූ සූරතලාගේ ඔළුවත් අතගාන ගමන් අනූ කල්පනා කලා.

'හේමන්ත අයියා ආදරේ තිෂූ අක්කිට. එයාත් එක්ක ගොඩක් ආදරෙන් කතා කරනවා'

'අපි තුන්දෙනාම විඳවනවා මේ දේවල් නිසා'

'ඒ නිසා තීරණයක් ගන්නම වෙනවා සැමී'

අනූ හිතත් එක්ක පැය ගාණක් වාද කරලා කරලා අන්තිමට එයා අමාරුවෙන් වුණත් තීරණයක් ගත්තා.

රෑට කෑම කාලා ඉවරවුණ ගමන් හේමන්ත කරන්නේ තිෂූට කතා කරන එක කියලා අනූ දන්නවා.

ඒත් ඊට කලින්ම අනූ හේමන්තගේ කාමරේ ළඟට ගියා.

වටපිට බැලුවේ තිශිත් ළඟපාතක ඉන්නවාද කියලා.

පේන්න හිටියේ නැති නිසාම අනූ හේමන්තට කතා කලා.

''හේමන්ත අයියේ''

''මොකද''

''මට ටිකක් කතා කරන්න පුළුවන්ද''

''මට කතා කරන්න දේවල් නෑ. යනවා යන්න මගුල''

''මට විනාඩි 5ක් ඇති. ප්ලීස්''

හේමන්තගේ කේන්ති ගිය මූණ කාමරේ දොර රෙද්ද අතුරින් එළියට මතු වෙද්දි අනූ නම් අඩියක් පස්සට ගියා.

“තමුසෙට කියන සිංහල තේරෙන්නේ නැද්ද ගෑණියේ. මොනවා කතා කරන්නද. පලයන් යන්න“

“අනේ අයියේ එහෙම කියන්න එපා. ආයේ කතා කරන්නේ නෑ අද විතරයි“

“එනවා කියන රෙද්දක් කියලා ඉක්මණට යනවා“

හේමන්ත ගිහින් ඇඳේ ඇලවුණා.

අනූ නම් ඇඳ ළඟම හිටගත්තා මිසක් ඉඳගත්තේ නෑ.

“අයියේ මං දන්නවා ඔයා මට ගොඩක් වෛර කරනවා කියලා“

“මං තරහක් නෑ“

“ඔයා තිෂු අක්කිට ගොඩක් ආදරෙයි කියලාත් මං දන්නවා“

“ඇත්තද. ඒවා දන්නවා නම් හොඳයි“

“ඔයා මේ කසාදේ තියාගෙන ඉන්නේ අම්මාගේ බල කිරීම හින්දු කියලාත් දන්නවා“

“එයාලගේ හිත් රිද්දන්න ඔයා කැමති නෑ“

“ඔයා කැමති නම් මං කැමති ඩිවෝර්ස් වෙන්න“

හේමන්තගේ නම් සතුට මූණෙන්ම පෙණුනා. ඉක්මණටම ඇඳෙන් නැගිට්ටේ ඇහුනු දේ ඇත්තක්ද අහන්න වගේ.

“ඇත්තටමද කියන්නේ“

“ඔව් අයියේ අපි තුන්දෙනාම දුක් විඳිනවාට වඩා හොඳයි ඔයාලා දෙන්නා හරි සතුටින් ඉන්න එක“

“සාධාරණ හේතු නැතුව ඩිවෝර්ස් වෙන්න බෑ“

“ඔයාට ඕන සාධාරණ හේතු හදාගන්න මං උදව් කරන්නම් අයියේ“

“දැන් සල්ලි නැති එකේ ලොකු වන්දියක්වත් ඉල්ලන්න හිතාගෙන ප්ලෑන් එකක්ද දන්නේ නෑ“

“සල්ලි.....“

අනූට තමන් ගැනම දුක හිතුණා.

“සල්ලි අද තියෙනවා හෙට නෑ අයියේ“

“මට රුපියලක්වත් එපා. මගේ වැරැද්දක් කිව්වොත් වන්දි දෙන්න ඕනේ නෑ“

“ඊටත් වඩා මට මුකුත් එපා කියලා මම කියන්නම්“

“ගෙදරක වැඩ කරලා හරි මට ජීවත් වෙන්න පුළුවන්“

“ඔයාව බඳින්න කලින් මාත් හොඳ රස්සාවක් කළා. ඒත් මං ඔයාගේ යුතුකම් ඉෂ්ට කරන්න ඕනේ නිසා ඒකෙන් අයින් වුණා“

“ඒ දේවල් වැඩක් නෑ“

“තිෂූ අක්කිගෙත් වයස යන්න කලින් ඔයාලා දෙන්නා එකතු වෙන්න අයියේ“

“ආදරේ හැමෝටම හම්බෙන්නේ නෑ අයියේ. ජීවිතේ විඳින්නත් හැමෝටම බෑ“

“මම ඔයත් එක්ක ජීවිතේ පටන් ගත්තේ ගොඩක් බලාපොරොත්තු එක්ක. ඒත් ඒ බලාපොරොත්තු වලට පණ දෙන්න අපි දෙන්නටම බෑනේ“

“ඔයාගේ ගෙදරින් ප්‍රශ්නයක් වුණොත් ඔයා කියන්න මම හොඳ නැති කෙනෙක් කියලා“

“දවල්ට ඔයා ගෙදර නැති නිසා මං හැමතැනම රවුම් ගහනවා කියන්න“

“අම්මලා කවදාවත් කැමති වෙන්නේ නෑනේ ඒ වගේ කෙනෙක් එක්ක තමන්ගේ පුතාව තියන්න“

“ඔයාට හොඳක් වෙන ඕන දේකට මං කැමති අයියේ“

“මෙච්චර කාලයක් ඔයා මට කන්න දීපු එකට මේ වහල යට මට ඉන්න දීපු එකට ඔයාට ගොඩක් පින්“

“මගෙන් ඔයාට පොඩි හරි හිත් රිදීමක් වුණා නම් මට සමාවෙන්න“

“ඔයාගේ ජීවිතෙන් මෙච්චර කාලයක් නාස්ති කළාටත් මට සමාවෙන්න“

“මට මේ ගෙදරින් යන්න ඕන දවස කියන්න අයියේ මං ලෑස්ති වෙලා ඉන්නම්“

හැමදේම කියාගෙන කියාගෙන ගිය අනූ හේමන්ත හිතන්නත් කලින් එයාගේ කකුල් දෙක අල්ලලා දණ ගහලා වැන්දා.

තවත් තත්පරයක්වත් එතන නොරැඳී අනූ ආවේ එයාගේ සුපුරුදු තැනට.

අනූගේ හිතේ හේමන්ත ගැන ආදරයක් තිබ්බද නොතිබ්බද කියන්න එයාවත් දන්නේ නෑ. ඒත් විවාහ බැම්මෙන් බැඳුණු ද පටන්ම අනූ හේමන්ත එයාගේ ස්වාමිපුරුෂයා විදියට පිළිගත්තා.

ආදරයක් නැති වුණත්, උණුසුමක් නැති වුණත් මනුස්සකම ළඟ ජීවත්වෙන්න කාටත් පුළුවන්. ඒත් උණු නොවෙන හිතක් ළඟ කිසිම ආදරයක් නූපදින බව පෙනි පෙනීම රැඳිය හැක්කේ කාටද?

අනූගේ හිතේ මෙච්චරකල් තිබුණු දුක, වේදනාව හැමදේම එයාගේ පුරුදු තැනට වෙලා නිදහසේ ගලාගෙන යන්න ඉඩ දුන්නා.

sinhalaebooks.com

.... 13

“මං දවස් 3කට විතර අද හවස එළියට යනවා. මගේ බෑග් එක හදලා තියනවා. නිශිත් ඇවිත් අරන් යයි“

හේමන්තගෙන් අනූට එහෙම කියලා ඇමතුමක් ආවේ දවල්වරුවේ.

‘නිෂූ එක්ක යනවා ඇති‘

එහෙම හිතුව අනූ හේමන්තගේ බෑග් එක සූදනම් කළා. යට ඇඳුමේ ඉඳන් හැමදේම පිළිවෙලට අසුරලා එයාට ඒ දවස් තුනට ඕන කරන පෙනඩෝල්, සිද්ධාලේප වගේ දේවලුත් අනූ ටවුන් එකට ගිහින් අරන් ආවා.

බෑග් එකත් සූදනම් කරලා අනූ එයාගේ ගෙදර වැඩ කරන්න පටන් ගත්තා.

‘ඔයා තිෂු එක්ක සතුටින් ඉන්න හේමන්ත අයියේ. මාව ඉක්මණට අයින් කරලා දාන්න‘

‘ඔයාගෙයි එයාගෙයි ජීවිතේ මං නිසා නිකරුණේ නාස්ති වෙනවා‘

‘දෙපැත්තට වෙලා ආදරේ කරලා ජීවිතයක් ලැබෙන්නේ නෑ‘

‘ඔයාට තිෂු ළඟට යන්න ඕනේ වුණත් ඔයාගේ අම්මලා නිසා ඔයාට ඒක කරන්න විදියක් නෑ‘

අනූ කල්පනා කර කරම එයාගේ වැඩ.

මේ අතරේ නිශිත් ආවේ හේමන්තගේ බෑග් එක අරගෙන යන්න. දවස් තුනක දීර්ඝ නිවාඩුවක් නිසාම එයත් ගෙදර යනවා.

‘‘නංගී හේමන්තගේ අල්මාරියේ කොළ පාට ෂර්ට් එකක් තියෙනවා කියලා ඒකත් දාගෙන එන්න කිව්වා‘‘

‘‘ඉන්න මං එන්නම්‘‘

‘‘නෑ ඔයා වැඩේ කරන්න. මං දාගන්නම්‘‘

එහෙම කියපු නිශිත් හේමන්තගේ අල්මාරිය ඇරලා කොහොම හරි කොළ පාට ෂර්ට් එකත් හොයාගත්තා.

ඇඳ උඩම තියලා තිබුණු ට්‍රැවලින් බෑග් එක ඇරියේ ඒ ඇඳුමත් ඒකට දාන්න. ඒත් දැකපු දේ....

මේ අතරේ අනූ කර කර හිටපු වැඩේ නවත්තලා අතත් හෝදගෙන ආවේ හේමන්තගේ කාමරේට.

එයාගේ බෑග් එක ඇරලා ඒ දිහාම බලාගෙන ඉන්න නිශිත් දැක්කාම අනුට කෙළ ගිලෙන්නෙත් නැතුව ගියා.

අනු එනවා දැණුනු නිසා නිශිත් බැලුවේ අනු දිහා.

"කෝ දෙන්න ඕක මං දන්නම්"

අනු ඉක්මණට නිශිත් අතේ තිබුණු හේමන්තගේ ෂර්ට් එක උදුරගෙන බෑග් එකට දන්නයි හැදුවේ.

නිශිත්ට කිසි දෙයක් අහන්න වචන ගලපගන්න බැරුව අනු දිහා බලාගෙන හිටියා.

"මං හැමදේම දන්නවා අයියේ"

"එයා මේ ගමන යන්නේ නිෂූ එක්ක වෙන්නම ඕනේ"

"ඉතිං එයාට ඕන කරන දේවල් තමා මේ තියෙන්නේ"

"එක දවසක් එයාගේ කලිසම හෝදනකොට මට හෝටෙල් රූම් එකක බිල් එකකුයි ඔය බොක්ස් එකකුයි හම්බුණා"

"එයාට ඒවා අයින් කරන්න අමතක වෙන්න ඇති"

"ඒ එයා ඒ දේවල් පාවිච්චි කරන නිසානේ"

"ඉතිං ඒකයි මං දැම්මේ"

අනු දුකෙන් වුණත් කියලා දැම්මා.

'ඔයා මොන වගේ කෙනෙක්ද අනු මට හිතාගන්න බෑ'

නිශිත් නලලත් මිරිකගෙන කල්පනා කළා.

"ඔයා දුක් විඳිනවා නේද අනු"

“හේමන්ත අයියා සතුටින්නේ. මගේ ලැබීමට එයාලා පලි නැනේ අයියේ“

නිශිත්ට ගොඩක් දුක හිතුණා අනූ ගැන. අනූව තමන්ගේ පපුවට තුරුල් කරගෙන ඒ ඔළුව අතගාන්න හිතුණු වාර අනන්තයි.

ඒත් ඒ හැමදේම හීන ගොන්නට එකතු වුණ ඒවා.

‘ඇයි අනූ වගේ කෙනෙක් මට නොදී මේ වගේ කාලකණ්නියෙක්ට දුන්නේ දෙවියනේ‘

‘මේ කෙල්ලගේ ජීවිතේ විනාස වෙන්නේ අපරාදේ‘

‘ඕකා ගිහින් ආවදෙන්කෝ මං කතාකරන්න‘

නිශිත්ට ඒ දේවල් අනූට කියන්න පුළුවන්කමක් නෑ.

“ඔයා ඕවා හිතන්න එපා අයියේ. ඔයත් ගෙදර යනවා නේද අද“

“හ්ම්ම්ම්ම්.. යන්න ඕනේ“

“ඔයාට තනියම ඉන්න පුළුවන්ද නංගී“

“අනේ මට මොන තනියක්ද ඉතිං“

‘ජීවිතේම තනි වෙලා තියෙද්දි තවත් මොනවාද‘ අනූ හිතුවා.

මේ ගෙදර මේ වෙනකම් තනියම දවස් ගණන් අනූ ඉඳලා නෑ.

“සැමී ඉන්නවානේ මාත් එක්ක. අයියා ගිහින් එන්න“

“පරිස්සමෙන් ඉන්න. මොන දේකට උනත් කතා කරන්න හොඳද. මං හැමවෙලේම ෆෝන් එක අතේ තියාගන්නම්“

“දන්නේ නැති කව්රු ආවත් මිදුලටවත් ගන්න එපා“

“අනේ මං පොඩි ළමයෙක් නෙමෙයිනේ අයියේ“

“පරිස්සමෙන් ගිහින් එන්න. බුදුසරණයි අයියේ“

නිශිත් අනුගේ ඔළුවත් අතගාලා එයාගේයි හේමන්තගේයි ඇඳුම් බෑග් ටිකත් අරගෙන ගියා.

*.... 14*

“මට උඹත් එක්ක කතා කරන්න ඕනේ. ගෙදර කතා කරන්න බෑ“

“ඇයි ගෙදර කතා කරන්න බැරි“

“බැරි හින්දනේ. ප්‍රශ්න අහන්නේ නැතුව උඹ හිටපන්කෝ“

දෙන්නා වැඩ ඇරිලා එනගමන් නිදහස් තැනකට ගියේ නිශිත්ට හේමන්ත එක්ක කතා කරන්න ඕනේ කියපු නිසා.

එළිමහනේ තිබුණු මේසයක් තෝරගෙන දෙන්නාම ඉඳගත්තේ බීමත් ඇණවුම් කරලා.

“කියපං දැන් මොනවාද උඹට ඔය මහලොකුවට කතා කරන්න තියෙනවා කිව්වේ“

“උඹ ඉස්සර ඔහොම නෑ හේමන්තයා“

“ඇයි බං අර ගෑණිට ඔහොම කරන්නේ අහිංසක හින්දද“

“බලපං උඹේ වැඩ හැමදේම කරනවා. උඹෙන් බැණුම් අහනවා, ගුටි කනවා“

“ඒවාටත් එක්ක තමා මං ගෑණියෙක් ගෙනාවේ“

“යකෝ උන් ඉන්නේ ඒ දේවල් වලටද“

“උඹට වෙන දේවල් වලට වෙන්න ඇති. මාත් එක්ක ඉන්නවා නම් මට ඕන දේවල් තමා මං කරන්නේ“

“උඹ තාම තිෂු පස්සේ වැටිලා. ගෙදර ගෑණි උන්නද මලාද නෑ“

“මට ඒකී හිටියත් එකයි මැරුණත් එකයි“

“මෙකෙද්ද බං තෝ“

“උඹ පිරිමියෙක් වගේ කෙලින් හිටියා නම් තිෂුව බඳින්න තිබුණා“

“කොහේවත් ඉන්න කෙල්ලෙක් මේකට පටලගෙන දැන් උඹලා ඔක්කොම දුක් විඳිනවා“

“මේ නිශිත් උඹට ඔච්චරම අමාරුවක් තියෙනවා නම් ගිහින් ඒ ගෑණිව බැඳගනින්කෝ මගුල“

sinhalaebooks.com

“බලු කතා කියන්න එපා බං“

“යකෝ මගේ ගෑණි ගැන මට නැති අමාරුවක් උඹට ආවේ කොහොමද“

හේමන්තට හොඳටම තරහා ගිහින්.

“මං නැති දවස් ටිකේ ගෙදර නොගිහින් එහේද දන්නේ නෑ හිටියේ“

“තෝ මොකද්ද කිව්වේ“

නිශිත්ගේ කේන්තියත් අහස උසට වෙද්දි පුටුවෙන් නැගිටලා හේමන්ත ළඟටම ආවා.

“ඇයි කිව්ව ඒවා ඇහුණේ නැද්ද“

“ඇහුණා හොඳට ඇහුණා. තොට අවලමේ යන්න ඒකි හැමදේම ලෑස්ති කරලා දෙනවානේ. තොට මොකද. තෝ අමාරුවේ වැටෙයි කියලා බයට ෆාමසි ගිහින් තොට ඕන දේවල් ළඟට ගෙනත් දෙනවා. ඒවත් අරන් අරකි එක්ක හෝටල් ගාණේ දවස් ගණන් ආතල් ගන්නවා“

“ගෙදර ගෑණි ගැන දශමයක් බලනවාද“

නිශිත්ගේ කේන්තිය උපරිම වුණේ බලාගෙන ඉද්දි.

“තෝ රස්සාවක් කරන්න කියපු නිසා ඒකි ගිහින් හෝටලේක පිඟන් හේදුවා. තෝ දන්නවාද ඒක“

“බස් වල යන්නවත් සල්ලි නැති නිසා කකුල් රිදෙනකම් පයින් ගියා තෝ දන්නවාද ඒවා“

“බල්ලටත් එක්ක හම්බකරන්න වෙයි කිව්වාම ඒකි ඒකිගේ කෑම එක බල්ලාට දීලා ඒකි නොකා හිටියා. තෝ ඒවා දන්නවාද“

“තමුසේ මගේ යාළුවෙක් කියන්න ලැජ්ජයි ඇත්තටම“

“කලින් හිටපු හේමන්ත ඔහොම නෑ“

“තිෂු කියන එකී තෝව විනාස කරලා“

“බලපං තොගේ ජීවිතෙත් ඒකී විනාස නොකළොත් මං නිශිත් නෙමෙයි“

නිශිත් එක හුස්මට කියාගෙන කියාගෙන ගියා.

හේමන්ත කොහොමත් කේන්තිකාරයෙක්. නිශිත් කිපයු දේවල් ඇහුවාම අනූව මරන්න තරම් කේන්තියක් ආවා.

“තෝ මගේ ගෑණි ගැන මෙච්චර දේවල් දන්නේ ඒකී උඹේ හොර ගෑණිද“

“මගේ ගෙදරම ඉඳන් මටම නොකා පෙන්නුවා උඹ එහෙනම් නේද“

“මට මොකද? උඹ ඒකී එක්ක බුදියගත්තත් මට කමක් නෑ යකෝ“

“ඒකිව කොහේ හරි ගිහින් තියාගනින් නිකන් ඉන්න එකේ එහෙම වැඩක්වත් ගන්න එපැයි“

“මොකද්ද බල්ලෝ තෝ කිව්වේ“

වසර ගණනක් තිබුණු යාළුකම දෙදරන්න විනාඩි පහක්වත් ගියේ නෑ.

හේමන්ත අන්තිමට කියපු ටිකට නිශිත්ට හොඳටම කේන්ති ගියා.

අතම්ට මොලවගෙන කේන්තිය පාලනය කරන් හිටපු නිශිත්ට තවත් ඒක දරාගන්න බැරි වුණා.

හේමන්තට හොඳටම ගැහුවා. නහයෙන් කටින් ලේ එන්න ගැහුවා.

දෙන්නගේ මේ රණ්ඩුව බේරන්න අන්තිමට එතන අයිතිකාරයටත් එන්න වුණා.

"මං අද අරකිව මරනවා. බලපිය මං කරනදේ"

හේමන්ත කෑගහනවා.

එතන හිටපු අය මේ දෙන්නාව අමාරුවෙන් දෙපැත්තට කරගත්තා.

හේමන්ත එයාගේ කටට වැදුණු පාරට එන ලේ ටිකත් අතින් පිහදා පිහදා නිම නොවුණු කේන්තියෙන්ම වාහනේ හරවගත්තේ ගෙදරට එන්න.

අනූ ගැන නිශිත් මේ තරම් අනුකම්පාවෙන් කතා කරද්දි එයා නොදන්න දේවල් නිශිත්ගේ කටින් කියවෙද්දි හේමන්තට එයා ගැනම ලැජ්ජා හිතුණා.

ඒ ලැප්ජාව අනූ එක්ක ඉවසගන්න බැරි කේන්තියක් තරමට වැඩි වුණා.

*.... 15*

නිශිත්ගේ හිතේ දෝංකාර දුන්නෙම හේමන්ත අන්තිමට කියලා ගිය දේ.

'මං අද අරකිව මරනවා. බලපිය මං කරනදේ'

හේමන්ත නිශිත්ව දාලා මහ වේගෙන් වාහනේ අරන් ගිය නිසා නිශිත් බයටම ඉක්මණටම ටැක්සි එකක් කතා කරගෙන ගෙදර එන්න ආවා.

මග දිගට ට්‍රැෆික් එක. නිශිත් එන්න එන්නම නොසන්සුන් වෙන්නේ හිතට දැනෙන මහා අමුත්තත් එක්ක.

මේ අතරේ දරාගන්න බැරි කේන්තියක් එක්ක ගෙදරට ආපු හේමන්ත කෙලින්ම ගියේ මුළුතැන්ගේ පැත්තට.

අනූ රෑට කෑම සූදානම් කරන්න එළවළු කපනවා.

“බැල්ලි...“

“තෝ මං නැති වෙලාවට අරූ එක්ක බුදියනවාද ආ“

“මොනවාද දෙයියනේ මේ කියන්නේ...“

“අනේ අත......අරින්න....කෝ... රිදෙනවා“

“මං මිනිහා වෙලා මං නොදන්න දේවල් ඌ දන්නවා“

අනූගේ පිටිපස්සෙන් කොණ්ඩෙන් අල්ලගත්තු හේමන්ත වියරු වෙලා වගේ කෑගහන්න ගත්තා.

“අනේ..... අයි... යෝ...“

“තෝ බැල්ලි. මට නැති අනුකම්පාවක් ඌට තියෙන්නේ උඹ ගැන“

“තෝ නිසා ඌ මට කවදාවත් නැතුව අද අත ඉස්සුවා“

“බලපිය මේ බලපිය ලේ එනවා“

“අනේ අයියේ.... මං මුකුත්..... ක..ලේ... නෑ... දෙයියනේ“

අනූ කෑගහනවා.

හේමන්ත අනුව තල්ලු කරපු පාරට ඔළුව වැදුණේ කුස්සියේ තිබුණු මේසේ..

“ආවි....“

අනූ ඔළුවත් අල්ලගෙන නැගිටින්න උත්සහා කළා.

ඒ වේගෙන්ම හේමන්ත අනූව ඇදලා අරගෙන තවත් බනිනවා.

“බලපිය උඹ නිසා ඌ මට අද අත ඉස්සුවා“

“තෝ මගේ මුළු ජීවිතේම විනාස කළා මදිවට මගේ යාළුවාත් උදුර ගත්තා“

“බැල්ලී..“

“මං තෝව මරනවා. මරලා හිරේ යනවා“

පිස්සුවෙන් වගේ හේමන්ත කෑගහනවා.

අනූ හේමන්තගෙන් ගැලවෙන්න දඟලනවා.

“අනේ අයියේ අතඅරින්න. අනේ පින් සිද්ධ වෙයි“

වටපිට බලපු හේමන්ත දැක්කේ අනූ එළවළු කප කප හිටපු පිහිය.

කේන්තිය අහස උසට නැගලා තමන්ට තමන්වත් පාලනයක් නෑ. කරන්නේ මොකද්ද මතක නෑ.

“අනේ අයියේ..... එපා...“

“අනේ මාව අතඅරින්න... අයි...යේ“

“අනේ බුදු අයියේ එපා.... මාව මරන්න එපා...“

ලස්සන ජීවිත දෙකක් නොහිතපු විදියට විනාශ වෙන්න ගියේ තත්පරයයි.

අනූ එළවළු කප කප හිටපු පිහිය අතට ගත්තු හේමන්තගේ කේන්තිය ඒ වෙනකොටත් අඩුවෙලා තිබුණේ නෑ.

“අයියේ... අනේ... එපා...“

“අනේ මාව බේර...ගන්න...“

“ආ...“

අනූගේ කොණ්ඩෙන් අල්ලගෙනම පිහියෙන් බඩට තුන් හතරපාරක්ම ඇන්නේ කිසිම හිතක් පපුවක් නැති මිනිහෙක් ගාණට.

“ආ...“

“ආ...“

මහා හඩින් ඇහුණු අනුගේ කටහඬ කෙඳිරියක් වෙලා ගියා.

හේමන්ත පියවි සිහියට එද්දි හැමදේම වෙලා ඉවරයි.

අනූ බිමට ඇදගෙන වැටුණේ කපලා දාපු කෙහෙල් කඳක් වගේ. කලබල වුණු බලූ පැටියත් සිහිය නැතුව ඉන්න අනූගේ මූණ ලෙවකනවා.

බලන්න බෑ දුකයි.

මේ වෙලාවේ නිශිත් එයාගේ නොසන්සුන් හිතත් එක්කම ට්‍රැෆික් එකේ හිටියත් තවත් බලන් ඉන්න පුළුවන්කමක් එයාට තිබුණේ නෑ.

ටැක්සියට සල්ලි ගෙවපු නිශිත් පුළුවන් වේගෙන් පයින්ම දුවගෙන ආවේ ගෙදරට. කකුල් පණ නැති තරම්. ඒත් අනූ ගැන දැණුන බය වගේම හේමන්ත ඒ වෙලාවේ හිටපු තත්වේ මේවා මතක් වෙද්දි නැති ශක්තියක් නිශිත්ට ලැබුණා.

හති දගෙන දුවගෙන එද්දි ගෙදර තිබුණු මූසල බව නිශිත්ගේ හදවත මොහොතකට නතර කළා.

අනූ වැඩි හරියක්ම ඉන්නේ මුළුතැන්ගේ පැත්තේ නිසා නිශිත් ආපු වේගෙන්ම ගියේ ඒ පැත්තට.

“දෙයියනේ අනූ....“

අනූ ලේ වලින් නැවිලා වතුරෙන් දැන් ගොඩ දාපු මාළුවෙක් වගේ බිම වැටිලා ගැහි ගැහි ඉන්නවා දැක්කාම නිශිත්ගේ හදවත නතර වුණා වගේ දැනුණා.

හේමන්තගේ අතේ ලේ තැවරුණු පිහිය එක්කම අනූ ළඟම ඉඳගෙන ඉන්නවා නිශිත් දැක්කා.

“මොකද්ද තෝ මේ කරපු අපරාදේ...“

වචනයක් කතා කරගන්න පුළුවන් වුණ ගමන්ම නිශිත් හේමන්තට ගැහුවේ හිතේ තිබුණු කේන්තිය පිපිරිලා යද්දි.

නිශිත් දුන්නු පාරවල් දෙකට හේමන්තගේ නහයෙන් කටින් ලේ ආවා.

“උදව් කරන්න. කව්රුත් නැද්ද“

නිශිත් කෑගහනවා.

“නංගි කතා කරන්න. අනේ රත්තරනේ කතා කරන්නකෝ“

ගෙදර කෑගහනවා ඇහුණු නිසාම එකා දෙන්නා මේ වෙනකොටත් මේ ගෙදරට එකතු වෙන්න පටන් අරන්. හේමන්ත නම් බලාගත්තු අත බලාගෙන ඉන්නවා.

“මාව දාලා යන්න එපා. අනේ කතා කරන්න අනූ..“

“මල්ලි වාහනේ ගනින්. හොස්පිට්ල් යමු“

මේ කලබලේට ගෙදරට ආපු කෙනෙක් එක්ක නිශිත් අනූව රෝහලට ගෙනියන්න සූදානම් වුණා.

අනූගෙන් ලේ ගලනවා ඉවරයක් නැතුව. රෙදිකෑල්ලක් තියලා තද කරගෙන හිටියත් නවතින්නේ නෑ.

“අනේ මල්ලි ඉක්මණ් කරපන්“

“තව ටිකයි අයියේ. පුළුවන් ඉක්මණට යන්නේ“

“අනූ... අනූ...“

නිශිත් අනූගේ මූණ දෙපැත්තට ගහන ගමන් අනූට කතා කරන්නේ එයාගේ ජීවිතේ ගැන බයවෙලා.

නිශිත් අනූව තුරුල් කරගෙන.

“අනේ කතාකරන්න...“

අනූගෙන් ඇහෙන්නේ මලානික වුණ කෙඳිරියක් විතරමයි.

“තව ටිකයි අනූ.... හොඳට හුස්ම ගන්න“

ඉක්මණින් හොස්පිට්ල් එකට ආපු නිශිත් අනුව අත්දෙකෙන්ම ඔසවගෙන ඇතුලට අරගෙන ආවා.

එතන කාර්ය මණ්ඩලය මැදිහත් වෙලා අනුව ඉක්මණින් ICU එකට ඇතුලත් කළා.

අනු ගැන බලන්නවත් කෙනෙක් නෑ. හේමන්තගේ මහ ගෙදර නම්බර් එක තමන් ළඟ තියෙනවා නේද කියලා මතක් වුණ නිසා නිශිත් ඇමතුමක් ගත්තා.

“මම නිශිත්“

“කියන්න පුතා“

“තමුන්ගේ පුතාට සදකල් කූඩුවේ ලගින්න ලෑස්ති වෙලා ඉන්න කියනවා“

කේන්තියෙන්ම එහෙම කියපු නිශිත් ඇමතුම විසන්ධි කරලා දැම්මා.

නිශිත් නම් හොඳටම අඩනවා.

“ඔයා දැන් ගෙනාව පේෂන්ට්ගේ හස්බන්ඩ් ද“

ICU එකෙන් එළියට ආව ඩොක්ටර් නිශිත්ගෙන් ඇහුවේ මේක පොලිසියි යන්න ඕන කේස් එකක් නිසාත් අනුගේ තත්වය ගොඩක් බරපතල නිසාත්.

‘මට එච්චර වාසනාවක් නෑ‘ නිශිත් හිතුවා.

“ඉක්මණට මේ ෆෝර්ම් ටික ෆිල් කරන්න“

නිශිත් ඉක්මණින් ඒ වැඩ ටික කරපු අතරේ කේන්තියටම පොලිසියටත් මේ දේ ගැන දැන්නුවා.

මේ හින්දම හේමන්තව ඇරස්ට් කරන්න වැඩි වෙලාවක් ගියේ නෑ.

හේමන්තගේ අම්මලා විලාප දෙද්දි හේමන්තව පොලිසියෙන් අරගෙන ගියා.

මේ අතරේ නිශිත් ICU එක ළගම තියෙන පුටුවකට වෙලා පොඩි දරුවෙක් වගේ අඩනවා.

තමන්ගේ ජීවිතේට ආදරයක් දැණුනු එකම කෙනා අනූ.

කාර්යබහුල රැකියා ජීවිතේ එක්ක, අධ්‍යාපන කටයුතු එක්ක නිශිත්ට මගඇරුණු දේ ආදරේ.

ඒත් හේමන්ත එක්ක කෙල්ලව බලන්න ගිය පළවෙනි දවසේ ඉඳලම හැමෝටම හොරෙන් නිශිත් අනූට ආදරේ කළා.

කෙල්ලෝ කොල්ලෝ වගේ ආදරේ කරන්න හැමෝටම ලැබෙන්නේ නෑ. දුරින් ඉඳගෙන වුණත් ආදරේ කරන්න කිසිම තහනමක් නෑ. තමන්ට අයිති නොවුණත් කවදාවත් තමන්ගේ නොවුණත් හිතින් ආදරේ කරන්න ඕන කෙනෙකුට පුළුවන්.

අනූගේ බර්ත්ඩේ එක දවසේ කේක් එක ගෙනාවාම කෙල්ලගේ මූණේ තිබුණ සතුට, උණ හැදුණ දවසේ බෙහෙත් අරගෙන දුන්නාම 'මට බෙහෙත් අරන් දුන්නට ඔයාට ගොඩක් පිං අයියේ' කියලා කියපු හැටි අවුරුද්දට ඇඳුමක් ගෙනත්

දුන්නාම පොඩි දරුවෙක් වගේ ඒ ගැන සතුටු වුණ හැටි නිශිත්ට මැවිලා පෙනුනා.

'දෙවියෝ ඇයි ඔයාව මගේ කළේ නැත්තේ නංගී'

'මගේ පණ ටික අරගෙන හරි ඉක්මණට සනීප වෙන්න නංගී'

'මාව දාලා යන්න එපා'

'මට ඔයාව දුර ඉඳන් බලාගන්න පුළුවන්'

'අනේ ඉක්මණට එන්න නංගී'

නිශිත් වැඳගෙන මේ දේවල් හිතෙන් මුමුණ ගත්තා.

මේ ආරංචිය ලැබුණු ගමන්ම නිශිත්ගේ මල්ලි මලිත් හොස්පිට්ල් එකට ආවේ නිශිත්ගේ තනියට.

හේමන්තගේ දෙමව්පියොත් හොස්පිට්ල් එකට ආවා.

හේමන්තගේ අම්මාව දැක්කාම නිශිත්ට නම් හේමන්ත එක්ක තිබුණු කේන්තියට වඩා කේන්තියක් ආවා.

හේමන්තගේ අම්මා ළඟට දුවගෙන ගියපු නිශිත් බැනගෙන බැනගෙන ගියා.

''තමුන්ලා එකතුවෙලා ඒ කෙල්ලගේ ජීවිතේ අපායක් කළා''

''හැමදේටම වගකියන්න ඕන තමුන්ලා''

''මහලොකු නම්බුව ගැන හිතලා අහිංසක ජීවිතයක් බිල්ලට දුන්නා''

sinhalaebooks.com

හේමන්තගේ අම්මා ළඟටම ගිහින් නිශිත් කෑගහන්නේ වටපිට ගැනවත් හිතන්නේ නැතුව.

“අයියේ ඇති ඔය. ප්ලීස්“

මලිත් නිශිත්ව ඇදගෙන යන්න හැදුවත් නිශිත් ආයේ ආයේත් කෑගහනවා.

“මේ කෙල්ලට මොනවා හරි වුණොත් මං උඹලා එකෙක්වත් ඉතුරු කරන්නේ නෑ“

“ඒක හොඳට මතක තියාගන්නවා“

“අයියේ ප්ලීස්. කෑගහන්න එපා බං. මේක හොස්පිට්ල් එක“

මේ රණ්ඩුව බලන් ඉඳලා බැරිම තැන ඩොක්ටර් කෙනෙක් එතෙන්ට ආවේ කෑගහගෙන.

“මේක හොස්පිට්ල් එක මිසක් ඔයාලගේ පෞද්ගලික ප්‍රශ්න විසඳගන්න තැනක් නෙමෙයි. ඒ නිසා නිශ්ශබ්ධ වෙන්න. අනිත් අයට කරදරයක් ඔයාලා ඔහොම හැසිරෙනකොට“

නිශිත් සද්ද නැතුව ගිහින් ආයේමත් හිටපු තැනින්ම වාඩිවුණා.

“මලිත්.... අනූ බේරලා දීපන් උඹට පින් සිද්දවෙයි“

“උඹ... උඹ.... දැක්කේ නෑ... කෙල්ල මං යනකොට ලේ විලක් මැද්දේ බිම බං. කෙඳිරි ගානවා“

“මං... මං... මෙහෙම අත්දෙකට ගත්තේ කෙල්ලව“

නිශිත් අඬ අඬ මලිත්ට විස්තර කියනවා.

sinhalaebooks.com

“අරූ ඒ කෙල්ලට පිහියෙන් ඇනලා බං...“

“මං යනකොටත් හැමදේම වෙලා...“

“මට ඒ කෙල්ලව බේරගන්න බැරි වුණා“

“අයියේ කෙල්ලට මුකුත් වෙන්නේ නෑ. උඹ ඔහොම දුක් වෙන්න ගත්තාම ඒ කෙල්ල ගැන බලන්නේ කව්ද“

“ඒ නිසා ඉස්සෙල්ලා උඹ ශක්තිමත්ව හිටපන්. කෙල්ලව කොහොම හරි සනීප කරගමු“

අනූ තාමත් ICU එකේ. අභ්‍යන්තර ඉන්ද්‍රියන්ට මුකුත් වෙලා නොතිබුණේ අනූගේ වාසනාවට.

ඒත් තුවාල ටිකක් බරපතල නිසා වගේම අධික රුධිර වහනයක් වුණු නිසා අනූට සිහිය නෑ දින දෙකක් තිස්සෙම.

රණ්ඩුව වෙලාවේ හේමන්ත තල්ලු කරපු පාරට අත, පය තැන තැන වගේම නළලත් තුවාල වෙලා.

කෑමක් බීමක් නැතුව නිශිත් ICU එක ළඟම ඉන්නවා.

දින තුනකින් පස්සේ නිශිත්ට නම් සතුටු කඳුළු දීලා අනූට සිහිය ආවා.

ඒත් තුවාල ගැඹුරටම තියෙන නිසා ටික දවසක් හොස්පිටල් එකේම ඉන්න වෙනවා. වෛද්‍යවරු කිව්වේ ඇවිදින්නවත් එපා කියලා.

අනූ මොන විදියට එදා වුණු සිද්ධිය අමතක කරන්න හැදුවත් එයාට ඒක කරන්න අමාරුයි. මතක් වෙන හැම වෙලාවකම හිතේ ඇතිවෙන ගැස්ම පිටට පේන තරම්.

මොකද නිදාගෙන හිටියත් අනූ එහෙම එකපාර ගැස්සිලා යනවා නිශිත් දකිනවා.

දවසක් මහ රෑ අනූ හිටියේ හොඳ නින්දේ. එයා හිටපු කාමරේ දොර හිමින් ඇරෙන සද්දේ අනූට ඇහුණා.

අනූ ඇහැරිලා දොර දිහා බලද්දි දැක්කේ හේමන්ත ඇවිත් ඉන්නවා. පිහියකුත් අතේ තියාගෙන.

“උඹ බේරුණා එදා නේද එහෙනම්“

“ඒ වුණාට උඹට අද බේරෙන්න බෑ“

“මං උඹව මරනවා“

හේමන්ත රහසින් අනූට කිව්වා.

“එපා…“

“අනේ මාව මරන්න එපා“

එකපාරම හේමන්ත අත්දෙකෙන්ම පිහිය අල්ලගෙන නිදාගෙන හිටපු අනූට ඇන්නා.

“එපා…..“

අනූ ගිරිය යටින් කෑගහද්දි අනූගේ ඇඳේම ඔළුව තියාගෙන හිටපු නිශිත්ට ඇහැරුණා.

අනූ දඟලනවා. කෑගහනවා.

“එපා මාව මරන්න එපා“

“අනේ එපා“

“නංගි... අනූ... ඇයි මේ... කව්රුත් නෑ මෙතන“

“නංගී...“

අනූ නිශිත්ගේ පපුවේ මූණ හංගගෙන මහා හයියෙන් හුස්ම ගන්නවා.

දෙර දිහා හොරෙන් බලනවා.

“නංගි කතා කරන්න. ඔයා හීනෙන් බය වුණාද..“

“මෙහේ කව්රුත් නෑ. කාටවත් එහෙම එන්න බෑ.. බය නැතුව ඉන්න“

“එයා මාව මරනවා කිව්වා. අතනින් ආවේ“

අනූ දෙර පැත්තට අත දික් කර කර අඬනවා.

“මැණික මේ අහන්න. කව්රුත් මෙතෙන්ට ආවේ නෑ. මං මෙතන ඉන්නවා. කාටවත් එන්න බෑ“

“ආ මේ වතුර ටික බීලා නිදගන්න“

අනූ පොඩි දරුවෙක් වගේ වතුර වීදුරුව බීගෙන බීගෙන ගියා.

අනූ තාමත් නිශිත්ට තුරුල් වෙලා ගාණක්වත් නෑ.

අනූට නින්ද යනකම්ම නිශිත් එයාගේ ඔළුව අතගෑවා.

'උඹ මහා පව්කාරයෙක් හේමන්ත. උඹට මේවා ගෙවන්නම වෙනවා දවසක'

'මේ පොඩි කෙල්ල බය වෙලා එදා වුණ දේට'

'පව් දෙයියනේ'

'උඹ මට අහුවුණොත් නම් මමයි උඹව මරන්නේ ඒක දැනගනින්'

නිශිත් කේන්තියෙන්ම හිතනවා.

මේ සිද්ධිය මිනී මැරීමට තැත් කිරීමක් නිසාම අනුව රූම් එකකට මාරු කළා විතරයි පොලිසිය කටඋත්තර ගන්න ඇවිත් හිටියේ.

''මිස් අපිට කියන්න එදා මොකද්ද වුණේ''

''හේමන්ත කියන කෙනා ඔයාගේ හස්බන්ඩ් නේද''

''එයා ඇයි ඔයාට පිහියෙන් ඇන්නේ''

''පරණ තරහා මොනවා හරි තිබුණද''

''නැත්තම් එයා මත්පැන් පාවිච්චි කරලා හිටියාද''

''මීට කලිනුත් රණ්ඩු දුරදිග ගිහින් තියෙනවාද''

''අපිට කියන්න මොකද්ද වුණේ''

පොලිසියෙන් එක දිගට ප්‍රශ්න වැලයි.

අනු හොඳ හුස්මක් ගත්තා.

''හේමන්ත මට පිහියෙන් ඇන්නේ නෑ''

‘‘මමයි එහෙම කරගත්තේ‘‘

‘‘මොකක්...‘‘

නිශිත් පුදුම වුණා.

‘‘ඔව් සර්. මට කේන්ති ගියා. ඒ හින්ද මමයි ඇන ගත්තේ මැරෙන්න හිතලා. ඒ වෙලාවේ හේමන්ත ඇවිත් පිහිය ඇදලා ගත්තා. ඒකයි එයාගේ අතේ පිහිය තිබුණේ‘‘

‘‘ඔයා හොඳ සිහියෙන්ද ඉන්නේ අනු. මොනවාද මේ කියන්නේ‘‘ නිශිත් ඇහුවා.

‘‘මිස් කාට හරි බයවෙලාද මෙහෙම කියන්නේ‘‘

‘‘සර් ප්ලීස්. මං කියන දේ පිලිගන්න. පින් සිද්ද වෙයි ඒ මනුස්සයාව නිදහස් කරන්න‘‘

‘‘හොඳට හිතලා බලලාද ඔයා ඔහොම කතා කරන්නේ මිස්‘‘

‘‘ඔව් දෙයියනේ ඔව්. මං කටඋත්තරේ දෙන්නේ එහෙමනම් ඇයි තවත් ප්‍රශ්න අහන්නේ‘‘

‘‘ආව්.....‘‘

අනූ කලබලෙන් උත්තර දෙන්න ගිය නිසාම තුවාලවල වේදනාව වැඩියෙන් දැණුනා.

‘‘සර් ප්ලීස් මෙයාව මහන්සි කරවන්න එපා. එයා එහෙම කියනවා නම් ඒක ලියාගන්න‘‘

අනූව තවත් මහන්සි කරන එකෙන් හොඳ නැත්තේ අනූටමයි කියලා හිතුණු නිසා නිශිත් එහෙම කිව්වා.

“අනූ..... නංගී ඇයි ඔයා ඒ විදියට පොලිසියට කිව්වේ?“

“මගේ ජීවිතේ විනාස වුණා කියලා ඇයි අයියේ මං හේමන්ත අයියාගෙත් ජීවිතේ විනාස කරන්නේ“

“එයා වැරැද්දක් කළා තමා. එයා ඒ තැනට පත් වුණේ මං හින්ද“

“එයාගේ දෙමව්පියෝ නිසා“

“හිර කූඩුවකට කරලා තරුණ ජීවිතයක් විනාස කරනවාට වඩා එයාගේ ජීවිතේට හොඳක් කරන්න මට පුළුවන් නේද අයියේ“

“මට ඔයාව තේරෙන්නේ නෑ නංගී“

“ඔයාව මරන්න හදපු කෙනාටත් ඔයා අනුකම්පා කරනවා“

“මෙච්චර වෙනස්කම් කරලා ඔයාගේ ජීවිතේ එපා කරපු මනුස්සයාට ඔයා අනුකම්පා කරනවා“

නිශිත්ට අනූ ගැන දැණුනේ පුදුමයක්.

‘ඔයාට මගේ වෙන්න බැරිද නංගි‘

‘මගේ මුළු ජීවිත කාලෙම මං ඔයාව බලාගන්නම්‘

‘මගේ ළඟට එන්න බැරිද ඔයාට‘

නිශිත් මේවා තනියම හිතුවත් කියන්න ගියේ නෑ.

sinhalaebooks.com

*.... 16*

අනූ තාමත් හොස්පිට්ල් එකේ. තාත්තා කෙනෙක් තමන්ගේ දරුවාව බලාගන්නවා වගේ නිශිත් අනූව බලාගන්නවා.

ගැඹුරට කැපිලා තියෙන නිසා අනූගේ තුවාල තාමත් අළුත්.

අනූට ඇවිදින්න, හිටගෙන ඉන්න අමාරු නිසාම මූණ හෝදවන්න, අනූව වොෂ්රූම් පවා එක්කගෙන ගියේ නිශිත්.

ජීවිතේ දවසක ලබන්න ප්‍රාර්ථනා කරපු ආදරයක් ඇස් ඉදිරියේම තියෙද්දි අනූට මහා අසරණකමක් දැණුනා.

“අයියේ.... ඔයාට මං නිසා වැඩට යන්නත් නෑ නේද“

“මට දැන් හොදයි. ඔයා යන්න“

“මං නිවාඩු දැම්මා මේ ටිකේ. ඒ නිසා පැහෙන්නේ නැතුව ඉන්න“

“නිශිත් අයියේ මගේ සැමී....“

“එදා ඔයා බිම වැටිලා ඉද්දි මූණ ලෙව කකා හිටියා. මං ඊට පස්සේ එහේ ගියානේ ඔයාගේ බඩු ටික ගේන්න. ඒ යද්දි ඌ හිටියේ නෑ“

“අනේ පව්. මං ඌට කිව්වා හැමදාම මාත් එක්ක ඉන්න කියලා. ඒත් මම ඌව දලා ආවා“

“මං හිතන්නේ ඌ යන්න ඇති අනු.. දැන් හිතන්න එපා ඒ ගැන“

නිශිත් හිටියේ අනුට සුප් එක පොවන ගමන්.

එක පාරම කාමරේ දොරත් ඇරගෙන ආවේ නිශිත්ගේ අම්මා.

“තමුන්ගේ මිනිහා පැත්තක දලා දැන් මගේ පුතාව අල්ලගන්නාද“

“අම්මා මොකද මේ. කෑගහන්න එපා“

“උඹ පලයන් පැත්තකට“

නිශිත්ව තල්ලු කරපු අම්මා අනු ළඟටම ඇවිත් හොඳටම බනිනවා.

“ලැජ්ජා නැද්ද උඹට බැඳපු ගෑණියෙක් නේද“

“අම්මා ඇති කෑගහන්න එපා“

“මගේ පුතා උඹේ අතකොළුවක් කරගන්නාද“

“උඹට ඔහොම මිනිස්සු එක්ක ගිහින් පුරුදු වුණාට මගේ පුතා අහිංසකයි“

“ඇන්ටි.....මං...“

අනු කතා කරන්න හැදුවත් වචනයක්වත් කතා කරන්න දුන්නේ නෑ.

“මගේ පුතා තමුසෙගේ වැඩකාරයෙක්ද“

“හ: ප්‍රයිවට් හොස්පිට්ල් එකට එන්න ඇත්තේ සැප ගන්න වෙන්න ඇති“

“අම්මා ඇති දැන් කිව්වනේ“

“උඹ මේකිගේ හයිය අරන් දැන් මටත් කෑගහනවාද පුතේ“

“අපේ එකාට සල්ලි තියෙනවානේ කොහේවත් ඉන්න ගෑණුන්ට බෙහෙත් කරන්න“

“එකක් මතක තියා ගනින් තෝ ඕන මගුලක පලයන් මගේ එකාව අතඇරලා“

“තමුසේ වගේ අනාථ ගෑණුන්ට වැඩකාරකම් කරන්න මං ළග ළමයි නෑ“

“තියෙන කරුමෙට තමුන්ගේ අම්මාත් තමුසෙව අතඇරලා දැම්මා“

“මිනිහාටත් එපා වෙලා වෙන්න ඇති මරලා දාන්න හදන්න ඇත්තේ“

“අම්මා.......“

නිශිත්ට කේන්ති ගියාම අහිංසකයි වගේම තමා.

ඒ කෑගහපු පාරට නිශිත්ගේ අම්මාත් නිශ්ශබ්ධ වුණා.

අනූගේ නම් ඇස් වලින් කඳුළු බේරෙනවා.

“අම්මා ඇති දැන්. තවත් මුකුත් කියලා මට කේන්ති ගිහින් අරවා කිව්වා මේවා කිව්වා කියන්න එපා. ප්ලීස් යන්න මෙතනින්“

නිශිත් කේන්තියෙන් කියපු දේට අම්මා ටිකක් පාලනය වුණා.

“මං මොකටද යන්නේ. යමු මාත් එක්ක ඔයත්“

“අම්මා යන්න. මං හවස එන්නම්“

“ආයේ හවස මොකද්ද. එනවා යන්න මාත් එක්ක. ආයේ මං කියන්නේ නෑ“

“මේ ටිකත් බොන්නකෝ අනූ“

“උඹ වෙන උන්ගේ ගෑණුන්ට සුප් පොව පොව හිටපන්කෝ පුතේ“

“මට ඇති. ඔයා යන්න අයියේ“

“මං අම්මාව දලා එන්නම් අනූ“

“එන්නම්. ආයේ කොහේ එන්නද. ආයේ මේකි එක්ක ඉන්නවා දැක්කොත් මං හොඳ වැඩක් කරනවා දැනගනින්“

“කන බොනකොට තිරිසනෙක්ටවත් මුකුත් කියන්න එපා අම්මා. පව් සිද්ද වෙනවා“

නිශිත් තවත් එතන නොරැඳි අම්මා එක්ක එළියට ගියේ තවත් අනූගේ හිත රිද්දන්න බැරිකමට.

අනූට නම් දැන් එයාගේ ජීවිතේ එපා වෙලා. හැමෝම එයාට මෙහෙම කරන්නේ ඇයි.

‘මටත් තියෙන්නේ හිතක්. ගලක් නෙමෙයි. මාත් මනුස්සයෙක්‘

‘ඇයි හැමෝම මට සතෙක්ට වගේ සලකන්නේ‘

‘මං මොකද්ද මෙච්චරටම කරපු පව‘

තුවාල සුව නොවුණත් තවත් මෙහෙම හිටියොත් නිශිත් අයියාටත් නැති ප්‍රශ්නවලට මූණ දෙන්න වෙනවා කියලා අනු හිතුවා.

එහෙම හිතලා වෛද්‍යවරයා කොච්චර විරුද්ධ වුණත් අනු පෙරැත්ත කරලා කරලා බලෙන්ම වගේ ටිකට් කපවගත්තා.

මේ වෙනකොටත් නිශිත් ගෙවීම් කරලා තිබුණු එක අනුගේ හිතට බරක් වුණත් පස්සේ දවසක ඒ ණය ගෙවලා දානවා කියලා එයා හිතාගත්තා.

‘අතේ රුපියලක්වත් නැතුව කොහෙන් සල්ලි හොයන්නද‘

නිශිත් ගෙදරින් ගෙනත් තිබුණු ඇඳුම් වලින් එකක් ඇඳගෙන ඉතුරු ඇඳුම් 2ත් ගත්තා. ඇඳ උඩ තිබුණු ෆෝන් එකත් අරගෙන අනු තුවාල වල වේදනාව දරාගෙන හොස්පිටල් එකෙන් එළියට ආවේ ආයෙත් නිශිත් එන්න කලින් එතනින් යන්න ඕනේ නිසා.

ඒ ආවත් කොහේ යන්නද කව්රු ළඟට යන්නද ඒ කොහොම වුණත් අඩුම තරමේ යන්නේ කොහොමද අතේ සතේ නැතුව.

‘මට මගේ ජීවිතේ නැති කරගන්න බැහැනේ. හිඟා කාලා හරි ජීවත් වෙන්න වෙනවා‘

අනූ අමාරුවෙන් වුණත් හිමින් හිමින් ඇවිදගෙන හොස්පිට්ල් එකෙන් ටිකක් දුරකට පයින් ආවේ අනිවාර්යෙන්ම නිශිත් හොයන බව දන්න නිසාමයි.

ඒත් වැඩි දුරක් යන්න බැරි වුණේ ඇවිදපු නිසාමද කොහේද බඩේ තුවාල වලින් වේදනාවක් දැණුනු නිසා.

නිවාඩු දවසක් නිසා වැඩි සෙනඟක් නෑ. පාළුවට ගිය බස් හෝල්ට් එකක අනූ ඉඳගත්තේ තවත් ඇවිදගන්න පණක් නැති වෙද්දි.

ඇඳගෙන හිටපු බ්ලවුස් එකට යටින් බඩේ ප්ලාස්ටර් දලා තිබුණු තැනට අත තියාගත්තේ එන්න එන්නම වේදනාව වැඩි වෙන නිසා.

තුවාල පෑරිලාද කොහේද. අතට තෙතක් දැණුන නිසාම අනූ අත දිහා බැලුවේ.

'දෙයියනේ ලේ එනවා. මං මොකද්ද කරන්නේ'

මේ අතරේ නිශිත් රණ්ඩුසරුවල් මැද්දෙම අම්මාව මගින් බස් එකට දලා ඉක්මණට ආවේ හොස්පිට්ල් එකට.

අනූ හිටපු රූම් එකේ දොර ඇරලා බලද්දි නිශිත් පුදුම වුණා ඇඳ හිස් බව දැකලා.

"මිස් මිස් මේ රූම් එකේ හිටපු පේෂන්ට් කෝ"

"එයා බලෙන්ම ටිකට් කපාගෙන ගියා"

"මොකක්...."

“ඔව් දැන් ටිකකට කලින් ගියේ“

නිශිත්ට කර කියා ගන්න දෙයක් නැති වුණේ ඒ කියපු දේට.

‘මේ කෙල්ල කොහේ ගියාද‘

‘දෙයියනේ ඇවිදින්න හොඳත් නෑ‘

‘තුවාල තාම එහෙම්මමයි‘

‘අනේ සල්ලිවත් නෑ. පයින් ගියාවත්ද‘

‘අම්මා කියපු දේවල් වලට දුක හිතෙන්න ඇති‘

නිශිත් ඔළුවේ අතගහගෙන මුළු හොස්පිට්ල් එක පුරාම අනූව හෙව්වා. ඒත් කොහේවත් පේන්න නෑ.

නිශිත් වාහනෙත් අරගෙන පුළුවන් හැමපාරකම බැලුවා.

‘අනේ දෙයියනේ මට මගේ අනූව මුණ ගස්සන්න‘

වැඩි වෙලාවක් ගත වෙලා නැති නිසාම අනූ දුරකට යන්න විදියක් නෑ කියලා තීරණය කරලා ළඟ ළඟ පාරවල් වල නිශිත් අනූව හොයන්න ගත්තා.

අහම්බෙන් වගේ අනූ හිටපු බස් හෝල්ට් එක නිශිත්ට පහු වුණේ දෛවය ආයෙත් දෙන්නාව මුණ ගස්සවලා.

‘අනූ නේද ඒ‘

නිශිත් වාහනේ පස්සට ගත්තේ අනූගේ ඡායාවක් වගේ දැකලා.

“දෙයියනේ අනූ......“

නිශිත් වාහනෙන් බැස්සා නෙමෙයි පැන්නා.

ඇස් වලින් කඳුළු වැටෙද්දි අමාරුවෙන් බඩත් අල්ලගෙන ඉඳගෙන ඉන්න අනුව දැක්කාම නිශිත් ඉක්මණට එතෙන්ට ආවා.

"අනු...."

"ඇයි නංගි ඔයා මෙහෙම කරන්නේ"

"අයියේ..."

අනුට කියන්න හම්බුණේ එච්චරයි. අනු නිශිත්ගේ ඇඟට කඩාගෙන වැටුණා.

"අනු කතා කරන්නකෝ.."

"අනු අනේ නංගී...."

අනුගේ තුවාල වල වේදනාවට එයාට කලන්තේ හැදුණා.

අනුව වත්තම් කරගෙන ඉක්මණට කාර් එකට දගත්ත නිශිත් වතුර ටිකක් අරගෙන එයාගේ මූණට ඉස්සා.

"අයියේ..."

අනු හිමින් ඇස් ඇරියා.

"ඔයා හරි හිතුවක්කාරයි නංගි"

"ඇත්තමයි මට දැන් කේන්ති යනවා ඔයත් එක්ක"

"ඇයි හොස්පිට්ල් එකෙන් ආවේ"

"බලන්න ඔයාට අමාරුයි. ආයෙත් තුවලා වල ලේ එනවා"

අනුගේ අත්වල ලේ තියෙනවා දැකලා නිශිත් හොඳටම කලබල වුණා.

“අපි යමු ආයෙත් හොස්පිට්ල්“

අනු නිශිත්ගේ අත් දෙකෙන් අල්ලගත්තා.

“අනේ එපා අයියේ. මේ ඇති දැන් හොඳටම ඇති“

“මාව කොහෙන් හරි දලා යන්න“

“මෙච්චර දවස් ඔයා මට ඕනවටත් වඩා සැලකුවා“

“මේ අනාථ කෙල්ල වෙනුවෙන් සල්ලි වියදම් කළා“

“මගේ ළඟ ඔයාට දෙන්න සල්ලි නෑ අයියේ. මං අසරණයි. ගොඩක් අසරණයි“

“මට පුළුවන් දවසක මං ඔයාට ඒ ණය ගෙවන්නම්“

“මාව කොහෙන් හරි දලා යන්න අයියේ“

නිශිත් තරහින් අනු දිහා බලාගෙන ඉන්නවා.

“ඉවරද කියවලා. නැත්තම් තව කියන්න තියෙනවාද මොනවාහරි“

නිශිත්ටත් කේන්ති ගිහින්.

“අයියේ මාව තේරුම්ගන්න. ඔයාගේ අම්මා කියන්නේ ඇත්තනේ“

“කොහේවත් ඉන්න මනුස්සයාත් මරන්න හදපු බැඳපු ගෑණියෙක්ට ඔයා සලකන්නේ ඇයි අයියේ“

“අම්මාගේ හිත රිද්දන්න එපා. අම්මා කෙනෙක්ගේ වටිනාකම දැනෙන්නේ මට ආදරේ කරන්න අම්මා කෙනෙක් නැති නිසා“

“එයාලාටත් මාව එපා වෙලා දාලා ගියා“

“ඇයි මම නිසා ඔයා ඔයාගේ අම්මාගේ හිත රිද්දන්නේ“

“අනූ පින් සිද්දවෙයි කට වහගෙන ඉන්නවාද. මං කරන්නේ මට ඕන දේ“

කිසිම කතාවක් නැතුව වාහනේ ගත්ත නිශිත් අනූ ආයෙත් හොස්පිට්ල් යන්න බෑම කියපු නිසා ආවේ ළඟම තිබුණු ඩිස්පෙන්සරියට.

නිශිත් ඇතුලට ගිහින් වෛද්‍යවරයාත් එක්ක කතා කරගෙන අනූව එක්ක යන්න ආවා.

අනූගේ පැත්තේ දොර ඇරලා අනූව අත්දෙකට ගන්න යද්දි අනූ නම් බයවෙලා බලාගෙන ඉන්නවා.

“අනේ අයියේ... එපා... මං හිමින් ඇවිදින්නම්“

“මරන්න ගෙනියනවා කියලා හිතුවද ආ. ගුටි නොකා මාව අල්ලගන්නවා“

එහෙම කියපු නිශිත් අනූව පරිස්සමෙන් අත්දෙකටම ගත්තා.

අනූ නිශිත්ගේ බෙල්ල බදාගෙන ඉන්නවා.

“වයිෆ් හිතුවක්කාරයි වගේ නේද කොල්ලෝ“

නිශිත් අනූ මූණෙන් මූණ බලාගත්තා.

“වයසේ වැරැද්ද තමා“

“ටික දවසක් ඇවිදින්නේ නැතුව ඉන්නවා නම් හොඳයි“

“මේ බෙහෙත් ටික බොන්න දිගටම. ඉක්මණට වේලෙයි“

“බය වෙන්න එපා හස්බන්ඩ් ඔයාට ආදරෙයි“

වෛද්‍යවරයා මේ කියන ඒවාට නිශිත්ට අනූට උත්තර නෑ.

ඒත් ඉතිං අනූව පරීක්ෂා කරපු වෛද්‍යවරයා දෙන්නටම ටිකක් බැන්නා තුවාල පෑරෙනකම් මොකද කලේ කියලා.

“ඇද්ද අහගත්තා නංගිට. හොඳ..... වැඩේ“

“දැන් මං කියන විදියට ඉන්න එකයි ඇත්තේ“

නිශිත් අනූට ඇද කරනවා.

නිශිත් ආයේමත් පරිස්සමට අනූව ගෙනත් වාහනෙන් තිබ්බා.

අනූට මේ දේවල් දරාගන්න බෑ. මෙච්චර ආදරයක් ජීවිතේට අනූට ලැබිලාත් නෑ.

අනූ ඇස්වල කඳුළු පුරවගෙන නිශිත් දිහා බලාගෙන ඉන්නවා.

“ඇයි දැන් මේ...“

“අනේ අයියේ..“

“මං කොහොමද මේවාට ඔයාට ණය ගෙවන්නේ“

“මට ඔයාගෙන් කිසි දෙයක් එපා නංගී.. කට වහගෙන ඉක්මණට තුවාල හොඳ කරගන්නකෝ. ඒ ඇති“

නිශිත් අනුගේ ඔළුවත් අතගාලා කල්පනා කළේ අනුවත් අරගෙන කොහේද යන්නේ කියලා.

එකපාරම දෙයක් නිශිත්ට මතක් වුණා.

“අනූ... ඔයාට මාව විශ්වාසයි නේද...“

නිශිත් අනූගේ මූණටම එබිලා ඇහුවා.

“මට හැමදම ඔයාව විශ්වාසයි. ඇයි එහෙම අහන්නේ“

නිශිත් ඇමතුමක් ගත්තේ විශ්වටට.

“විශ්ව මචං උඹේ අර රෙන්ට් එකට දෙන්න තිබුණු ගෙදර කාට හරි දුන්නාද“

.........

“ආ... තාම තියෙනවාද. ගෙදර බඩු....“

...........

“ඒවත් එක්කමද දෙන්නේ. හරි බං. මං දැන් ආවොත් කමක් නැද්ද“

..........

“හරි බං තව පැයෙන් මං ඔතන“

නිශිත් තව වචනයක්වත් කතා නොකර වාහනේ පණ ගන්වගත්තා.

“අපි කොහේද යන්නේ“

“නිශිත් අයියේ කියන්නකෝ කොහේද යන්නේ“

“මාව ඉස්සරහින් දලා යනවාද“

“අයියේ“

“කන් ඇහෙන්නේ නැද්ද ඔයාගේ“

නිශිත් සද්දයක්වත් නෑ.

“කියන්නකෝ ඇයි ගෙයක් ගැන ඇහුවේ“

“අයියේ කතා කරන්නකෝ“

අනූ නිශිත්ගේ අතින් ඇද ඇද අහනවා. ඒත් සද්දයක් නෑ.

“ආවි.....“ අනූ බොරු ඇක්ටින් පාරක් දැම්මේ.

“අනේ ඔයාට අමාරුයිද. නංගි කතා කරන්නකෝ“

හිහ්හ්හ්හ්හ්.

“බොරුකාරී.....“

*.... 17*

විශ්වගේ කුලියට දෙන්න තිබුණු ගෙදරට මේ දෙන්නා යනකොටත් විශ්ව ඇවිත් හිටියා.

අනූට වාහනේම ඉන්න කියලා නිශිත් විශ්ව එක්ක කතා කරලා ගණුදෙනු බේරගෙන ඒ වැඩ ටික ඉවර කරගත්තා.

“අනූ... එන්න යමු ඇතුලට“

“අනේ අයියේ ඔයාට ප්‍රශ්නයක් වෙයි...“

“මේ අහන්න ඔයාට මාව විශ්වාසයි නම් මට අනිත් අය වැඩක් නෑ“

“කව්රු මොනවා කිව්වාත් මං මට පුළුවන් විදියට ඔයාව බලාගන්නවා“

“ඒක නවත්තන්න කාටවත් බෑ“

“මං කොහොමද මේවාට ණය ගෙවන්නේ අයියේ“

“ඒක පස්සේ මං කියන්නම්කෝ. දැන් පැහෙන්නේ නැතුව එනවා“

නිශිත් අනුව පරිස්සමට අත්දෙකට අරගෙන කාමරේට ගෙනත් ඇදෙන් තිබ්බා.

“මේ අහන්න ඔයාව මට එක්කගෙන යන්න වෙන තැනක් නෑ. ඒකයි අපි මෙහෙට ආවේ“

“ඔයාගේ ගෙදර කියලා හිතාගෙන ඉන්න තේරුණාද“

“මං ඉක්මණට ටවුන් එකට ගිහින් එන්නම්. එතකම් ඔයා පරිස්සමට ඉන්න. මං දෙර ලොක් කරලා යතුර අරන් යනවා හොඳද“

නිශිත් අනුගේ ඔළුවත් අතගාලා යන්න ගියා.

“හ්ම්ම්ම්ම්“

එහෙම කිව්වාට අනුට ඉතිං තාමත් හිතේ බය තියෙනවා.

නිශිත් ඉක්මණට එළියට ගිහින් අනූට ඕන කරන ඇඳුම්, අනෙක් හැමදේම ගත්තා.

අද උයන්න බැරි නිසා එයාට රෑට කෑමත් කඩෙන්ම ගත්තා. අනූට නම් ගොඩක් දෙන්නේ පලතුරු වර්ග නිසාම පලතුරු ටිකකුත් ගත්තා.

නිශිත් ඉක්මණට මේ වැඩ ටික කරගෙන ගෙදර ආවේ අනූ ගෙදර තනියම හින්ද.

ඒත් අනූ පේන්න නෑ.

"අනූ.... ඔයා කොහේද.."

"අනූ... නංගී"

නිශිත් අනූව මුළු ගේ පුරාම හෙව්වා. ඒත් අනූ නෑ.

ආයේමත් දැණුනු සැකේට නිශිත් අනූ හිටපු කාමරේට ආවා.

යන්තමට ඇහුණු අඩන සද්දේ නිසා නිශිත් නිකමට වගේ ඇඳ යට බැලුවේ.

"දෙයියනේ මොකද ඔතන කරන්නේ"

"අනේ මට බෑ එළියට එන්න. හේමන්ත අයියා මාව මරයි"

"අනූ මං ආවානේ. හොඳ ළමයා වගේ එන්නකෝ"

නිශිත් හිමින් පරිස්සමට අනූව ඇඳ යටින් එළියට ගත්තා.

"මේ අහන්න අනූ අපි මේ ඉන්න තැන ගැන කව්රුවත් දන්නේ නෑ"

“අඩුම තරමේ අපේ ගෙදර අයවත් දන්නේ නෑ“

“ඉතිං මේ තැන ගැන හේමන්ත කොහොමවත් දන්නේ නෑ“

“අනික එයා ආයේ ඔයාට එහෙම කරදර කරන්නේ නෑ“

“තේරුණාද“

“ඒ නිසා බය වෙන්න එපා. මං ඉන්නවානේ. කව්රුත් මෙහේට එන්නේ නෑ“

“මං දන්නවා ඔයාට ඒක අමතක කරන්න අමාරුයි කියලා“

“ඒත් ඒක අමතක කරන්න කොහොම හරි“

නිශිත් අනුව ළඟට අරගෙන පැහැදිලි කළා.

ඒත් අනු නම් අඩනවා.

“ඔයාට ආයේ කරදර කරන්න කාටවත් බෑ“

“අපි හැමවෙලේම පිරිත් දලා තියමුකෝ. ම්ම්ම්ම්ම්“

“මෙන්න මේකේ ඇඳුම් ටිකක් ඇති. මට ඉතිං එහෙම ලොකුවට තෝරන්න නම් තේරෙන්නේ නෑ“

“අනිත් එකේ අනිත් ඕන ඒවත් ඇති. කවදා කාපු ටකරන්ද කියලා වට පිට නොබලාම ගත්තා“

“අයියේ....“

අනුට ඊට වඩා කතා කරන්න වචන එකතු කරගන්න බැරි වුණා.

"ඔය ඉතිං අඬනවා... නංගී මේ අහන්න ඔයා මගේම නංගි වගේ"

"ඔයා මාත් එක්ක ඉන්නකල් මට පුළුවන් තරමින් මං ඔයාව බලාගන්නවා"

"ඔයාට යන්න ඕනේ හිතුණ දවසට ඔයා යනකම්ම මං ඔයත් එක්ක ඉන්නවා"

"ඒ නිසා දැන් ඒ දේවල් කිසි දෙයක් ගැන හිතන්නේ නැතුව ඉන්න"

"මාත් එක්ක දඟලන්න හදන්න එපා මං හේමන්තට වඩා වසයි තේරුණාද"

බොරු නපුරු මූණකුත් හදාගෙන නිශිත් කියද්දි අනූ කිසිම දෙයක් නොකියා එයා දිහා බලාගෙන හිටියා.

'ඇයි මේ අනාථ කෙල්ලට මෙහෙම සලකන්නේ අයියේ' අනූ හිතුවට කිව්වේ නෑ.

නිශිත් එයාගේ අතින්ම අනූට හිමින් හිමින් කෑලි වලට කපපු පලතුරු ටික ටික කැව්වා. බෙහෙත් ටිකත් බොන්න දීලා නින්ද යනකම්ම ළඟට වෙලා හිටියා.

අනූ ඇස් වහගෙනත් කල්පනා කලේ නිශිත් ගැන.

මෙච්චරම අනූට සලකන්න තරම් එයා කොච්චර හොඳ කෙනෙක්ද.

අනුට නින්ද ගියාට පස්සේ නිශිත් අනුගේ ඇඳ ළඟම බිමින් රෙද්දක් එළාගෙන නිදගත්තේ අනුට හදිස්සියක් වුනොත් ළඟ කව්රුත් නැති නිසා.

වතුර තිබහක් ආපු නිසා අනු මහ රෑ ඇහැරුණා. වතුර එක ගන්න ඇඳ ළඟම තිබුණු මේසේට අත යද්දි අනු දැක්කේ බිම රෙද්දක් එළාගෙන නිදගෙන ඉන්න නිශිත්ව.

අනුගේ පපුවේ විදුලියක් කෙටුවා වගේ වුණා නිශිත් මෙහෙම බිම නිදගෙන ඉන්නවා දැක්කාම.

ජීවිතේ හැමකෙනෙක්ම ලබන්න ප්‍රාර්ථනා කරන මේ වගේ ආදරයක්, රැකවරණයක් බැඳීමක් නැතුවම ලබන්න තරම් අනු වාසනාවන්තයි කියලා එයාට හැඟුණා.

තවත් මුකුත් හිතන්නේ නැතුව අනු පරිස්සමෙන් හිමීට ඇඳෙන් නැගිටලා එයාගේ කොට්ටෙත් අරගෙන තුවාල වල අමාරුවත් දරාගෙනම නිශිත් ළඟින්ම නිදගත්තා.

නිශිත් උදේ නැගිට්ටනකොට දැක්කේ අනු පොඩි දරුවෙක් වගේ නිශිත් අස්සෙම නිදගෙන ඉන්නවා.

අනු හිමීට කම්මැලිකමින් ඇහැරෙනවා නිශිත් වැලමිට උඩ ඔළුවත් තියාගෙන ආදරෙන් බලාගෙන හිටියේ එයාව තුරුල් කරගන්න ආපු හැඟීම අමාරුවෙන් හිරකරගෙන.

“ඒ මේ හලෝ…“

“මොකද මේ බිම කරන්නේ ආ..“

“මං මේ බිමද ඉන්නේ. කව්ද මාව බිමින් තිබ්බේ..“

අනූ මුකුත් දන්නේ නෑ වගේ වට පිට බලනවා.

“මාව චීනෙක් වගේ පේනවාද නංගිට ආ“

“ම්ම්ම්ම්..... නෑ අනේ.. මට හොඳ සිංහල කොල්ලෙක් වගේ තමා පේන්නේ“

“මේ අනූ සෙල්ලම් කරන්න එපා අනේ. තාම ඔයාට සනීපයක් නෑනේ. බිම සීතලයි. තුවලා රිදෙනවා. ඇයි කියනවා බිමට ආවේ“

“ඉතිං ඔයා බිම නිදාගත්තේ ඇයි මේ ගෙදර මෙච්චර ඇඳන් තියෙද්දි“

“ඉතිං අනේ ඔයාගේ ඇඳේ නිදාගන්නද කියන්නේ මට“

අනූ සද්ද නෑ.

“හරි හරි එහෙනම් මං මගේ ඇඳ මේ කාමරේට දාගන්නම්. කමක් නැද්ද“

“හා යමු. මාත් උදව් කරන්නම්“

අනූ එකපාරම නැගිට්ටින්න හැදුවේ.

“ආව්... අනේ...“ අනූ බඩ අල්ලගෙන.

“තමුසේ නම් මහා පණ්ඩිත ගූහාවක්. දැන් හරිනේ“

නිශිත් ඉක්මණට නැගිටලා අනූව අත් දෙකට අරගෙන ඇඳෙන් තිබ්බා.

දවස් ගාණක්ම අනුට අත්‍යාවශ්‍ය දේකට ඇරෙන්න ඇඳෙන්වත් බහින්න දෙන්නේ නැතුව නිශිත් එයාගේ අතින් හැම වැඩක්ම කළා. අනූගේ කොණ්ඩේ පවා පීරුවේ නිශිත්.

අනූට නම් මේ දේවල් දරාගන්න කොහෙත්ම බෑ. ඒත් අනූ ඒ ආදරේට දැන් ගොඩක් ලෝභයි.

අනූ මේ දවස් ටික හරිම සැහැල්ලුවෙන් ගත කළා. නිශිත් පුළුවන් හැමවෙලාවකම අනූව සතුටින් තියන්න පුළුවන් හැමදෙයක්ම කළා.

***********************************************
*******

“අනූ...මොකද අද මූණ බෙරි වෙලා“

අනූ සද්ද නෑ.

“අනූ....“

අනූ බඩට අත තියාගත්තා.

නිශිත් අනූ ළඟින්ම ඇවිත් වාඩිවුණා.

“ඇයි තුවාල රිදෙනවාද ආයෙත්. ඩොක්ටර් කෙනෙක්ට පෙන්නමුද“

“එහෙම දෙයක් නෙමෙයි..“

“එහෙනම්..“

“බඩ රිදෙනවා...“

අනූ ඇහෙන නෑහෙන ගාණට කියලා දැම්මා.

නිශිත්ට දැනුයි කල්පනාවට ආවේ.

“අසනීප වෙලාද“

“හ්ම්ම්ම්ම්“ අනූ බිම බලාගෙන කිව්වා ඉතිං.

නිශිත් නැගිටලා ගිහින් පෙන්ඩෝල් දෙකකුත් එක්ක, බෝල් එකකට උණු වතුරත් දාගෙන ටවල් එකකුත් අරගෙන ආවා.

“ආ මේක බොන්න“

“ඔයා ටිකක් තවාගන්න මේකෙන්. තනියම පුළුවන්ද“

අනූ ඔළුව හෙල්លුවා.

“මං කොත්තමල්ලි ටිකක් හදාගෙන එන්නම්“

අනූට නම් මේ දේවල් අදහාගන්න බෑ. කොල්ලෙක්ට පුළුවන්ද මෙච්චරටම කෙල්ලෙක් වෙනුවෙන් දේවල් කරන්න.

‘ඔයාට හම්බෙන කෙනා හරිම වාසනාවන්තයි අයියේ‘

‘මේ ලෝකේ ඔයා වගේ අය කොහේවත් නැතුව ඇති‘

“ආ... මේක බීලා ටිකක් නිදාගන්න“

“පින් සිද්දවෙයි කියලා නම් කියන්න එපා නගෝ....“

“තැන්ක්යූ අයියේ..“

“පිස්සි...“

*.... 18*

අනුගේ තුවාල තාමත් හොඳටම වේලිලා නැති නිසා නිශිත් නම් කැමති නෑ අනූ කුස්සිය පැත්තටවත් එනවාට. ඒ හින්දමයි අනූ මේ වෙනකම් ඒ පැත්තටවත් ගියේ නැත්තේ.

ඒත් ඉතිං එකම තැන ඉඳලත් කම්මැලියිනේ. ඊටත් වඩා නිශිත් මහන්සි වෙන එක ගැන අනූගේ හිතේ තියෙන්නේ ලොකු දුකක්.

අනූ හිමීට කුස්සිය පැත්තට ගියා. නිශිත් හිටියේ එළවළු කප කප.

අනූ කකුලේ සද්ද ඇහෙන්නේ නැති වෙන්න ඇඟිලි තුඩු වලින් ඇවිද ඇවිද නිශිත්ගේ පිටිපස්සට ආවා.

නිශිත්ට කව්රුහරි ආවා කියලා දැණුන නිසාම එයා පිටිපස්ස බැලුවේ පිහිය අතේ තියෙද්දීමයි.

අනූ ඇස් දෙක ලොකු කරගෙන බයවෙලා බලාගෙන ඉන්නවා.

"අනූ... ඇයි මෙහෙට ආවේ...

නිශිත්ගේ අතේ පිහිය තියෙනවා දැකපු අනූට මතක් වුනේ එද හේමන්ත අනූට පිහිය අරගෙන ඇනගෙන ඇනගෙන ගිය හැටි.

අනූ පස්සෙන් පස්සට ගියා.

ඒත් නිශිත්ට නම් හිතාගන්න බෑ අනූ මෙහෙම හැසිරෙන්නේ ඇයි කියලා.

"අනූ මොකද්ද වුනේ...."

අනූ පස්සෙන් පස්සට ගිහින් එකපාරම කෑගහගෙන දුවන්න ගත්තා.

"අනේ මාව මරන්න එපා..."

"අයියේ එපා... අනේ මාව මරන්න එපා"

නිශිත්ට දැනුයි කල්පනාවට ආවේ. නිශිත්ගේ අතේ පිහිය තියෙනවා දැකපු අනූට හිතුනේ නිශිත් අනූට පිහියෙන් අනින්න හදනවා කියලා.

මොකද මෙච්චර දවසක් ගතවෙලාත් අනූට තාමත් බෑ එද වුණ සිද්ධිය අමතක කරන්න.

අනූ එයාගේ තුවාල වල වේදනාව දරාගෙන පිටිපස්ස බල බල දුවනවා.

"නංගී දුවන්න එපා... නවතින්න.."

"මගේ ළඟට එන්න එපා..."

"මරන්න එපා... මාව මරන්න එපා..."

“අනේ බේරගන්න...“

“අනූ කෑගහන්න එපා. මං ඔයාට මුකුත් කරන්නේ නෑ“

නිශිත් අනූගේ පස්සෙන්ම දුවනවා.

අනූ දුවගෙන දුවගෙන ඇවිත් මිදුලට බැහැලා පාර පැත්තට දුවනවා.

“නංගී එපා.....“

ප්‍රධාන පාර ආසන්නයේ තිබුණ ගෙයක් නිසාම අනූ පාරට පැන්නොත් ජීවිතේ ලොකු අනතුරක.

“අනූ එපා...“

නිශිත් ගිරිය යටින් කෑගැහුවා.

අනූ ආව වේගෙන්ම පිටිපස්ස හැරුණේ නිශිත් එනවාද බලන්න.

අනූගේ වෙලාව හොඳකමට නිශිත් අද ගේට්ටුව තාමත් ලොක් කරලා.

අනූ ආපු වේගේටම ගේට්ටුවේ හැප්පිලා සිහි නැතුව වැටුණේ නිශිත්ට කර කියාගන්න දෙයක් නැති වෙද්දි.

“දෙයියනේ අනූ... මොනවාද මේ කරගත්තේ“

ආයේමත් බඩේ තුවාල වලින් ලේ එනවා. අනූට සිහිය නෑ.

නිශිත් අනූව ද්‍රේනටම අරගෙන පරිස්සමට ඇඳෙන් හාන්සි කරවලා ඩොක්ටර්ට කෝල් කළා.

ඒත් ඩොක්ටර් එන්න ටික වෙලාවක් ගතවෙන බව කිව්ව නිසාම නිශිත් වතුර ටිකක් අනුගේ මූණට ඉස්සා.

"අනූ කතා කරන්න... අනේ මට මෙහෙම කරන්න එපා...."

"අනූ..."

"අනේ නංගී...."

ටික වෙලාවකින් අනුගේ ඇස් ඇරුණත් අනූට පෙනුනේම නිශිත් පිහිය තමන්ගේ පැත්තට එල්ල කරගෙන ඉන්නවා.

"අනේ මාව මරන්න එපා..."

"මට යන්න දෙන්න..."

"අනේ එපා...."

අනූ කෑගහනවා. දඟලනවා.

"අනූ ෂ්ෂ්ෂ්..."

"මං ඔයා ළඟ ඉන්නවා... කෑගහන්න එපා.."

"දඟලන්න එපා තුවාල වලින් ලේ එනවා"

"ඔයා... ඔයා... මාව මරනවාද..."

"අනේ එපා... මාව මරන්න එපා..."

නිශිත් අනූව තදින් තුරුල් කරගත්තේ කෙල්ල දඟලන එක නවත්තන්නේම නැති නිසා.

අනූ නිශිත්ගෙන් ගැලවෙන්න දඟලලා දඟලලා අනූට දැන් මහන්සියි.

අනූගේ දැඟලිල්ල නැවතුන නිසාම නිශිත් කතා කළා.

“අනූ මට සමාවෙන්න..“

“ඔයාව බය කරන්න ඕනේ වුණේ නෑ මට..“

“කව්රුහරි එනවා දැණුනු නිසයි මං පිටිපස්ස හැරුණේ“

“මගේ අතේ පිහිය තියෙනවා කියලා මට අමතක වුණා..“

“මට සමාවෙන්න දෙයියනේ... මං මහා පව්කාරයෙක්“

“ගේට්ටුව ඇරලා තිබුණා නම්.... අනේ දෙයියනේ... අනූ.....“

නිශිත්ට තමන් කරපු දේ බරපතලකම දැනුයි.

වාහනේකටවත් අනූ හැප්පුණා නම් මුළු ජීවිතේම පසුතැවෙන්න වෙනවා නේද කියලා නිශිත් කල්පනා කළා.

නිශිත් අනූව එයාගේ පපුවට තද කරගෙන හිස සිපගත්තේ ඒ හැඟීමෙන්මයි.

“ඔයා මාත් එක්ක තරහයිද අනූ......“

“අනේ කතාකරන්නකෝ... ඔහොම ඉන්න එපා...“

“මට සමාවෙන්න..“

“කතා නොකර ඉන්න එපා අනූ...“

“අනේ මට ගහන්න බනින්න. තරහයි නම් මරලා දාන්න“

“ඒත් කතා නොකර ඉන්න එපා“

නිශිත්ගේ කඳුළු බේරෙනවා. ඒ හැම කඳුළු බිංදුවක්ම අනුගේ මූණටත් වැටුණා.

අනු මෙච්චරවෙලා නිදහසේ පහළට වැටිලා තිබුණු එයාගේ අත්දෙක නිශිත්ගේ ඉන වටේ දාගෙන එයාට තුරුල් වුණා.

"මං... මං... හිතුවා.. ඔයාත් මාව මරන්න.. හදනවා කියලා"

අනු ඉකි ගහනවා.

"මට... මට... බය හිතුණා.."

"ඔයා ඔහොම හිතුවේවත් කොහොමද නංගී"

"මං මැරුණත් මං ඔයාට කවදාවත් එහෙම කරනවාද"

"ඔයා මං ගැන එහෙමද හිතාගෙන ඉන්නේ අනු..."

"අනේ... එහෙම කියන්න එපා... මං ඔයා ගැන එහෙම හිතුවේ නෑ"

"ඒත් මට පිහියක් දැක්කත් පුදුම බයක් දැනෙනවා"

"මාව මරන්න එනවා වගේ හිතෙනවා"

දෙන්නාම මෙච්චර වෙලා තුරුල් වෙලා ඉඳලා කාටවත් ගාණක් නෑ..

නිශිත් කලින් ඩොක්ටර්ට කතා කරලා තිබුණු නිසා එයා බෙල් කරන සද්දෙට තමා දෙන්නා ඈත් වුණේ.

අනුගේ තුවාල පිරිසිදු කරලා ආයේමත් බෙහෙත් දාලා දෙන්නාටම හොඳටම බැනලා තමා ඩොක්ටර් ගියේ.

ඇයි ඉතිං ඒ තුවාලෙට වේලෙන්න දෙන්නෙම නෑනේ. මොනවාම හරි කරගන්නවා.

“ආයේ ඇඳෙන් බැහැලා තිබුණොත් බලාගමු හරිද“

“ඇයි...“

“ඇයි.? ඇයි නෙමෙයි. ගැටගහලා දනවා ඇඳේ තුවාල හොඳවෙනකම්ම“

“එතකොට මං කෑගහනවා...“

“ආ ඇත්තද.. එහෙනම් ඉස්සෙල්ලාම කට තමා ගැටගහන්නේ“

“ඇදට වෙලා ඉන්න බෑ අනේ... ඉඳගෙන ඉඳලාම පස්සත් රිදෙනවා මගේ“

“හිහිහිහිහ්හ්හ්හ්“

“මොකද හිනාවෙන්නේ...“

“කෝ එන්නකෝ අතගාන්න එහෙනම්...“

නිශිත් උනන්දුවෙන් නැගිටලා අනූ ළඟට ආවා.

“ආ ඇත්තද.. වෙලා යයි...“

අනූ කට ඇද කරනවා.

“අයියෝ.... ඕකට මහා වෙලාවක් යන්නේ නෑ...“

“යනවා යන්න මෝඩයා..“

අනූ නිශිත්ට ගුටියක් දුන්නේ ඇඳේ තිබුණු කොට්ටෙන්.

****************************************************
********

දවල් වුණු සිද්ධිය නිසා නොකිව්වාත් දෙන්නාම ඉන්නේ කල්පනා ලෝකේ.

නිශිත්ට හිතාගන්න බෑ අනූ මෙහෙම බය වෙන එකට මොනවා කරන්නද කියලා.

අනූ හීනෙන් බය වෙන එක නම් යන්නතම් නැතුව ගියා. නිශිත්ට ඒක ලොකු සැනසීමක් වුණත් දැන් මේ ප්‍රශ්නේ.

නිශිත් තාමත් නිදගන්නේ අනූගේ කාමරේට දගත්තු එයාගේ ඇඳේ.

දෙන්නාම වෙනද වගේම නිදගන්න ආවත් දෙන්නටම නින්ද යන්නේ නෑ.

නිශිත්ට නම් කල්පනා වෙන්නෙම තමන් නිසා වෙන්න ගියපු විනාසේ තරම ගැන.

මේ අතරේ අනූට කවදාවත් නැතුව ඇඳේ තනියම නිදගන්න බය හිතුණා.

ඇඳන් දෙක කාමරේ කෙළවරවල් දෙකේ තමා තියෙන්නේ.

වැරදි වැඩක් කියලා හිතුණත් අනූ එයාගේ කොට්ටෙත් අරගෙන ගියේ නිශිත්ගේ ඇඳ ළඟට.

“අයියේ...“

“අයියේ....“

“අනූ ඇයි මේ...“

“මං මෙතෙන්ට එන්නද..“

නිශිත් නම් ඇස් දෙක ලොකු කරගෙන බලාගෙන ඉන්නවා.

“එන්නද කියන්නකෝ...“

“එන්න.. ඒත්...“

අනූ නිශිත් ළඟම කොට්ටේ තියාගෙන එයාගේ පැත්තට හැරුණා.

“ඔයා මට බය නැද්ද“

නිශිත්ගේ වයසේ වෙන කොල්ලෙක් එක්ක මේ වගේ ගෙදරක ලස්සන කෙල්ලෙක් තනියම හිටියා නම් මේ වෙද්දිත් වෙන්න ඕනේ හැමදේම වෙලා.

ඒත් දැන් සති ගාණක් ගතවෙලාත් නිශිත් අනූ දිහා වැරදි බැල්මක්වත් දැම්මේ නෑ නේද කියලා අනූ කල්පනා කළා.

හොස්පිට්ල් එකෙන් ආපු මුල්ම දවස්වල අනූට නැවෙන්නවත් බැරුව ඉද්දි නිශිත් මූණ හෝදන වැඩ ඉඳන් හැමදේම කරපු හැටි අනූට මතකයි.

එයා තමන්ගේම තාත්තා කෙනෙක්, සහෝදරයෙක් වගේ තමන්ව බලාගන්නවා කියලා අනූ දන්නවා.

කව්රුවත් අඳුරන්නේ නැති තැනක, තනි ගෙදරක සති ගාණක් ගත කරපු එකේ..

ඉතිං මොකටද බය වෙන්නේ...

‘‘ඔයාට බය වෙන්න ඔයා නරක කෙනෙක් නෙමෙයි අයියේ‘‘

‘‘ඔයා එහෙම කෙනෙක් වුණා නම්  මං මේ වෙද්දිත් විනාස වෙලා ඉවරයි‘‘

පොඩි දරුවෙක් ඇඳෙන් වැටෙයි කියලා පරිස්සම් කරන තාත්තා කෙනෙක් වගේ නිශිත් අනූට රෙද්දත් පොරවලා අනූගේ පැත්තට හැරිලා අනූගේ ඔළුව වටෙන් අත තියාගත්තා.

අනූ නම් හා පැටියෙක් වගේ නිශිත්ගේ අස්සටම තුරුල්වෙලා හොඳට නිදි.

මේ දේවල් දකිද්දි නිශිත්ට උහුලගන්න බැරි තරම් ආදරයක් දැනෙනවා.

‘මේ හිටියා වගේ ටික දවසක් ඉවසපන් නිශිත්‘

‘කෙල්ල උඹේ වෙනවා. ඒක ඉර හඳ වගේ විශ්වාසයි‘

නිශිත්ම හිතාගත්තා.

sinhalaebooks.com

*.... 19*

එදා වුණු සිද්ධිය නිසා අනූ වගේම නිශිත් ඉන්නෙත් හිතේ කරදරෙන්.

මොන දේ වුණත් හැමදාමත් මෙහෙම නිශිත්ටම උයන පිහන වැඩ කරන්න දෙන්න බෑ නේද කියලා අනූ රෑ නින්දට යද්දි හිතුවා.

අනූ අද නිශිත්ට කලින්ම නැගිට්ටා. නිශිත්ට ඇහැරෙන්නේ නැති වෙන්න හිමීට කුස්සිය පැත්තට ගියා.

ඒත් අනූ ඇහැරෙනකොටම නිශිත්ටත් ඇහැරුණු නිසාම අනූ මොකද කරන්න හදන්නේ බලන්න නිශිත් පිටිපස්සෙන් හිමීට ගියා.

කොණ්ඩෙත් බෝලයක් වෙන්න බැඳගත්තු අනූ අද උයන්න ඕන දේවල් ෆ්‍රිජ් එකෙන් තෝරගත්තා. ඒ ටිකත් පැන්ට්‍රිය උඩින් තියලා අනූ ගියේ පිහි ටික තියෙන තැනට.

නිශිත් මේ හැමදේම දොරට මුවා වෙලා බලාගෙන ඉන්නවා.

අනූ හොඳ හූස්මක් අරගෙන එළවළු කපන පිහිය අතට ගත්තා.

sinhalaebooks.com

ඒත් අනුගේ හිතේ එක පාරම මැව්ලා පෙනුනේ හේමන්ත පිහිය අරගෙන අනුගේ බඩට ලේ විසිවෙද්දි ඇනගෙන ඇනගෙන ගියපු හැටි.

අනූ අතින් අල්ලගෙන හිටපු පිහිය විසි වුණා. අනූ අඬ අඬම පැන්ට්‍රිය ළග බිම වාඩිවුණා.

නිශිත් හිමීට අනූ ළඟට ඇවිත් එයත් බිමින් වාඩි වුණා.

"අනූ.... මගේ නංගි..."

අනූ මහ සද්දෙන් අඬාගෙන නිශිත්ට තුරුල් වුණා.

"මට බෑ දෙයියනේ මට බෑ.."

"මේ අහන්නකෝ අනූ.."

"දමිත් ඔයාව අතරමග දාලා යද්දිවත් ඔයා ඔහොම අඬන්න නැතුව ඇති කියලා මට හොඳටම විශ්වාසයි"

"ඔයාගේ අම්මාගේ බල කිරීමට ඔයා ජීවිතේටවත් දැකලා නැති මනුස්සයෙක් එක්ක පවුල් කන්න කැමති වුණා"

"ඒ මනුස්සයා ගාව ඔයාගේ අම්මා ඔයාව දාලා යන්න ගියා"

"හේමන්තගේ කරදර හැමදෙයක්ම ඔයා ඉවසගෙන හිටියා"

"එයා වෙන කෙනෙක් ළඟට යන බව දැන දැනත් ඔයා ජීවත් වුණා"

"ඔයා ඒ හැමදේම ඉවසගත්තේ දරාගත්තේ ඔයා ශක්තිමත් නිසා"

“ඔයා කසාද බැන්ද වුණත් තාමත් පොඩියි අනූ“

“හේමන්ත එද කරන්න හදපු දේ ඔයාට දරා ගන්න අමාරුයි කියලා මං දන්නවා“

“ඒත් එහෙමයි කියලා ඒ දේ නිසා ඔයා ඔයාගේ මුළු ජීවිත කාලේම මෙහෙම බයවෙලා ඉන්න පුළුවන්ද“

“ඔයා ඔයාගේ ජීවිතේ ගැන හිතන්න ඕන. තාමත් ඔයාගේ ජීවිතෙන් බාගයක්වත් ගෙවිලා නෑ“

“ඉතිං ඒ වගේ දේකට ඔයාව හැමදම බය කරලා තියන්න ඉඩ දෙන්න එපා අනූ“

“මම කියන තරම් ඒ අත්දැකීමට මූණ දුන්න ඔයාට ඒක කරන්න ලේසි නෑ තමා“

“ඒත් ඔයාට පුළුවන්. ඔයා ඒක කොහොම හරි කරන්න ඕනේ“

අනූ නිශිත්ගේ තුරුලෙන් ඈත් වුණා. කඳුළු පිහදගෙන නැගිටලා පිහිය විසි කරපු තැනට ගියා.

නිශිත් අනූගේ පස්සෙන් ගිහින් අනූගේ වම් අතින් අල්ල ගත්තේ කිසි දේකට බය වෙන්න එපා කියලා ඇස් වලින් ඉඟි කරන ගමන්.

අනූ පිහිය අතට ගත්තා. හිතට ශක්තිය අරගෙන එළවළු කපන්න හැදුවත් අනූට ඒක කරන්න බැරි වුණා.

ඒ සිද්ධිය ඒ තරමට අනූව කම්පනයට පත් කරලා.

“අනේ මට බෑ... මට බෑ... මට බෑ...“

“නෑ අනූ. අද ඔයා ඒක කරන්නම ඕනේ“

“අද බැරි වුණොත් ඔයාට කවදාවත් ජීවිතේට මූණ දෙන්න බැරිවෙයි“

“මම ළඟ ඉන්නවානේ.. බය නොවී ඒක කරන්න අනූ..“

“මං මෙච්චර කියන නිසාවත් කරන්න බලන්නකෝ...“

නිශිත්ගේ වචන ඉස්සරහා අනූ ගොඩක් අසරණ වුණා.

අනූ තමන් ගැනම හිතලා බැලුවා. ඒ වගේ සිද්ධියකට තමන්ගේ මුළු ජීවිතේම තීරණේ කරන්න දෙන එක වැරදි නේද කියලා එයාටම හිතුණා.

අනූ ඇස් වලින් කඳුළු වැටෙද්දි එළවළු ටික කපලා ඉවර කළා.

පොඩි දරුවෙක් වගේ නිශිත්ට තුරුල් වෙලා ඒ සතුට බෙදාගත්තා.

නිශිත්ට නම් ගොඩක් සතුටු හිතුණා අනූගේ හිතෙන් ඒ බය නැති කරන්න පුළුවන් වුණ එක ගැන.

එදා ඉඳන් උදේට දෙන්නාම එකටම නැගිට්ටා. වැඩ බෙදාගෙන කළා.

නිශිත් උයන්න ඕන එළවළු කපලා දෙනවා. අනූ උයනවා. එහෙම නැත්නම් අනූ එළවළු කපලා දෙනවා. නිශිත් උයනවා.

හරිම ලස්සනයි.

sinhalaebooks.com

නිශිත් අනූ වෙනුවෙන් කරන හැමදේකටම අනූ නම් හැමදාම නිශිත්ට පින් දෙනවා.

“මට දැන් පින් දීලා දීලාම දාගන්න තැනකුත් නෑ අප්පා“

නිශිත් ඒ වෙලාවට එහෙම තමා කියන්නේ.

“අයියෝ....“

“ම්ම්ම්ම් මොකෝ“

“මට දැන් වැඩ කරන්න පුළුවන්. තුවාලත් හොඳයිනේ“

“ඉතිං“

“ඔයා දැන් ගොඩක් දවස් ඔෆිස් ගියේ නෑනේ. හෙට ඉඳන්වත් යන්නකෝ“

“බලමුකෝ“

“බලමුකෝ කියන්නේ ඇයි“

නිශිත් ටික වෙලාවක් සද්ද නැතුව හිටියා. කවදා හරි ඉතිං ඇත්ත කියන්න වෙනවනේ.

“මං රස්සාවෙන් අයින් වුණා“

“මොනවා...“

ඇඳේ හාන්සි වෙලා හිටපු අනූ එකපාරම ඇඳෙන් නැගිට්ටා.

“හොඳ වෙලා තියෙන තුවාල ආයෙත් පාරගන්න හදනවාද අනේ ඔයා“

“තුවාල ඕන දෙයක් වුණ දෙන්. ඇයි ඔයා අයින් වුණේ.... කියන්නකෝ“

“ඔයාට තාම හරි සනීපයක් නෑනේ නංගි. මට ඔයාව මෙහෙම ගෙදර දලා වැඩට යන්නත් බෑ. ඒ හින්දයි මං අයින් වුණේ“

“අනික මට හේමන්තගේ මූණ බලාගෙන තවත් වැඩ කරන්න බෑ නංගී“

“ඔයාට ඌ කරපු දේ නිසා මට ඌත් එක්ක තියෙන්නේ පුදුම කේන්තියක්. මං අතින් ඌ මැරෙනවාට මං කැමති නෑ“

“මං නිසා ඔයාට ඔයාගේ රස්සාවත් නැති වුණා නේද අයියේ. මං මහා පව්කාරියක්“

“අනේ එහෙම කියන්න එපා. ඔයා නිසා මට කිසි දෙයක් නැති වුණේ නෑ. මං එහෙම හිතන්නෙත් නෑ“

අනූගේ ඇස් වලට කඳුළු පිරෙන්න තත්පරයක්වත් ගියේ නෑ.

“මං වගේ අනාථ කෙල්ලෙකුට කසාදයක් කඩා ගත්තු කෙල්ලෙකුට මෙහෙම සලකන්න එපා අයියේ...“

“ආයේ ඔය වගේ කතා කිව්වොත් ඇත්තමයි ඔය කට කඩලා දනවා මම තේරුණාද“

නිශිත්ට හොඳටම තරහා ගියා.

අනූ බය වෙලා බලාගෙන ඉන්නවා.

“මොකද ඇස් දෙක ලොකු කරගෙන ඒ පාර“

“ඔයාට තරහා යනවනේ අනේ“

“අපෝ නෑ තරහා එනවා“

“ඔයා පව් අයියේ“

“පව් නේන්නම්. අනේ දෙවියනේ මට වුණු වියෝයා“

අත් දෙකත් උඩට උස්සගෙන නිශිත් කියද්දි අනූටත් හිනා ගියා.

“ඔලමොට්ටලයා“

“මොකා...“

“ඔලමොට්ටලයා අනේ...“

‘ගෙදරම ඉදලාත් කෙල්ලට එපා වෙලා ඇති‘

‘දැන් මගේ රස්සාව නැති එක ගැන හිත හිත ඉඳී‘

“අනූ....“

“ම්ම්ම්ම්ම්“

“අපි අද එළියට ගිහින් එමුද. ඔයාට දැන් මේ ගේ අස්සෙම ඉදලා කම්මැලි ඇතිනේ“

“අනේ ඔයාට කරදරයි අයියේ...“

අනූටත් යන්න නම් ආසයි. ඒත් නිශිත්ට කරදර කරන්න අනූට හිත දෙන්නෙත් නෑ.

“ලා පාට එකක් ඇඳගන්න. පන්සලටත් ගිහින් එමු“

දෙන්නාම ලෑස්තිවුනේ ඇවිදින්න යන්න.

අනුව පරිස්සමෙන් වාහනෙන් තියලා එයාම පන්සල් යන්න ලෑස්ති කරපු බඩු ටිකත් වාහනේට දගත්තා.

අනූට නම් මේ දේවල් වලට හීල්ලෙනවා හරියට.

අනූ වාහනේ සීට් එකට බෙල්ල හේත්තු කරගෙන නිශ්ශිත් දිහාම බලාගෙන හිටියා.

“දැන් නංගිට මොකද්ද ප්‍රශ්නේ“

“ම්ම්ම්ම්ම්හ්හ්“

“එහෙනම් මගේ මූණේ පෙරහැරක් යනවාද ආ“

“ඔයා ඇත්තටම මනුස්සයෙක්ද“

“මොකක්....? ඇයි මං සතෙක් වගේද. අනේ දෙයියනේ. මෙච්චර ලස්සන කොල්ලෙක්ට ඔහොම කියනවාද“

“නෑ ඔයා දෙවි කෙනෙක් වගේ“

අනූගේ ඇස් වලින් කඳුළු බිංදු එක දෙක වැටෙන්න ගත්තා.

“අනූ ඇයි අනේ අඬන්නේ.. ඔයා මෙච්චරටම දූර්වල වුනේ කවද ඉදලාද“

‘ඔයාගේ ආදරේ දැණුනු දවසේ ඉදලාම මම දූර්වලයි‘

‘මට ඔයාව දලා යන්න දුකයි‘

‘මට මෙච්චර ආදරේ කෙනෙක් මගේ මුළු ජීවිත කාලේම මුණගැහිලා නෑ‘

අනූ කල්පනා ලෝකේ.

“අනූ මං ඔයාට කතා කරන්නේ...“

අනූ ඉක්මණට කඳුළු පිහදාගත්තා.

දෙන්නාම කතාවෙන් කතාවෙන් පන්සලටත් ආවා.

අනූගේ සෙරෙප්පු දෙකත් නිශිත්ම ගලවලා වාහනේ තිබ්බා.

“මේ ටික ඔයාට ගන්න පුළුවන්ද අනූ...“

“හා..“

පන්සලට ඕන කරන බඩු ටික අනූ අතට ගත්තා.

ඊටත් පස්සේ අනූව අරගෙන පන්සලට ඇතුල්වෙන දෙර ළඟට වෙනකම්ම හරහාට උස්සගෙන ගියේ තාමත් වැඩිය ඇවිදින්න හොඳ නැති නිසා.

අනූව පරිස්සමට බිමින් තියලා නිශිත් එයාව වාරු කරගෙන පන්සලේ බුදු ගෙට ගියා.

මල් වට්ටියෙන් මල් අරගෙන නිශිත්ගේ දෝතටත් මල් දීලා එයාත් මල් අරගෙන දෙන්නාම එකටම මල් පූජා කළා.

අනූ ඇස් දෙක පියාගෙන අත්දෙක එකතු කරලා නළලේ තියාගෙන වඳින දිහා නිශිත් ගොඩක් වෙලා බලාගෙන හිටියා.

අනූ වන්දනා කරලා ඉවර වෙලා ගොඩක් වෙලා. ඒත් නිශිත් එයා දිහාම බලාගෙන ඉන්නවා.

“අයියේ ඇයි....“

“ආ... මේ... නෑ... මුකුත් නෑ...“

නිශිත්ට ලැජ්ජා හිතුණේ වැඩේ මාට්ටු වුණ නිසා.

“මොනවාද මෙච්චර වෙලා ඉල්ලුවේ...“

අනූ නිශිත්ගේ අත්දෙක අල්ලගත්තා.

“මං ඉල්ලුවේ ඔයාට ගොඩාාාක් ආදරේ කරන ලස්සනම ලස්සන කුමාරිකාවක් ඉක්මණටම ඔයා ළඟට එන්න කියලා“

“මගේ කුමාරිකාව මට හම්බෙලා ඉවරයි...“

නිශිත් ඇහෙන නෑහෙන ගාණට කියලා දැම්මා

“මොකද්ද...“

“ඇයි...“

“නෑ ඔයා මොනවා හරි කිව්වා වගේ ඇහුණා...“

“හොල්මනක්ද දන්නේ නෑ... මම නම් මුකුත් කිව්වේ නෑ“

“නරකයි ඔයා...“

“මේ අහිංසකයාටත් නරකයි කියනවනේ අප්පා“

“අහිංසක තමා අංගුලිමාල වෙන්නේ කියලා අහලා නැද්ද ආ...“

“පණ්ඩිත ආච්චි...“

“එහෙනම් ඉතිං ඔයා පණ්ඩිත සීයා...“

අනූ නම් ගොඩක් හිත සැහැල්ලුවෙන් තමා පන්සලෙන් එළියට ආවේ..

“ඔයාට ගොඩක් පින් අයියේ..“

අනූගේ කටේ තියෙන්නෙම ඉතිං ඕක තමා.

කොළඹටම ආපු එකේ ගෝල් ෆේස් නොගියොත් ඉතිං වැඩක් නෑනේ.

දෙන්නාම ආවේ එතෙන්ට. හෙවණ තියෙන තැනක බංකුවක දෙන්නාම ඉඳගත්තා.

“මොනවාද ඕනේ...“

“මුකුත් එපා අයියේ...“

“අනේ මේ.... කියනවා ලැජ්ජා නොවී.. කන්න මොනවාද ඕනේ...“

අනූ ටිකක් වෙලා හිතලා හිතලා එයාට ඕන දේ කිව්වා.

“අරවා ඕනේ මට...“

අනූ ඇගිල්ල දික් කරලා පෙන්නපු දිහා නිශිත් බැලුවේ මොනවාද ඕනේ කියන්නේ කියලා බලන්න.

දිග ඉරටුවල ගහලා තියෙන රෝස පාට  ලොකු බොම්බයි මොටයි එකට තමා අනූට ආස හිතිලා තියෙන්නේ..

“හහ් හහ්හ්හ්හ්හ්හ්“

නිශිත්ට මහා සද්දෙන් හිනාවක් ගියා.

“ඇයි අනේ හිනාවෙන්නේ...“

නිශිත් මුකුත්ම නොකියා අනුගේ ඔළුවත් අතගාලා ගියේ ඒවා අරන් එන්න.

නිශිත් වඩේ, අච්චාරු තව තව ඒවා ගොඩක් ගෙනාවා.

එනකොටත් අනු ලොකු කල්පනාවක. අනු ඉන්න තැන ටිකක් එහායින් අම්මෙකුයි පුංචි දුවෙකුයි හරි ආදරෙන් කියවා කියවා ඉන්නවා.

නිශිත් ඇවිත් හිමීට අනුට ගෑවි නොගෑවි ඉඳගත්තා. ඒත් අනු තාම කල්පනා ලෝකේ.

කල්පනා ලෝකේ ඉවර වෙලා මහා බර සසුමක් අනුගෙන් නිදහස් වුණේ නිශිත්ගේ පපුවට නම් මහා බරක් දීලා.

“ආ මෙන්න අපේ චූටි බබාට බොම්බයි මොටයි..“

“ඕක කාලා මේවා කන්නකෝ“

“ආ ඔයාට... හරි රසයි නේද අයියේ...“

අනු නිශිත්ටත් ඒවා කවනවා.

‘ඔයා තාම පොඩි දරුවෙක් වගේ අනු‘

‘ඔයාට ඕනේ ආදරේ විඳින්න‘

‘ඔයාට මං ආදරේ කරනවාට ඔයා කැමතියි. ඒත් ඔයා හිතන්නේ ඔයා ඉන්න තත්වේ. මට ඒක දැනෙනවා‘

'මට ආදරේ කරන්න බය වෙන්න එපා අනූ. මාත් ඔයාට ගොඩක් ආදරෙයි'

නිශිත් හිතුවා.

"මගේ අම්මා මාව අයින් කරලා දැම්මේ ඇයි දන්නේ නෑ නේද අයියේ.. මං එයාගේ දරුවෙක් නෙමෙයි වෙන්න ඇතිද"

මහා වෙලාවකට පස්සේ අනූ නිශිත්ගෙන් ඇහුවා.

නිශිත් අනූගේ කර වටෙන් අතදලා අනූව එයාට ළං කර ගත්තා.

"ඔයාගේ අම්මාට වාසනාවක් නෑ ඔයා වගේ දරුවෙක් ළඟ ඉන්න"

"මේ අවුරුදු 24ට මට මෙච්චර දුක් විඳින්න වෙයි කියලා මං හිතුවේ නෑ අනේ..."

"හැමදේම වෙන්නේ මිනිස්සුන්ට අනූ.. තමන්ගේ පව් පින් අනුව. ඔයාගේ ජීවිතේ මෙච්චර කල් දුක් වින්ද බව ඇත්ත. ඒත් මීට පස්සේ එහෙම වෙන්නේ නෑ"

අනූ පුදුම වෙලා නිශිත් දිහා බැලුවා.

"මං... මං.. කිව්වේ හැමදම මිනිස්සු දුක් විඳින්නේ නෑනේ"

"මං දෙයක් අහන්න ඔයා තරහා වෙන්නේ නෑ නේද අයියේ..."

"පිස්සුද අනේ මට ඔයත් එක්ක තරහා වෙලා ඉන්න බෑනේ"

"ඔයා ඇයි බඳින්නේ නැත්තේ"

“ම්ම්ම්ම්... ඒක නම් ටිකක් ලොකු ප්‍රශ්නයක්...“

“ඇයි...“

“නෑ ඉතිං මෙහෙම කෙල්ලෙක් තුරුල් කරන් ඉන්නකොට වෙන කෙල්ලෝ බලන්නේ නෑනේ“

අනුට සිහි කල්පනාව ආවේ එතකොටයි. මෙච්චර වෙලා හිටියේ කොහොමද කියලාවත් අනුට තේරුමක් තිබුණේ නෑ.

“අනේ අයියේ... සොරි... මං හිතලා කලේ නෑ..“

“අනේ මට සමාවෙන්න...“

“අනූ මොකද මේ.. මං විහිළුවක් කළේ ළමයෝ..“

“අනේ මෙච්චර වෙලා මට ඒක තේරුණේ නෑ අයියේ..“

අනූ ඉක්මණට හිටපු තැනින් නැගිට්ටා.

“මේ අනූ මාත් එක්ක සෙල්ලම් කරන්න එපා. මං හොඳට හොඳයි නරකටත් හොඳයි තේරුණාද...“

දෙන්නාම මහා සද්දෙන් හිනා වුණා.

ආදරෙයි කියලා නොකිව්වත් තුරුළු කරගෙන ආදර හැඟීමකින් සිප ගත්තේ නැති වුණත් නිශිත්ගෙත් අනුගෙත් නමක් නැති සම්බන්ධේ හරි ලස්සනයි කියලා ඒ දෙන්නාටම හිතුණා.

*.... 20*

sinhalaebooks.com

අනූගේ සිද්ධිය වෙලා දැන් මාසයක් විතර. නිශිත්ගෙත් අනූගෙත් මේ බැඳිමක් නැති සම්බන්ධෙ හරිම සුන්දරව ගලාගෙන ගියා.

නිශිත් පරණ කිසිම දෙයක් අනූට මතක් කළේවත් නෑ.

නිශිත් වගේම අනූත් මේ බැඳිම නිසා ගොඩක් සතුටින්. ඉතිං පරණ දේවල් ඇදලා ඒ බැඳිමට හානියක් කරගන්න දෙන්නාම කැමති නෑ.

මේ අතරේ නිශිත් බඩු ගේන්න එළියට ගිය වෙලාවක් බලලා අනූ නිශිත්ගේ ෆයිල් ටික ඇදලා බයෝ ඩේටා එකක් හොයා ගත්තා.

නිශිත් රැකියාවක් නොකරන්නේ තමන් නිසා කියන හැඟීම අනූගේ හිතට හැමදාමත් වද දුන්නා.

ඉතිං කොහොම හරි හොඳ රස්සාවක් හොයලා දෙනවා කියලා අනූ අධිෂ්ඨාන කර ගත්තේ ඒ හින්දාමයි.

ලියුමක්වත් දන්න එළියට යන්න බැරි නිසා අනූ එයාගේ ෆෝන් එකෙන්ම පුළුවන් තරම් රැකියා ඇබෑර්තු බැලුවා.

පුළුවන් හැම එකකටම නිශිත්ගේ බයෝ ඩේටා එක ඡායාරූප ගහලා යැව්වා.

අනූ උත්සාහය අතඇරියේම නෑ. හැමදාම ඇබෑර්තු බැලුවා.

ලංකාවේ සුප්‍රසිද්ධ පෞද්ගලික ආයතනයක කළමණාකරු තනතුරක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට කැඳවලා ලියුමක් හම්බුණේ අනූගේ බලාපොරොත්තු සඵල කරලා.

අනුගේ වෙලාව හොඳකමට ඒ ලිපිය අනුට ලැබුණේ නිශිත් ගෙදර නැති වෙලාවක.

අනු ඒ ලියුම කියව කියව හිටියේ. ගෙදර බෙල් එක එක දිගට වදිනවා. අනු ඒ ලියුමත් පැත්තකින් තියලා ගිහින් දොර ඇරියේ.

ඇවිත් හිටියේ නිශිත්ගේ අම්මා.

“අම්මා....“

චටාස්...

අනුට දොර ඇරපු ගමන් වැදුනේ කම්මුල් පාරක්.

“අම්මා.. කොහේ ඉන්න අම්මෙක්ද... ආවාද නෑදැකම් හදාගන්න“

“එච්චා ඉතිං මේ අම්මාත් එක්ක නම් බෑ මතක තියාගතින්“

“එදා හොස්පිට්ල් එකේදී කිව්වා මම. ඒත් ලැජ්ජා නෑ“

“මගේ එකාගේම එල්ලෙන්න හදන්නේ මොකද ගෑණියේ“

නිශිත්ගේ අම්මා අනුව තල්ලු කළා. ඒ තල්ලු කරපු පාරට අනුගේ ඔළුව වැදුනේ මේසේ කොණේ.

අනුගේ නළලෙන් ලේ එනවා දැණුනත් එයා නැගිට්ටා.

“තමුසේ හිඟන්නියක් නිසා මගේ එකාගේ ටික කඩා ගන්නවා නේද“

“ලැජ්ජා නැතිකම තියෙන. අම්මෙක් අප්පෙක් නෑ. මිනිහෙක් නෑ“

“දැන් ඉතිං මගේ එකාව අල්ලගෙන පාළු මකාගන්න“

නිශිත්ගේ අම්මා කියවගෙන කියවගෙන යනවා.

“තමුසේගේ ආසාවල් ඉෂ්ට කරගන්න වෙන මිනිහෙක් හොයා ගනින්“

“මගේ පුතාව ඕවාට අල්ලගන්න එපා“

“අපේ එකාටත් පිස්සු. බැඳපු ගෑණියෙක් ගේ අස්සේ දාගෙන“

“කෝ දැන් මගේ අහිංසක කොල්ලා“

“එයා එළියට ගිහින්“

“එයා... අනේ අම්මේ... එයා... දැලේ දාගෙන මගේ කොල්ලාවත්“

“එකක් මතක තියාගනින් මගේ එකාට හොඳ කෙල්ලෙක් කතා කරලා තියෙන්නේ“

“තමුසේ වගේ අතේ සතේ නැති හිඟන්නියක් නෙමෙයි“

“තමුසේ වගේ බැඳපු ගෑණු අපේ පුතාට දෙන්න තරම් ලංකාවේ ගෑණු අහේනියක් තාම නෑ“

මේ අතරේ නිශිත්ගේ වාහනේ ඇවිත් මිදුලේ නතර කළා.

අම්මාව දැක්කා විතරයි නිශිත්ට උන් හිටි තැන් අමතක වුණා.

“අම්මා... ඔයා කොහොමද මෙහේ හොයාගත්තේ“

“ලැජ්ජා නැතුව අහන හැටි විතරක්. උඹ හිතාගෙන ඉන්නේ හැමදාම අපෙන් හැංගෙන්නද“

“බැඳපු ගෑණියෙක් ගෙයක් අස්සේ දාගෙන ලැජ්ජා නැද්ද පුතා“

“තමුන්ගේ තාත්තා හිටියා නම් පොලවේ පස් කයි“

“ඒ කෙල්ලට කරදරයක් වෙලා තියෙන වෙලාවේ ඔහොම කතා කරන්න එපා අම්මා“

“කෙල්ල.. හහ්හ්“

“බැඳපු ගෑණියෙක් මේ. මිනිස්සු මොනවා නොහිතයිද මේවා දකිද්දි“

“මං ගැන මිනිස්සු මොනවා හිතුවත් මට කමක් නෑ“

“උඹේ බණ මට වැඩක් නෑ පුතේ“

“කසාද බඳින්න ලෑස්ති වෙයන්“

“මට කසාද ඕනේ නෑ“

“උඹට ඕන ඕන දේවල් කරන්න බෑ“

“අම්මා... මම කිව්වානේ මං බඳින්නේ නෑ. ඔයා ඔහොම නෙමෙයි කොහොම කිව්වත් බඳින්නේ නෑ“

“නිහාල් මාමාගේ දුවව උඹ බඳින්නම ඕනේ“

“මට ඕන කෙනා තමා මම බඳින්නේ“

“උඹට ඕනේ මේ වගේ අතේ සතේ නැති හිඟන්නියක් බැඳගන්නද ආ පුතේ“

“අම්මා ඇති දැන් පින් සිද්ධ වෙයි ඔය කට වහගන්න“

“උඹට ඕන දෙයක් මේකිගෙන් කරගනින්. ඒක මට වැඩක් නෑ“

“අම්මා....“

නිශිත්ට හොඳටම කේන්ති ගියා අම්මා ඒ කියපු කතාවට.

“උඹේ සද්දෙට මං බය නෑ පුතේ“

“ඔයත් ගෑණියෙක් නේද. ඇයි ඔහොම කතා කරන්නේ“

“මට තව මෙතන උඹ එක්ක කියවා කියවා ඉන්න ඕනේ නෑ“

“මේකිව මඩමකට ගිහින් දාපන්. උඹ ගෙදර වරෙන්. ආයේ මට කියන්න තියන්න එපා“

අනූ අඬාගෙනම එයාගේ කාමරේට ගිහින් දොර වහගත්තා.

“මනුස්සකමක් කියලා දෙයක් නැද්ද අම්මා...“

“ඇති දැන්.. යන්න කරුණාකරලා..“

“උඹට දැන් මට වඩා ඒකිව ලොකුයි නේද. මාව එළවන්නේ“

“අම්මා ප්ලීස් මට කේන්තියන්න කලින් යන්න“

“හොඳයි පුතේ එහෙනම් මං යන්නම්“

නිශිත්ගේ අම්මාත් කේන්තියෙන්ම යන්න ගියා.

sinhalaebooks.com

අම්මාවත් කොහොම හරි පිටත් කරපු නිශිත් ආවේ අනු හොයාගෙන.

‘‘අනූ දෙර අරින්න‘‘

අනුගේ නලල තුවාල වෙලා තියෙනවාත් නිශිත් දැක්කා.

‘අම්මා ගැහුවාද දන්නෙත් නෑ. නැත්තම් නළල තුවාල වුණේ කොහොමද‘

‘පව් කෙල්ල. හිත හදාගෙන ඉන්නකොට මොනවා හරි වෙනවානේ‘

‘අම්මා මෙහේ හොයාගත්තේ කොහොමද. කිසි කෙනෙක් ඉන්න තැනක් දන්නේ නෑනේ‘

නිශිත් මේවා හිතුවා.

‘‘අනූ ප්ලීස් දෙර අරින්නකෝ‘‘

‘‘අනූ...‘‘

‘‘මට ටිකක් තනියම ඉන්න දෙන්න අයියේ‘‘

‘‘හ්ම්ම්ම්ම්‘‘

කරදර කරන්න හොඳ නෑ කියලා හිතලා බර සුසුමක් හෙළපු නිශිත් අනුට පාඩුවේ ඉන්න දීලා එයාගේ කාමරේට ගියා.

sinhalaebooks.com

*.... 21*

අනූ නලලේ තුවාලෙට ප්ලාස්ටර් එකකුත් දාගත්තේ ලේ එන නිසා.

අනූට තමන් ගැනම මහා කලකිරීමක් ඇතිවුණා. මිනිස්සු තමන්ට සතෙක්ට වගේ සලකන්නේ ඇයිද කියන්න අනූටවත් හිතාගන්න බෑ.

sinhalaebooks.com

කාටවත්ම වචනෙකින්වත් හිත රිදෙන දෙයක් කියන්නේ නැති තමන්ට අනිත් අය මේ විදියට සලකද්දි හිතට දැනෙන හැඟීම....

අනූ හොඳ හුස්මක් ගත්තා.

'මං නිසා නිශිත් අයියාටත් ප්‍රශ්න'

'තවත් මං මෙහේ ඉන්න එකෙන් මේ මනුස්සයාගේ වටින ජීවිතෙත් විනාස වෙයි'

'මට දැන් කොහොමත් එකයි'

'මට ඔයාව දාලා යන්න හිත හදාගන්න ගොඩක් අමාරුයි අයියේ'

'ඒත් අමාරුවෙන් වුණත් ඒ දේ කරන්නම වෙනවානේ'

'මගේ ජීවිතේ මට හම්බුණු සොඳුරුම මනුස්සයා ඔයා'

'ඔයා ළඟ ඉන්න මට බෑනේ'

'මං යන්න ඕනේ. මේ හොඳටම ඇති'

එහෙම හිතපු අනූ නිශිත්ට රැකියාවේ සම්මුඛ පරීක්ෂණයට කැඳවපු ඒ ලියුමත් ගත්තා.

නිශිත්ට තේ එකකුත් එක්ක ගෙදර තිබුණු කේක් එකත් කපලා කෑලි හතරක් විතර පීරිසයකටත් දාගෙන නිශිත්ගේ කාමරේට ආවා.

“අයියේ....“

“අනූ.... එන්න“

නිශිත් පුළුවන් තරම් සාමාන්‍ය වෙන්න උත්සහා කරන ගමන් කතා කළා.

අනූ නිශිත් ළඟින්ම ගිහින් වාඩි වුණා.

“නලල මොකද වුණේ. අම්මා ගැහුවාද“

“නෑ අයියේ මගේ ඔළුව වැදුණා කලබලේට දෙර අරින්න ඇවිත්“

“මට බොරු කියන්න එපා අනූ. මං දන්නවා අම්මා ඔයාව තල්ලු කරන්න ඇති. ඒත් ඔයා කියන්නේ නෑ“

“අම්මා වෙනුවෙන් මට සමාවෙන්න නංගී. එයා ඔයාට කතා කරපු විදිය වැරදියි“

අනූ ඒ දේට උත්තර නොදී වෙන කතාවක් පටන් ගත්තා.

“මේ තේ එක බීලා ඉන්නකෝ“

“මං ඔයාට පොඩි දෙයක් දෙන්න ආවේ“

“මොකද්ද නංගී“

අනූ නිශිත්ට දුන්නේ එයාගේ අතේ තිබුණු ලියුම් කවරය.

“මේ මොකද්ද“

“බලන්නකෝ..“

නිශිත් ලියුම්කවරය ඇරලා ඒකේ තිබුණු ලියුම අරගෙන බැලුවා.

“අනූ....“

“සොරි මං ඔයා ගෙදර නැති වෙලාවේ ඔයාගේ ෆයිල් එක ඇදලා බයෝ ඩේටා එකක් හොයා ගත්තා“

අනූ බිම බලාගෙන කිව්වේ කලේ වැරදි වැඩක් නිසා.

“ඔයා ඕකට යන්නම ඕනේ. අනිවාර්යෙන්ම ඔයාට මේ ජොබ් එක ලැබෙනවා අයියේ. මට ඒක විශ්වාසයි“

“මම භාරයක් වුණා ඔයාට ජොබ් එක ලැබුණු ගමන් අනුරාධපුරේ එනවා කියලා“

“මම නැති වුණත් ඔයා අමතක නොකර ඒක කරන්න ඕනි හොඳද“

එහෙම ඇහෙද්දි නිශිත් බැලුවේ ඇයි කියලා.

“මොනවාද ඔයා මේ කියන්නේ නංගී“

“ඔයාටත් මම නිසා ප්‍රශ්න අයියේ“

“මට....? ඔයා හින්දු ප්‍රශ්න ඇයි.. එහෙම කිසිම දෙයක් නෑ“

අනූ එයාගේ හිතේ තියෙන හැමදේම නිශිත්ට කියන්න තීරණේ කළා.

“ඔයා දන්නවාද මගේ තාත්තා මං පොඩි කාලේම නැති වුණා“

“බාප්පා මට වෙනස්කම් කළා. මගේම අම්මාත් මට වෙනස්කම් කළා“

“ඊට පස්සේ දමිත් හම්බුණා. එයත් මගේ ජීවිතේ මාව අතරමග දලා ගියා“

“මට ඒ කව්රුවත් ආදරේ කරලා නෑ අයියේ“

“අහිංසක සතෙක්ට උනත් ආදරෙයක් ඕනේ. ඒත් මට සතෙක්ට ලැබෙන තරම්වත් ආදරයක් ලැබුණේ නෑ“

“අම්මාගේ බල කිරීමට එයාලව සතුටු කරන්න මං හේමන්ත අයියාව බැන්ද“

“මාව හේමන්ත අයියා ළඟ දලා මගේ අම්මා මාව පවුලෙන්ම අයින් කරලා දැම්මා“

“හේමන්ත අයියාට මගේ මූණ පේනකොට පුදුම කේන්තියක් එනවා“

“මං එයාට වචනෙකින්වත් වැරැද්දක් කරලා නෑ“

“මං එයාගෙන් ඇතිවෙන්න ගුටි කාලා තියෙනවා“

අනූ මේ දේවල් අඬ අඬ මතක් කරන්නේ පුදුම දුකකින්.

“අන්තිමට එයාට මාව එපා වෙලා මාව මරන්න හැදුවා“

“නංගී....“

“ෂ්ෂ්ෂ්... මට කතා කරන්න දෙන්න අයියේ“

“හරියට බැලුවොත් ඒ හැමෝගෙම ජීවිත මං නිසා විනාස වුණා“

“ඔයාගේ ජීවිතෙත් මං නිසා විනාස වෙන්න දෙන්න එපා අයියේ“

“ඔයාට විකාරද මොනවාද මේ කියන්නේ“

නිශිත් කේන්තියෙන්ම ඇඳෙන් නැගිට්ටේ අනූගේ මූණ දිහා බලාගෙනමයි.

“තමන්ටම කියලා කව්රුත් නෑ කියන හැඟීම පුංචි කාලේ ඉඳලාම මං වින්ද“

“මං ඒ කාගේවත් ජීවිත වලින් මට විශේෂ තැනක් හෙව්වේ නෑ අයියේ“

“අනිත් අය වගේම මම හෙව්වෙත් ආදරේ, සෙනෙහස, මනුස්සකම ටිකක් විතරයි“

“ඔයා මට ගොඩක් හොඳට සැලකුවා අයියේ“

අනූගේ ඇස් වලින් කඳුළු හෝ ගාලා වැටෙනවා.

“ජීවිතේ කවදාකවත් ඒ වගේ මං ගැන කව්රුවත්ම බැලුවේ නෑ“

“ඒකට ඔයාට ගොඩක් පින්“

අනූ අත්දෙකත් එකතු කරලා නිශිත්ට එහෙම කිව්වාම එයාට දැණුනේ මහා අසරණකමක්.

“එදා ඔයා මාව බේර නොගත්තා නම් හොඳයි කියලා මට අද හිතෙනවා අයියේ“

චටාස්.....

නිශිත් මෙච්චර ආදරෙන් අනුට සැලකුවේ මේ දේවල් අහගන්න නෙමෙයි. නිශිත්ට හොඳටම කේන්ති ගියා අනූ ඒ වගේ දෙයක් කිව්වාම.

අනූ කම්මුලත් අල්ලගෙන නිශිත් දිහා බැලුවා.

“මං නිසා ඔයාගේ ජොබ් එක නැති වුණා“

“ඔයාට අම්මාගෙන් බැණුම් අහන්න වෙලා“

“මට සාත්තු කරන්න ඕනේ නිසා ඔයා මේ ගෙදරකට කුලිය ගෙවාගෙන ඉන්න වෙලා“

“ඔයාට ඔයාගේ හොඳම යාළුවා මං නිසා නැති වුණා. රස්සාව අනඇරියා“

“හේමන්ත අයියා කියපු කතාව ඇත්ත අයියේ“

“එදා මං ඔයාලාට අවුරුද්දට විශ් කරනකොට එයා කිව්වේ උඹේ අවුරුද්දම ඉවරයි කියලා“

“ඒක ඇත්ත අයියේ. මං වගේ කෙනෙක් ඔයා ළඟ ඉන්නවා කියන්නේ ඔයාගේ ජීවිතේටත් හොඳක් වෙන්නේ නෑ“

“ඔයා මෙහෙම ඉන්න ඕන කෙනෙක් නෙමෙයි අයියේ“

“ඔයාගේ ජීවිතේ විනාස වෙන්න ඉඩ තියන්න එපා“

“මට දැන් හොඳටම සනීපයි අයියේ. ඒ නිසා මට දැන් තනියම වැඩ කරගන්නත් පුළුවන්“

“තනියම වැඩ කරගන්න පුළුවන් වුණාම මාව එපා වෙලාද“

“අනේ එහෙම හිතන්නවත් එපා. ඔයා නිසායි මං මෙහෙම නැගිටලා ඉන්නේ“

“මං තවත් මෙහෙම හිටියොත් තවත් ජීවිතයක් විනාස වෙනවා“

“මට රස්සාවක් හොයාගන්න පුළුවන්“

“ඔයා මං වෙනුවෙන් මේ ටික කාලේට කරපු දේවල් වලට මට ණය ගෙවලා ඉවර කරන්න බැරිවෙයි“

“ඔයා ලොක්කෙක් වෙන්න ඕනේ දවසක. ඒ වගේම අම්මා ඔයාට කතා කරලා තියෙන කෙනා ගොඩක් හොඳ ඇති. එයා ඔයාගේ වයිෆ් වෙන්නත් ඕනේ“

අනූ මේ කියන දේවල් වලට නිශිත්ගේ කම්මුල් දිගේ කඳුළු ගලාගෙන යන්නේ එයාටම පාලනයක් නැතුව.

“මං කොහේ හිටියත් ඔයාලා දෙන්නාම දවසක මාව බලන්න එන්න“

“එදට මං මට පුළුවන් උපරිමෙන් ඔයාලා දෙන්නටම සලකනවා“

“ඔයා මාත් එක්ක මෙහෙම එක ගෙදර ඉන්න එකත් ඔයාගේ නමට හානියක්“

“මං දන්නේ නෑ මට ඒක මෙච්චර කාලෙකට හිතුණේ නැත්තේ ඇයිද කියන්න“

“ඔයාගේ නමට හානියක් වුණොත් ඒක ඔයාගේ මුළු අනාගතේටම බලපානවා අයියේ“

“මං තව ටික දවසකින් දික්කසාද ගෑණියෙක්. දැනටත් අනාථයෙක්“

“මට මිනිස්සු මොනවා කිව්වාත් මට කමක් නෑ“

“ඒත් ඔයාට එහෙම බෑ“

“දන්නවාද ඔයාට ලැබෙන කෙනා කව්රු උනත් හරි වාසනාවන්තයි“

‘මට ඔයාගේ ආදරේ දුලා යන්න බෑ. ඒත් මං එච්චර වාසනාවන්ත නෑ අයියේ‘ අනූ ඒක කිව්වේ නෑ.

“ඔයා මට කරපු දේවල් වලට මං මගේ මුළු ජීවිත කාලේම ඔයාට ණයයි අයියේ“

“මගේ ළඟ සන්තකේටම කියලා තියෙන්නේ මෙච්චරයි. ඔයා මේක තියාගන්න“

අනූ එයා දාගෙන හිටපු චේන් එක ගලවලා නිශිත්ගේ අතේ තිබ්බා.

“ඔයාට මොනවාද නංගී මේ වෙලා තියෙන්නේ“

“විකාර නැතුව මේක දාගන්නවා. මාව කේන්ති කරන්න එපා“

ඒත් අනූ ඒක අතටවත් ගත්තේ නෑ.

“ඔයාට මගෙන් ගන්න දෙයක් තියෙනවා නම් ගන්න අයියේ“

අනූ එයා ඇඳගෙන හිටපු බ්ලවුස් එකේ බොත්තම් ගලවන්න පටන් ගත්තා.

“අනූ නවත්තනවා ඕක මගේ යකා අවුස්සගන්නේ නැතුව“

නිශිත් ගිරිය යටින් කෑගහපු පාරට අනූ හොඳටම බය වුණා. ඉක්මණට ගලවපු බොත්තම් දෙක දාගත්තා.

“ඇති අනූ ඇති.. දැන් හොඳටම ඇති“

නිශිත් මෙච්චර වෙලා මේ හැමදේම අහගෙන හිටියා. ඒත් දැන් එයාගේ සීමාව ඉවරයි.

“තවත් මුකුත් කියන්න එපා“

“මං ඔයා කියපු හැමදේම අහගෙන හිටියා“

“ඒකෙන් කියන්නේ නෑ ඔයා කියපු හැමදේම හරි කියලා“

“මං කියපු දේවල් වැරදි ඇති. ඒත් මං යනවා අයියේ“

“ඔයාට හොඳක් වෙන්න නම් මං යන්නම ඕනේ“

එහෙම කියපු අනූ හැරුණේ නිශිත්ගේ කාමරෙන් යන්න.

ඒත් නිශිත් අනූගේ අතින් අල්ල ගත්තා.

“අනූ...... යන්න එපා“

“මට ඔයාව ඕනේ.. මාව දාලා යන්න එපා“

අනූ පුදුම වුණේ නිශිත් එහෙම කිව්වාම.

අනූව බිත්තියට හේත්තු කරගත්ත නිශිත් අනූගේ මූණටම ළං වුණා.

දෙන්නා අතර පරතරය සෙන්ටිමීටර් ගාණකට සීමා වෙද්දි අනූ බෙල්ලත් උස්සලා නිශිත් දිහා බලාගෙන හිටියා. නිශිත් අනූ දිහා බලාගෙන හිටියා.

දෙන්නාගේ දෙතොල් ගෑවි නොගෑවි තියෙන්න ඇති...

අනූගේ නම් බයටම පපුව ගැහෙන්න ගත්තා.

වෙනදා නිශිත් ළගට ගිහින් තුරුල් වුණත් අද නිශිත්ගේ ඇස් වල තියෙන පෙනුම නිසාම අනූට වෙනදා නොදැණුන හැඟීමක් දැණුනා.

නිශිත් අනූගේ මූණ දිහා බලාගෙන හිටියත් තමන්ගේ පපුවේ පහළ හරියේ ගෑවි නොගෑවි වේගයෙන් උස් පහත් වෙන අනූගේ ළැම පේනකොට නිශිත් ආයාසයෙන්ම එළියට එන්න හදන හිනාව නවත්තගත්තා.

නිශිත් අනූ දිහාම බලාගෙන එයාගේ බ්ලවුස් එකේ බොත්තම් වලට අත තිබ්බා.

අනූ ඇස් දෙක තද කරලා පියාගෙන මූණත් පැත්තට හරවගෙන ඉන්නවා දැක්කාම නිශිත් හිනා නොවී හිටියේ පුදුම අමාරුවෙන්.

තවමත් බයෙන් ගැහෙන අනූ ළඟින් නිශිත් අයින් වුණා.

ඒත් එක්කම අනූ එයාගේ පපුවට අත තියාගත්තාම නිශිත්ට නම් හිනා ගියා.

“බය වුණාද...“

“හ්ම්ම්ම්ම්ම්“

“එහෙනම් මහා ලොකු චණ්ඩියා වගේ කලින් කිව්වේ මගෙන් ගන්න දෙයක් තියෙනවා නම් ගන්න කියලා“

“ඕක ගලවන්නත් හැදුවේ. එතකොට බයක් තිබුණේ නැද්ද ආ“

අනූ සද්ද නෑ බිම බලාගෙන ඉන්නවා.

හිතට ශක්තිය අරගෙන මෙච්චර කාලයක් හිතේ හිර කරගෙන හිටපු ඒ ආදරේ නිශිත් කියන්න තීරණය කළා.

“මං ඔයාට ආදරෙයි අනූ....“

“මාව විශ්වාස කරන්න. ඔයාට මගේ ආදරේ පිළිගන්න බැරි නම් කමක් නෑ“

“ඒත් මාව දාලා යන්න එපා“

“මෙච්චර දවස් මාත් එක්ක හිටියා වගේම ඉන්න“

“ඔයාට වෙන කෙනෙක් ළඟට යන්න ඕනේ නම් එදාට යන්න“

“ඒත් ඒ වෙනකම් මාත් එක්ක ඉන්න“

“මං ඔයාට වැරැද්දක් කරන්නේ නෑ. ප්‍රොමිස්.. මාව දාලා යන්න එපා අනූ“

“දැන් අවුරුද්දකටත් වැඩිය මං මේ දේවල් හංගගෙන හිටියා. තවත් බෑ“

“මොකක්...“

“ඔව් අනූ.. මං ඔයාට ආදරේ කළේ ඔයාව දැකපු දවසේ ඉඳන්“

“එදා ඔයා කහ පාට ඔසරිය ඇඳලා, බෙල්ලට කොණ්ඩයක් බැඳලා බූලත් හෙප්පුවත් අරගෙන හේමන්ත ඉස්සරහට එද්දි මට ඒක උදුරලා ගන්න හිතුණා“

“මං ඒ තත්පරේ ඉඳන්, එදා ඉඳන් ඔයාට ආදරේ කළා අනූ...“

“ඊට පස්සේ හේමන්ත ඔයාව බලාගනී කියලා හිතලා හිත හදාගත්තා“

“ඔයාලගේ ගෙදරට ආවට පස්සේ ඔයාලා අතරේ ප්‍රශ්න ඇති කියලා මං හිතුවේ නෑ“

“ටික දවසක් යද්දි ඌ මං හිටියත් ඔයාට සලකපු හැටි දකිද්දි මට හිතුණා මං නැතුව හිටපු කාලෙත් මෙහෙම වෙන්න ඇති කියලා“

“එයා යන එන වෙලාවට ඔයා එළියටවත් එන්නේ නෑ. ඔයාලා දෙන්නා කතා කරන්නේ නෑ“

“අළුත බැඳපු දෙන්නෙක් පස්සේ වෙනස් වුණත් මුලදි එහෙම වෙන්න විදියක් නෑනේ. එදා ඉඳලම මට හිතුණා ප්‍රශ්න ඇති කියලා“

“ඌට බැරි නම් මට ඔයාව දුර ඉඳන් හරි බලාගන්න පුළුවන්නේ කියලා හිතලා මං හිත හදාගත්තා“

“ඔයා බලූ පැටියත් එක්ක කතා කරද්දි මං ඒ දේවල් හැමදෙයක්ම අහගෙන හිටියා“

“ඒත් මට ඔයාට ළං වෙන්න පුළුවන්කමක් තිබුණේ නෑ අනූ“

“ඔයා දුක් විඳිනවා මට තවත් ඉවසන්න බැරි වුණා“

“හේමන්ත ඔයාට සලකන විදිය ඉවසන්න බැරි වුණා“

“ඒ නිසයි එදා මං ඌ එක්ක රණ්ඩු කළේ“

“ඔයාට වුණ දේට මමයි වගකියන්න ඕනේ“

“මම නිසයි ඔයාට එහෙම දෙයක් වුනේ. මට සමාවෙන්න“

“අනේ එහෙම කියන්න එපා අයියේ“

“මගේ ජීවිතේ මෙච්චර කාලෙකට ආදරෙයි කියලා මට දැණුනේ ඔයාව විතරයි අනූ.... මාව විශ්වාස කරන්න..“

“අයියේ තේ බොන්න එන්න. අයියේ කෑම කන්න එන්න.. අයියේ මේ වතුර එකත් අරන් යන්න කිය කිය ඔයා ඒ දේවල් කියද්දි කරද්දි මං තනියම ඒ දේවල් විඳගත්තා“

“මට කියන්න තේරෙන්නේ නෑ. මං ඔයාට ආදරෙයි“

“මං ඔයාව බඳින්න කැමති නංගී“

“ඔයාට හිතෙයි මං ඔයාට මේ කාලේ සැලකුවේ ඔයාගෙන් ආදරේ ගන්න කියලා“

“නෑ කවදාවත් එහෙම හිතන්න එපා. මං ඔයාට සැලකුවේ මගේ හදවතින්මයි“

“කිසිම දෙයක් බලාපොරොත්තුවෙන් නෙමෙයි“

“ඔයා මට ආදරේ කළත් නොකළත් මගේ ආදරේ කවදාවත් වෙනස් වෙන්නේ නෑ. මං ඒක වෙනස් කරන්නෙත් නෑ“

“අනේ අයියේ.....“

“මට ඔයාගේ ආදරේ විඳින්න වාසනාවක් තියෙනවාද නැද්ද කියන්න මං දන්නේ නෑ නංගි“

“ඒත් ඔයාට මගේ හුස්මකින්වත් වැරැද්දක් වෙන්නේ නෑ ඔයා මට ආදරේ නැති වුණත්“

“ඔයා කොහේවත් යන්න එපා. මාත් එක්ක ඉන්න. මට ඔයාගේ ආදරෙත් එපා“

“ඒත් මාව දාලා යන්න එපා“

තිශිත් හොඳටම අඬනවා. අනුත් අඬනවා.

“ඒත් අයියේ ඔයාගේ අම්මාගේ බලාපොරොත්තු නැති කරන්න එපා“

“ඒ මගේම අම්මා නෙමෙයි නංගි“

“අයියේ ඔයා මොනවාද මේ කියන්නේ“

“මං කියන්නේ ඇත්ත. මගේ අම්මා නැති වුණාට පස්සේ අපේ තාත්තාගේ දෙවනි කසාදේ“

“මලිත්ගේ අම්මා එයා“

“එයා මට කවදාවත් වෙනස්කමක් කරලා නෑ තමා“

sinhalaebooks.com

“මාත් මගේ අම්මාට තරම්ම එයාට ආදරේ කළා. දැනුත් එහෙමයි“

“එයාට ඕනේ තාත්තා මට ලියපු දේපල පිට යන්න නොදී තියාගන්න. ඒකයි මාව එයාගේ මල්ලිගේ දුවට බන්දන්න හදන්නේ“

“ඒ දේවල් වැඩක් නෑ“

“කියන්න ඔයා මාව දලා යනවාද අනූ...“

අනූ සද්දයක් නෑ.

‘ඔයාගේ ආදරේ මට ලැබෙනවා නම් මං තරම් වාසනාවන්ත කෙල්ලෙක් මේ ලෝකේ නෑ අයියේ‘

“අනූ කතා කරන්න. ඔයාගේ හිතේ මං ගැන පුංචිම හැඟීමක්වත් නැද්ද“

“අයියේ මං කසාද බැඳපු කෙනෙක්. ඔයා ඇයි මම නිසා ඔයාගේ ජීවිතේ විනාස කරගන්න හදන්නේ“

නිශිත් අනූගේ උරහිස් දෙකෙන්ම අල්ලගෙන මූණටම එබුනා.

“ඔයා බැඳලා නෙමෙයි ඔයාට ළමයි දහයක් හිටියත් මං ඔයාට ආදරෙයි“

“ඔයා ඉන්න තත්වේ මට අදාල නෑ නංගි. ඒ දේවල් හිතන්න තරම් පටු මිනිහෙක් නෙමෙයි මම“

“අනික මං දන්නවා ඔයා හේමන්තට ආදරේ කළේ නෑ කියලා. ඔයා කළේ ඔයාගෙන් වෙන්න ඕනේ යුතුකම් ඉෂ්ට කරපු එක විතරයි“

අනූ ඇස් දෙකත් ලොකු කරගෙන නිශිත් දිහා බලාගෙන ඉන්නවා.

“ඔයා එදා සැමී එක්ක ඒ හැමදේම කියනවා මම අහගෙන හිටියා“

“ඔයා මට ආදරෙයි නම් ඩිවෝස් එක හම්බුණ ගමන් අපි බඳිමු“

“ඔයාගේ අතීතේ මට වැඩක් නෑ. මේ දැන් ඉඳන් අද ඉඳන් ඔයා මගේ“

“මට වැදගත් ඔයා. අනිත් අය මට මොනවා කිව්වාත් මට වැඩක් නෑ“

නිශිත් අනූගේ මූණ ළඟටම ගත්තා.

“කියන්න... ඔයා මට ආදරෙයිද අනූ. මගේ වෙන්න කැමතිද“

‘මං ඔයාගේ ආදරේ විඳින්න ආසයි... මං ඔයාගේ ආදරේට ලෝබයි..‘

‘ඒත් මං වගේ කෙනෙක් ඔයාට ගැලපෙන්නේ නෑ අයියේ‘

‘මං අසරණයි. ඔයාගේ අම්මා කැමති ඔයාව හොඳ කෙනෙක්ට බන්දලා දෙන්න‘ අනූ එහෙම හිතුවා.

“මං වගේ කෙනෙක් ඔයාට ගැලපෙන්නේ නෑ අයියේ“

“ඔයා ඉගෙනගත්ත කෙනෙක්. සල්ලි තියෙන කෙනෙක්. ඒත් මං ඒලෙවල් විතරක් කරපු කෙනෙක්. අතේ සතේ නැති හිඟන්නියක්“

“ඒ නිසා මාව අමතක කරන්න අයියේ. අම්මා කතා කරපු කෙනාට කැමති වෙන්න“

නිශිත්ට හිතාගන්න බැරුව ගියා අනූ එහෙම කිව්වාම. නිශිත් හිතුවේ අනූ එයාට ආදරේ කරයි කියලා.

ඒත් අනූ මේ වෙලාවේ හිතුවේ නිශිත් ගැන. එයාගේ අනාගතේ ගැන.

අනූ දිහාවත් නොබලා නිශිත් වාහනෙත් අරගෙන ගියා.

“අයියේ අනේ නවතින්නකෝ“

“අයියේ.....“

අනූ නිශිත්ව කොච්චර නවත්තන්න හැදුවත් එයාට ඒක කරගන්න බැරි වුණා.

අනූ එහෙම්මම බිම ඉන්දවුණා.

‘මොකද්ද දෙයියනේ මං මේ කළේ‘

‘උඹ මහා මෝඩියක්. මෙච්චර කල් උඹව බලාගත්තු දෙවියෙක් වගේ මනුස්සයාගේ හිත රිද්දුවා‘

‘රටේ ලෝකේ මිනිස්සු ඕනතරම් දේවල් කියයි‘

‘ඒත් ඒ මනුස්සයාට ඒක ප්‍රශ්නයක් නැත්තම් ඇයි උඹ ඒක ප්‍රශ්නයක් කරගන්නේ‘

'මෝඩි... මෝඩි.. උඹ මහා පට්ටපල් මෝඩියක්'

අනුගේ හිත අනුට හොඳටම බැන්නා.

අනු ඉක්මණට ෆෝන් එක අරගෙන නිශිත්ව සම්බන්ධ කරගන්න හැදුවත් නිශිත් සම්බන්ධ වුණේ නෑ.

.... 22

නිශිත්ගේ හිත හොඳටෝම රිදිලා. අනුට මෙච්චර ආදරේ කරලාත් අනු අම්මා කතා කරපු කෙනාට කැමති වෙන්න කිව්වාම.

නිශිත් ඔහේ වාහනේ පදිනවා. වාහන හෝන් කරනවා ඉවරයක් නැතුව. කේන්තියට දැන් කීප පාරක්ම සූක්කානමට ගැහුවා.

අනුගෙන් එක දිගට ඇමතුම් එනවා දැක්කත් ඒවා නොදැක්කා වගේ හිටියා.

බැරිමතැන නිශිත් ෆෝන් එක ඕෆ් කරලා දැම්මා.

මේ අතරේ අනූ කෑමක් බීමක්වත් නැතුව ඔහේ බිම ඉඳගෙන ඉන්නේ අඬ අඬ.

අනූගේ හිත බය වුණේ නිශිත් කරදරයක්වත් කරගනීද්දෝ කියලා.

මොකද නිශිත් වාහනේ අරන් ගිය වේගේ අනූගේ හිතත් කලබල කරපු නිසා.

නිශිත්ගේ දන්න යාළුවෙක්ගේවත් නම්බර් එකක් අනූ ළඟ නෑ. කාගෙන් කියලා එයා ගැන විස්තර හොයන්නද දෙයියන්ට කියනවා ඇරෙන්න.

නිශිත්ට ආයෙත් ඒ ගෙදරට යන්න බැරිතරම්. හිත හොඳටම රිදිලා. පුළුවන් තරම් ඇඬුවා. ඒත් හිත හදා ගන්න නිශිත්ට බෑ.

පාරවල් ගාණේ ඔහේ ඩ්‍රයිව් කරලා කරලා රෑ වෙද්දි ගෙදර එන්න ඕනේ කියලා හිතුවත් තමන්ගේ හිත ඒකට ඉඩ දුන්නේ නෑ.

නිශිත් ගියේ ටවුන් එකේ තියෙන බාර් එකට...

නිශිත් මංගල උත්සවයකදී ඇරෙන්න මත්පැන් පාවිච්චි කරපු කෙනෙක් නෙමෙයි. කරන කෙනෙකුත් නෙමෙයි.

ඒත් අද හිතේ දුකට හොඳටම බිව්වා. සීමාවක් නැතුව බිව්වා.

අන්තිමට කෙලින් හිටගන්නවත් පණක් නෑ.

නිශිත්ගේ වෙලාවේ හොඳකමට එතෙන්ට ආවේ විශ්ව.

"නිශිත්.... උඹ.."

විශ්වටත් පුදුමයි නිශිත් මෙච්චර බීලා ඉන්නවා දැක්කාම.

සෑහෙන වෙලාවක් විශ්වත් බලන් හිටියා. ගෙදර යන්න හිතක්වත් නෑ නිශිත්ට නම් ඒ වුණාට.

"නිශිත් උඹට කෙලින් ඉන්නවත් බෑ. ඇති දැන් අපි යමු ගෙදර"

"ගෙදර.... මට බෑ... බං... ගෙදර..."

"අර කෙල්ල.... මට.... මට.... ආදරේ නෑ..."

"මගේ අනූ.. මට ආ...දරේ.. නෑ"

නිශිත්ට වචන කියවෙන්නෙත් නෑ.

"බලපිය බූරුවෝ දැන් වෙලාව කීයද කියලා. 1 ත් පහුවෙලා"

"අර කෙල්ල ගෙදර තනියම නේද"

"වරෙන් දැන්වත් යන්න. මොන මගුලක් වෙලාද මට තේරෙන්නේ නෑ නිශිත් උඹට"

බලෙන්ම වගේ නිශිත්ව වාහනේට දාගත්තා.

අනූ නම් නින්දක් නෑ තාමත් වෙලාව බලනවා. ආයෙත් ජනේලේ ළඟට යනවා පාර දිහා බලනවා.

තාමත් නිශිත්ගේ ෆෝන් ඕෆ්.

නිශිත්ගේ වාහනේ සද්දේ ඇහුණා විතරයි අනූ එළියට ආවා.

වාහනේ අරන් ඇවිත් තිබුණේ විශ්ව කියලා දකිද්දි නම් අනූගේ පපුවත් හිරවුණා.

“අයියේ මොකද වුණේ නිශිත් අයියාට“

අනූ දුවගෙන වාහනේ ළඟට ගියා.

“දෙයියනේ....“

“මූ හොඳටම බීලා නංගී.. මං ගියේ වෙලාවට. බලෙන්ම දාගෙන ආවේ“

අනූ නිශිත්ව කොහොම හරි වත්තම් කරගත්තා.

“අයියා යන්නේ කොහොමද. වාහනේ අරන් යන්න“

“නෑ නංගී යාළුවෙක් පාරේ ඉන්නවා. මට එයා එක්ක යන්න පුළුවන්“

අනූ තවත් ටිකක් විශ්ව එක්ක කතා කරලා අමාරුවෙන් අමාරුවෙන් නිශිත්ව ගේ ඇතුලට අරගෙන ආවා.

“අනූ..... මං ඔයාට... ආදරෙයි... කෙල්ලේ...“

“මාව... දාලා........ යන්න... එපා... බං“

“මං... මං... මැරෙයි...“

“ඔව්... මං... මැරෙනවා...“

“මට.. ඒ... කෙල්ල.. ආදරේ නෑ. ආදරේ... නෑ...“

“අනූ...“

නිශිත්ගේ කටින් කියවුණේ අනූ කියන නම විතරයි.

නිශිත් වමනේ දැම්මා හොඳටම.

අනූ ඒවත් අස් කරලා නිශිත්ගේ ඇඟත් හෝදවලා පුළුවන් විදියට සරමකුත් ඇන්දුවා.

නිශිත් ඒ හැමදේම කරනකම් පොඩි ළමයෙක් වගේ හිටියා.

ඇස් දෙකවත් හරියට ඇරගෙන ඉන්න බෑ නිශිත්ට.

අනූ නිශිත්ව එක්කගෙන ඇවිත් ඇඳෙන් නිදිකරවලා බෙඩ් ෂීට් එකත් පොරවලා යන්නයි හැදුවේ.

ඒත් නිශිත් අනූගේ අතින් ඇදලා ගත්තා.

හිතුවේ නැති දෙයක් වුණු නිසාම අනූගේ සමබරතාවය ගිලිහිලා එයාව නිශිත්ගේ ඇඟ උඩට වැටුණා.

නිශිත් ඒ ක්ෂණිකෙටම අනූව එයාගේ පැත්තට හරව ගත්තා.

අනූට හිතන්නවත් වෙලාවක් නැතුව නිශිත් අනූගේ දෙතොල් නතු කරගත්තා.

ඉවස ගන්න බැරිතරම් මත්පැන් ගඳ ආවත් නිශිත්ට සිහියක් නැතුව මේ වෙන දේවල් අනූට වේදනාවක් උනත් අනූ ඒවා දරාගත්තා.

අනූගේ තොල හොඳටම තුවාල වෙලා. ඒ ලේ රස එයාටම දැණුනා.

නිශිත්ගේ හිතේ වේදනාව ගතින් පිටවෙද්දි ඒ සිප ගැනීම් එකක්වත් සියුම් ඒවා නම් වුණේ නෑ.

නිශිත් අවසිහියෙන් හපලාම අනූගේ බෙල්ලේ, උරහිසේ දත්පාරවල්.

ටිකකින් අනූගේ ඉන වටේ අත දාලා එයාගේ පපුව උඩ ඔළුව තියාගෙන නිශිත් හොඳටම නිදි.

අනූ නම් දරාගන්න බැරි ආදරේකින් නිශිත්ගේ ඔළුව අතගෑවා. ටිකක් පහත් වෙලා නිශිත්ගේ නළල සිපගත්තේ එයාටම පොරොන්දුවක් වෙනගමන්. දන්නේම නැතුව එයාටත් නින්ද ගිහින්.

*********************************************************

උදේ ඔළුවේ බර ගතියත් එක්කම නිශිත්ට ඇහැරුණා. ඉන්නේ කොහේද කියලාවත් සිහියක් නෑ.

නිශිත් ඇස් අරිද්දි දැක්කේ තමන්ට යට වෙලා ඉන්න අනූව.

කොණ්ඩෙත් අවුල් වෙලා, ඇඳුමත් ටිකක් පහළට වෙලා, තොලත් තුවාල වෙලා, බෙල්ලේ, උරහිසේ දත්පාරවල්. අනූ සුදු නිසා පොඩ්ඩ රතු වුණත් පේනවා.

“දෙයියනේ අනූ…“

නිශිත් නැගිටින්න හදනකොටයි දැක්කේ තමන්ගේ සරමත් විසිරිලා තියෙනවා. එයාගේ හිතට මහා බයක් දැණුනා.

‘අනූ මගේ අතින් කරදරයක්වත් වුණාද ඔයාට. දෙයියනේ මොකද්ද මං මේ කළේ. නිශිත් ඔළුවේ අතගහගෙන කල්පනා කරනවා.

"අනූ... නැගිටින්න..."

"අනූ...නංගී..."

නිශිත් අනූව හොලව හොලව කතා කරනවා.

අනූ අමාරුවෙන් ඇස් ඇරියා. අනූ නිශිත් එක්ක තරහින්. ඇඳුමත් හදාගෙන ඉක්මණට ඇඳෙන් නැගිටින්නයි හැදුවේ.

"ආවි..."

අනූගේ කොන්ද දිහායින් පුදුම වේදනාවක් අනූට දැණුනා.

නිශිත් මුළු රෑම තමන්ගේ ඇඟ උඩ හිටපු නිසා අනූ හෙලවෙන්නේවත් නැතුව උදේ වෙනකම්ම හිටියේ නිශිත්ට ඇහැරෙයි කියලා.

එක විදියටම හිටපු නිසාද කොහේද කොන්ද රිදෙනවා අනූගේ.

මේ හැමදේම දකිද්දි නිශිත්ගේ හිත එයාට දෙයක් කිව්වා.

නිශිත් එයාගේ ඔළුවේ අතගහගත්තා.

"අනූ... අනේ මට සමාවෙන්න දෙයියනේ"

"මං මේ මුකුත් හිතලා කලේ නෑ. අනේ මට සිහියක් තිබුණේ නෑ"

"කව්ද මාව ගෙදර ගෙනාවේ"

අනූ කතා නෑ.

"අනූ අනේ නංගි කතා කරන්නකෝ"

“අනේ මට සමාවෙන්න. ඔයා ඇයි මගේ ළඟට ආවේ අනූ සිහියක් නැතුව ඉද්දි“

“අනේ දෙයියනේ මං මහා පව්කාරයෙක්“

“අනූ කතා කරන්න මැණික. පින් සිද්ද වෙයි“

“මොකද්ද වුණේ කියන්න“

“මං ඔයාට කරදරයක් කරන්න හිතුවේ නෑ අනූ. මං ඒ වගේ මිනිහෙක් නෙමෙයි. මාව විශ්වාස කරන්න“

“ඔයාගෙන් ප්‍රයෝජන ගන්න මට ඕනේ වුණේ නෑ“

“අනූ.....“

අනූ කිසිම කතාවක් නැතුව ඇඳත් පිළිවෙලට හදලා කුස්සියට ගියේ ඉක්මණට කෑම හදන්න. දෙන්නාටම ටිකක් දවල් වෙනකම් නින්ද ගිහින් ඊයේ නිදාගන්න රෑ වුණ නිසා.

අනූ හිතාවෙච් ඉක්මණට කෑම ලෑස්ති කළා.

“නිශිත් අයියේ කන්න එන්න“

ටිකක් තරහින් වගේ එහෙම කියපු අනූ නිශිත් එනකම් බලාගෙන හිටියා.

“අනූ කතා කරන්න ප්ලීස්“

“අයියේ කමුද. මට බඩගිනියි. ඊයේ රෑට කෑවෙත් නෑ මං“

“මට කන්න ඕනේ නෑ අනේ. කියන්න අනූ මගෙත් එක්ක තරහාද“

“මං සිහියෙන් හිටපු නැති නිසයි මෙහෙම වුනේ නංගී“

“අනේ මට සමාවෙන්න. මං හිතලා මේ දේවල් කළේ නෑ. සත්තයි“

නිශිත් බැගෑපත් වුණා.

අනු නිශිත්ටත් එක්කම කෑම බෙදාගෙන නිශිත් එක්ක කතා නොකරම එයාට කෑම කැව්වා.

නිශිත්ට දුකයි අනු මෙහෙම ඉද්දි. ඒත් වැරැද්ද කළේ තමන්.

නිශිත් දහඅතේ කල්පනා කරන්නේ අනුට මේක කොහොම තේරුම් කරන්නද කියලා.

අනු නිශිත් එක්ක කතාවක් නෑ.

එයාගේ පාඩුවේ වැඩ ටික කරලා කාමරේට ගියා.

නිශිත් කොච්චර ඊයේ රෑ වුණ දේවල් එකක්වත් වුණේ සිහියෙන් නෙමෙයි කියලා තේරුම් කරන්න හැදුවත් වැඩක් වුණේ නෑ.

“අනූ....“

නිශිත් අනුගේ කාමරේට ආවා.

“මට සමාවෙන්න. මං දන්නවා මං කරපු දේ සමාව ඉල්ලන්න තරම්වත් සුදුසු නෑ කියලා“

“ඒත් මං ඒ වෙලාවේ සිහියෙන් නෙමෙයි අනූ හිටියේ“

“මාව තේරුම් ගන්න“

“කියන්න අනූ... මගෙන් වුණු වැරැද්දට මං මොකද්ද කරන්න ඕනේ“

“කතා කරන්න“

දැන් හොඳටම හවස් වෙලා. අනූටත් තවත් මේ ප්‍රශ්නේ දුරදිග ගෙනියන්න ඕනේ වුණේ නෑ.

“මාව ගිහින් දාන්න..“

නිශිත් පුදුම වුණා.

“ගිහින් දාන්න. කොහේද?“

“මං ආදරේ කරන කෙනා ළඟට“

නිශිත්ගේ ඔළුවේ හෙණයක් පිපිරුවා වගේ වුණා.

“ආා...දරේ කරන කෙනා?“

නිශිත්ගේ ඇස්වල කඳුළු පිරිලා තියෙනවා අනූ දැක්කා.

“ඔව් අයියේ මට යන්න ඕනේ. දැන්ම“

නිශිත්ව දුක වැඩිකමට වෙව්ලනවා. නිශිත් අනූ දිහාම ගොඩක් වෙලා බලාගෙන හිටියා.

“මං ඔයාව නැති කරගත්තාද අනූ..“

නිශිත් එයාගෙම හිතට තරවටු කරලා අනූව ගිහින් දාන්න හිත හදාගත්තා.

“ඔයා ලෑස්තිවෙන්න නංගී. මං එක්කගෙන යන්නම්“

නිශිත් තවත් එතන හිටියේ නෑ එයාගේ කාමරේට ගියා.

නිශිත් හොඳටම ඇඩුවා. පපුවෙන් එන වේදනාව එයාටම දරාගන්න බැරිවුණා.

'ඒත් අනූගේ සතුට ඒක නම් මට ඒක කරන්න පුළුවන්'

අනූ මේ දේවල් හොරෙන් බලාගෙන.

'ඔයා මට මෙච්චර ආදරෙයිද අයියේ'

නිශිත් අනූව එක්කගෙන යන්න ලෑස්ති වුණා.

අනූ ලෑස්තිවෙලා එළියට එද්දි දැක්කේ නිශිත් වාහනේට හේත්තු වෙලා අහස දිහා බලාගෙන කල්පනා කර කර ඉන්නවා.

අනූ අද ඇන්දේ නිශිත්ම අරගෙන දීපු ලස්සන දිග කහපාට අත්නැති ගවුමක්. ඒ ගවුම අනූ තෝරගත්තේම ඉතිං අර දත්පාරවල් ටික වහගන්න ඕනේ නිසා.

අනූ නිශිත් ළඟටම ගියා.

"අයියේ..."

නිශිත් අනූගේ ලස්සන දිහාම බලාගෙන හිටියා.

අනූගේ හමේ පාටටම ගැලපෙන කහපාට ගවුම නිසා අනූ වෙනදටත් වඩා ලස්සනයි.

නිශිත් අනූගේ ළඟට ආවා. අනූගේ කම්මුල් දෙකෙන් අල්ලගෙන එයාගේ මූණටම එබුණා.

"අනූ.... ඔයා අද හරිම ලස්සනයි"

“මං ඔයාට ආදරෙයි අනූ“

“එහෙම කියලා ඔයා මගේම වෙන්න ඕනේ නෑනේ“

“ඔයාගේ සතුට එතන නම් මට ඕනේ එච්චරයි“

“හැමදම හිනාවෙලා ඉන්න අනූ“

“ඔයාට මොනම හරි ප්‍රශ්නයක් ආවොත් මට කතා කරන්න“

“එහෙම ප්‍රශ්න එන්න එපා කියලා මං ප්‍රාර්ථනා කරනවා“

“ඒත් මං සදහටම ඔයා වෙනුවෙන් ඉන්නවා. ඒ නිසා බය නැතුව මට කතා කරන්න තේරුණාද“

අනූගේ ඇස්වල කඳුළු පිරුණා ඒ කියපු දේවල්වලට.

අනූගේ අතේ මොනවාත් බෑග් නැති නිසා නිශිත් බැලුවේ ඇයි කියලා.

“අනූ ඔයාගේ බෑග්?“

“මං ඒවා පස්සේ ගන්න එන්නම්“

“එන්න අපි යමු. එයා බලාගෙන ඇති නංගී“

නිශිත්ම වාහනේ දොර අනූට ඇරලා දුන්නා.

‘මට සමාවෙන්න අයියේ මං මෙහෙම කරනවාට ඔයාට‘

“එයා කොහේටද අනූ එනවා කිව්වේ“

“මං ඔයාට කියන්නම් පාර. ඔයා යමුකෝ“

“හ්ම්ම්ම්ම්ම්“

sinhalaebooks.com

ටිකක් දුර ඇවිත් නිශිත් වාහනේ අයිනක් බලලා නතර කළා.

“අයියේ ඇයි....“

“නෑ නංගී. වාහනේ ප්‍රශ්නයක් වගේ. ඔයා ඔහොම ඉන්න මං බලලා එන්නම්“

නිශිත් වාහනෙන් බැහැලා ගිහින් බොනට් එක ඇරියා.

නිශිත් වාහනේ නැවැත්තුවේ වාහනේ ප්‍රශ්නයක් නිසා නෙමෙයි. තවත් කඳුළු හංගන් ඉන්න අමාරු වුණ නිසා.

නිශිත් අනුට නොපෙනෙන්න බොනට් එකට මූවා වෙලා අඬනවා.

අනුටත් හිතුනා නිශිත් වාහනේ ලෙඩක් කිව්වේ බොරුවට කියලා.

අනු සද්ද ඇහෙන්නේ නැති වෙන්න හිමීට වාහනෙන් බැහැලා නිශිත් ළඟට ගියා.

නිශිත් හොඳටම අඬනවා.

“අයියේ...“

“අනූ... මගේ නංගී..“

“මාව එකම එක පාරක් තුරුල් කර ගන්න අනූ. ප්ලීස්“

අනූ නිශිත්ව තුරුල් කර ගත්තා.

“මට... මට තේරෙන්නේ නෑ නංගී“

“මට ඔයාව වෙන කෙනෙක්ට දෙන්න හිත හදාගන්න බෑ. මං ඒ තරම් දුර්වල වෙලා“

“මාව දාලා යන්න එපා අනූ...“

“තව ටිකක් හිතලා බලන්න.. ඔයාට පින් සිද්ධ වෙයි අනූ“

“මං ඔයාට හිතලා වැරැද්දක් කළේ නෑ. මට ඒකට සමාවෙන්න අනූ“

“මට හිතාගන්න බෑ මගේ අතින් එහෙම දෙයක් වුණේ කොහොමද කියලා“

“ඔයාට යන්නම ඕනේද නංගී. තව පාරක් හිතලා බලන්න බැරිද“

අනූ ඒ දේවල් වලට උත්තර දෙන්න ගියේ නෑ. දෙන්න උත්තර අනූ ගාව තිබුණත් ඒකට තව ටික වෙලාවක් ඉවසන් ඉන්නම වෙනවා.

“අයියේ රෑ වෙනවානේ. අපි යමුද“

කොච්චර කිව්වාත් අනූගේ හිත වෙනස් වෙන්නේ නෑ කියලා හිතපු නිශිත් ආයේමත් වාහනේ පණගන්වගත්තා.

*.... 23*

දෙන්නාම වැඩි කතාවක් නැතුව අදාල තැනට ආවා.

වාහනෙන් බැහැලාත් නිශිත්ට අනූ එක්ක යන්න බැරි ගතියක් දැණුනා.

“අනූ...“

“ම්ම්ම්ම්ම්“

“මං මේ තරම්වත් දුරක් ආවේ පුදුම අමාරුවෙන්. මාව තේරුම්ගන්න. පුළුවන් නේද ඔයාට ඉතුරු ටික යන්න“

“මං මෙතනම ඉන්නම්. ඔයා එයා ළඟට යන්න අනූ“

“මට තවත් දුර එන්න හිත හදාගන්න බෑ අනූ“

“අයියේ...“

“ම්ම්ම්ම්ම්ම්“

“ඔයාට මාව විශ්වාසයිද“

“ඔව් මගේ නංගී. මට ඔයා ගැන විශ්වාසයි. ඇයි එහෙම ඇහුවේ“

“නෑ මට ඔයාව තැනකට එක්ක යන්න ඕනේ. ඒත් ඔයාගේ ඇස් දෙක වහගෙන යන්න තරම් මං උස නෑනේ“

“ඒ හින්ද ඔයාම ඇස් දෙක වහගෙන මාත් එක්ක එනවාද“

“මං පරිස්සමෙන් එක්ක යන්නම්“

නිශිත්ට පුදුමයි අනූ එහෙම කිව්වාම.

“අනූ ඇයි මාව එක්ක යන්නේ“

“අයියෝ අනේ අන්තිම දවස හින්දවත් එන්නකෝ ප්‍රශ්න අහන්නේ නැතුව“

“හරි හරි යමු“

නිශිත් ඇස් වහගෙන අනූ එක්ක ආවා.

අනූ නිශිත්ව එක්කගෙන ආවේ බීච් සයිඩ් එකේ ලස්සන රෙස්ටූරන්ට් එකකට.

“අයියේ... ඇස් අරින්න“

නිශිත් ඇස් ඇරියාම එයාටම ඇස් අදහාගන්න බැරි වුණා.

විශ්ව, මලිත් තව නිශිත්ගේ ළඟම යාළුවෝ තුන්දෙනෙක් ඇවිත් හිටියා.

“විශ්ව.... මලිත්.... උඹලා...“

“මේ හැමදේම ඉතිං අනූ නංගිගේ ප්ලෑන් තමා...“

මලිත් කියලා දැම්මා.

බීච් එකේ හට් එකක් ලස්සනට බල්බ් දලා සරසලා තිබුණා. ඒ මුළු හට් එක පුරාවටම රතු පාට හදවතේ හැඩේ බැලුම් බෝල එල්ලලා.

HAPPY BIRTHDAY NISHITH කියලාත් ගහලා තිබුණා.

නිශිත්ට අනූ ගැන හිතපු නිසාම අද එයාගේ උපන්දිනේ කියලාවත් එයාට මතක තිබුණේ නෑ.

හදවතේ හැඩය ගත්තු රෝස මල් විදියට වටේම අයිසින් කරපු ලස්සන කේක් එකක් ඒ හට් එකේ මැද පුංචි මේසයක් උඩ තිබුණා.

නිශිත් ඉනටත් අතක් තියාගෙන අතින් කටත් වහගෙන පුදුම වෙලා මේ දේවල් දිහා බලාගෙන ඉන්නවා.

“බර්ත්ඩේ විශ් කරන්න කලින් ඔයාට දෙයක් කියන්න තියෙනවා“

රෙස්ටූරන්ට් එකේ වැඩ කරන සේවකයෙක් අනූට ගෙනත් දුන්නේ ලොකුම ලොකු රතු රෝස මල් පොකුරක්.

“අයියේ...“

කට්ටියම පුදුමවෙලා බලාගෙන ඉන්නවා.

අනූ රෝස මල් පොකුර නිශිත්ට දික් කළා.

“මං ඔයාට ආදරෙයි මගේ අයියේ....“

නිශිත්ගේ යාළුවෝ ටික නම් කෑගැහුවා, අත්පුඩි ගැහුවා.

මල් පොකුර අතට ගත්තත් අනූ කියපු දේ නම් නිශිත්ට හිතාගන්න බැරුව ගියා.

“අනූ.....“

“මට සමාවෙන්න මෙච්චර වෙලාවක් ඔයාගේ හිත රිද්දන්න වුණාට“

“අනූ... මට තේරෙන්නේ නෑ..“

“අනූ… අනූ….“

නිශිත් මල් පොකුරත් අතේ තියාගෙනම අනූට හිතන්නවත් වෙලාවක් දෙන්නේ නැතුව අනිත් අතින් එයාව තුරුල් කරගෙන දෙතොල් සිප ගත්තා.

නිශිත්ට යාළුවෝ ඉන්නවා නේද කියලාවත් මතකයක් තිබුණේ නෑ.

“අපොයි දෙවියනේ.. අපි මෙතන ඉන්නවෝ….“

මලිත් මහා සද්දෙන් කෑගැහුවා.

අනූ නම් ලැජ්ජාවටම රතු වෙලා.

නිශිත් රැවුලත් අතගාගෙනම හිමිහි හිමින් අනූගෙන් අයින් වුණා.

“එක පාරක් මගේ නම කියන්න මැණික… ප්ලීස්…“

“කියන්නකෝ…“

“මං.. ඔයාට ආදරෙයි…. නිශිත්….“

“අනේ මට බෑ…“

අනූට නම් නිශිත්ගේ නම කියලා කතා කරන්න හිතෙන්නෙම නෑ.

“මගේ කෙල්ලගේ ලැජ්ජාව බලන්නකෝ“

“මාත් ආදරෙයි ඔයාට ගොඩාාාක්“

නිශිත් අනූගේ නළලට හාදුවක් දුන්නා.

නිශිත්ට නම් තාමත් මේක පුදුමයක්.

"මේ උඹලා පස්සේ ඕවා කරගනිල්ලා. මෙතන දැන් ඕක බලන්නද එන්න කිව්වේ ආ.."

"මෙතන මේ ෆිල්ම් බලන්න බෑ අපිට"

යාළුවෝ කෑගහනවා.

"හරි හරි ඔන්න එහෙනම් නැවැත්තුවා"

"හැපි බර්ත්ඩේ මගේ අයියේ..."

අනූ නිශිත්ව බදාගෙන විශ් කළා.

යාළුවන්ගේ කෑගැහිල්ල තාම එහෙම්මම තමා.

"හැපි බර්ත්ඩේ මචං"

"සොරි මෙච්චර වෙලා විශ් කරන්න පරක්කු කළාට"

"අයියේ කේක් එක කපන්න.."

නිශිත් අනූව අතඇරින්නේ නැතුවම හැමෝගෙම සුබ පැතුම් මැද්දේ කේක් කැපුවා. අනූට නම් කේක් කවලා කම්මුලට කිස් එකකුත් දුන්නා.

නිශිත් අනිත් යාළුවන්ටත් කේක් කැව්වා..

"මේ අපිට නැද්ද..."

"මොනවාද...?"

"ඇයි යකෝ කේක් කවලා නංගිට කිස් එක දෙන්න පුළුවන් නම් අපිට මොකද දෙන්න බැරි"

sinhalaebooks.com

“තොට මං කියනවා මෙන්න මෙයා හිටියේ නැත්නම්“

හැමෝම ඒ මොහොත ගොඩක් සතුටින් ගත කළා. රෑට කෑමත් අනූ ඕඩර් කරලාම තිබුණු නිසා කට්ටියම කෑමත් කාලා සින්දු කියන්න පටන් ගත්තා.

නිශිත් නම් ගොඩාක් සතුටින්....

නිශිත් අනූව එයාට තුරුල් කරගෙනම යාළුවොත් එක්ක සින්දු කියනවා. හිටපු ගමන් කම්මුලට හාදුවක් දෙනවා. විකාර ගොඩයි.

“මේ දැන් අපි මෙතන හිටියා ඇති විශ්ව. තවත් හිටියොත් මොන මොන සීන් බලන්න වෙයිද දන්නේ නෑ“

“ඔන්න එහෙනම් දෙන්නාටම තෑන්ක්ස් අපිට පාර්ටි එක දුන්නට. අපි කැපුණා එහෙනම්.. උඹලා හනිමූන් ගිහිල්ලාම ගෙදර පලයන්කෝ“

මලිත් නිශිත්වත් අනූවත් තනි කරලා යාළුවෝ ටිකත් එක්ක පිටත් වුණා.

නිශිත් අනූ දෙන්නා අත් අල්ලගෙනම ආවේ මුහුදු වෙරළ පැත්තට.

නිශිත් එතන තිබුණු පඩිපෙලේ වාඩි වුණා. අනූත් ඊට පහළ පඩිපේළියේ නිශිත්ගේ කකුල් දෙකට මැදි වෙලා නිශිත්ගේ පපුවට එයාගේ පිට හේත්තු කර ගත්තා. නිශිත් අනූගේ බෙල්ල වටෙන් අතදාලා තුරුල් කරගත්තා.

“අනූ මට කියන්න තේරෙන්නේ නෑ නංගී“

sinhalaebooks.com

“මෙච්චර කාලෙකට මං සමරපු ලස්සනම බර්ත්ඩේ එක“

“තෑන්ක්ස් ඔයාට“

නිශිත් පාත් වෙලා අනුගේ කම්මුල හාදුවක් දුන්නා.

“සොරි අයියේ ඔයාව දවසම ඇඩෙව්වාට. ඔයා ඇත්තටම හිතුවේ මට වෙන කෙනෙක් ළඟට යන්න ඕනේ වෙලා කියලාද“

“අනේ මන්ද මට එහෙම හිතන්න අමාරු වුණා. ඒත්... අනේ මට කියන්න තේරෙන්නේ නෑ“

“මං ඇත්තටම එහෙම ගියා නම් ඔයාට ගොඩක් දුක හිතෙයි නේද අයියේ“

“මට පිස්සු හැදෙයි..“

“ඔයා ඇයි මට මෙච්චර ආදරේ. මං වගේ වැඩකට නැති කෙල්ලෙක්ට, අනාථයෙක්ට, හිඟන්නියෙක්ට“

“එහෙම කියන්න එපා අනූ.. ඔයාට මොන දේවල් නැති වුණත් මගේ මුළු ජීවිතේම ඔයා“

“ඔයාට තියෙන්නේ මොනවාද නැත්තේ මොනවාද මට වැඩක් නෑ“

“ඔයා දහයක් බැඳලා ආවත් මං ඔයාට ආදරෙයි අනූ. මගේ ආදරේ අවංකයි. මං ඊට වඩා කිසි දෙයක් දන්නේ නෑ“

“ඒත් අයියේ අම්මා..“

“අපි ඒ ගැන නොහිතා ඉමු. අපි බඳිමු. එයාලට කැමති දවසක අපිට සමාව දෙයි. සමාව දුන්නේ නැති වුණත් මං ඔයාව හැමදාටම බලාගන්නවා අනූ“

“මං දන්නේ නෑ ඔයාට මාව විශ්වාස කරන්න පුළුවන්ද බැරිද කියලා. මොකද ඔයා මට වඩා ජීවිතේ ගැන දන්නවා. ආදරේ ගැන දන්නවා“

“මට සමාවෙන්න මෙහෙම කියනවාට. මං දමිත් වගේවත් හේමන්ත වගේවත් නෙමෙයි අනූ ඔයාට ආදරේ“

“මට ඔයාට ආදරේ මෙහෙමයි කියලා කියන්න දන්නේ නෑ. ඒත් ඔයා හිතනවාටත් වඩා මං ඔයාට ගොඩාක් ආදරෙයි“

අනූ තවත් නිශිත්ට තුරුල් වුණා.

“අනූ....“

“ම්ම්ම්ම්ම්“

“මං ඔයාට ඊයේ ගොඩක් කරදර කළාද මැණිකෙ...“

අනූ ඉඳගෙන හිටපු තැනම නිශිත්ගේ මූණ පේන විදියට නිශිත්ගේ කකුලට හේත්තු වුණා.

“ඔයා මට ලොකු කරදරයක් කළේ නෑ අයියේ...“

“මොකක්...“

“ඔව් අනේ. ඔයා ඉතිං බෙල්ලෙන් එහාට ගියේ නෑ“

“ඔයා දෙපාරක් තුන්පාරක් මාව හපලා හොඳට මගේ ඇඟ උඩට වෙලා නිදි. මට හෙලවෙන්නවත් විදියක් නෑ. උදේ වෙද්දි කොන්ද කැක්කුම ආවේ ඒකයි“

“ඔයා හිතුවේ වෙන දෙයක් නේද. හොඳටම බය වුණා හැබැයි අනේ. ආසාවේ බෑ ඒ වෙලාවේ මූණ දකිද්දි“

“ඔයා සිහියෙන් නොහිටියත් මාව ආරක්ෂා කළා අයියේ“

“මේ එතකොට අර සරම ඇන්දුවේ ඔයාද?“

“ම්ම්ම්ම් ඔව්නේ. හොඳටම බීලා දඩිය පෙරාගෙන ආවේ. ඉතිං මං ඇඟ හෝදවලා මට පුළුවන් විදියට සරම ඇන්දුවා. කට්ටකුත් ගැහුවා බයටම“

“මොකක් ඇඟ හේදුවා?“

“අයියෝ මං මුකුත් බැලුවේ නෑ අනේ. මං ඇස් දෙක වහගෙන කළේ. ඒක මතක තියෙන්නත් ඉතිං සිහියක් තියෙන්න එපැයි“

“ඒක මිසක්. මං හිතුවා මෙච්චර අහිංසක මගේ සිල් බිඳිලා ඉවරද කියලා“

අනූට නම් හයියෙන් හිනා ගියා.

“හැමදම හිනාවෙලා ඉන්න අනූ...“

නිශිත් අනූගේ නලලට හාදුවක් දුන්නා.

“මේ ඒක නෙමෙයි. ඔයා එතකොට උදේ පුම්බගෙන හිටියේ මොකද. මං ඊයේ රෑ මුකුත් කළේ නැති හින්දද“

අනූ නිශිත්ගේ කොණ්ඩෙන් ඇද්දේ ඒ කියපු කතාව

“ආව්... අනේ අම්මේ... මෙන්න මරන්න හදනවා...“

“මං තරහෙන් හිටියේ හේතු 3කට“

“හපොයි.... එහෙමද... මගේ මැණික කියන්නකෝ බලන්න හේතු 3“

අනූ බොරුවට රවාගෙන හේතු ටික කියන්න පටන් ගත්තා.

“එක ඔයා මාව මහ රෑ වෙනකම් තනියෙන් තිබ්බා කව්රුත් නොදන්න පළාතක. මං බයවෙලා මුල්ලකට වෙලා ඉඳගෙන හිටියා කොහේවත් ගියේ නැතුව“

“අනේ මැණික...“

“දෙක කෙලින් ඉන්නවත් බැරිවෙන්න බේබද්දෙක් වගේ බීගෙන ගෙදර ආව එක. ගඳේ බෑ කිස් කරද්දි මට හුස්ම හිරවෙලා මැරුණේ නැතුව ඇති“

“එතකොට මැණික මොකද්ද අනිත් හේතුව තරහා යන්න“

“ඔයා මට රිද්දපු එක. මේ බලන්න“

අනූ එයාගේ තොලත් පෙන්නුවා. බෙල්ලටත් අත තියලා පෙන්නුවා.

නිශිත් ඉතිං අහිංසක මූණක් හදගෙන අනූ දිහා බලාගෙන ඉන්නවා.

“බෙල්ලයි උරහිසයි හපලා තාමත් දනවා අනේ“

අනූගේ බෙල්ල ළඟට වෙනකම්ම තිබුණු ගවුමේ ෂිප් එක නිශිත් හිමීට පහත් කළා.

නිශිත්ගේ දත් පාරවල් තිබුණු පැත්තේ ගවුම් කර පාත් කරලා ඒ තැන් ඔක්කොම සිප ගත්තා.

අනුගේ නම් ඉතිං ඇඟම හිරිවැටිලා ගියා.

“පිස්සා...“

“ඔයා තමා මාව පිස්සු වට්ටන්නේ ඉතිං“

“මේ ඒක නෙමෙයි නංගි බබා මාව ඇඬෙව්වාට වාඩුව මං ගන්නම් හොඳේ. බලනවා මේ අහිංසකයා කොච්චර දුක් වුණාද කියලා“

“තව ටිකෙන් හාර්ට් ඇටෑක් එකක් එනවා“

“මං ඔයාගේ හිත ගොඩක් රිද්දුවා නේද. සොරි අයියේ. මට ඔයාට ආදරෙයි කියලා මේ විදියට කියන්න ඕනේ වුණා. ඒකයි එහෙම කළේ“

“ඔයා අඬද්දි මමත් ඇඬුවා අයියේ ඔයාගේ හිත රිද්දලා මම සතුටු වුණේ නෑ අයියේ..“

“පිස්සු කෙල්ල“

නිශිත් අනුව සිපගත්තා.

“අනූ...“

“ම්ම්ම්ම්ම්ම්“

“දැන් ගොඩක් රෑ වෙලා අපි යමු නේද..“

“අද අපි මෙහෙම ඉමු..“

“ඔයාට අසනීප වෙයි අනූ.. දැන් ගොඩක් වෙලා ඉඳන් එළියේනේ... හුළඟ වැදුණාම අසනීප වෙනවා“

“ඔයා මං ගැන මෙච්චර හිතනවාද අයියේ...“

“ඔයාට අසනීපයක් වුණාම මං හිතෙන් විඳවන විඳවිල්ල ඔයාට හිතාගන්නවත් බෑ මැණික“

“ඒ නිසා මං වෙනුවෙන්වත් පරිස්සම් වෙන්න“

අනූ නිශිත්ගේ පපුවේ මූණ හංගගත්තා.

‘ඔයා මට මෙච්චර ආදරේ කරනවාද අයියේ. අනේ මට සමාවෙන්න උදේ ඉඳන් ඔයාගේ හිත රිද්දුවාට‘

අනූ එයාටම කියාගත්තා.

“මාව කවදාවත් දාලා යන්න එපා අයියේ“

“කවදාවත් නෑ නංගී. කවදාවත් නෑ. ඔයා හැමදාටම මගේ“

නිශිත් අනූගේ හිස සිපගත්තේ අළුත් පරිච්ඡේදයකට ආරම්භයක් දීලා.

“අපි යමු අයියේ...“

*.... 24*

නිශිත් අද උදේම එළියට ගියේ විශ්වගෙන් ආපු ඇමතුමකට.

sinhalaebooks.com

හැබැයි ඉතිං නිශිත් ආයෙත් ගෙදර ආවේ නම් ටිකක් තරහින්.

“අයියේ ඇයි මේ මූණත් රතුවෙලා“

“දැන් රතු වෙලා. තව ටිකකින් දම්පාට වෙනවා“

“දම්පාට වෙනවා. ඒ මොකද ඔයා මට දේදුන්නක්වත් පෙන්නන්න යනවාද“

“මේ ඒවා වැඩක් නෑ. මට ඔයාගෙන් පොඩි දෙයක් ඕනේ. හදිසියකට“

“මොනවාද. පුළුවන් දෙයක් නම් ඉතිං දෙන්නම්“

“මට ඔයාගේ චේන් එක දෙනවාද. මං ඒක තියලා සල්ලි ගන්නම්. හෙට බේරලා දෙන්නම්“

‘දෙයියනේ දැන් මොකද කරන්නේ මං. අද නම් ගුටි කාලා ඉතුරු වුණොත් ඇති‘ අනූ හිතුවා.

ඊයේ නිශිත්ගේ බර්ත්ඩේ පාර්ටි එකට ඕන සල්ලි ගත්තේ චේන් එක උකස් කරලා.

විශ්ව, නිශිත්ව එක්කගෙන ආපු වෙලාවේ අනූ නිශිත්ව සාලෙන් වාඩි කරවලා විශ්වත් එක්ක මේ දේවල් කතා කරගත්තා.

ළඟ සල්ලි නැති නිසා කරේ තිබුණු චේන් එක එයාට දුන්නේ ඒක උකස් කරලා සල්ලි ගන්න.

“අනූ මට ඒක දෙනවාද“

“අයි...යේ... මේ... මං ඒක... අරන් තිබ්බා කොහේ හරි.... මං අරගෙන එන්නම්....“

“අරන් තිබ්බේ උකස් බඩු කඩේද?“

නිශිත් අතේ තිබුණු චේන් එක අතට අරගෙන අනූට පෙන්නුවා.

“අයියේ... මං...“

“මුකුත් කියන්න එපා අනූ...“

“මට ඔයාගේ සතුට වටිනවා අයියේ මේ දේවල් වලට වඩා..“

අනූ නිශිත්ට තුරුල් වුණා.

“ඉතිං මැණික මං ඔයාගේ පොතට සල්ලි දැම්මානේ. ඇයි ඒවා ගන්නේ නැතුව මේක විශ්වට දුන්නේ“

“ඒ ඔයා මහන්සියෙන් හම්බකරපු ඔයාගේ සල්ලි අයියේ“

“ඔයාට තාමත් අපි දෙන්නා දෙන්නෙක්ද අනූ...“

“අනේ එහෙම කියන්න එපා දෙයියනේ..“

“විශ්ව මේක උකස් කරලා නෑ. එයා ඒක තියාගෙන එයාගේ සල්ලි වියදම් කරලා“

“ඔයා පව් කිව්වා, අහිංසකයි කිව්වා, ඌට ඒක කරන්න හිතුණේ නෑ කිව්වා“

“ඉතිං මට කතා කරලා චේන් එක දුන්නා. මං බලෙන්ම සල්ලි දීලා ආවා ඌට“

අනූ තාම නිශිත්ට තුරුල්වෙලා. දන්නවනේ කරපු වැඩේ වැරදි කියලා. ෂේප් කරගන්නත් ඕනේනේ.

නිශිත් අනූගේ බෙල්ලට චේන් එක දැම්මා.

"ආයේ මේ වගේ වැඩ කරලා තිබුණොත් මං හොඳ වැඩක් කරනවා තේරුණාද කෙල්ලේ"

"මේ දෙවනි පාර සහ අන්තිම පාර තේරුණාද නෝනාට"

අනූ නිශිත්ගේ කම්මුලට හාදුවක් දුන්නා.

"කෙල්ලන්ට මායම් 64 ක් නෙමෙයි 264ක් විතර තියෙනවා අප්පා. අපිත් ඉතිං එකක් දෙකක් දැකපු ගමන් රැවටෙනවානේ දෙයියනේ"

"ඉතිං කව්ද දැන් රැවටෙන්න කිව්වේ ආ.."

"කිව්වේ නම් නෑ තමා.. ඒත් ඉතිං වෙන්නේ ඒකනේ"

***********************************************
********

බලාපොරොත්තු දහසක් එක්ක අනූ නිශිත්ගේ වෙන්න පෙරොන්දු වුණා.

"හැමදේම ලැබෙන්නේ ඒකට ලැබෙන්න ඕනම වෙලාවට. ඒ හින්දා ඉවසන්නම වෙනවා අමාරුවෙන් වුණත්. ඔයාට දෙයක් නොලැබුනේ ඊට වඩා හොඳ දෙයක් ඔයාට ලැබෙන්න තියෙන නිසා වෙන්න පුළුවන්නේ"

එදා මලින්දි ඒ කියපු දේ අනූට මතක් වුණා.

අද නිශිත් සම්මුඛ පරීක්ෂණේට යන දවස.

අනුට විශ්වාසයි නිශිත්ට මේ රැකියාව ලැබෙනවා කියලා. ඒ විශ්වාසෙන්ම එයා උදේම නැගිටලා කිරිබතක් හැදුවේ නිශිත්ගේ මේ සුබ ගමනට ආශිර්වාද කරන්න.

"ඔයා කිරිබත් හදලා. හරිම රසයි මැණික"

නිශිත් ආයේමත් හැමදේම හරිද කියලා බලලා පිටත් වෙන්න සූදානම් වුණා.

වතුසුද්ද මල් දාපු වතුර වීදුරුවක් අරගෙන අනු නිශිත්ගේ ඉස්සරහාට ආවේ මේ යන ගමන සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වෙන්න කියලා හිතින් ප්‍රාර්ථනා කරන ගමන්.

වතුර වීදුවෙන් ටිකක් බීපු නිශිත් අනුගේ නළලට හාදුවකුත් දීලා ඒ ගමන පිටත් වුණා.

ජීවිතේ හැමදම ලබන්න ප්‍රාර්ථනා කරපු ඒ ආදරේ තමන්ට ලැබෙද්දි අනුට දුක් විඳපු කාලේ අමතක වෙලා යන්නේ ඉබේමයි.

සම්මුඛ පරීක්ෂණෙන් දින දෙකකට පස්සේ ඒ රැකියාවට නිශිත්ව තෝරගෙන කියලා ලැබුණු ලියුමත් එක්කම නිශිත් අනුව අත්දෙකට වඩාගෙන වට ගාණක්ම කැරකුණේ පොඩි දරුවෙක් වගේ.

"අනේ බිමින් තියන්නකෝ...."

"මාව වැටෙයි මැට්ටෝ..."

“ඔයා නිසයි මට මේක හම්බුණේ අනූ..“

“අපි අනුරාධපුරේ ගිහින් ඇවිත් ඊළඟ සතියේ මැරි කරමු තවත් කල් දන්න ඕනේ නෑ“

“මට තවත් ඔයාව මෙහෙම ළඟ තියාගෙන උඩ බලන් ඉන්න බෑ“

“අනේ අපි මෙහෙම ඉමු..“

“ඔයාට ඕනේ හැමදාම මාත් එක්ක හුරතල් වෙවී ඉන්න විතරද ආ“

“නැතුව ඉතිං වෙන මොනවා කරන්නද“

“කරන්නද? කරන්න දේවල් ඕන තරම් තියෙනවා නංගී. මං ඒවා වෙලාව ආවාම හීමිට කියලා දෙන්නම්කෝ...“

“මහා නරකයි අප්පා ඔයා....“

“නරකයිද කියලා ඉක්මණට බලාගන්න පුළුවන්“

“අනේ.....“

“අනේ අම්මේ ලැජ්ජාව ඉතිං“

අනූ බාර වුණු විදියටම රැකියාව ලැබුණු දවසේ සති අන්තයේ දෙන්නාම අනුරාධපුරේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඳපුදා ගන්න ගියේ තවත් බාරයක් වෙන ගමන්මයි.

දික්කසාදයත් ලැබුණු නිසා වගේම විවාහ උත්සවයක් නොගන්න නිසාම ඊළඟ සතියේ එළඹෙන සුබ දිනයක නිශිත් අනූව විවාහ කරගන්න හැමදේම සූදානම් කළා.

ළඟම මිතුරන් කීපදෙනෙකුටත්, නිශිත්ගේ මල්ලි මලිත්ටත් විතරක්ම ආරාධනා කළේ අනුගේ පැත්තෙනුත් කව්රුවත්ම නැති නිසා.

නිශිත්ගේ තේරීමක් වුණු සමේ පැහැයටම ගැලපෙන ක්‍රීම් පාට ලස්සන ගල් අල්ලපු සාරියකින් හැඩවුණු අනුත් දුඹුරු පාට කෝට් කිට් එකකින් සැරසුණු නිශිත් පුදුම විදියට අද ලස්සනයි.

අනූ හේමන්ත එක්ක විවාහ වුණ දවසේ හිනාවක් නැතුව තමන් දිහා රවාගෙන, තරහින් බලන් හිටපු හේමන්තව අනූට මතක් වුණා.

අද නිශිත්ගේ ඒ ආදරණීය හිනාවෙන්ම තමන්ව එයාට කොච්චර වටිනවාද කියලා අනූ දැක්කා.

“නිශිත් වික්‍රමසිංහ වන මම මෙහි සිටින අනුලි විජේසිංහ යන අය මාගේ නීත්‍යානුකූල භාර්යාව ලෙස පිළිගන්නා බවට දිවුරා පොරොන්දු වෙමි“

“අනුලි විජේසිංහ වන මම මෙහි සිටින නිශිත් වික්‍රමසිංහ යන අය මාගේ නීත්‍යානුකූල ස්වාමිපුරුෂයා ලෙස පිළිගන්නා බවට දිවුරා පොරොන්දු වෙමි“

එහෙම කියපු නිශිත් අනූ දෙන්නා මුදු මාරු කරගත්තේ එතන හිටපු හැමෝගෙම අත්පොළසන් මැද්දේ.

නිශිත් නම් අනුගේ අත අතඅරින්නේම නෑ.

“අනේ අම්මේ බං උඹේ ගෑණිව කව්රුත් ගෙනියන්නේ නෑ“

දෙන්නා අත් අල්ලගෙනම ඉන්නවා දැකපු යාළුවෝ නම් නිශිත්ට විහිළු කළා.

“අපෝ බෑ මට උඹලව ෂුවර් නෑ“

ලස්සන දවසක අවසානේ මිතුරන්ගෙන් වෙන් වෙලා නිශිත් අනූ දෙන්නා නුවර එළියේ එන්න පිටත් වුණා.

නුවර එළියේ කඳු පන්තියකින් වට වුණු තේ වත්තක් මැද අපූරුවට පිහිටලා තියෙන හෝටලයකට දෙන්නාම ආවේ සුහද පිළිගැනීමක් එක්ක.

“අනූ මහන්සියි නේද....“

“ඔයා වොෂ් එකක් දාගෙන එන්න“

නිශිත් අනූගේ සාරියත් ගලවන්න උදව් කළා.

අනූට මේ දේවල් දකිද්දි අවුරුද්දකට කලින් තමන් හේමන්තගේ වෙලා ගිය දවස මතක් වෙන්නේ ඉබේටමයි.

හනිමූන් එකට හොටෙල් එකට ආවත් තමන්ගේ මූණවත් නොබලා හේමන්ත හිටපු හැටි, කට්ටක්වත් ගලවන්න උදව්වක් නැති නිසාම තමන් තනියම අමාරුවෙන් ඇඳුම ගලවගත්ත හැටි අනූට මතක් වෙලා සුසුමක් හෙළුනේ ඉබේටමයි.

“හ්ම්ම්ම්ම්ම්“

“අනූ... මැණික ඇයි මේ...“

ඒ සසුමේ හඩ නිශිත්ටත් ඇහුණා.

“මුකුත් නෑ අයියේ. මං ඉක්මණට එන්නම්“

‘මට තේරේනවා නංගි ඔයාට පරණ දේවල් මතක් වෙනවා. ඒත් ඒ දේවල් ඉක්මණින්ම අතීතේම විතරක් වෙයි‘ නිශිත් හිතුවා.

අනු ඉක්මණින් වොෂ් එකක් දගෙන නිශිත් අරගෙන දීපු ලා රෝස පාට දුහුල් නයිට්යත් ඇඳගෙන හිමින් හිමින් බාත් රූම් එකෙන් එළියට ආවා.

අනුව දැකපු නිශිත් මනමාල හිනාවකුත් අනුට දලාම එයත් ගියේ වොෂ් දගන්න.

මේ අතරේ කලින්ම ඇණවුම් කරලා තිබුණු කෑමත් ලැබුණු නිසාම නිශිත් එනකම් අනු ඒ කෑම ටික හැදුවා.

කොණ්ඩෙත් බාගෙට පිහාගෙන ටවල් එක පිටින්ම බාත් රූම් එකෙන් එළියට ආව තාමත් වතුර බිංදු ඇඟ දිගේ බේරෙන ඒ කඩවසම් රුව දකිද්දි අනුගේ පපුව ගැහෙන්න ගත්තා.

අනු ඉක්මණට පිටිපස්සට හැරුනේ නිශිත්ට මූණ දෙන්න බැරිකමට.

ජීවිතේ දවසක කෙල්ලෙක්ට මුහුණ දෙන්න වෙන ඒ මොහොතට අනුට තව ටිකකින් සූදනම් වෙන්න ඕනේ නේද කියලා හිතෙද්දි අනුගේ පපුව ඊටත් වේගෙන් ගැහෙන්න පටන් ගත්තා.

නිශිත්ට කොච්චර දවස් තුරුල්වෙලා ඉන්න ඇතිද, ආදරේ කරන්න කලින් එක ඇඳේ නිදගෙන ඇතිද, ඒත් අද ඒ

හැමදේකටම වඩා වෙනස් හැඟීම් දෙන්නගේම හිත්වල තියෙන්නේ.

“මැණික....“

නිශිත් වතුර පිටින්ම ඇවිත් අනුව පිටිපස්සෙන් තුරුල් කර ගත්තා.

අනුගේ තිගැස්ම නිශිත්ටත් දැනෙන්න ඇති.

“අනු.... ඔයා බය වෙලාද...“

නිශිත් අනුව එයාගේ පැත්තට හරවා ගත්තාත් අනු නම් බිම බලාගෙන ඉන්නවා.

“අනේ ඇයි මේ... මගේ දිහා බලන්නකෝ“

“ම්ම්ම්ම්හ්හ්හ්“

“ලැජ්ජයිද බයයිද“

“දන්නේ නෑ“

ඇහෙන නෑහෙන ගාණට අනු කතා කරද්දි නිශිත්ටත් හිනා.

“මේ අහන්න මැණික.. ඔයා තාම මාත් එක්ක ඒ දේට ලෑස්ති නැත්නම් මං ඔයාට මුකුත් කරන්නේ නෑ“

“ඔයාට බයවෙන්න කිසිම දෙයක් නෑ තේරුණාද“

“මං ඔයාව බැන්දේ මගේ ආසාවල් පිරිමහගන්න නෙමෙයි රත්තරන්“

“මං ඔයාට ආදරෙයි“

“අද නෙමෙයි ඔයා තව මාස ගාණක් අවුරුදු ගාණක් වුණත් ඒ දේට ලෑස්ති නැත්තම් මං ඔයාට මුකුත්ම කරන්නේ නෑ. ප්‍රොමිස්“

කොල්ලෙක්ගේ කටින් කවදාවත් පිටවෙයි කියලා හිතන්න බැරි වචන නිශිත් කියද්දි අනූ ඇස් දෙකත් ලොකු කරගෙන නිශිත් දිහා බලාගෙන හිටියා.

“එන්න අපි කාලා ඉමු. හොඳටම බඩගිනියි...“

නිශිත් ඉක්මණට ෂෝර්ට් එකක් ඇඳ ගත්තේ තෙත තුවාය පිටින් ඉන්න බැරි නිසා.

“මං ඔයාට කවන්නද...“

“අනේ අම්මේ ඉතිං ඕක අහන්නත් දෙයක්ද මගේ කෙල්ල“

නිශිත්ට හරි සතුටුයි අනූ කවන්නද ඇහුවාම.

හේමන්ත එක්ක ගිය දවසයි අද දවසයි අනූ තාමත් ගලපනවා.

තත්පර, විනාඩි ගෙවෙද්දි නොකිව්වාත් අනූගේ හිතේ ගැස්ම නම් වැඩි වෙලා.

නිශිත් නිදාගන්න කොට්ටෙත් අරගෙන ඇඳ වටෙන් එනවා දැක්කාම අනූ පුදුම වුණා.

“අයියේ ඔයා කොහේද යන්නේ“

“ඔයා ඇඳේ නිදාගන්න. මං සෙට් එකට යන්නම්“

“එහෙනම් මාත් එනවා“

sinhalaebooks.com

“කොහේද...“

“ඇයි දැන් ඔයා සෙට් එකට යනවා කිව්වේ. මාත් එනවා සෙට් එකට...“

“පිස්සි...“

“එහෙනම් මං ඇඳට එන්නද“

“හා....“

අනූ ලැජ්ජාවෙන් වුණත් හා කිව්වා.

නිශිත් ඇඳට ආවේ අනුගේ මේ විකාරත් හිත හිත.

බඳින්න පොරොන්දු වුණු දවසේ ඉඳන් මේ වෙනකම් නිශිත් අනූගේ නළලත හාදුවකින් එහා අනූට ළං වෙලා නෑ. ඒ නිශිත්ට හැඟීම් නැති නිසා නෙමෙයි.

විවාහය වෙනකම්ම නිශිත් ඒ දේවල් අමාරුවෙන් වුණත් නවත්තගත්තේ අනූ ගැන හිතලා.

එයා බැඳපු කෙනෙක් නිසා එයාගෙන් ප්‍රයෝජන ගන්නවා කියලා අනූ හිතයි කියලා නිශිත් බය වුණු නිසා.

ඒත් අදත් අනූගේ අකමැත්තෙන් කිසිම දෙයක් වෙන්නේ නෑ කියලා එයා අනූට පොරොන්දු වුණා.

අනූ ලයිට් නිවලා නයිට්යට උඩින් දගෙන හිටපු හවුස්කෝට් එක ගලවලා නිශිත් ළඟින්ම ඇඳෙන් හාන්සි වුණේ හොඳ හුස්මක් අරගෙන.

නිශිත් දැන් තමන්ගේ හස්බන්ඩ්. තමන්ව පොඩි දවසක් වුණත් මහා ආදරේකින් බලාගත්තු කෙනා. එයා වෙනුවෙන් යුතුකම් ඉෂ්ට කරන්න අනූ එයාගේ හිත එකඟ කර ගත්තා.

"අයියේ...."

"ම්ම්ම්ම්ම්"

"තරහයිද..."

"ඒ මොකටද දැන් තරහා වෙන්නේ ආ..."

නිශිත් වැලමිට කොට්ටෙට තියාගෙන ඒ උඩින් ඔළුව තියාගෙන අනූගේ පැත්තට හැරුණා.

නිශිත් එයාගේ නිදහස් අතින් අනූගේ කොණ්ඩේ අතගානවා.

"මේ...."

අනූ නිශිත්ගේ පපුවට අතත් තියාගෙන ගස් ගලවන්න හදනවා.

"නංගී මේ.. එක එක සෙල්ලම් දන්න ගිහින් අර නයාට ගහලා පොල්ල වරද්දගත්තා වගේ වෙයි හොඳේ... මං නෑ ඊට පස්සේ වෙන එව්වාට"

"අනේ..."

"මේ කෙල්ලගේ කෝලම බලන්නකෝ... මොකෝ දැන්..."

"මට ඔයාට තෑග්ගක් දෙන්න තියෙනවා"

"තෑග්ගක්?"

sinhalaebooks.com

නිශිත් පුදුම වෙලා.

“මොකද්ද තෑග්ග...“

“ඒක මං වෙලාව ආවම දෙන්නම් ඉතිං“

අනූ ඇස් දෙක පියාගෙන නිශිත්ගේ කම්මුලක් ආදරෙන් සිප ගත්තේ නිශිත් අමාරුවෙන් හිර කරගෙන හිටපු හැඟීම් නිදහස් වෙද්දි.

නිශිත්ගේ හිතේ මෙච්චර වෙලා තිබුණු ඒ හැඟීම් නමැති පිදුරු ගොඩට ගිනි ඇවිලෙන්න ගියේ තත්පරයයි.

නිශිත් අනූ දිහා බැලුවා. අනූගේ කිසිම විරුද්ධත්වයක් නොතිබුණු නිසාම නිශිත් අනූව එයාගේම කරගන්න ඒ හැඟීම් වලට ඉඩ දුන්නා.

නිශිත් අනූගේ දෙතොල් වලට බර වුණේ ජීවිතේ කවදාවත්ම තමන්ට හිමි නොවෙයි කියලා හිතපු තමන්ගේ ආදරේ, මෙච්චර කාලයක් හිතේ හිර කරගෙන තිබුණු ඒ ආදරේ, අනූ තමන්ගේ ළඟ තමන් එක්කම සති ගාණක් ගත කළත් ඉඟියකින්වත් කරපු නැති ඒ ආදරේ මුළු හදවතින්ම අනූට දෙන ගමන්.

මුළු ලෝකේම අමතක කරලා නිශිත් එයාගේ මෙතුවක් කල් තිබුණු හැඟීම් එකින් එක නිදහස් කරන්න පටන් ගත්තා.

විනාඩි ගාණක්ම ආවේගයෙන් ඒ දෙතොල් රතු වෙනකම්ම කරපු සෙල්ලම නවත්තලා හිමින් හිමින් අනූගේ බෙල්ල හරහා ළැම දෙසට දෙතොල් එද්දි අනූගේ හීන් පටි තිබුණු රෑ ඇඳුම

ඉවත් වුණේ  නොකිව්වාත් අනූ නිශිත්ගේ ඒ දරාගන්න බැරි උණුසුමට නතු වෙද්දි.

අනූගේ ජීවිතේ පිරිමියෙක්ගෙන් ලබපු ප්‍රථම උණුසුම මේක වෙද්දි අනූගෙත් හැඟීම් උණුසුම් වුණා.

මෙතෙක් වෙලා තිබුණු සියුම් පිරිමැදීම්, සිප ගැනීම් ටිකෙන් ටික රළු පිරිමැදීම්, සිපගැනීම් වෙද්දි අනූ සුසුමකින්වත් බාධා නොකර නිශිත්ට ඒ හැඟීම් විඳගන්න සහාය වුණා.

උමතුවෙන් වගේ අනූගේ මුළු සිරුර පුරාම දිව ගිය ඒ ස්පර්ශයන් සීමා මායිම් බිඳින්න සූදානම් වෙද්දි අනූ නිශිත්ව තව තවත් තදින් තුරුළු කර ගත්තේ ඒ වේදනාව දරාගන්න.

රැහැයියෙකුගේවත් සද්දයක් නැති වටපිටාවේ මේ උස් හඬින් නැගෙන දෙන්නගේම සුසුම් මැද්දේ වුණත් එක් තැනකදි ඇහුණු අනූගේ වේදනාබර කෙඳිරිය වගේම නිශිත්ට ඒ දැණුනු දේ නිශිත්ව පුදුමට පත් කළත් ඒ ගැන හිතන්නවත් වෙලාවක් දෙන්න නිශිත්ට ඕනකමක් තිබුණේ නෑ.

සුසුම් හඬවල් මැද්දේ පැයක් දෙකක්ම ඒ දෙන්නා එයාලගේම ලෝකයක තනිවුණා.

නිශිත් නම් අනූගේ ඇඟ උඩට වෙලා හති අරිනවා.

අනූ පුදුම ආදරේකින් නිශිත්ගේ ඔළුව අතගානවා.

“මොකද දැන් හති අරින්නේ ආ ඕනේ නැති වැඩ කරලා…“

“ඕනේ නැති නෙමෙයි මැණික ඕනේම දේ ඒකනේ.....“

“මැට්ටා... බරයි ඔයාව...“

“ඒ උනාට කරන්න දෙයක් නෑ.. මට මහන්සියි“

නිශිත් අනුගේ ඇඟ උඩ වැටිලා පපුවට ඔළුව තියාගෙන ඔහේ ඉන්නවා.

ඉක්මණට දෙයක් මතක් වුණා වගේ නිශිත් අනූ දිහා බැලුවා.

“මේ කෝ ඔයා අර දෙනවා කියපු තෑග්ග මට“

“ඇඟ උඩින් අයින් වෙන්නකෝ ඉතිං....“

“දෙනවා කිව්ව තෑග්ග දෙනකම් බෑ....“

“ඒක දෙන්න තමා නැගිට්ටන්න කියන්නේ...“

නිශිත් පුදුම වෙලා අනූගේ ඇඟ උඩින් අයින් වුණා.

අනූ බෙඩ් ෂීට් එකත් පොරවගෙන ඇඳෙන් නැගිට්ටා.

“දැන් ඉතිං ඕක පොරවගත්තාට වැඩක් නෑ නංගී“

“ඉස්සරහාට වැඩි හරියක් ඉන්න වෙන්නේ මූකුත් නැතුව තමා“

නිශිත්ගේ මනමාල හිනාව අනූව නම් තව තව රතු කරනවා.

“මෝඩයා...“

අනූ ඇඳ අයිනේ තිබුණු මේස ලාම්පුව පත්තු කළා.

අනූ ඇද දිහාම බලාගෙන ඉන්නවා දැක්කාම නිශිත් ඒ දිහා බැලුවා.

“අනු.... දෙයියනේ කොහොමද මෙහෙම වෙන්නේ“

නිශිත් ඇඳෙන් නැගිට්ටා නෙමෙයි ඇඳෙන් පැන්නා.

ඒ වෙන මුකුත් නිසා නෙමෙයි. අනුගේ පිවිතුරු බව ලස්සනට ඒ ඇඳේ රෙද්ද මත තිබුණු නිසා.

නිශිත් ඇස් අදහාගන්න බැරුව ඒ දිහා බලාගෙන ඉන්නේ ඉනටත් අත තියාගෙන අතින් කටත් වහගෙන.

තාමත් කතාවක් නෑ.

“අනූ කතා කරන්න.. මට මේ මොනවත් තේරෙන්නේ නෑ“

“මේක තමා මට ඔයාට දෙන්න තියෙන තෑග්ග“

“එතකොට ඔයා.... හේමන්ත...“

“නෑ අයියේ. එයා මගේ අතකින්වත් අල්ලලා නෑ“

“එයා මාව බලන්න ආව දවසෙම කිව්වා එයා ආදරේ තිසුට කියලා“

“එද රෑ එයා මාත් එක්ක හිටියේ නෑ අයියේ..“

“මට තේරෙන්නේ නෑ නංගි මොනවා කියන්නද කියලා“

“මං මේ දේවල් බලාගෙන හිටියේ නෑ“

“ඒත්... ඒත්.... මට සතුටුයි මගේ මැණික මගේම වුණ එකට“

“මං ගොඩක් වාසනාවන්තයි අනූ. ඔයාගේ හැමදේම දැන් මගේ“

“ඔයාට මං රිද්දුවා නේද“

“මට මතක නෑ...“

අනූ නිශිත්ගේ පපුවේ මූණ හංගගත්තේ ලැජ්ජාවට.

“රිදුණත් කරන්න දෙයක් නෑ. මට තව ඕනේ...“

නිශිත් අනූව තුරුල් කරගෙනම ආයෙත් ඇඳට වැටුණේ මේ හැඟීම තවමත් දරාගන්න බැරිවෙද්දි.

මුළු රැයක් පුරා ඒ සතුට නිශිත් වගේම අනූත් විඳගත්තේ එන්න එන්නම වැඩිවෙන මේ ආදර හැඟීම් එක්ක.

“මං ඔයාට ආදරෙයි මැණික“

*.... 25*

සතුටින් සැහැල්ලුවෙන් ගොඩක් ආදරණීයව ආරම්භ කරපු ඒ විවාහ ජීවිතයට අනූ නිශිත් පුදුම විදියට ලෝබයි.

මුල් දවසේ වගේම තාමත් අනූ නිශිත් ඒ දෙන්නාගේ ලෝකේ හැඟීම් වෙනසක් නැතුවම විඳිනවා.

විවාහයෙන් දින කීපයකට පස්සෙම නිශිත් අනූ එක්කම නිශිත්ගේ ගෙදරට ගියේ මොන ප්‍රශ්න මොන විදියට වුණත් ඒ එයාව හදාගත්තු අම්මා නිසා.

මුලදී නිශිත්ගේ අම්මා විරුද්ධ වුණත් විරුද්ධ වෙලා වැඩක් නැති නිසා වගේම අනූ ගැන පැහැදුණු නිසා ඒ දෙන්නාට ආශිර්වාද කළා.

ඉත් සති කීපයකට පස්සේ නිශිත්ට අනූ එක්කම විදේශගත වෙන්න වුනේ එයා රැකියාව කල ආයතනයේම මව් ආයතනයේ ඇතිවුනු පුරප්පාඩුවක් වෙනුවෙන්.

නිශිත් අදටත් උදේ හවස අනූට පින් දෙන්නේ මේ රැකියාව ලැබුණේ අනූගේ උත්සාහයෙන් නිසා.

“ඔයා නිසායි මැණික මේ හැමදේම“

“ආ මෙන්න වැඩක්. දැන් මගේ සුදුසුකම් බලලාද ඔයාව ජොබ් එකට ගත්තේ ආ“

“ඒ උනාට ඔයාගේ අතින්නේ ඇප්ලිකේෂන් දැම්මේ පැටියෝ....“

“මගේ පිස්සු කොල්ලා....“

නිශිත් රාජකාරී එක්ක කොච්චර කාර්යබහුල වුණත් අනූ වෙනුවෙන් වැඩි කාලයක් වෙන් කරන්න වගබලා ගත්තා.

අනූ පිට තැනක රැකියාවක් කරනවාට නිශිත්ගේ කැමැත්තක් නොතිබුණු නිසාම නිශිත්ගේ සහායෙන්ම ඔන්ලයින් ඇඳුම් ව්‍යාපාරයක් ආරම්භ කළේ පිටරට ගිය මුල් කාලයේමයි.

නිශිත්ගේ කැපවීම වගේම අනූගේ උත්සාහය නිසාම නොබෝ දිනකින් මෙම ව්‍යාපාරය ස්ථාවර මට්ටමකට ගේන්න එයාලට පුළුවන් වුණා.

කාලය වේගෙන් ගෙවිලා ගිහින්.

ඉස්සරහාට එන සුන්දර දවස් ගැන අනූ නම් හීන මවනවා.

අනූ අද ඉන්නේ හරිම සතුටින්. නිශිත් ගෙදර එනකම් ඉවසිල්ලක් නැතුව බලාගෙන ඉන්නවා.

දොර ගාවට යනවා. වෙලාව බලනවා. ෆෝන් එක බලනවා ගෙදර එකම විකාරයයි.

"ඔයා කීයටද එන්නේ අයියේ..."

"මොකෝ හදිස්සිය..."

"නෑ... මුකුත් නෑ...."

"නැත්තේ නෑ.. දැන් මේ කීවෙනි පාරද මට කතා කරපු"

"අනේ ඉක්මණට එන්නකෝ...."

"හරි මැණික මං අද කලින් එන්නම් එහෙනම්..."

"නෑ නෑ එපා... හදිස්සි නෑ..."

නිශිත්ට කෝල් කරනවා. මැසේජ් කරනවා.

නොකිව්වාත් නිශිත් කලබල වෙලා ඉන්නේ අනූ ඇයි අද මෙහෙම හැසිරෙන්නේ කියලා.

'මේ කෙල්ලට මුකුත් ප්‍රශ්නයක්වත්ද'

'ඇහුවාට කියන්නෙත් නෑ'

'කෝකටත් කලින් යනවා'

එහෙම හිතපු නිශිත් වෙනදාට වඩා කලින් ගෙදරට ආවා.

“මැණික ඇයි මේ.. කියන්නකෝ...“

“වොෂ් දාගෙන එන්නකෝ ඉක්මණට. මං කියන්නම්“

නිශිත්ට අද නම් අනුව තේරුම්ගන්න බෑ. කවදාවත් අනූ මේ විදියට හැසිරිලා නෑ නේද කියලා නිශිත් හිතුවා.

නිශිත් ඉක්මණින් වොෂ් දාගෙන එනකොටත් අනූ වෙනදාට වඩා ලස්සනට කෑම වර්ග ගොඩක් එක්ක තේ මේසේ හදලා තියෙනවා දැක්කාම ඊටත් වඩා අමුත්තක් දැණුනා.

“අනූ ඔයා හොඳින් නේද...“

“ඔව් අනේ...“

“දැන්වත් කියන්නකෝ අනූ...“

“තේ බීලා ඉන්නකෝ....“

“ඔයා තේ බොන්නේ නැද්ද...“

“ම්ම්ම්ම්හ්හ්හ්“

“මට තේ බොන්න එපා කිව්වා“

“එපා කිව්වා.. ඒ කව්ද එපා කිව්වේ“

“අපේ පැටියා...“

නිශිත් කටට ගත්තු තේ උගුර එළියට විසි වුණේ ඒ ඇහුණු දේට.

ඇස් දෙකත් ලොකු කරගෙන අනූ දිහා බලාගෙන ඉන්න විදිය දැක්කාම අනූට හොඳටම හිනා.

"අයියෝ.... ඇයි අනේ බයවෙලා"

"ඔයා මොකද්ද කිව්වේ අනූ...."

නිශිත්ට ඇහුණු දේ තාමත් විශ්වාස නෑ.

"මං කිව්වේ අපේ පැටියා මට තේ බොන්න එපා කිව්වා කියලා"

තේ කෝප්පය පැත්තකින් තියපු නිශිත් අනූ ළඟට ආවේ කියාගන්න බැරි සතුටකින්.

"අනූ... මගේ වස්තුව..."

"අනේ මට කියන්න තේරෙන්නේ නෑ..."

"ඔයා... ඔයා...."

"ඔයා තාත්තා කෙනෙක් වෙන්න යන්නේ අයියෝ...."

නිශිත් අනූව හරහාට අරගෙන කාමරේට ගියේ සතුට සමරන්න.

"අදත් හනිමූන් යමු නේද ඔයා අදත් මට තෑග්ගක් දීපු එකේ"

"ආ මෙන්න වැඩක්... ඊයේ වෙනකම්ම එතකොට හනිමූන් නෙමෙයිද ගියේ"

"හරි හරි ඉතිං ඒ වුණාට අද වෙනස්නේ..."

“ඔයා නම් මහා.......“

“හොඳ..... කොල්ලෙක් නේද මැණික“

නිශිත්ගේ ඇස්වල කඳුළු පිරිලා තියෙනවා දකිද්දි අනූට දරාගන්න බැරි තරම් සතුටක් දැණුනා.

“මං ඔයාට ගොඩක් ආදරෙයි අයියේ. මගේ ජීවිතේ මෙච්චර ලස්සන කළාට ඔයාට ගොඩක්....“

“ෂ්ෂ්ෂ්..“

අනූ කියන්න හදපු එක නිශිත් අනූගේ දෙතොලට ඇඟිල්ල තියලා නැවැත්තුවා.

“ඔයාටයි ගොඩක් පින් මගේ ජීවිතේ මෙච්චර ලස්සන කළාට නංගී“

“මගේ මුළු ජීවිතේම ඔයායි මේ දරු පැටියයි දැන්“

“ඒත් මට තව ඕනේ...“

“මොනවාද...“

“අම්මෝ.. දන්නෙම නෑ මෙයා බබා...“

“නෑ දන්නේ නෑ“

“දන්නේ නැද්ද.... දන්නේ නැද්ද ආ....“

නිශිත් අනූට කිචි කවනවා.

“අනේ මට හුස්ම ගන්න බෑ.. අනේ... ඇති....“

අනූ කෑගැහුවේ බොරුවට. ඒ වුණාට නිශිත් නම් හොඳටම බය වුණා.

“අනේ මැණික... අනූ.... අනේ ඔයාට අමාරුද..“

“අනේ මං හිතලා කළේ නෑ අනූ...“

“අයියෝ මොකද මේ.. මං විහිළුවක්නේ කළේ“

“ඔහොම බය වුණාම මදෑ“

“බය වෙන්නේ නැද්ද ඉතිං. දැන් දෙකක් පරිස්සම් කරන්න එපැයි“

අනූ නිශිත්ගේ දෙතොල් සිපගත්තේ කියාගන්න බැරි ආදරේකින්.

මේ පවුලට අළුතෙන් එකතු වෙන්න යන යාළුවාගේ සතුට සමරන්න නිශිත් අනූ මුල් දවසේ වගේම මුළු රෑ පුරාම එයාලගේ හැඟීම් විඳගත්තා.

sinhalaebooks.com

*.... 26*

නිශිත් තාත්තා කෙනෙක් වෙන්න යනවා කියලා අනූ කියපු වෙලාවේ ඉඳලාම එයාගේ උපරිමයෙන් අනූව බලාගන්නවා.

අනූව තනියම තියන්න බැරි නිසාම අනූගේ අකමැත්තෙන් වුණත් නිශිත් එයාගේ බොස් එක්ක කතා කරලා ගෙදර ඉඳන් වැඩකරන්න පුළුවන් විදියට හදාගත්තා.

"අනේ ඔයා ගෙදර ඉන්න ඕනේ නෑ අයියේ... මට තාම මේ දේවල් කරන්න පුළුවන්නේ"

"මේ පැහෙන්නේ නැතුව ඉන්නවාද පණ්ඩිත ආච්චි"

"පණ්ඩිත සීයා ඔයා..."

"අයියේ...."

"ම්ම්ම්ම්ම්..."

අනුගේ මුළු ජීවිතේම නිශිත්. අනු වෙනුවෙන් නිශිත් මේ කරන දේවල් සමහර වෙලාවට අනුට දරාගන්න බැරිතරම්.

'මෙච්චර ආදරයක් ලැබෙන්න තරම් මං කොච්චර වාසනාවන්තද'

අනු හැමවෙලේම හිතුවේ එහෙම.

අනු නිශිත් ළඟට ගිහින් එයාව තුරුල් කර ගත්තා.

"මගේ මැණික... ඇයි මේ...."

නිශිත් අනුගේ ඔළුව අතගාන ගමන් අහන්නේ අනු එකපාරම ඇවිත් එයාව තුරුල් කරගත්තු නිසා.

අනු තාමත් නිශිත්ගේ අස්සටම වෙලා ඒ දැනෙන උණුසුම විඳගන්න තමා ආසා.

"මුකුත් නෑ..."

"මුකුත් නැති වෙන්න බෑ. මොකද හනිමුන් යන්න ඕනේ වෙලාද ආ..."

"අනේ ඔයා නම් මහා නරකයි අනේ..."

"බලන්නකෝ පුතේ මේ තාත්ති හරි නෝටී නේද..."

නිශිත් පහත් වෙලා අනුගේ කුස සිපගත්තේ ගොඩක් ආදරෙන්.

"තාත්ති නෙමෙයි පැටියෝ මේ අම්මි තමා නෝටි"

අනූ ගර්භනී වුණ දවසෙ ඉඳලම නිශිත් ඇයත් එක්ක සායනවලට, ව්‍යායාම පන්තිවලට පවා සහභාගී වුණා. ඇයත් එක්කම හිටියා.

නිශිත් අනූට වෙනදටත් වඩා දැනෙන්න ආදරය කළා. හැම වෙලාවකදිම ඇයට උදව් කළා.

"මැණික... ඔයාට දැන් ටිකක් අමාරුයි නේ... ඒ හින්ද රෙස්ට් කරන්න.. මට ගෙදර වැඩ කරන්න පුළුවන්...'

"අනේ ඕනේ නෑ අයියේ. ඔයාට ඔෆිස් එකේ වැඩත් එක්ක ඕවා කරන්න කරදරයි"

"චූටි පැටියෝ ඔයාගේ අම්මි මගෙන් දැන් ගුටි කන්න තමා හදන්නේ ඔන්න"

"මගේ පුතු පැටියා එළියට ආවම තාත්තිට තමා ගුටි දෙන්නේ හොඳද"

"කියනදේ අහලා ඔයා ටිකක් හාන්සි වෙන්න අනූ..."

"ඔයත් එන්නකෝ අයියේ..."

"අම්මාගේ හුරතලේ බලන්නකෝ... බබා හොඳයි..."

"අනේ එන්නකෝ..."

අනූ ඉතිං පොඩි ළමයෙක් වගේ තාමත් නිශිත් ළඟටම වෙලා ඉන්න තමා කැමති.

"මං එන්නම්... හැබැයි මොනවා හරි වුණොත් මං නැතෝ..."

නිශිත්ටත් ඉතිං ඊට වඩා දෙයක් නෑ. කතා කරන පමාවට එයා අනූ ළඟ කොච්චර වැඩ තිබුණත්..

“කමක් නෑ...“

“පුතු.. අපේ අම්මිටත් දැන් හොඳටම විසේ වැඩි වෙලා නේද..“

අනූගේ බඩ අතගාන ගමන් නිශිත් කතාව.

“ඉන්නකෝ තව ටික දවසයිනේ පුතු එළියට එනකම්. මේ කාලේ ඇරියස් ටික මං අම්මිගෙන් කවර් කරගන්නම්“

අනූ නම් නිශිත්ට තුරුල් වුණා ලැජ්ජාවට.

රෑට නිදගන්න ආවාමත් නිශිත් කරන්නේ අනූගේ බඩ අතගානවා, කකුල් තවනවා ඒවා තමා.

මාස නමයක් ගතවෙලා අනූගෙත් නිශිත්ගෙත් සතුටුම දවස උදා වුණේ ලස්සනම ලස්සන කොලු පැටියෙක් නිශිත්ගේ අතට දීලා.

දරුවා බිහි කරන වෙලාවේ අනූ විඳපු ඒ වේදනාව නිශිත් නම් දරාගත්තේ පුදුම අමාරුවකින්.

ඒ වෙලාවේ නිශිත්ට හිතුණේ තමන්ගේ පපුව පැලිලා මැරෙයි කියලා. නිශිත් ඒ තරමටම අනූට ආදරේ කළා.

“අම්මා හොඳයි තාත්තානේ ඇඬුවේ බැරල් එකක් විතර කඳුළු“

“මං හිතුවා තාත්තාව ඇඩ්මිට් කරන්න වෙයි කියලා අම්මා කෙසේ වෙතත්“

නර්සි කිව්වේ එහෙම තමා.

දරුවා අතට ගත්තු නිශිත් අනුගේ නලල සිපගත්තේ දරාගන්න බැරි සෙනෙහසකින්.

ජීවිතේ දැන් සම්පූර්ණයි නේද කියන හැඟීම නිශිත්ගේ මුළු හිතපුරාම පැතිරිලා..

*************************************************
*******

මුළු ගේ පුරාම ඇහෙන ඒ ඇඬුම් හඬ අනුගෙත් නිශිත්ගෙත් ලෝකේ තවත් ලස්සන කළා.

නිශිත් එයාගේ රාජකාරි වලට බාධාවක් නොකර අනූට පුළුවන් හැම තත්පරේම උදව් කළා දරුවා බලාගන්න.

දරුවාගේ රෙදි ටික පවා එයා හේදුවා අනූව මහන්සි නොකර. අනූ කැමති අකමැති දේවල් ගැන හොයලා බැලුවා.

අනූ පුතුට කිරි දෙන කොට බබාව අල්ලගන්න පවා නිශිත් උදව් කළා.

“බබා අල්ලගෙන ඉඳලා ඔයාගේ අත රිදෙනවා ඇති මැණික“

“කෝ දෙන්න අපේ පුතුට ගුඩුස් යවන්න“

“කෝ.... කෝ... ගුඩුස් ගුඩුස්“

නිශිත් පුතු පපුවට තුරුළු කරගෙන ඉන්න විදිය දැක්කහම ඒ බැඳීම ගැන අනුට ඇති වුණේ කියාගන්න බැරි සෙනෙහසක්.

අනු කිරි දෙන නිසාම එයාට ඕනකරන කෑම බීම, විටමින් වර්ග මේ හැමදෙයක්ම හොයලා බලලා නිශිත් ගෙනත් දුන්නා.

වෙලාවකට තාත්තගෙයි පුතාගෙයි එක එක විකාර. හිනා වෙලා ඉවරයක් නෑ.

“මේ කොල්ලා එක්ක බෑ අප්පා..“

“ඇයි අනේ…“

“කොයි වෙලාවේ බැලුවත් ඉතිං ඕක කටේනේ.. තාත්තිට නෝ චාන්ස්“

“එහෙනම් තාත්ති මේ පැත්තට එන්න. පුතු මේ පැත්තේ ඉඳියි“

අනුත් ඉතිං ඒ වෙලාවට එහෙම තමා කියන්නේ.

“බෑනේ මැණික මට ඔය පොඩ්ඩ පොඩ්ඩ මදි. දෙනවා නම් ගොඩක් ඕනේ. නැත්තම් බෑ“

“ච් අනේ ඔයා නම් නරක් වෙලා..“

“අම්මි තමා ඉතිං මාව නරක් කළේ“

දරුවා අඬන ගොඩක් වෙලාවට එයාව බලාගත්තේ නිශිත්. රෑට අනුට නිදිමරන්නවත් දුන්නේ නෑ. ඒ තරම් ආදරෙන් නිශිත් අනුවත්, පුතුවත් බලාගන්නවා.

මේ දේවල් දකිද්දි අනූගේ ඇස් වලට කඳුළු පිරෙන්නේ මේ වගේ ආදරයක් ලබන්න හැමෝටම බෑ නේද කියලා මතක් වෙද්දි.

ජීවිතේ තමන් ගත්තු හොඳම තීරණය නිශිත් බව අනූ ආයේ ආයෙත් මතක් කරනවා.

කසාද සහතිකේට විතරක් තමන් කලින් විවාහ වෙලා හිටපු කෙනෙක් වුණත්, දික්කසාද වුණු කෙනෙක් වුණත් ඒ ජීවිතේ භාර ගන්න නිශිත් ඉදිරිපත් වුණු හැටි...

අද වෙනතුරු අනූගේ ජීවිතේ පරණ දේවල් එක වචනෙකින්වත් නිශිත් මතක් කළේ නෑ.

ඒ වගේ කෙනෙක් වෙනුවෙන් තමන්ගේ පතිවත පුදන්න පුළුවන් වුණු එක ගැන අනූගේ හිතේ තියෙන්නේ කියාගන්න බැරි සතුටක්.

එදා දවසේ ඒ මොහොතේ විඳගත්ත ඒ හැඟීම අදටත් වෙනසක් නැතුව විඳින්න තරම් ඒ දෙන්නගේම ආදරේ තාමත් ශක්තිමත්.

කාලය ගතවන ඉක්මණ...

දන්නේම නැතිව පුංචි පැටියාට අවුරුදු දෙකකුත් වෙලා.

“අම්මී....“

නිශිත් දැන් අනූට කතා කරන්නේ එහෙමයි.

“ම්ම්ම්ම්ම්“

නිශිත් අනූ එක්කම ඇඳේ හාන්සි වෙලා අනූගේ පැත්තට හැරිලා අනූගේ ඔළුව අතගානවා.

“තාත්තිට මොනා හරි ඕනි වෙලා වගේ....“

“නෑ අනේ...“

“නෑ නෙමෙයි...“

“මේ ඒක නෙමෙයි ආයේ ඔයාට තේ බොන්න එපා කියලා කව්රුත් කිව්වේ නෑ නේද“

අනූ ඇස් දෙකත් ලොකු කරගෙන නිශිත් දිහා බලාගෙන ඉන්නේ එයාගේ නිරුවත් පපුවට ඔළුවත් තියාගෙන.

“නෑ මං හිතුවේ ආයේ එහෙම කියන්න කෙනෙක් ආවොත් මොකද කියලා“

නිශිත් ඔළුවත් කස කස කියද්දි අනූට නම් හොඳටම හිනා.

“ආ ඇත්තද... මං දැනගත්තා ඔච්චර ඔළුව අතගානකොට....“

“මේ තාත්ති නම්....“

අනූ නිශිත්ගේ කම්මුලට හාදුවක් දුන්නේ නිශිත්ගේ ඒ ඉල්ලීම පිළිඅරගෙන.

නිශිත් අනූව ළඟට ගන්න හදන කිසිම දවසක අනූ ඒකට විරුද්ධ වුණේ නෑ.

එදා දවසේ ඒ සුසුම් හුවමාරුව අතරේ දෙන්නාම හිතුවේ එකම දෙයයි..

තවත් පුංචි දරුපැටියෙක්....

*.... 27*

අනූ දැන් ටික දවසක ඉඳලාම නිශිත්ගේ වෙනසක් දැක්කා.

එයාටවත් දරුවාටවත් ආදරේ වෙනසක් නොවුණත් ගොඩක් වෙලාවට කල්පනා කර කර ඉන්නවා අනූ දැක්කා.

“අයියේ....“

“අයියේ....“

අනූ කීපපාරක්ම නිශිත්ට කතා කළත් ඇහුණේ නෑ වගේ ඉන්නවා.

“අයියේ...“

“ඇ.... ඇ.... ඇයි...“

“මේ ලෝකේ නම් නෙමෙයි හිටියේ“

“එහෙම නෑ අනේ“

“මොනවාද ඔච්චර කල්පනා කරන්නේ අයියේ... මුකුත් ප්‍රශ්නයක්ද“

“නෑ අනූ එහෙම මුකුත් නෑ“

අනූ තවත් මුකුත් අහන්න ගියේ නෑ.

දින ගාණක්ම නිශිත් කල්පනාවෙන් ගත කරනවා අනූ බලාගෙන හිටියත් නිශිත්ගෙන් මුකුත් ඇහුවේ නැත්තේ හිත රිද්දන්න බැරිකමට.

“අම්මී...“

“ම්ම්ම්ම්ම්“

“අපි ලංකාවට ගිහින් එමුද“

“හදිසියේම...“

“නෑ ඉතිං අපි ආවට පස්සේ ලංකාවට ගියේම නැනේ“

නිශිත් කල්පනා කරලා කල්පනා කරලා අන්තිමේදි අනූට කිව්වා.

“කවද්ද යන්නේ ඉතිං“

“අපි අනිද්දවත් යමු. මං ටිකට්ස් දාන්න දූන්නා“

“මෙච්චර ඉක්මණට. එහේ මුකුත් ප්‍රශ්නයක් නෑ නේද අයියේ...“

“නෑ මැණික. අපි යමු. ඔයාට ලෑස්ති වෙන්න පුළුවන් නේද“

“පුළුවන්. ඒත් ඔයා මොකක් හරි ලොකු ප්‍රශ්නෙකද ඉන්නේ“

“මට කියන්න බැරි දෙයක්ද“

නිශිත් ඒකට කිසිම උත්තරයක් නොදී අනූගේ ළැමදට ඔළුව තියාගත්තා.

****************************************************
*******

නිශිත්, අනූ එක්ක ඒ දෙන්නගේ චූටි පැටියත් ලංකාවට එද්දි එයාලව ගන්න ඇවිත් හිටියේ මලිත්.

“යකෝ ලංකාවෙන් ගියාම එන්නත් මතක නෑ නේද“

“මතක හින්දනේ ආවේ...“

“අනේ පලයන් යන්න එහේ සැපනේ ඉතිං තේ සීත....ලේ“

“උඹට මම...“

නිශිත් මලිත්ගේ බෙල්ල නවාගෙන ගුටි දෙනවා.

අනූ නම් රතු වෙලා බලාගෙන ඉන්නවා.

මලිත් එක්කම කට්ටියම පිටත් වුණේ නිශිත් එක්ක කලින් කතා කරගෙන තිබුණු ගමන යන්න.

“අපි කොහේද යන්නේ..“

අනූ මෙච්චර වෙලාවක් හිතාගෙන හිටියේ නිශිත් එයාගේ ගෙදර යනවා කියලා. ඒත් වාහනේ යන්නේ ඒ පාරේ නෙමෙයි කියලා හිතෙද්දි වගේම යන පාරේ හුරු බව නිසාම අනූ කතා කලා.

මලිත් නිශිත් දෙන්නා මූණෙන් මූණ බලාගත්තත් අනුට උත්තරයක් හම්බුණේ නෑ.

“කියන්නකෝ අනේ... ඇයි කතා කරන්නේ නැත්තේ ඔයාලා දෙන්නාම“

“ඔයා දන්න තැනකට යන්නේ...“

“දන්න තැනකට....?“

“මල්ලි වාහනේ නවත්තපං ටිකකට“

නිශිත් අනුවත් එක්කගෙන වාහනෙන් බැස්සා.

නිශිත් අනුගේ උරහිස් දෙකෙන්ම අල්ලගෙන ඒ මූණට එඹුණා.

“මැණික අපි යන්නේ හේමන්තගේ ගෙදර“

අනු පුදුම වුණා.

“හේමන්ත අයියාගේ ගෙදර යන්නේ ඇයි?“

“එයාට ටිකක් අසනීපයි. ඔයත් එක්ක කතා කරන්න ඕනේමයි කිව්වා“

“මං දන්නවා ඔයාට නොකියා මෙහෙම එක්කගෙන ආව එක වැරදි කියලා“

“ඒකට මට සමාවෙන්න“

“ඔයාගේ හිත රිදෙන කිසිම දේකට මං කැමති නෑ අනු“

“ඒත් හේමන්ත මට පහුගිය ටිකේම කතා කළා“

“මං කල්පනා කර කර හිටියේ ඒක. ඔයාට කියනවාද නැද්ද කියලා“

“මාත් කැමති නෑ. ඌ ඔයාට කරපු දේවල් මට අමතක වෙලා නෑ“

“ඒත් එයාට ගොඩක් අමාරුයි. බීලා බීලාම විනාස වෙලා“

“මගේ මැණික මාත් එක්ක තරහා නෑ නේද“

තමන් ගැන මෙච්චරටම නිශිත් හිතනවාද. ඒ ආදරේ අනූගේ කරගන්න තරම් එයා කොච්චර පිං කරලාද...

“මං තරහා නෑ මගේ මහත්තයෝ...“

අනූ නිශිත්ව තුරුල් කරගත්තා.

“යකෝ මුන්ට පාරද කියලත් අමතකයිනේ ලව් කරන්න ගත්තාම.. ඔය එහේ පුරුද්ද තමා“

“මේ මැන් ඕවා ඉගෙන ගනී බලාගෙන ඉඳලා හොඳද“

මලිත් කෑගහනවා.

“එනවා බං එනවා. තෝ නම් පුදුම දූෂ්ටයෙක්“

“වෙනසක් කරගන්න දෙන්නෙම නෑනේ..“

නිශිත් අනූ එක්කම ආයෙත් වාහනේට නැග්ගා.

“වෙනසක් කරගන්න රෑ වෙනකම් ඉවසපන්...“

“අපෝ බෑ. එච්චර ඉවසීමක් නෑ දැන්“

“අනූ නංගී කොහොමද අප්පා මූ එක්ක ජීවිත් වෙන්නේ“

sinhalaebooks.com

“පුදුම වදයක්නේ දෙනවා ඇත්තේ“

අනූ නම් සද්ද නෑ. බිම බලාගෙන ඉන්නවා.

“එයත් කැමති එහෙම තමා“

අනූ දුන්නා නිශිත්ගේ අතට පාරක්....

*අවසාන කොටස*

හේමන්තත් අනූත් හිටපු ගෙදර...

අනූ ඒ මිදුලටම අද ආවත් අනූට ඒ ගේ ඇතුළට යන්න බැරි හැඟීමක් දැණුනා.

තමන්ට නොසෑහෙන්න කරදර කරපු හිත රිද්දපු තමන්ව මරන්න හදපු ඒ මනුස්සයාට වුණත් අනූ වෛර කළේ නෑ.

තමන් මේ ගේ ඇතුලේ කොච්චර ගුටි කාලා ඇද්ද, කොච්චර බැණුම් අහලා ඇද්ද, කොච්චරක් නම් කුස්සියේ පඩිපෙළ ළඟට වෙලා හූල්ල හූල්ල ඉන්න ඇතිද...

අන්තිමට කේන්තියෙන් කෑගහගෙන ඇවිත් තමන් එළවළු කප කප හිටපු පිහිය ඇදලා අරගෙන අනුට ඇනගෙන ඇනගෙන ගිය හැටි අනුට මැවිලා පෙනුනා.

අනුගේ අත එයාගේ බඩට ගියේ ඉබේටමයි.

නිශිත් මේ හැමදේම බලාගෙන හිටියා.

අනු නොකිව්වාත් එයාට මේ ගෙදර වුණු හැමදෙයක්ම මතක් වෙනවා ඇති කියලා නිශිත් හිතුවා.

"ඔයාට ප්‍රශ්නයක් නෑ නේද මැණික"

"නෑ අයියේ..."

"එන්න යමු ඇතුලට. මං පුතාව ගන්නම්"

හේමන්තගේ අම්මා, තාත්තා විතරක් නෙමෙයි නිශිත්ගේ අම්මා, තාත්තාත් හේමන්තව බලන්න ඇවිත් හිටියා.

ඇඳ විට්ටමට කොට්ටයක් තියලා ඒකට හේත්තු වෙලා ඉන්න හේමන්තව අනු දැක්කා.

කකුල් ඉදිමිලා, ඇඟම කහපැහැ වෙලා, බඩත් ලොකු වෙලා....

අනු ගියාට පස්සේ තිෂූ හේමන්ත ළඟට එයි කියලා හිතුවාත් එයා මෙච්චර කල් කරලා තියෙන්නේ බොරුවක් කියලා දැනගත්තාම හේමන්ත ෂොක් වුණා.

බීලා බීලාම තමන්ටත් නොදැනීම තමන් විනාස වෙලා ගියා. දැන් හේමන්ත සිරෝසිස් රෝගියෙක්.

මෙච්චර අඩු වයසකදී හේමන්තට මේ වගේ ඉරණමකට මූණ දෙන්න වෙයි කියලා කිසිම කෙනෙක් හිතුවේ නෑ.

අනූට බර සුසුමක් හෙළුනා. අනූගේ මුළු හදවතින්ම එයා දුක් වුණා හේමන්තව දැකලා.

නිශිත් අනූ එක්කම හේමන්ත ළඟට ගියා.

"ලස්සන කොළු පැටියෙක්..."

"මොකද්ද චූටි බබාගේ නම..."

හේමන්ත බබාව අල්ලනවා.

"අන...නි..ත්..."

පුංචි එකත් පැහිච්චකමට නම කියන්න දඟලනවා.

"එයා අනුශිත්" අනූම උත්තර දුන්නා.

"අනූ.... නිශිත්...... අනුශිත්. ලස්සනයි"

හේමන්තගේ ගෙදර අය වගේම නිශිත්ගේ ගෙදර අයත් මේ දේවල් දිහා බලාගෙන ඉන්නවා මිසක් මුකුත් කියන්නේ නෑ.

"අනූ...."

හේමන්ත ලොකු කතාවකට මුල පිරුවා.

"අයියේ දෙන්න මං පුතාව අරගෙන යන්නම්"

"කෝ එන්න මගේ සුදු පැටියා බාප්පි ළඟට..."

මලිත් එයාලට නිදහසේ කතා කරගන්න ඉඩ දීලා පුතාවත් අරගෙන එළියට ගියා.

sinhalaebooks.com

“මං ඔයාට ගොඩක් වැරදි කළා නංගී“

“මට ඔයාගෙන් සමාව ගන්නයි ඕනේ වුණේ“

“ඔයාව බලන්න ගෙදරට ආව දවසේ ඉඳලම මං ඔයාට සැලකුවේ නරක විදියට“

“පරණ දේවල් දැන් වැඩක් නෑනේ අයියේ. ඒවා වෙලා ඉවරයි“

“නෑ අනූ. මං ඔයාට කරපු දේවල් මේ අයත් දැනගන්න ඕනේ. මට තවත් මේ දේවල් හිතේ තියාගෙන විඳවන්න බෑ“

“මේ විඳවන විඳවිල්ල හොඳටම ඇති“

“මේ දේවල් ඔයාලා දැනගත්තාට පස්සේ මාව මැරුවත් මං මුකුත් කියන්නේ නෑ“

“හේමන්ත අයියේ ඒ දේවල් ගැන කතා කරන්න ඕනේ නෑ“

“අතීතේ අතීතයක්ම විතරයි“

අනූ එහෙම කිව්වේම අතීතේ ආපහු ඇදලා අරගන්න ඕනේ නැති නිසා වගේම ඒ වගේ අතීතයක් කිසිම කෙනෙකුට නැති නිසා.

“නෑ නංගී මේ දේවල් කියන්නම ඕනේ“

හේමන්තගේ අම්මා අනූට පුටුවක් ඇදලා දුන්නේ හේමන්ත ළඟට.

නිශිත් අනූගේ අතින් අල්ලගෙනම අනූගේ පැත්තකට වෙන්න හිටගත්තා.

"මං එදා අනුව බලන්න ගිය දවසේම අනුට කිව්වා මං නිෂූට ආදරේ කරනවා. අම්මාට ඕන නිසා විතරයි මං ඔයාව බඳින්නේ කියලා"

"අනූ ඒකට කැමති වුණා. මොකද එයාටත් ගෙදරින් බලපෑම් කරපු නිසා මාව බඳින්න"

"ඒත් මං ඔයාව ඇත්තටම බැන්දේ නෑ අනූ.."

අනූ බිමට පාත් කරගෙන හිටපු ඔළුව ඉස්සුනේ ඒ ඇහුණ දේට. නිශිත් අනුගේ ඔළුව අතගෑවා.

හේමන්ත ඒ දිහා බලාගෙන හිටියේ දුකෙන්.

අනිත් අයගේ මූණු වලත් තිබුණේ පුදුමයක්.

"ඔව් අනූ. එදා ආව රෙජිස්ටාර් බොරු කෙනෙක්. අම්මාට ඒ කෙනෙක් හොයන්න නොදී මම හොයන්නම් කියපු නිසා එයාලා ඒ ගැන දන්නේ නෑ"

"එදා ගත්තේ බොරු කසාද සහතිකයක්"

"එතකොට දික්කසාද ලියවිල්ල?" නිශිත්ට තිබුණු ප්‍රශ්නේ ඒක.

"ඒකත් බොරු එකක්. මං දන්න ලෝයර් කෙනෙක්ට කියලා හදවාගත්තේ"

අනූ නම් බිම බලාගෙන.

"නිෂූ මාව හැමවෙලේම අනුට විරුද්ධව පාවිච්චි කළා"

“ඉතිං අපි හනිමූන් ගිය දවසේත් මාත් එක්ක ඇදේ හිටියේ තිෂු. අපිට ඕනේ වුණේ අනූට රිද්දන්න“

“අනූ මුළු රෑ පුරාම හිටියේ බාත්රූම් එකට වෙලා“

“උදේ වෙද්දි සීතලේ ඉඳලා උණත් හැදුණා එයාට“

“ඒත් මං බැලුවෙවත් නෑ. එයා ඒ දේවල් හැමදේම ඉවසගත්තා“

අනූගේ අත අල්ලන් හිටපු නිශිත්ගේ අත කේන්තියට තද වෙනවා දැණුනු නිසාම අනූ නිශිත්ගේ අත අතගෑවා.

මේක දැකපු හේමන්තට දැණුනා නිශිත් ඉන්නේ කේන්තියෙන් කියලා.

“මං දන්නවා නිශිත් උඹට කේන්ති ඇති. මොකද උඹ ඒ තරම් අනූ ආදරෙයි කියලා මං දන්නවා. ඒත් මීට වඩා උඹට කේන්ති යයි මං මේ කියන්න යන දේවල් ඇහුවාම“

“මොකද අනූ ඒ කිසි දෙයක් උඹට කියලා නෑ කියලා මං දන්නවා“

අනූ නම් බිම බලාගත්තේ කතාව ඇත්ත නිසා. හේමන්ත ගැන වැරැද්දක් මේ වෙනකම් අනූ නිශිත් එක්ක කියලා නෑ.

“ඒ දවස්වල මට මේ කිසිම දෙයක් තේරුණේ නෑ“

“තිෂු මට එච්චර කාලෙකට කරලා තියෙන්නේ බොරුවක් කියලා තේරෙද්දි මං පරක්කු වැඩියි“

‘‘අපි ගෙදර ආව දවසේ ඉඳලාම මං කළේ අනූට බැනපු එක. ගහපු එක‘‘

‘‘නිශිත් උඹ මං ගහද්දි අනූව බේරගත්තේ එක දවසක් විතරයි‘‘

‘‘ඒත් මේ කෙල්ල මේ ගෙදරට ආව දවසේ ඉඳන් හැම දවසකම මගෙන් ගුටි කෑවා‘‘

‘‘මං මේ කෙල්ලගේ මූණ දැකපු හැම දවසකම මං ගැහුවා‘‘

‘‘මූණ දැක්කේ නැති වුණත් තිසු මාව අවුස්සපු දවස්වල මං මේ කෙල්ලට ගැහුවා‘‘

‘‘බෙල්ට් එකෙන් කාලා ඇති ඇතිවෙනකම්‘‘

‘‘දවසක් මට අතට අහු වුණේ කොස්ස. මං ඒක කැඩෙනකම්ම කේන්තියට මේ කෙල්ලට ගැහුවා‘‘

‘‘අනූ දන්නවා එයාගේ මූණ මං දැක්කොත් මගෙන් ගුටි කන්න වෙනවා කියලා‘‘

‘‘එක දවසක් මං සෙල්ලම් කරලා එනකොට අනූ මං එයි කියලා හිතුවේ නැති නිසා එකපාරම ඉස්සරහාට ආවා‘‘

‘‘මගේ අතේ තිබුණේ බැට් එක‘‘

‘‘එදත් මං අනූට හොඳටම ගැහුවා‘‘

‘‘හේමන්ත උඹ මහා නරුමයෙක්, තිරිසනෙක්‘‘

නිශිත් කේන්තියෙන්ම ආවේ හේමන්තට ගහන්න.

“එපා අයියේ.... ප්ලීස්“

අනූ නිශිත්ගේ අතේ එල්ලුනා.

“ගහපං නිශිත් ගහපං. මං කරපුවාට මාව මැරුවත් මදි“

“ඇත්ත බං. මං මහා නරුමයෙක්, තිරිසනෙක් තමා“

හේමන්ත ඇත්තටම දුකෙන් කිව්වා.

“තිෂු හැමදම කලේ මේ කෙල්ලට විරුද්ධව මාව අවුස්සපු එක“

“මාත් කේන්තියෙන් හිටපු නිසායි ඒ දේවල් වුණේ“

“බත් කකා හිටපු පිඟාන දවස් කීයක්නම් මං විසි කරන්න ඇද්ද“

ඒත් එක දවසක්වත් මට වෙනස්කමක් නොකර කෑම උයලා දුන්නා.

“දවස් කීයක් මං ඔයාව මහ රෑ කරුවලේ එළියට දලා තිබුණාද අනූ“

හේමන්තගේ අම්මා, තාත්තා වගේම නිශිත්ගේ අම්මා තාත්තාගෙත් ඇස්වල කඳුළු පිරිලා.

ඊටත් වඩා නිශිත්ගේ පපුව පැලෙන්න තරම්.

“අපේ අම්මා අනූට ජොබ් එකෙන් අයින් වෙන්න කිව්වේ මං නිසා. ඒත් මං එයාට සැලකුවේ නෑ“

“අතට වැඩිපුර කීයක්වත් දුන්නේ නෑ. කඩේ ගිහින් ආවාත් මාරු කාසි ටික තියලා මං කොළ ඔක්කොම ගත්තා තරහාට“

“මගේ ජීවිතේ විනාස වුණු පලිය මට ඔයාගෙන් ගන්නයි ඕනේ වුණේ“

“අවුරුදු දවසේවත් මං ඔයාට හොඳට සැලකුවේ නෑ අනූ“

“ඔයා ගොඩක් මහන්සිවෙලා මගෙන් සල්ලිවත් ඉල්ලන්නේ නැතුව කෑම හදාගෙන ලිප් හදාගෙන ගොඩක් ආසාවෙන් එදා හිටියා කියලා මං දන්නවා“

“ඒත් මගේ නපුරුකම ඔයාට හොඳින් සලකන්න ඉඩ දුන්නේ නෑ“

අනූ මූණ බිමට බර කරගෙන අඩනවා.

“ඔයාට සල්ලි නැති නිසා මං ඔයාට රස්සාවක් හොයාගන්න කියපු නිසා ඔයා ගිහින් පිඟන් හේදුවා කියලා මට නිශිත් එදා රණ්ඩු වෙද්දි කිව්වා“

“බඩු උස්සගෙන පයින් එනවා කිව්වා“

“නිශිත් එදා ඉඳලම ඔයා ගැන හිතුවා අනූ..“

“ඒක උගේ කතා බහෙන් මං දැනගත්තා“

“මට ඔයාට ඔහොම කරන්න එපා කිය කිය පුදුම තරම් උපදෙස් දුන්නා“

“ඒ හැමදවසකම මං උගේ ඇස් වලින් දැක්කා ඔයාට තිබුණු ආදරේ“

“උඹ අපේ ගෙදරට ආවට පස්සේ මං ඒ තරම් කන්ට්‍රෝල් වෙලා හිටියේ උඹට බයේ“

“මොකද අනුට මොනවා හරි වුණොත් උඹ නයා වගේ කියලා මං දැනගත්තා“

අනූ පුදුම අහිංසක විදියට නිශිත් දිහා බැලුවා.

“ඒත් මට ඉවසීම හරිම අඩුයි කියලා උඹ දන්නවනේ“

“එදා ඔයා ගැන එච්චර දුකකින් නිශිත් කතා කරද්දි මට කේන්ති ගියා“

“ඒ කේන්තියෙන්ම මම ගෙදර ආවාම ඔයාව දකිද්දි මට ඊටත් වඩා කේන්ති ගියා“

“මං ඔයාව මරන්න හැදුවා“

“මට ඔයාගෙන් සමාව ඉල්ලන්න බෑ අනූ“

“ඒත් ඔයා මට සමාව දුන්නා. පොලිසියට බොරු කටඋත්තරයක් දීලා ඔයා මාව හිරේ යන එක නැවැත්තුවා“

“මං දන්නේ නෑ ඔයා මොන වගේ කෙනෙක්ද කියලා“

“මට ඔයාව බලන්න එන්න ඕනේ වුණා“

“ඒත් නිශිත් ඒක කරන්න දුන්නේ නෑ“

“උඹ දන්නවාද මේ කෙල්ලට ඒ සිද්ධිය මතක් වෙලා කොච්චර දවසක් බය වුණාද කියලා හේමන්ත“

“දවසක් උඹ මරන්න එනවා කියලා බය වෙච්ච පාර ඇද යට හිටියේ“

“තෝ මහා පච්කාරයෙක්..“

“ඇත්ත නිශිත්. මං පච්කාරයෙක් තමා“

“එදා රණ්ඩු වුණ දවසේ මට නිශිත් කිව්වා බලපං තොගේ ජීවිතෙත් තිෂූ විනාස නොකළොත් මං නිශිත් නෙමෙයි කියලා“

“ඇත්තටම හරි නිශිත් උඹ. ඒකී මාව විනාස කළා. තව ටිකෙන් මේ අහිංසක කෙල්ලගේ ජීවිතේ මං නිසා ඉවර වෙනවා“

“උඹ නිසායි කෙල්ල බේරුණේ“

“එයා ඇත්තටම ඔයාට ගොඩක් ආදරෙයි අනූ“

“උඹ වාසනාවන්තයි නිශිත්. මේ වගේ කෙල්ලෙක් ලැබෙන්න ඇත්තටම පින් කරන්න ඕනේ“

“මං එච්චර වෙනස්කම් කළත් මූණේ තරහවක්වත් නැතුව මට සැලකුවා. කෑම ටික හදලා දුන්නා“

“මට සමාවෙන්න අනූ. මේ හැමදේටම සමාවෙන්න“

හේමන්ත අත්දෙක එකතු කරලා අනූගෙන් සමාව ගත්තේ හදවතින්මයි.

“සමාව ඉල්ලන්න එපා අයියේ. ඔයාගේ තත්ත්වේ මම හිටියා නම් මමත් ඔහොම කරයි“

sinhalaebooks.com

“ඔයා ආදරේ කරපු කෙනාව ඔයාට නැති කරලා මූණවත් දකින්න අකමැති කෙනෙක්ව බන්දලා දුන්නාම කව්ද කැමති ජීවත් වෙන්න“

“මං ඔයාත් එක්ක හිටපු කාලෙට කාත් කව්රුවත් නැති අසරණ මට මෙතන වැටිලා ඉන්න දීපු එකම ඇති අයියේ“

“ඒ නිසා සමාව ඉල්ලලා මට පව් සිද්ධ කරන්න එපා“

“මගේ පව් ගෙවා ගන්න ඔයා මට උදව් කළා කියලා හිතන්න“

“ඒ හිටපු කාලෙට මගෙන් ඔයාට වැරැද්දක් වුණා නම් මට සමාවෙන්න හේමන්ත අයියේ“

“මගේ හිතේ පොඩ්ඩක්වත් ඔයා එක්ක තරහක් නෑ“

“මං ඔයාට කරපු දේවල් මට මේ ආත්මෙම ලැබුණා නංගී“

“අපිටත් සමාවෙන්න දුව. ඔයා එච්චර කාලයක් මේ දේවල් ඉවසගෙන හිටියා. අපි නිසයි මේ හැමදේම වුණේ“

“එහෙම කියන්න එපා අම්මා. මොන අම්මා වුණත් කැමති අපි එයාලාට ඕන විදියට එයාලා කැමති දේවල් කරනවාට“

“ඉතිං අම්මාත් කළේ ඒ දේනේ“

“සමාව ඉල්ලන්න එපා. මං ඔයාලා කාත් එක්කවත් තරහක් නෑ“

අනූට තවත් එතන ඉන්න පුළුවන්කමක් තිබුනේ නෑ.

අනූ නැගිටලා ගියේ කුස්සිය පැත්තට.

ජීවිතේටවත් හේමන්ත එයාගෙන් මෙහෙම සමාව ඉල්ලයි කියලා අනු හිතුවේ නෑ.

මොන දේ වුණත් හේමන්ත තමන්ට අවුරුද්දක් තිස්සේ කන්න බොන්නවත් දුන්නනේ.

අනුට දුක හිතුනේ හේමන්ත ගැනද, එයා ගැනද නැත්තම් නිශිත් ගැනද කියලා හිතාගන්න බැරුව ගියා.

“මැණික...“

අනු එතනින් නැගිටලා ගියත් එක්කම නිශිත් එළියට ආවා.

නිශිත් අනුව තුරුල් කර ගත්තා.

“ඔයා මෙච්චරටම දුක් වින්ද කියලා මම දන්නේ නෑ අනු“

“දැනගෙන හිටියා නම් මං ඌට ගහලා හරි ඔයාව මීට කලින් අරගෙන ගිහින්“

“මගේ කෙල්ල ගොඩක් දුක් විඳලා“

“මට සමාවෙන්න. එද හේමන්තට නොදී මං ඔයාව මගේ කරගත්තා නම් ඒ වගේ දුකක් ඔයාට විඳින්න වෙන්නේ නෑ“

නිශිත් ගොඩක් ආදරෙන් අනුගේ නළල සිපගත්තා.

“මට මෙච්චරටම ආදරේ කරන්න එපා අයියේ. මට මේ දේවල් දරා ගන්න බෑ“

“ඔයා වගේ අය මේ ලෝකේ කිසිම තැනක නෑ“

“මං හරි වාසනාවන්තයි ඔයාගේ ආදරේ ලැබෙන්න“

sinhalaebooks.com

“මට මේ හැමදේම හීනයක් වගේ අයියේ තාමත්“

“මට ගොඩක් බයයි දවසක ඒ හීනෙන් ඇහැරෙන්න වෙයිද කියලා“

අනූ නිශිත්ගේ පපුවට පුළුවන් තරම් තුරුල් වුණා.

අනූගේ කඳුළු නිශිත්ගේ ෂර්ට් එක හරහා පපුවටම කාන්දු වුණා.

“මගේ මුළු ජීවිතේම ඔයා. තව ආත්ම ගාණකටම ඔයා මගේ පණ“

“ඒක වෙනස් වෙන්නේ නෑ අනූ“

“ඒ හින්ද එහෙම හිතන්නවත් එපා“

“යකෝ මේක හරි මගුලක්නේ. මුන් දෙන්නා කොයි වෙලාවේ බැලුවත් ගැරඬි ජෝඩුව වගේ එතිච්ච ගමන්මයි“

එතෙන්ට කෑගහගෙන ආවේ මලිත්.

“දරුවෙක් ඉන්නවා නේද කියලාවත් හිතපංකෝ. එහෙම නෑ. ලව් ලව් ලව්“

“තෝ මහා ඉරිසියාකාරයෙක් බං ඇත්තමයි. මගේ මල්ලි වුණේ මොකටද මන්දා“

අම්මලා දෙන්නෙක්ගේ දරුවෝ වුණත් නිශිත්, මලිත් දෙන්නා ඇත්තටම සහෝදර බැඳීම උපරිමව තිබුණු දෙන්නෙක්.

අනූට එකපාරම ඔක්කාරයක් වගේ ආපු නිසා අනූ නිශිත්ව අතඇරලා ඉක්මණට එහාට ගියා.

නිශිත් ඒ පස්සෙන්ම දුවගෙන ආවේ අනුට මොකද වුණේ බලන්න.

“අනූ... ඇයි මේ...“

අනූ නිශිත් දිහා බලපු බැල්මෙන්ම එයා දැනගත්තා වෙලා තියෙන දේ.

“මගේ මැණික.... වස්තුව...“

නිශිත් අනුව තුරුල්කරගෙන උමතුවෙන් වගේ මුළු මූණම සිප ගත්තා.

ජීවිතේ ආයේමත් වතාවක් දරුවෙකුගේ සුරතල් බලන්න නිශිත්ටත් අනූටත් වාසනාව ලැබිලා...

“හරිනේ ඉතිං.... ඔය කොරලා තියෙන්නේ“

“එතිලා හිටියාට ඉතිං පාඩුවකුත් නෑ“

මලිත් එහෙම කියාගෙනම එතනින් දුවගෙන ගියේ නිශිත්ගෙන් ගුටි කන්න වෙයි කියලා.

“මේ අපි යමුකෝ ඉක්මණට“

“කොහේද“

“හොටෙල් එකට“

නිශිත් ලංකාවේ ඉන්න දින කීපයට හෝටල් කාමරයක් වෙන් කරගත්තේ නිදහසේ ඒ දින කිහිපය ගත කරන්න ඕන නිසා වගේම අනූගේ හිත රිදෙන කිසිම දෙයක් වෙනවාට අකමැති නිසා.

“හොටෙල් එකට?. ඇයි හදිසි අනේ..“

“ඇයි අනේ අපේ පැටියා එන එක සමරන්න ඕනේ නැද්ද. මට නම් හදිස්සියි“

“මේ තාත්තිට නම් දැන් හොඳටම විසේ වැඩියි“

“ඇයි අනේ ඉතිං මේ වගේ ලස්සන වයිෆ් කෙනෙක් ඉද්දි හස්බන්ඩ්ට විසේ වැඩිවෙන එක අහන්නත් දෙයක්ද ආ“

“දෙන්නේ ගුටි හොඳද..“

“ගුටියත් ඉතිං මාාාාර සනීපයි අනේ.... ඒකත් ඇති ඉතිං පැයක් විතර ෂේප් කරගන්න“

“මං ඔයාට ගොඩක් ආදරෙයි අයියේ...“

“මාත් ඔයාට ගොඩක් ආදරෙයි නංගී.... මේ ආත්මේ විතරක් නෙමෙයි තව ආත්ම ගාණකට ඔයා මගේම වෙන්න මැණික....“

මහ මෙරෙක් තරම් ආදරයක්...

මුළු ලොවක් එළිය කල ආදරයක්...

සදාකාලික ආදරයක්...

හිත ගත දෙකම සනසන ආදරයක්...

ආත්මගත බැඳීමක්.....

දෙන්නාම හිතෙන් මිමිණුවේ එකම ගීතයක්.....

sinhalaebooks.com

මේ වස්සාන සිහිනය පුරා
පෙම්හොරෙක් රහසේ අඩි තියා
මහ රෑ තිස්සේ හිරිහැර කලා
මගේ උන්මාද පෙම ඇහැරවා
ඔබේ සෙවණට වෙලා දිවි තුරා
ඉන්නම් ඔබට ඇපකැප වෙලා
හීනයක්ද මේ ඔබෙන් ලද සෙනේ
ආත්මයම ඔබටයි භවයෙන් භවේ
ඔය සුපෙම් හිතේ සෙනෙහේ වෑහුනේ

ජීවිතයම පුදුමාකරයි හීනයක්ද මේ
පෙම් පැතුම් අතරේ පින්සාර මාගේ
හැගුම් කිති කැවුනා නිස්කාරනේ
මේ පිරිමි පපුවෙ නුබට මිස ලදුනේ
නෑ පෙම උපන්නේ සංසාරයේ
පෙරුම් පුරා ලංවෙලා ආත්මයම හැඩ කලා
උපදිනා භවයක් පුරා අපි අපේ වේවා සඳ

හීනයක්ද මේ ඔබෙන් ලද සෙනේ
ආත්මයම ඔබටයි භවයෙන් භවේ
ඔය සුපෙම් හිතේ සෙනෙහේ වෑහුනේ
ජීවිතයම පුදුමාකරයි හීනයක්ද මේ.....

*-නිමි-*

sinhalaebooks.com